


ලස්සන වසිලීස්සා

රුසියන් පුරාණ කතා









ලස්සන වසිලීස්සා

රුසියන් සුරඟනා කතා

රාදුගා ප්‍රකාශකයෝ
මොස්කව්

අනුවාදය – දැදිගම වි. රුද්‍රිගු
චිත්‍ර හා සැකැස්ම – යෙ. මිනායෙව්

ISBN 5-05-000908-1

ලස්සන වසිලීස්සා

ඒකෝමත් එක රටක, බොහොම ඉස්සර කාලේ, එක පුංචි ගෙදරක මහල්ලෙකු යි, මැහැල්ලක යි හිටියා. මේ දෙදෙනාට හිටියෙ එක ම එක දුවක් විතරයි. එයා ගේ නම වසිලීස්සා. ඒ ගොල්ලො බොහොම හොඳට ජීවත් වුණා. හිටිහැටියේ ම ඒ ගොල්ලන්ට විපතක් සිදු වුණා. වසිලීස්සා ගේ මහලු මව අසනීප වුණා. ඇගේ මරණය ළං වුණා. අම්මා වසිලීස්සාට කතා කරලා, ඇට බෝනික්කෙකු දීලා මෙහෙම කීව්වා:

"අනේ හොඳ දුවේ. මේ බෝනික්කාව කාටවත් එහෙම පෙන්වන්නෙ නැතිව පරිස්සම් කර ගනින්. නුඹට විපතක් සිදු වුණොත්, බෝනික්කාට කෑම ටිකක් දීලා උපදෙස් ලබාගනින්. එයා නුඹට පිහිට වේවි."

අම්මා විසිලීස්සාව සිපගත්තා. ඊට පස්සෙ ඈ මළා.

වසිලීස්සා ගේ මහලු පියා ටික කලක් දුක් වුණා. පසුව ඔහු වෙනත් ගැණියක විවාහ කර ගත්තා. තාත්තා හිතුවේ ඈ හොඳ කෙනෙකු හැටියටයි. එහෙත් ඈ නපුරුයි. වසිලීස්සාව කුඩම්මාට බාර දුන්නා.

කුඩම්මාට දූවරු දෙදෙනෙක් හිටියා. මේ දෙදෙනා නපුරුයි, මෝඩයි, අහංකාරයි. කුඩම්මා ඇගේ දූවරුන්ට ආදරය කළා. උන්ව හුරතල් කළා. ඈ වසිලීස්සාට නිතරම බණින්ට වුණා. වසිලීස්සා ගේ ජීවිතය දුකින් පිරුණා. කුඩම්ම යි ඇගේ දූවරු දෙදෙන යි හැම තිස්සේ ම වසිලීස්සාට නපුරු හිතින් බණිනවා, වැඩ ගොඩක් බාර දෙනවා. එහෙම කළේ මොකට ද කියලා

දන්නව ද? බරවැඩ හින්දා ඇයව කෙට්ටු කරන්නයි. වැහි හුළං වලට අහුවෙලා ඇව ලෙඩකු කරවන්නයි. ඉර අව්ව නිසා ඇ කළු වෙලා අවලස්සන වෙයි කියලා හිතුවා. හැම තිස්සේම මේ තුන්දෙනා වසිලීස්සාට අණ කළා:

"වසිලීස්සා කම්මැලි කෙල්ලේ! කෑම උයාපන්. ගේ අතුගාපන්. දර ගෙනෙන්. එළදෙනුන්ගෙන් කිරි දොවාපන්. ඉක්මනට වැඩ කරපන්. කම්මැලිවෙන්ට එපා."

වසිලීස්සා හැම කෙනෙකුගේම වැඩ කරනවා, හැම දෙනාටම කීකරුවෙනවා. හැම වැඩක්ම හොඳින් ඉටුකරනවා. කොපමණ වැඩ කළත් වසිලීස්සා කෙට්ටු වුණෙත් නැහැ, අවලස්සන වුණෙත් නැහැ. වසිලීස්සා බොහොම ලස්සනයි. කියන්ට බැරි තරම් ඇ ලස්සනයි, වචනවලින් ලියලා විස්තර කරන්න බැරි තරම් ඇ ලස්සනයි. ඇ මෙතරම් ලස්සන වුණේ බෝනික්කා උදවු කරන නිසා.



වසිලීස්සා හිමිදිරි පාන්දර නැගිටලා කිරි දොවලා, ගබඩා කාමරයට ගිහිල්ලා දොර වහලා, බෝනික්කාට කිරි පොවනවා. ඊට පස්සෙ දුක කියනවා:

"අනේ හොඳ බෝනික්කෝ කිරි බොන්න. මගේ කරදර ගැන අහන්න."

බෝනික්කා කිරි බොනවා.. වසිලීස්සාව සනසනවා. ඇගේ වැඩ කරනවා. වසිලීස්සා හෙවණ ඇති තැනක වාඩිවෙලා මල් කඩනවා. ගෙවත්තේ වල් පැළෑටි උදුරන්නේත්, වතුර ගේන්නේත්, ලීපට දර දාන්නේත්, ගෝවා කොටුවට වතුර ඉහින්නේත් බෝනික්කා. ඉර අව්වට අහුවෙලා හම පිළිස්සී නොයන ලෙස, වසිලීස්සා ගේ ලස්සන රුව ආරක්ෂා කිරීමට බෙහෙත් පැළෑටි පෙන්වා දෙන්නේත්

බෝනික්කා. මේ නිසා ඈ තවත් ලස්සන වුණා.

දවසක් දා වසිලීස්සා ගේ තාත්තා බොහෝ දුර ගමනක් ගියා.

කුඩම්ම යි දූවරු තුන්දෙන යි ගෙදර හිටියා. ගෙදරින් එපිට අඳුරු, වැසි වසිනවා. හුළං හමනවා. සරත් සමය ඉවරවෙන්නට ළං වෙලා. ගේ අවට මූකළන් කැලෑව. ඔය මහ කැලෑවෙ බාබායිගා නැමැති යකින්න වාසය කරනවා. හරිම නපුරු යකින්න. හිවලා කුකුළු පැටවුන් කන්නා වගේම බාබායිගා යකින්න මිනිසුන්ව කනවා.

කුඩම්මා ළමයින් තුන්දෙනාට වැඩ පැවරුවා: එක දුවක් ලේන්ද ගොතනවා, අනිත් දුව මේස් ගොතනවා. වසිලීස්සා ලොම් වලින් නූල් අඹරනවා. කුඩම්මා ගේ ඇතුළෙ පහන නිවා දැම්මා. දූවරුන් වැඩ කරන තැන ලුවීන නැමති දර කෝටුවක් විතරක් පත්තු කරලා. කුඩම්මා නිදාගන්ට ගියා. දර කෝටුව පට පට ගාලා පත්තු වෙලා නිවිලා ගියා.

''මොනවා කරමු ද? ගෙදර එළියක් නැහැ. වැඩ කරන්නත් ඕන. පාන පත්තු කර ගන්ට ගින්දර ටිකක් ඉල්ලා ගන්ට බාබායිගා යකින්න ළඟට යන්ට ඕන'' කියලා කුඩම්මා ගේ දූවරු කීවා.

''මම යන්නෙ නැහැ. මම ලේන්ද ගොතනවා. ගොතන කටුව දිලිසෙන නිසා ඒ එළියෙන් මට ගොතන්නට පුළුවනි.'' ලොකු දුව කිව්වා.

''මමත් යන්නෙ නැහැ. මගේ ගොතන කටුවත් දිලිසෙනවා. එම එළියෙන් මටත් ගොතන්නට පුළුවනි.'' මද්දුම දුව කීවා.

දෙදෙනා ම එකවර කෑ ගසා මෙහෙම කිව්වා:

''වසිලීස්සා, වසිලීස්සා පලයන්, ගින්දර ඉල්ලා ගෙන වරෙන්. බාබායිගා යකින්න ගෙන් ගිනි එළියක් ඉල්ලා ගෙන වරෙන්.'' දූවරු දෙන්නා වසිලීස්සාව ගෙයින් පිටතට තල්ලු කරලා දොර වැසුවා.

ඇහැට ඇන්නත් පෙනෙන්නෙ නැති තරම් කළුවරයි. මූකළන් කැලෑව. නපුරු කුණාටු. වසිලීස්සා අඬන්නට පටන් ගත්තා. සාක්කුවේ තිබුණු බෝනික්කාව එළියට අරගෙන මෙහෙම කිව්වා:

''අනේ මගේ හොඳ බෝනික්කෝ, ගිනි එළියක් ඉල්ලා ගන්ට මාව බාබායිගා යකින්න ළඟට යවනවා. ඈ මිනී කන යකින්නක්. ඈ මගේ ඇටකටු පවා කා දමාවි.''

''නුඹ බයවෙන්ට එපා. මා නුඹ සමග ඉන්නා තුරු නුඹට විපැත්තියක් වෙන්නෙ නැහැ'' බෝනික්කා කිව්වා.



"අනේ බෝනික්කෝ නුඹට බොහොම ස්තුතියි. නුඹ බොහොම කරුණාවන්තයි." වසිලීස්සා එහෙම කියලා ගමනට පිටත්වුණා.

හැම තැන ම මහ කැලෑව. අහස අඳුරුයි. අහසේ තරු පේන්නටවත් නැහැ. හඳහාමි පායලා නැහැ.


වසිලීස්සා බෝනික්කාව තුරුළු කරගෙන බයෙන් වෙවුල, වෙවුලා යනවා.

ඔන්න හිටි හැටියේ ම අසරුවෙක් එනවා. අශ්වයා සුදුම සුදු පාටයි. අසරුවාත් සුදු පාටයි. අසරු ඇඳුම දිලිසෙනවා.

හිරු පායන්නට ළං වුණා.

වසිලීස්සා ගිහිල්ලා, ගිහිල්ලා ලිස්සා වැටුණා. ගස්කොටයක හැප්පිලා තුවාල වුණා. ඇගේ හිසකෙස් පිනි බිංදුවලින් වැසුණා. අත්දෙක හිම වගේ හීතල වෙලා ගල් ගැසුණා.

ඔන්න හිටි හැටියේම තවත් අසරුවෙක් එනවා. අශ්වයා රතුම රතු පාටයි. අසරුවාත් රතු පාටයි. අසරු ඇඳුම රතු පාටින් දිලිසෙනවා.



හිරු පැව්වා. හිරු රැස් නිසා වසිලිස්සාට උණුසුමක් දැනුණා. ඇගේ හිසකේ අව්වට වේලුණා.

මුළු දවස තිස්සේම ඈ ගමන් කළා. හවස් වෙනකොට තණ පිටියකට ආවා.

ගෙයක් තියෙනවා. ගෙවැට හදලා තියෙන්නේ මිනී කටු වලින්. වැටෙහි කණු උඩ මිනී ඔළු. වැටෙහි ගේට්ටුව මිනී කකුල් ඇට වලින් හදලා. වැටේ අගුල මිනී අත් ඇට වලින් හදලා. ගෙවැටේ යතුරු ඉබ්බා වෙනුවට මිනී දත්.

වසිලීස්සා බොහොම බයවුණා. ඈ ගල් රූපයක් වගේ හිටියා. ඔන්න හිටිහැටියේ ම කළු ම කළු පාට අසකු පිට නැගලා කළු පාට අසරුවෙක් එනවා. අසරු ඇඳුම කළු පාටයි. අශ්වයා මිනී කටු වැට ළඟට ඇවිත් අතුරු-දහන් වුණා. රෑ වුණා. අඳුර පැතිර ගියා.

ගෙවැටෙහි කණු උඩ තියෙන මිනී ඔළු වල ඇස් දිලිසෙන්නට වුණා. ගෙය අවට පිටිය මිනී ඇස් නිසා හරියට දහවල් හිරු පැව්වා වගේ ආලෝක

වුණා. වසිලීස්සා බයෙන් වෙවුලනවා. දෙපා ගල් ගැහිලා. දෙපා ඔසවන්නටවත් බැහැ.

පොළොව හෙළවෙන හැටි ඇට දැනුණා. පොළොව තොටිල්ලක් වගේ පැද්දේනවා. එහෙම වුණේ බාබායිගා යකින්න අහසින් එන හන්දා. ඒ යකින්න යකඩ වංගෙඩියක වාඩිවෙලා යකඩ මෝල්ගහකින් කොට, කොටා පියාසර කරනවා. අහසේ ඈ යන මග කොස්සකින් පිහදමනවා.

යකින්න ගෙවැට ළඟට ඇවිත් කෑ ගැසුවා.

''ගඳයි, ගඳයි, මිනිස් ගඳයි! මෙතන කවුද?''

වසිලීස්සා යකින්න ළඟට ඇවිල්ලා, හිස නමා ආචාර කරලා, බොහොම පහත් ලෙස මෙහෙම කිව්වා:

''ආච්චියේ, මගේ කුඩම්මා ගේ දූලා දෙන්නා ගිනි එළියක් හොයාගෙන එන්ට කියලා මාව ආච්චි ළඟට එව්වා.''

''එහෙම ද, නුඹේ කුඩම්මා මගේ නෑයෙක්. නුඹ මගේ ගෙදර වැඩ කරපන්. ගිනි එළිය ගැන පස්සෙ බලමු.'' යි යකින්න මහ හඬින් කෑ ගැසුවා:

''ඕං ගිරින් කට්ටු මගේ වැටේ අගුළු ඇරපියව්! දොරපළු ඇරපියව්!''

දොර ඇරුණු හැටියේම යකින්න වංගෙඩියයි, මෝල්ගහයි එක්ක ගෙට ඇතුළු වුණා. වසිලීස්සා ඇය පිටුපසින් ආවා. වැට ළඟ එකපාරටම බිරියෝසා ගහක් වැව්ලා වසිලීස්සාට පහර දීමට සූදානම් වුණා.

''නුඹ කෙල්ලට පහර ගසන්ට එපා! ඒකිව අඬගහගෙන ආවේ මායි'' යකින්න කිව්වා.

දොර ළඟ නපුරු බල්ලෙක් ඉන්නවා. ඌ වසිලීස්සාව හපාකන්ට පැන්නා.

''නුඹ ඇය හපන්නට එපා. මම තමා ඔය කෙල්ලව අඬගහගෙන ආවේ.'' යකින්න බල්ලාට කීවා.

පිළිකන්නෙ හිටිය නපුරු පූසා වසිලීස්සා සූරන්නට පැන්නා.

''නුඹ ඇය සූරන්නට එපා. මම තමා ඔය කෙල්ලව මෙහාට ගෙනාවේ'' යකින්න නපුරු පූසාට කිව්වා.

''වසිලීස්සා මෙතනින් පැන යන්ට බැරි බව දැන් නුඹට පේනවා නේද? පූසා නුඹව සූරාවි, බල්ලා හපාකාවි, බිරියෝසා ගහ නුඹේ ඇස් උගුල්ලා දමාවි. ගෙවැටෙහි දොර ඇරගන්නට බැරුව යාවි.''

යකින්න ගෙට ඇතුළු වෙලා බංකුව උඩ වාඩි වුණා.

''ඒයි, වැඩකාර කෙල්ලේ කෑම බෙදාපිය!''



වැඩකරන ගෑනු ළමයා බාබායිගා යකින්නට කෑම බෙදුවා. සුප් හැළි-යයි, රා බාල්දිය යි, කුකුළු පැටව් විස්ස යි, තාරා පැටව් හතළිහ යි, හරකෙකු-ගෙන් බාගය යි, කේක් ගෙඩි දෙක යි, තවත් නොයෙක් බීම ජාති යි.

යකින්න මේවා සේරම කෑවා, බීවා. වසිලිස්සාට පාන් කෑල්ලක් විතරක් දුන්නා.

යකින්න වසිලීස්සාට හාල් මිටියක් බාරදීලා මෙහෙම කිව්වා: ''මෙන්න මේ හාල් මිටියේ හාල් ඇටයක් ගානේ වෙන වෙනම සුද්ද කරපන්. ගුල්ලො ගහපු හාල් වෙන් කරපන්. නො කොළොත් නුඹව මරාගෙන කනවා.''

යකින්න ගොරව, ගොරවා නිදාගත්තා. වසිලිස්සා පාන් කෑල්ල බෝනික්-කා ගේ කට ළඟට ළංකරලා ඇගේ දුක කීවා:

''අනේ මගේ රත්තරන් බෝනික්කෝ. හොඳ ළමයකු වගේ මේ පාන් කෑල්ල කන්න. මට කරන්න බැරි වැඩක් යකින්න බාර දීලා තියෙනවා. වැඩේ හරියට නොකොළොත් මාව මරාගෙන කනවා කියලා යකින්න කිව්වා...''

බෝනික්කා කතා කළා:

''නුඹ අඬන්ට එපා. දැන් නිදා ගනින්. හෙට උදේට බලමු. රෑට නැති නුවණ උදේට පහළ වෙනවා කියලා කතාවක් තියෙනවා නෙවද.''

වසිලීස්සා නිදාගත් හැටියේම, බෝනික්කා හඬනගා කතා කළා:

''මගේ හොඳ කුරුල්ලනේ, පරවියනේ! මෙහෙ වරෙල්ලා, වසිලීස්සාව බේරාගන්ට උදවු කරපල්ලා!''

කුරුළු රෑන්, රෑන් ඉගිලිලා ආවා. හාල් මිටියේ හාල් ඇට වෙන වෙනම සුද්ද කරන්ට පටන් ගත්තා. 'හොඳ හාල් මිටියට, නරක හාල් අපේ බඩට' මෙහෙම කිය, කියා කුරුල්ලෝ, පරෙවියෝ වැඩ කළා. හාල් මිටියම සුද්ද කළා.

ඔන්න එතකොටම සුදු අසු පිට නැග ගත් සුදු අසරුවා ගියා විතරයි, පාන්දර හිරු එළිය කළා. යකින්න නැගිටලා වසිලීස්සාට කතා කළා:

''ඇ බොල කෙල්ලේ, මා කී වැඩේ කළා ද?''

''ඔව් ආච්චියෙ කරලා ඉවරයි.''

යකින්නට තරහ ආවා. ඇට කියන්ට දෙයක් නැහැ.

''මම දැන් කෑම හොයන්ට යනවා. මම ආපහු එන්ට ඉස්සෙල්ලා අන්න අර මල්ලෙ තියෙන මුං ඇටයි, අබ ඇටයි වෙන්කරලා වෙනවෙනම ගො-

ඩවල් දෙකකට බෙදාපන්. නැතිනම් නුඹව මරාගෙන කනවා.''

යකින්න ගෙමිදුලට ඇවිත්, උරුවන් බැව විතරයි, වංගෙඩියයි, මෝල්-ගහයි ඇය ළඟට ආවා. ඈ වංගෙඩියට නැගලා අහසින් ගියා.

එතකොට රතු අසරුවා ගියා. හිරු පැව්වා.

බාබායිගා යකින්න වංගෙඩිය උඩ වාඩිවෙලා මෝල්ගහෙන් කොටනවා. ඈ යන පාර කොස්සකින් පිහ දමනවා.

වසිලිස්සා බෝනික්කා ගේ කට ළඟට පාන් කෑල්ල තියලා ඇගේ දුක කිව්වා.

''අනේ මගේ හොඳ බෝනික්කෝ මට අනුකම්පා කරපන්! මට උදවු කරපන්!''

''වසිලිස්සා නුඹ බතලකොටුවෙ මීයන්ටයි, කොස්ඇට මීයන්ටයි, ගබඩා කාමරේ ඉන්න මීයන්ටයි කතා කරලා උදවු ඉල්ලපන්.'' බෝනික්කා කිව්වා. මීයෝ රංචු, රංචු ආවා. පැයක් යන්ට ඉස්සෙල්ලා උන් මුං ඇටයි, අබ ඇටයි වෙන් කරලා ගොඩ ගැසුවා.

හවස් වෙනවිට, වැඩකාර ළමයා යකින්නට කෑම ලැස්ති කළා. කළු අසරුවා ගෙවැට ළඟින් ගියා විතරයි, රෑ වුණා. වැට උඩ තියෙන මිනී ඔළුවල ඇස් දිලිසෙන්නට වුණා. ගස්වැල් හෙළ වුණා. කොළ සුරු, සුරු ගෑවා. බා-බායිගා යකින්න ආවා.

''ඈ බොල වසිලිස්සා වැඩේ කරලා ඉවර ද?''

''ඔව්. ආච්චියෙ වැඩේ ඉවර කළා'' වසිලිස්සා කිව්වා.

යකින්නට කේන්ති ආවා. කියන්ට දෙයක් නැහැ.

''එහෙනම් ගිහින් නිදාගනින්. මාත් නිදාගන්නට යනවා.''

වසිලිස්සා ගිනි උදුනට මුවා වුණ හැටියෙ ම යකින්න වැඩකාර කෙල්ලට කතා කරලා මෙහෙම කියනවා වසිලිස්සාට ඇහෙනවා:

''ඈ බොල කෙල්ලේ නුඹ ලිපට දර දමාපන්. ගිනි මොළවාපන්. මම ටිකක් නිදාගෙන නැගිටලා වසිලිස්සාව බැදලා කන්නම්.''

යකින්න ලී බංකුව උඩට වෙලා නිදා ගත්තා. ඇගේ දෙකොල් බොහොම දිග නිසා ඈ නිදාගන්නාවිට ඒවා රාක්කය උඩ තියනවා. ලොකු යටි පතුලෙන් ඇඟ පොරවා ගත්තා. මුළු කැලෑවටම ඇහෙන්නට ඈ ගොරවන්නට පටන් ගත්තා.

වසිලිස්සා අඬ අඬා බෝනික්කාව අතට අරගෙන පාන් කෑල්ල කට

ළඟට ළං කරලා දුක කිව්වා:

"අනේ බෝනික්කෝ මේ පාන් කෑල්ල කන්න. අසරණ මගේ දුකට පිහිට වෙන්න. බාබායිගා යකින්න මාව මරලා බැදගෙන කන්න ලෑස්ති වෙනවා."

විපතින් බේරී පැනලා යන්නේ කොහොමද කියන එක ගැන බෝනික්කා වසිලිස්සාට කියා දුන්නා. වැඩකාර ළමයා ගේ දෙපා ළඟ වැටිලා වසිලීස්සා ඈට කන්නලව් කළා:

"අනේ මගේ සුදු ළමයෝ! නුඹ හුඟාක් වතුර වත්කරන්ටත් එපා. ළිපට දර ආන්ටත් එපා. මෙන්න නුඹට ලේන්සුවක්."

"හොඳයි වසිලිස්සා මම නුඹට උදවු කරන්නම්. බොහෝ වේලා යන තුරු ළිපට දර දමන්නම්. යකින්නට හොඳට නින්ද යන්ට මම ඇගේ යටි පතුල් කසන්නම්. මගේ යෙහෙලියේ නුඹ මෙතැනින් පැනලා දුවපන්!" වැඩකාර ළමයා කිව්වා.

"අශ්වයින් පිට නැගලා යන මිනිස්සු මාව අල්ලා යන්නෙ නැද්ද? ආපහු යකින්නට මාව බාර දෙන්නේ නැද්ද?"

"නැහැ. සුදු අසරුවා තමා හිමිදිරි පාන්දර, රතු අසරුවා තමා දිලිසෙන හිරු රැස්, කළු අසරුවා අඳුරු රැය. ඒගොල්ලො නුඹට අත තියන්නෙ නැහැ." වැඩකාර ළමයා කීවා.

වසිලිස්සා ඉස්තෝප්පුවේ කාමරයට ගියා විතරයි නපුරු පූසා ඇය සූරන්ට කඩා පැන්නා. වසිලිස්සා ඌට කේක් කෑල්ලක් දුන්නා. ඌ ඇයට හිරිහැර කළේ නැහැ.

වසිලිස්සා පිළිකන්නට ආවා විතරයි නපුරු බල්ලා ඇය හපාකන්නට පැන්නා. වසිලීස්සා ඌට මස් කටුවක් දුන්නා. නපුරු බල්ලා ඇයට යන්නට ඉඩදීලා මස්කටුව ලෙවකන්නට වුණා.

වසිලීස්සා ගෙවැට ළඟට දිව්වා.. බිරියෝසා ගහේ අතු ඇගේ දෑස් උගුල්ලන්ට ආවා. එවිට වසිලිස්සා ගහේ අතු රෙදි පටියකින් බැඳ දැම්මා.

වැටේ දොරවල් වල අගුල් ඉබේටම වැහෙන්ට ගිය හැටියේම වසිලිස්සා ඒවාට තෙල් ගෑවා. එවිට දොරවල් ඇරුණා.

වසිලීස්සා මූකළන් කැලෑවට දිව්වා. කළු අසරුවා ආව හැටියේම හොඳටම රෑ බෝ වුණා. ඇහැට ඇන්නත් පේන්නේ නැති තරම් කළුවරයි. ගිනි එළියක් නැතිව ගෙදර යන්නේ කොහොම ද? ගිනි එළියක් නැතිව



ගෙට ඇතුළු වෙන්නේ කොහොම ද? කුඩම්මා මාව ගෙදරින් පන්නා දමාවි. බෝනික්කා නැවත වසිලීස්සාට නුවණ කියා දුන්නා. ගෙවැටෙහි කණුවක් උඩ තිබුණු මිනී ඔළුවක් කෝටුවකට අමුණා ගෙන වසිලීස්සා දුවන්නට පටන් ගත්තා.

වසිලීස්සා කැලෑව මැදින් දුවනවා. මිනී ඔළුවේ ඇස් දිලිසෙන හන්දා අඳුරු කැලෑව බොහොම පැහැදිලියි.

යකින්න නැගිටලා වසිලීස්සාව අල්ලා ගන්ට ඉස්තෝප්පුවට ගියා.

"පූසීහාමි නුඹ වසිලීස්සාව සීරුවේ නැති ද?" යකින්න ඇසුවා.

"බාබායිගා ආච්චියේ මා නුඹ ළඟ අවුරුදු දහයක්ම වැඩ කළා. නුඹ මට පාන් වාටියක්වත් දුන්නෙ නැහැ. වසිලීස්සා කෙල්ල මට කේක් කෑල්ලක් දුන්නා. කෙල්ලට යන්ට මම ඉඩ හැරියා." නපුරු පූසා කිව්වා.

යකින්න පිළිකන්නට දිව්වා.

"මගේ හොඳ බලු රාළහාමි. නුඹ අර වසිලිස්සා කෙල්ලව හපා කැවේ නැතිද?"

"බාබායිගා ආච්චියේ මම නුඹ ළඟ අවුරුදු කීයක් සේවය කළා ද? නුඹ මට පුස් පාන් කෑල්ලක්වත් දුන්නේ නැහැ. වසිලිස්සා මට මස් කෑල්ලකුයි කටුවකුයි දුන්නා. ඇට පිටවී යාමට මම ඉඩ දුන්නා" නපුරු බල්ලා කිව්වා. යකින්න කෝපවෙලා කෑ ගැසුවා.

"අනේ මගේ බිරියෝසා ගහ, නුඹටවත් බැරිවුණා ද ඔය කෙල්ලගෙ ඇස් වලට පහර ගහන්ට?"

"මම නුඹ ළඟට වෙලා අවුරුදු දහයක් වෙනවා. නුඹ මගේ අතු ලනු පොටකින් වත් බැන්දේ නැහැ. වසිලිස්සා මගේ අතු රෙදි පටියකින් බැන්දා. ඒ නිසා මම ඇට යන්නට ඉඩ දුන්නා" බිරියෝසා ගහ කිව්වා.

බාබායිගා යකින්න ගෙවැටෙහි දොර ළඟට දිව්වා:

"මේ තරම් හයිය ඇති දොරවල් වලටත් අර කෙල්ලව අල්ලා ගන්ට බැරි වුණාද?"

ගෙවැටෙහි දොරවල් ඇට මෙහෙම පිළිතුරු දුන්නා:


"අපි නුඹට කොපමණ කල් සේවය කළා ද, නුඹ අපේ අගුල් වලට වතුරවත් දැම්මේ නැහැ. වසිලිස්සා අපේ අගුල් වලට තෙල් දැම්මා. ඇට පිටවී යාමට අපි ඉඩ හැරියා."

යකින්න බොහොම කෝපවෙලා බල්ලාට ගෙහුවා, පූසාටත් ගැහුවා. ගෙවැටේ දොරුවල කඩා දැම්මා. බිරියෝසා ගහ කපා දැම්මා. වසිලිස්සා ගේ පස්සෙන් ඇය අල්ලා ගන්ට ගියේ නැහැ.

වසිලිස්සා ගෙදර ගියා. ගෙදර ගිනි එළියක් පෙනෙන්නට නැහැ. කුඩම්මා ගේ දූවරුන් ඇවිත් සැරවෙන්ටයි, බණින්ටයි පටන් ගත්තා:

"බොල කෙල්ලේ තෝ මෙපමණ වේලා ගියේ කොහි ද? ගින්දර කොහි ද? ගෙදර ගිනි එළියක් ඇත්තෙම නැහැ. ගල් අතුල්ලා ගින්දර ලබා ගන්ට වැයම් කළා, කළා, කළා, හරිගියේ නැහැ. අල්ලපු ගෙදරින් ගෙනා ගින්දරත් නිවී ගියා. නුඹ ගෙනා ගිනි එළිය නිවිලා යන්නේ නැද්ද."

මිනී ඔළුව ගෙයි මැද සාලයට ගෙනාවා. එහි ඇස් දෙක ගිනි බෝල වගේ. ඒවා කුඩම්මා සහ ඇගේ දූවරුවන් දෙස රවා බලනවා. ඒ බැල්ම නිසා ඒ තුන්දෙනා ගින්නට අහුවෙලා පිළිස්සී යන්නට පටන් ගත්තා. මේ



තුන්දෙනා ගෙයි මුළුවල හැංගෙන්නට හැදුවා. එයත් හරි ගියේ නැහැ. කොහේ ගියත් මේ තුන් දෙනා දිහා මිනී ඔළුවේ ඇස් රවා බලනවා. ඒ ඇස් දෙකෙන් ගිනි පිටවෙනවා.

උදේ වනවිට, කුඩම්මයි, ඇගේ දුවරුන් දෙදෙනයි ගින්නට හසුවෙලා පිළිස්සී අඟුරු වුණා. වසිලීස්සාට කිසිම හානියක් වුණේ නැහැ.

වසිලීස්සා වළක් හාරලා මිනී ඔළුව වළලා දැම්මා. එතැන රෝස මල් පඳුරක් පැළවුණා.

පසු ආ වසිලීස්සා ගෙදරින් පිටවෙලා නගරෙට ගිහිල්ලා, ආච්චි කෙනෙකු ගේ ගෙදර නැවතුණා.

"අනේ ආච්චි අම්මේ ගෙදරට වෙලා නිකම් ඉන්න මට බැහැ. ඉතාම හොඳ හන නූල් මට අරන් දෙන්න" කියලා වසිලීස්සා ආච්චිට කිව්වා.

ආච්චි හන නූල් ගෙනාවා. වසිලීස්සා ඒවා වියන්නට පටන් ගත්තා. ඇ බොහොම ලස්සනට නූල් කටින්නටයි වියන්නටයි වුණා. හන නූල් රන් කෙඳි වගේ සිනිඳු වුණා. සුදුම සුදු පාට බොහොම සිනිඳු රෙද්දක් ඇ වියලා ඉවර කළා.

"ආච්චි අම්මේ මෙන්න මේ රෙදි කැල්ල විකුණලා ආච්චි සල්ලි අර ගන්න." වසිලීස්සා කිව්වා.

වසිලීස්සා වියාපු ලස්සන රෙද්ද දැකලා ආච්චි බොහොම පුදුම වුණා.

"අනේ දුවේ. ඔයතරම් හොඳ රෙද්දක් අඳින්නට පුළුවන් අපේ රාජ කුමාරයාට විතරයි. මම මේ රෙද්ද රජ ගෙදරට ගෙනියන්නම්."'

රාජ කුමාරයා රෙද්ද දැකලා බොහොම පුදුම වුණා.

"ඔය රෙදි කැල්ලේ වටිනාකම කොපමණ ද?"

"මේ රෙදි කැල්ලේ වටිනාකම කියන්ට බැහැ. එතරම් වටිනවා. මම ඔබ තුමාට තෑගි දෙන්ට ගෙනාවා" කියලා ආච්චි රාජ කුමාරයාට රෙද්ද තෑගි කළා.

රාජ කුමාරයා ආච්චිට ස්තුති කරලා තෑගි බෝග දීලා ගෙදර යැව්වා. රාජ කුමාරයා රෙද්දෙන් කමිසයක් මහන්නට සිතුවා. එතරම් සිනිඳු, ලස්සන රෙද්දකින් කමිස මහන්ට කාටවත් බැහැ. රාජ කුමාරයා ආච්චිට එන්ට කිව්වා.

"ආච්චියේ නුඹ මෙතරම් සිනිඳු ලස්සන රෙද්දක් සෑදුවා නේද. දැන් ඉතින් නුඹම කමිසයක් මහපන්" කියලා ආච්චිට කිව්වා.

''රාජ කුමාරයාණෙනි, ඔය රෙද්ද හැදුවේ මම නොවෙයි. මගේ මිනිබිරි වසිලීස්සා'' ආච්චි උත්තර දුන්නා.

''එහෙනම් එයා කමිසය මහන්ට ඕන'' රාජ කුමාරයා අණ කළා.

ආච්චි ගෙදර ඇවිත්, වුණ දේ ගැන වසිලීස්සාට විස්තර කළා. වසිලීස්සා බොහොම ලස්සන කමිසයක් සේද නූල් වලින් මැහැව්වා. මැණික් ගලකුත් කමිසයට අල්ලා මැහැව්වා. ආච්චි කමිසය රජ ගෙදරට ගෙන ගියා.

වසිලීස්සා ජනේලය ළඟට වෙලා රෙදි වියන්නට පටන් ගත්තා. රජ ගෙදර සේවකයෙක් දුවගෙන එන සැටි ඈ දුක්කා.

''වසිලීස්සා නුඹට රජ ගෙදරට එන්ට කියලා රාජ කුමාරයා අණ කළා.'' සේවකයා දන්නුවා.

වසිලීස්සා රජ ගෙදරට ගියා. රාජ කුමාරයා ඇය දැකලා මත් වුණා. වසිලීස්සා එතරම් ලස්සන තරුණියක්.

''මම ඔයාට ආදරය කරනවා. මම ඔයාව සරණ පාවා ගන්නවා.'' රාජ කුමාරයා කීවා.

වසිලීස්සා කැමති වුණා. රාජ කුමාරයා ඇය සරණ පාවා ගත්තා. බොහොම ජයට මගුල් කෑවා.

දුර ගමනක් ගිය තාත්තා වසිලීස්සාව හොයාගෙන ඇවිල්ලා රජ ගෙදර නැවතුණා. වසිලීස්සා ආච්චිවත් රජ ගෙදරට ගෙන්වා ගත්තා. වසිලීස්සා තමා ගේ බෝනික්කාව හැම තිස්සේම සාක්කුවේ තබාගෙන ඉන්නවා. දැන් ඉතින් ඒ ගොල්ල බොහොම සැපෙන් හා සතුටින් ජීවත් වෙනවා.



ඉවාන් කුමාරයා සහ හොඳ වෘකයා

බෙරෙන්දෙයි රජ්ජුරුවෝ රට පාලනය කළා. එයාට පුතුන් තුන්දෙනෙකු හිටියා. බාල පුතාගේ නම ඉවාන්.

රජ්ජුරුවන් ගේ උයන බොහොම ලස්සනයි. මේ උයනෙහි ඇපල් ගස් වල රත්රන් ඇපල් ගෙඩි තිබෙනවා.

මේ උයනට කවුදෝ හොරෙන් ඇවිල්ලා රත්රන් ඇපල් හොරකම් කිරීමට පටන් ගත්තා. රජතුමා බොහොම දුක් වුණා. හොරා අල්ලාගන්නට මුර කාරයින් පිටත් කළා. මුරකාරයින්ට හොරාව අල්ලා ගන්ට බැහැ.

රජතුමා නොකා, නොබී, සුසුම්ලෑවා. කුමාරයෝ තුන්දෙනා පිය රජතුමාව සැනසුවා.

'''පිය රජතුමනි, කනගාටු වෙන්ට එපා. අපි ගිහිල්ලා උයන මුරකරලා හොරා අල්ලා ගන්නෙමු.''

''අද මගේ දවස. මම අද උයන මුර කරනවා'' වැඩිමල් කුමාරයා කිව්වා.

ඔහු උයනට ගිහිල්ලා හැම තැනම ඇවිදලා හොයා බැලුවා. කිසිවෙකු පෙනෙන්නට නැහැ. ඔහුට බොහොම මහන්සියි. ඔහු තණ පිට්යට වෙලා නිදා ගත්තා.

''ලොකු පුතේ මාව සතුටු කරපන්. නුඹට පුළුවන් වුණාද හොරාව අල්ලා ගන්ට?'' රජතුමා ඇසුවා.

''බැරිවුණා පිය රජතුමනි. රෑ එළි වෙන තුරු නිදා ගන්නේ නැතුව හොයා බැලුවා. බැරි වුණා.''

දෙවැනි දවසේ දී මද්දුම පුතා උයනට ගිහිල්ලා, වටයක් ඇවිදලා, මහන්සි වෙලා, එළිය වැටෙන තුරු නිදා ගත්තා. පසු දා උදේ රජතුමාට කීවා හොරාව අල්ලා ගන්ට බැරිවුණා කියලා.

තුන්වැනි දවසේදී උයන මුර කරන්ට බාල පුතා ඉවාන් ගියා. ඔහු නිදාගන්නවා තබා වාඩිවෙන්නට පවා කැමති වුණේ නැහැ. නිදිමත හැදෙන විට, ඔහු තණ කොළවල තියෙන පිනි බින්දු වලින් ඇස් හෝදනවා. එවිට නිදි මත නැතිව යනවා.

මහ රෑ යාමෙට ඉවාන් පුදුම දෙයක් දැක්කා. රජ උයන දිලිසෙනවා. දහවල් වගෙ එළිය වැටුණා. ඇපල් ගහ උඩ ගිනි කුරුල්ලෙක් වහලා රත්රන් ඇපල් කනවා.

ඉවාන් කුමාරයා හෙමින් හෙමින් ඇපල් ගහට නැගලා ගිනි කුරුල්ලා ගේ වලිගයෙන් අල්ලා ගත්තා. ගිනි කුරුල්ලා වේගයෙන් අත් තටු ගහලා පියඹා ගියා. ඉවාන්ගේ අතේ ඉතුරු වුණේ පිහාටුවක් විතරයි.

පසු දා උදේ ඉවාන් කුමාරයා පිය රජතුමා ළඟට ආවා.



''මගේ පුතේ ඉවාන්, නුඹ හොරාව දැක්කා ද?''

''පිය රජ තුමනි හොරාව අල්ලා ගන්නට බැරිවුණා. නමුත් හොරාව මම දැක්කා. අපේ උයන වනසන හොරාගේ වලිගයේ පිහාටුවක් මගේ අතට අසුවුණා. මෙන්න හොර ගිනි කුරුල්ලාගේ පිහාටුව.''

රජ තුමා රජ බොජුන් කෑවා. පැන් බීවා. සතුට වුණා. දවසක් දා ඔහුට ගිනි කුරුල්ලා ගැන මතක් වුණා.

ඔහු පුතුන් තුන්දෙනා කැඳවා මෙහෙම කිව්වා:

''මගේ ආදරනීය පුතුනි, නුඹලා තුන්දෙනා අශ්වයින් තුන්දෙනෙකු පිට නැගලා ලෝකයේ හැම තැනම

ගිහිල්ලා රටවල් දැක බලාගනිල්ලා. ගිනි කුරුල්ලා ගැන හොයා බලපල්ලා.''

පුතුන් තුන් දෙනා පිය රජතුමාට වැඳලා අසුන් පිට නැගලා ගියා. ලොකු පුතා එක පැත්තකට ගියා, මද්දුම පුතා තවත් පැත්තකට ගියා. බාල පුතා ඉවාන් වෙනත් පැත්තකට ගියා.

දවස් කීපයක්ම ඔහොම ගිහිල්ලා, ගිහිල්ලා, ඉවාන් කුමාරයා දවසක් දා විඩාපත්ව නිදාගත්තා. ඔහු නැගිටින විට, ඔහුගේ අශ්වයා පේන්න හිටියේ නැහැ. ඔහු අශ්වයාව සෙව්වා. උගේ කටු විතරක් ඉතුරු වෙලා තිබෙන සැටි ඉවාන් කුමරා සොයා ගත්තා.

ඉවාන් කුමාරයාට බොහොම කනගාටුයි. අශ්වයකු නැතිව ඔයතරම් දුරක් යන්නේ කොහොම ද?

මොනවා කරන්ටද කියලා හිත හදාගෙන ඔහු පයින් ගමන් කළා.

ඉතින් ඔහොම පයින් ගිහිල්ලා, ගිහිල්ලා ඉවාන් කුමාරයා බොහොම මහන්සි වුණා. ඔහු තණ පිටියක වාඩිවෙලා කනගාටු වුණා. ඔන්න එවිට වෘකයෙක් දුවගෙන එන හැටි ඔහු දැක්කා.

''ඉවාන් කුමාරයා, ඔළුව පාත්කර ගෙන, වාඩිවෙලා කනගාටු වෙන්නේ මොකද?'' වෘකයා ඇසුවා.

''වෘකයෝ! කනගාටු නොවී පුළුවන් ද? මගේ හොඳ අශ්වයා නැතිවුණා.''

''ඉවාන් කුමාරයා නුඹ ගේ අශ්වයාව කෑවේ මමයි... නුඹ ගැන මට දුක හිතුනා! මේ තරම් දුර ආවේ මොකට ද? යන්නේ කොහේ ද?'' වෘකයා ඇසුවා.

''ලෝකයේ හැම රටකම ඇවිදලා හොර ගිනි කුරුල්ලා අල්ලා ගෙන එන්ට ඕන කියලා පිය රජතුමා මට අණකළා.''

''අපොයි, අපොයි, ඔය ගිනි කුරුල්ලා හොයන්ට නුඹගේ නැතිවුණ අශ්වයා පිට ගියොත් අවුරුදු තුනක් විතර යාවි. ගිනි කුරුල්ලා ඉන්න තැන මම දන්නවා. මම නුඹ ගේ අශ්වයාව කාපු නිසා මම නුඹට අවංක ලෙස සේවය කරන්නම්. නුඹ මගේ පිට උඩ නැගලා බෙල්ල තදින් අල්ලා ගනින්.'' වෘකයා ඉවාන් කුමාරයාට කිව්වා.

ඉවාන් කුමාරයා වෘකයාගේ පිට උඩ නැග ගත්තා.. වෘකයා වේගයෙන් දිව්වා. එක හුස්මට කැලෑව හරහා දිව්වා. එක පිම්මට පොකුණු උඩින් පැන්නා.

ඔහොම දුවලා, දුවලා ගිහිල්ලා උසැති බිත්ති තියෙන බල කොටුවක් ළඟට ආවා.

''ඉවාන් කුමාරයා මා කියන දේ අහලා මතක තියාගනින්. බය නැතුව බිත්තිය දිගේ නැගපන්. සුබ මොහොතක්. මුරකාරයෝ හැමදෙනාම නිදි. එක තැනක අඳුරු ජනේලයක් ඇති. එය ළඟ ලස්සන රත්තරන් කූඩුවක් තියෙනවා. ඔය කූඩුව ඇතුළෙ තමා ගිනි කුරුල්ලා ඉන්නේ. නුඹ ඌව අල්ලාගෙන නුඹෙ කමිසය තුළ තබා ගනින්. රත්තරන් කූඩුව විතරක් අල්ලන්නට එපා.''

ඉවාන් කුමාරයා බිත්තිය දිගේ නැගලා ගේ දිහා බැලුවා. ජනේලය ළඟ රත්රන් කූඩුවක් තියෙනවා. කූඩුව ඇතුළෙ ගිනි කුරුල්ලා හිටියා. ඔහු කුරුල්ලාව අරගෙන කමිසය යටට දා ගත්තා. රත්රන් කූඩුව දැකලා ඔහු බොහොම පුදුම වුණා: ''හරිම ලස්සනයි. රත්තරන් කූඩුව හුඟක් වටිනවා. නොගෙන ඉන්නට පුළුවන් ද!'' වෘකයා ගේ උපදෙස් ඉවාන් අමතක කළා. රත්රන් කූඩුවට අත තැබුවා විතරයි, නලා පිඹිනවා, බෙර ගහනවා ඇහුණා. මුරකාරයෝ නැගිට්ටා. ඉවාන් කුමාරයාව අල්ලාගෙන අප්රොට්ස් රජු ඉදිරියට ගෙන ගියා.

අප්රොට්ස් රජු කෝප වෙලා කෑගැසුවා:

''නුඹ කවුද, කොහෙ ඉඳල ද?''

''මම බෙරෙන්දෙයි රජුගේ පුතා ඉවාන්.''

''හරිම නින්දාවක්! රජකු ගේ පුතෙක් හොරකම් කරනවා.''





''එහෙනම් මොකද, ඔබ තුමාගේ ගිනි කුරුල්ලා අපේ උයනට ඇවිත් ඇපල් හොරකම් කළේ?'' ඉවාන් ඇසුවා.

''නුඹ මා ළඟට ඇවිත් ඉල්ලා හිටියා නම්, නුඹේ දෙමව්පියන්ට ගරු කිරීමක් හැටියට මම කුරුල්ලාව තෑගි කරනවා. දැන් නුඹ කළ මේ හොරකම නිසා නුඹට නින්දා ලැබේවි... හොඳයි නුඹ මට උදව්වක් කළොත්, මම නුඹට සමාව දෙනවා. බෙල්ලේ රත්තරන් කෙඳි තියෙන අශ්වයෙක් කුස්මාන් රජුට අයිතියි. අන්න ඒ අශ්වයාව ගෙනාවොත් මම නුඹට ගිනි කුරුල්ලාවයි, රත්තරන් කූඩුවයි තෑගි දෙනවා'' කියලා අෆ්රොට්ස් රජු ඉවාන්ට කීවා.

ඉවාන් කුමාරයා කනගාටු වෙලා වෘකයා ළඟට ගියා.

''මම නුඹට කීවා නේද රත්තරන් කූඩුවට අත තියන්ට එපා කියලා! නුඹ මගේ කීම ඇහැව්වේ නැත්තේ ඇයි?'' වෘකයා ඇහුවා.



"අනේ වෘක රාළහාමි නුඹ මට සමාවෙයන්" ඉවාන් කුමාරයා කිව්වා.

"හොඳයි, නුඹට සමාව දෙන්නම්. නැගපන් මගේ පිට උඩ. පටන් ගත් වැඩේ කරලා ඉවර කරන්ට ඕන" කියලා වෘකයා දුවන්නට පටන් ගත්තා.

ඉවාන් කුමාරයාව කර උඩ තබාගෙන වෘකයා ආයෙමත් දුවනවා. ඔහොම දුවලා, දුවලා ගිහිල්ලා රත්රන් කෙඳි සහිත අශ්වයා ඉන්න බල-කොටුව ළඟට ආවා.

"ඉවාන් කුමාරයා බිමට බැහලා, බලකොටුවේ තාප්පයට නැගපන්. එහා පැත්තෙ අස්ප ගාල, මුරකරුවෝ මේ වේලාවට නිදා ගන්නවා. අශ්-වයාව අරගෙන වරෙන්, හැබැයි, කටකලියාවට අත විතරක් තියන්න එපා!" වෘකයා උපදෙස් දුන්නා.

ඉවාන් කුමාරයා බලකොටුවට ඇතුළු වුණා. අස්ප ගාලට ගිහින්, රත්රන්

කෙඳි සහිත අශ්වයාව අල්ලා ගත්තා. මුරකරුවෝ හැම දෙනෙක්ම නිදි. රත්රන් කටකලියාව බොහොම ලස්සනයි. ඒකට මැණික් ගල් ඔබලා හඳා තියෙනවා. ඒක රත්රන් කෙඳි සහිත අශ්වයාට සුදුසු කටකලියාව.

ඉවාන් කුමාරයා කටකලියාවට අත තැබුවා විතරයි, නළා පිඹින්නට පටන් ගත්තා, බෙර ගැහුවා. මුරකාරයෝ නැගිටලා ඉවාන් කුමාරයාව අල්ලා ගෙන කුස්මාන් රජු ළඟට ගෙනගියා.

"නුඹ කවුද? කොහි ඉඳල ද? රජු ඇසුවා.

"මම ඉවාන් කුමාරයා."

"නුඹ හැබෑ මෝඩයෙක්. අශ්වයාව හොරකම් කළේ ඇයි? මේ වගේ හොර කමක් ගමයෙකුවත් කරන්නේ නැහැ. නුඹට මම සමාව දෙන්නම්, නුඹ මට උදව්වක් කරන්ට ඕන. අල්මාත් රජුගේ දුව සුන්දර යෙලේනා. ඔන්න ඔය කුමරියව හොරාගෙන ඇවිත් මට බාර දීපන්. මම නුඹට රන්-කෙඳි අශ්වයාවයි රන් කටකලියාවයි තෑගි දෙනවා." කුස්මාන් රජු කීවා.

ඉවාන් කුමාරයා බොහොම කනගාටු වෙලා හිස පහත නමාගෙන වෘකයා ළඟට ආවා.

"ඉවාන් කුමාරයා මම නුඹට කිව්වා නේද කටකලියාවට අත තියන්ට එපා කියලා! නුඹ මගේ කීම ඇහුවේ නැහැ" වෘකයා සැර කළා.

"අනේ වෘක හාමි නුඹ මට සමා වෙයන්."

"දැන් ඉතින් සමාව ඉල්ලනවා... කමක් නැහැ. නැගපන් මගේ කර උඩ." වෘකයා කිව්වා.

ඉවාන් කුමාරයාවත් කරේ තබාගෙන අල්මාත් රජුගේ මාලිගාව දෙසට වෘකයා දිව්වා. මාලිගාව ළඟ උයනේ සුන්දර යෙලේනා කිරි මවුවරුන් සහ වැඩකාරයන් සමග ඇවිදිනවා.

"ඉවාන් කුමාරයා මේ වර නම් මම නුඹව යවන්නේ නැහැ. මම තනිවම යනවා. නුඹ ආපහු මේ පාර දිගේ පලයන්. මම ඉක්මනට නුඹ ළඟට එන්නම්." වෘකයා මෙහෙම කියලා එක පිම්මට උයනට පැනලා පඳුරක් අස්සේ නැංගිලා හිටියා. සුන්දර යෙලේනා කිරි මවුවරුන් සහ වැඩ කාරියන් සමග ඇවිදිනවා. ඔහොම ඇවිදගෙන යනවිට, සුන්දර යෙලේනා අනිත් අයගෙන් ටිකක් ඈත් වුණා. වෘකයා එකපාරට ම ඇයව සොරා ගෙන, පිට උඩ තබා ගෙන තාප්පයට උඩින් පැනලා දිව්වා.

ඉවාන් කුමාරයා මග දිගේ යනවා. වෘකයා ඔහු ළඟටම ආවා, උගේ

පිට උඩ සුන්දර යෙලේනා වාඩිවෙලා ඉන්නවා ඔහු බොහොම සතුටු වුණා.

"ඉක්මනට මගේ පිට උඩ වාඩිවෙයන්. අප අල්ලන්න එන්නට ඉස්සෙල්ලා පැන දුවන්ට ඕන." වෘකයා කීවා.

ඉවාන් කුමාරයාවයි, සුන්දර යෙලේනාවයි කර උඩ තබාගෙන වෘකයා එක පිම්මට කැලෑ හරහා දුවනවා. ගංගා හා පොකුණු හරහා එක පිම්මට පනිනවා. ඔහොම ගිහිල්ලා, ගිහිල්ලා වෘකයා කුස්මාන් රජුගේ මාලිගාවට ළංවුණා.

"ඉවාන් කුමාරයා මොකද නුඹ කනගාටුවෙන් ඉන්නේ?" වෘකයා ඇසුවා.

"කනගාටු නොවී පුළුවන් ද? මෙතරම් ලස්සන කුමරියක් කාටවත් දෙන්නේ කොහොම ද? සුන්දර යෙලේනාව අශ්වයකුට මාරු කරගන්නේ කොහොම ද?"

"මෙතරම් ලස්සන කුමරියක් නුඹගෙන් වෙන් කරන්න මම ඉඩතියන්නේ නැහැ. අපි සුන්දර යෙලේනාව හංගමු. මම යෙලේනාගේ වෙස් ගන්නම් නුඹ මාව රජු ඉදිරියට ගෙනියපන්." වෘකයා කිව්වා.

දෙදෙනාම එකතු වෙලා සුන්දර යෙලේනාව කැලෑවේ ගෙයක හැංගුවා. මායාකාර වෘකයා කරණමක් ගැහුවා විතරයි, ඌ සුන්දර යෙලේනා වගේම ලස්සන කුමරියක ගේ වෙස් ගත්තා. ඉවාන් කුමාරයා වෙස්ගත් වෘක කුමරියව රජු ළඟට ගෙන ගියා. කුස්මාන් රජු බොහොම සතුටුවෙලා ඉවාන් කුමාරයාට ස්තුති කළා.

"ඉවාන් කුමාරයා නුඹට බොහොම ස්තුතියි. නුඹ මට මනාලියක් ගෙනාවා. රන් කෙඳි අශ්වයයි, රන් කටකලියාවයි මම නුඹට තෑගි කරනවා" රජු කීවා.

ඉවාන් කුමාරයා රන් කෙඳි අසු පිට නැගලා සැබෑ යෙලේනා කුමරිය ඉන්න තැනට ගිහිල්ලා ඇයත් අසු පිට නංවාගෙන ගියා.

කුස්මාන් රජු විවා මගුලට ලෑස්ති වුණා. උදේ සිට හවස් වන තුරු කාලා, බීලා, නටලා සතුටු වුණා. වෙස්ගෙන සිටින කුමරියව මංගල ඇඳට ගෙනගියා. එවිට සුන්දර යෙලේනා කුමරිය ආයෙමත් වෘකයෙකු ගේ වෙස් ගත්තා. කුස්මාන් රජු බොහොම බියවෙලා ඇඳෙන් බිමට වැටුණා. වෘකයා පැන දිව්වා.

ඌ දුවලා, දුවලා ගිහිල්ලා ඉවාන් කුමාරයා ළඟට ආවා.

"ඉවාන් කුමාරයා නුඹ මොනවා ගැනද කල්පනා කරන්නේ?" කියලා වෘකයා ඇසුවා.

"කනගාටු නොවී පුළුවන් ද? මේතරම් වටිනා අස්පයකු දෙන්නේ කොහොම ද?"

"නුඹ කනගාටු වෙන්න එපා. මම නුඹට උදවු කරන්නම්." වෘකයා කීවා.

මේ ගොල්ල අප්රොට්ස් රජුගේ මාලිගාව ළඟට ආවා.

"ඉවාන් කුමාරයා නුඹ සුන්දර යෙලේනාවයි, රන් කෙඳි අශ්වයාවයි හංගාපන්. මම අශ්වයාගේ වෙස් ගන්නම්."

ඉවාන් කුමාරයා වෘකයා කී හැටියටම කළා. සුන්දර යෙලේනාවයි රන් කෙඳි අශ්වයාවයි කැලෑවේ තැනක හැංගුවා. වෘකයා පිනුමක් ගැහැව්වා විතරයි රන් කෙඳි අශ්වයාගේ වෙස් ගත්තා. ඉවාන් කුමාරයා මේ වෘක-අශ්වයාව අප්රොට්ස් රජු ළඟට ගෙනගියා. රජතුමා සතුටුවෙලා ගිනි කුරුල්-ලාව යි, රත්රන් කූඩුව යි ඉවාන්ට තෑගි කළා.

ඉවාන් කුමාරයා පයින් ඇවිදගෙන කැලෑවට ඇවිල්ලා හැබැ රන් කෙඳි අශ්වයා පිට සුන්දර යෙලේනාව නංවා ගෙන, ගිනි කුරුල්ලාවයි, කූඩුවයි අරගෙන ගමනට පිටත් වුණා.

තෑගි ලැබුණු රන් කෙඳි අශ්වයාව ගේන්නට කියලා අප්රොට්ස් රජු අණ කළා. ඔහු බොහොම සතුටුවෙලා අසු පිට නැගීමට ලෑස්ති වුණා. එවිට රන් කෙඳි අශ්වයා වෘකයා ගේ වෙස් අරගත්තා. මෙය දුටු රජතුමා බයවෙලා සිහිසන් නැතිව ඇද වැටුණා. වෘකයා පැන දිව්වා.

"මෙතැනින් එහාට යන්ට මට තහනම්, ආයුබෝවන්!" වෘකයා ඉවාන් කුමාරයා ගෙන් සමුගෙන නැවතුනා.

ඉවාන් කුමාරයා අසුගෙන් බැහැලා වෘකයා ළඟට ඇවිත් තුන් වරක් හිස නමා ඌට ආචාර කළා, ඌට ස්තුති කළා.

"නුඹ සදහටම මගෙන් සමුගන්ට එපා. ඉවාන් කුමාරයා නුඹට තවත් මගෙන් උදවු ඕන වේවි." වෘකයා කීවා.

ඉවාන් කුමාරයා වෘකයාට නො කියා මෙහෙම කල්පනා කළා. "දැන් ඉතින් මේ වන සතා ගෙන් මට ඇති පිහිට මොකක් ද? මට වුවමනා සියලු දේ මා ලබාගත්තා නොවේ ද?" සුන්දර යෙලේනාව රන් කෙඳි අසුගේ පිට උඩ නංවාගෙන, තමාත් නැගගෙන ගිනි කුරුල්ලාවයි, රත්රන් කූඩුවයි



අරගෙන තමාගේ රටට ගියා. අතර මගදී ඔහු කෑම ටිකක් ගැනීමට කල්පනා කළා. ඔහු ළඟ තුබුණේ පාන් කෑල්ලක් විතරයි. හතර දෙනාම පාන් කෑල්ල බෙදාගෙන කාලා, උල්පතකින් වතුර බීලා තණ පිට්යක වැතිරීලා ගිමන් හැරියා.

ඉවාන් කුමාරයාට නින්ද ගිය හැටියේම, ඔහුගේ අයියලා දෙදෙනා එතැනට ආවා. අයියලා දෙදෙනාත් ගිනි කුරුල්ලා අල්ලන්නට රට රටවල් ගානේ ඇවිදලා හිස් අතින් ආවා. මල්ලී ළඟ තියෙන අගනා වස්තු දැකලා ඔවුන්ට ඉරිසියා හිතුණා.

අයියලා දෙදෙනා රහසක් කතා කර ගත්තා:

"අපි මල්ලීව මරා දමමු. ඔහු ගේ වස්තුව බෙදා ගනිමු."

අයියලා දෙදෙනා ඉවාන් කුමාරයාව මරා දැම්මා. රන් කෙඳි අසු පිට සුන්දර යෙලේනාව නංවාගෙන, දෙදෙනා ම උගේ පිට උඩ නැගලා ගිනි කුරුල්ලාවයි, රත්රන් කූඩුවයි අරගෙන ගමනට පිටත්වෙලා, යෙලේනාව බය කළා:

"නුඹ කාටවත් මේ ගැන කියන්ට එපා!"

ඉවාන් කුමාරයා ගේ මළ සිරුරට උඩින් කාක්කෝ කෑ කෝ ගසමින් පියාසර කළා. එතැනට හිටි හැටියේම වෘකයා ඇවිත් කාක් පැටියකු අල්ලා ගෙන, කාක් අම්මාට කතා කරලා මෙහෙම කිව්වා.

"කාක්කියේ, කාක්කියේ, නුඹ පියාඹා ගිහිල්ලා පණ දෙන වතුර යි, පණ නසන වතුර යි ඉක්මනට ගෙනෙන්. එවිට මම කාක් පැටියාව නුඹට දෙන්නම්."

කාක්කී පියාසර කළා. වෘකයා කාක් පැටියාව අල්ලාගෙන හිටියා.



කාක්කී පණ දෙන වතුර යි, පණ නසන වතුර යි ගෙනාවා. වෘකයා පණ නසන වතුරෙන් ඉවාන් කුමාරයාගේ තුවාල සේදූ හැටියේම, තුවාල එක වරම සුව වුණා. පණ දෙන වතුර ඔහුගේ ඇඟට ඉස්ස හැටියේම ඔහුට පණ ලැබුණා.

"මම බොහෝ වේලාවක් නිදා ගත්තා!" කියලා කිසිවක් නො දත් ඉවාන් කුමාරයා කීවා.

"ඔව්, ඔව්, නුඹ සදහටම නිදා ගත්තා. ආයෙමත් කවදාවත් නො නැගිටින්ට ම නිදා ගත්තා. නුඹ ගේ ම සහෝදරයෝ දෙදෙනා නුඹව මරා දැම්මා. නුඹ ලබාගත් තෑගි හොරකම් කරගෙන උන් රජ ගෙදරට යනවා. ඉක්මනට මගේ පිට උඩ නැගපන්." වෘකයා ඔහුට කිව්වා.

වේගයෙන් දුවලා, දුවලා ගිහින් වෘකයා ඉවාන්ගේ අයියලා දෙදෙනාව අල්ලා මරා දැම්මා.

ඉවාන් කුමාරයා දණගසා, හිස නමා වෘකයාට ආචාර කරලා උගෙන් සමුගත්තා.



ඔහු අසු පිට නැගලා, සුන්දර යෙලේනාවත් නංවාගෙන ගිනි කුරුල්ලා-වයි, රත්රන් කූඩුවයි අරගෙන පිය රජතුමා ගේ මාලිගාවට ගියා. පිය රජුට ගිනි කුරුල්ලාව තෑගි කළා. සුන්දර යෙලේනාව ඉවාන් කුමාරයා විවාහ කර ගන්ට සිතුවා.

බෙරෙන්දෙයි රජතුමා බොහොම සතුටුවෙලා බාල පුතාගෙන් තොරතුරු ඇසුවා. ඉවාන් කුමාරයා වෘකයා තමාට පිහිට වුණ හැටි කීවා. අයියලා දෙදෙනා තමාව මරා දමාපු හැටි කීවා. වෘකයා ඇවිත් අයියලා දෙදෙනාව මැරූ සැටිත් කීවා.

බෙරෙන්දෙයි රජු ලොකු පුතුන් ගැන කනගාටු වෙලා, පසුව සැනසුනා. ඉවාන් කුමාරයා සුන්දර යෙලේනාව විවාහ කර ගත්තා. මේ දෙදෙනා සැපෙන් බර, දුකින් තොර ජීවිත ගත කළා.



ඉවාන්ලා දෙදෙනා

එකෝමත් එක රටක ඉවාන්ලා දෙදෙනෙක් හිටියා. වැඩිමල් ඉවාන් පොහොසත්. බාල ඉවාන් දුප්පත්. පොහොසත් ඉවාන් ගේ ගෙය බඩු මුට්ටු වලින් පිරිලා. ගෙදර හාල්, තිරිඟු පිටි තියෙනවා. ඔහුට එළදෙන්නු, එළු, බැටළුවෝ බොහොම ඉන්නවා. උන් නිල්පාට තණකොළ කාලා වතුර බීලා සැපට හැදෙනවා. ගෙදර හැම තිස්සේ ම හොඳ, හොඳ කෑම ජාති හදනවා. පොහොසත් ඉවාන්ට හැම දෙයක්ම තියෙනවා. ගෙදර ඉන්නෙ පොහොසත් ඉවානුයි, එයා ගේ බිරිඳ යි විතර යි. මේ දෙදෙනාට ළමයින් ඇත්තෙම නැහැ.

දුප්පත් ඉවාන්ට එළ දෙනුන්, බැටළුවන් නැහැ. ඒ වුණාට දරු පැටවු හත් දෙනෙක් ඉන්නවා. හත් දෙනාම බංකුව උඩ වාඩි වෙලා කැඳ ඉල්ලනවා. ගෙදර හාල් ඇටයක්වත් නැහැ. පිටි ටිකක්වත් නැහැ. බැරිම තැන දුප්පත් ඉවාන් පොහොසත් ඉවාන්ව හමු වෙන්නට ගියා.

''ආයුබෝවන් අයියේ!''

''ආයුබෝවන් දුප්පත් ඉවාන්. ආවේ මොකට ද? ගෙදරට වෙලා ඉන්න බැරි ද?''

''අයියේ මට පිටි ටිකක් දෙන්න. මම පසුව ණය ගෙවන්නම්.'' දුප්පත් ඉවාන් කීවා.

''හොඳයි, මම නුඹට පිටි රාත්තලක් දෙන්නම්. නුඹ මට පිටි හොණ්-

ඩරයක් ගෙනත් දෙන්ට ඕන.'' පොහොසත් ඉවාන් කීවා.

''අනේ අයියේ රාත්තලක් දීලා හොණ්ඩරයක් ඉල්ලන එක හරි ද?'' දුප්පතා ඇහුවා.

''එහෙම බැරිනම් පලයන් යන්ට. වෙනින් ගෙදරකින් ඉල්ලා ගනින්.''

කරන්නට දෙයක් නැහැ. දුප්පත් ඉවාන්ට ඇඬුණා. ඔහු පිටි රාත්තලත් අරගෙන මහ පාරට ආවා විතරයි බොහොම වේගයෙන් සුළං හැමුවා. පිටි ටික සුළඟට අහුවෙලා විසිරී ගියා. පිටි ගෙනගිය බඳුන බිම වැටුණා.

දුප්පත් ඉවාන්ට තරහ ආවා:

''ආ නුඹ මුරණ්ඩු සුළඟ, නුඹ මගේ ළමයින්ව බඩගින්නේ තැබුවා. ඔවුන්ට හිරිහැර කළා. මුරණ්ඩු නුඹට මම යස පාඩමක් උගන්වනවා!''

දුප්පත් ඉවාන් මෙහෙම කියලා සුළඟ හොයාගෙන ගියා. සුළඟ මහ පාර දිගේ යනකොට දුප්පත් ඉවාන් මහ පාර දිගේ යනවා. සුළඟ කැලෑවට යනවිට ඔහුත් කැලෑවට යනවා. සුළඟ ලොකු ඕක් ගහක බෙනයට රිංගා ගත්තා. ඉවාන් දුවලා, ගිහිල්ලා ඒ බෙනයට රිංගුවා.

සුළඟ ඉවාන්ව දැකලා ඔහුට කතා කළා:

''ගමරාළ නුඹ මාව බලන්නට ආවේ මොකට ද?'' සුළඟ ඇසුවා.

''බඩ ගින්නේ ඉන්න මගේ දරු පැටවුන්ට කැඳ උයා දෙන්නට, පිටි ටිකක් ඉල්ලා ගෙන මම මහ පාරට ආ හැටියේම නුඹ ඇවිත් මගේ පිටි ටික ඉහිරුවා හැරියා. මම හිස් අතින් ගෙදර යන්නේ කොහොම ද?''

''මා අතින් සිදුවූ වරදට නුඹ කේන්ති ගන්ට එපා. මම නුඹට අපූරු මේස රෙද්දක් දෙන්නම්. එය මේසය උඩ එලලා නුඹට ඕන කෑම ජාති ඉල්ලාපන්. එකවර ඒවා· ලැබේවි.''

ඉවාන් බොහොම සතුටු වෙලා සුළඟට හිස නමා ආචාර කරලා මේස රෙද්දත් අරගෙන ගෙදර ගියා.

දුප්පත් ඉවාන් ගෙදර ඇවිත් මේසය උඩ රෙද්ද එලලා මෙහෙම කීවා:

''මේස රෙද්ද මේස රෙද්ද මට කෑම දෙන්න, බීම දෙන්න!''

කිව්වා විතරයි, පාන්, කේක්, මස්, සුප්, ඌරු මස්, කැඳ ජාති වලින් මේසය පිරුණා.

ළමයින් සමග එකතුවෙලා දුප්පත් ඉවාන් කා, බී, නින්දට ගියා. පසු දා උදේ කෑමට වාඩිවුණ හැටියේම පොහොසත් ඉවාන් මල්ලීව බලන්ට ආවා.



පොහොසත් ඉවාන් කෑමවලින් පිරුණු මේසය දැකලා ඉරිසියාවෙන් රතු වුණා.

"කොහොමද මල්ලියෙ නුඹ පොහොසත් වුණේ?"

"පොහොසත්කම කොහොම වුණත් නුඹට කෑම ටිකක් දෙන්නට පුළුවනි" කියලා දුප්පත් ඉවාන් අයියාට කිව්වා. "මම නුඹට ගෙවන්නට ඕන පිටි හොණ්ඩරය දැන්ම දෙන්නම්. මේස රෙද්ද, මේස රෙද්ද මට පිටි හොණ්ඩරයක් ගෙනෙන්න."

කිව් හැටියේම මේසය උඩ හොණ්ඩරයක් බර පිටි මිටියකි.

පොහොසත් ඉවාන් පිටි මිටියත් අරගෙන කතා නො කර ගෙදර ගියා.


පොහොසත් ඉවාන් හවස්වුණු හැටියේම දුප්පත් ඉවාන්ව හොයාගෙන ආවා.

මගේ හොඳ මල්ලියේ, මට පිහිට වෙයන්, මාව එළවන්ට එපා! අල්ලපු ගමේ පොහොසත් ගොවියෝ අපේ ගෙදරට එනවා. මගේ ගෙදර දර නැහැ.

පාන් නැහැ. බීම නැහැ. එක පැයකට නුඹේ අපූරු මේස රෙද්ද දීපන්. මට පිහිට වෙයන් මල්ලියේ!'' පොහොසත් ඉවාන් කිව්වා.

දුප්පත් ඉවාන් අපූරු මේස රෙද්ද අයියාට දුන්නා.

පොහොසත් ඉවාන්, පොහොසත් ගොවීන් හොඳට කෑම බීම වලින් සතුටු කරලා, අපූරු මේස රෙද්ද පෙට්ටගමක හංගලා, නිකම් මේස රෙද්දක් දුප්පත් ඉවාන්ට දුන්නා. නිකම් මේස රෙද්දත්, අපූරු මේස රෙද්ද වගේමයි. වෙනස හොයන්ට බැහැ. දුප්පත් ඉවාන් අයියාව විශ්වාස කරලා, නිකම්



මේස රෙද්ද ගෙදර ගෙනාවා.

"බොහොම ස්තුතියි මල්ලියේ බොහොම හොඳට කෑවා" කියලා පොහොසත් ඉවාන් මල්ලීට කීවා.

දුප්පත් ඉවාන් ගෙදර ඇවිල්ලා මේස රෙද්ද මේසය උඩ එලලා මෙහෙම කිව්වා:

"මේස රෙද්ද, මේස රෙද්ද කෑම ගේන්න."

මේසය හිස්. කෑම කිසිවක් නැහැ.

දුප්පත් ඉවාන් පොහොසත් අයියා ළඟට දුවගෙන ගිහිල්ලා, "අයියේ නුඹ මගේ මේස රෙද්දට මොනව ද කළේ?" කියලා ඇසුවා.

"මම කිසිදෙයක් දැක්කෙත් නැහැ, දන්නෙත් නැහැ. නුඹෙන් ගත් මේස රෙද්ද නුඹට ආපහු දුන්නා" පොහොසත් ඉවාන් කිව්වා.

දුප්පත් ඉවාන් අඬ, අඬා ගෙදර ගියා. දවසක්, දෙකක් ගතවුණා. ළමයි බඩගින්නේ අඬන්නට පටන් ගත්තා. දුප්පත් ඉවාන් පොහොසතා ළඟට ගියා.

"ආයුබෝවන් අයියේ!"

"ආයුබෝවන් දුප්පත් ඉවාන්! නුඹ ආවේ මොකට ද? ගෙදරට වෙලා නිකම් ඉන්න බැරි ද?"

"මගේ ළමයින් අඬනවා. උන් කෑම ඉල්ලනවා. අනේ අයියේ මට පිටි ටිකක් හරි, හාල් ටිකක් හරි, පාන් කෑල්ලක් හරි ණයට දියන්." දුප්පත් ඉවාන් ඉල්ලා හිටියා.

"මා ළඟ පිටි, හාල්, පාන් නැහැ. නුඹට ඕන නම් බිම් ගෙයි පීප්පයක කැඳ තියෙනවා. එයින් පීරිසියකට කැඳ ගෙනියපන්."

කැඳ පීරිසියත් අරගෙන දුප්පත් ඉවාන් ගෙදර ගියා. අව්ව නිසා පිළුණු කැඳ උතුරා ගිහිල්ලා බිම හැළුණා. දුප්පත් ඉවාන්ට බොහොම කේන්ති ගියා.

"අනේ ඉර හාමි නුඹ හැබෑ මෝඩයෙක්!



නුඹ සෙල්ලම් කරනව... මගේ ළමයින් බඩගින්නේ අඬනවා. නුඹේ නරක වැඩ නිසා නුඹට යස පාඩමක් උගන්වනවා!''

දුප්පත් ඉවාන් ඉර හොයාගෙන ගියා. යනවා, යනවා, ඉර අල්ලාගන්ට ඔහුට බැහැ. හවස ඉර කන්දකට එහා බැහැලා ගියා. ඉවාන් එතැන දී ඉර සොයා ගත්තා.

ඉර දුප්පත් ඉවාන්ව දැකලා ඔහුට කතාකළා:

''ඉවාන් නුඹ මා බලන්ට ආවාද?''

ඉවාන් සිදු වූ දේ ඉරට කීවා. ''මගේ ළමයි බඩගින්නේ ඇඬුවා. මම ඔවුන්ට කැඳ ටිකක් ණයට ඉල්ලා ගත්තා. නුඹ ඉරු රැස් විහිදුවලා කැඳ ටික උණු කළා. කැඳ සේරම පාර දිගට හැළුනා. මම ගෙදර යන්නේ කොහොම ද?''

''මා හන්දා නුඹට පාඩු සිදු වුණා. මම නුඹට පිහිට වෙන්නම්'' ඉර කීවා. ''මම නුඹට එළුදෙනකු දෙන්නම්. නුඹ ඌට ඕක් ගහේ ගෙඩි කන්ට දීපන්. උගෙන් කිරි දොවන කොට, නුඹට කිරි වෙනුවට රත්රන් කාසි ලැබේවි.''

දුප්පත් ඉවාන් ඉරට හිස නමා ආචාර කරලා එළු දෙන අක්කාගෙන ගෙදර ගියා. ඔහු ඕක් ගහේ ගෙඩි කඩා ගෙනැවිත් ඌට කන්ට දීලා. කිරි දොවන්නට පටන් ගත්තා. කිරි වෙනුවට දුප්පත් ඉවාන්ට රත්රන් කාසි ලැබුනා. දැන් ඉතින් ඉවාන් බොහොම හොඳින් ජීවත් වෙනවා. ළමයින්ට හොඳ කෑම ලැබෙනවා.

රත්රන් කාසි ලබාදෙන පුදුම එළුදෙන ගැන පොහොසත් ඉවාන්ට දැනගන්නට ලැබුණා. ඔහු දුප්පත් ඉවාන් ළඟට ආවා.

''ආයුබෝවන් මල්ලියෙ!''

''ආයුබෝවන් අයියේ!''

''මල්ලී මට පිහිට වෙයන්. මම ණයක් ගත්තා. එය ගෙවන්ට සල්ලි නැහැ. නුඹේ එළුදෙන මට පැයකට දීපන්. ණය ගෙවලා එළුදෙන ආපහු ගෙනත් දෙන්නම්.'' පොහොසත් ඉවාන් මල්ලීට කිව්වා.

''හොඳයි එළුදෙන අරගෙන පලයන්. හැබැයි මාව රවටන්ට එපා.''

පොහොසත් ඉවාන් ඉර තෑගි දීපු එළුදෙන අක්කාගෙන ගෙදර ගිහිල්ලා, උගෙන් රත්රන් කාසි දොවාගත්තා. ඌව කූඩුවක ආලා, වෙනින් එළුදෙනකු අක්කාගෙන ගිහින් දුප්පත් ඉවාන්ට බාර දුන්නා.



"මල්ලී, නුඹ මට උදවු කළා. බොහොම ස්තුතියි."

දුප්පත් ඉවාන් එළුදෙනට ඕක් ගහේ ගෙඩි කන්ට දීලා කිරි දෙව්වා. රත්රන් කාසි වෙනුවට කිරි ලැබුණා.

අයියා තමාව රැවටූ බව දුප්පත් ඉවාන් දැනගත්තා. ඔහු අයියා ළඟට දුවගෙන ගියා.

"මම දන්නෙත් නැහැ. දැක්කෙත් නැහැ! ඉල්ලා ගත් එළුදෙන ආපහු බාර දුන්නා." පොහොසත් ඉවාන් බොරු කිව්වා.

දුප්පත් ඉවාන් අඬ අඬා ගෙදර ගියා. දවසක් ගෙවුණා. සුමානයක් ගෙවුණා. ළමයින්ට කෑම නැහැ. උන් අඬන්නට පටන් ගත්තා. සීත කාලය ආවා. හිම වැටෙනවා. තද සීතයි. ගෙදර හාල් ඇටයක්වත් නැහැ. පිටි නැහැ. දුප්පත් ඉවාන් පොහොසත් ඉවාන් ළඟට ගියා.

"අනේ අයියේ මට උදව් කරපන් ළමයින් බඩගින්නේ. පිටි ටිකක් ණයට දීපන්!" දුප්පත් ඉවාන් ඉල්លුවා.

"මා ළඟ පිටිත් නැහැ. හාලුත් නැහැ. අන්න කුස්සිය මුල්លේ තියෙනවා පිළුණු වෙච්ච සුප් ටිකක්. ඒක අරගෙන පළයන්."

දුප්පත් ඉවාන් පුංචි බේසමකට සුප් ටිකක් වත් කරගෙන ගෙදර ගියා. මහ පාරට ආවා විතරයි, තද සීත සුළං හමනවා, හිම කුණාටු හමනවා, ඇඟ හිරි වැටෙන තරම් සීතයි. එතරම් තද සීත ලංකාවේ වාසය කරන ළමයින්ට හිතාගන්ටවත් බැහැ. හිම කැට එක්ක සීත සුළං හමන්නට වුණා. සුප් ටික අයිස් කැටයක් බවට පත්කළා. දැන් ඉතින් සුප් වෙනුවට අයිස් කැල්ලක් විතරක් තියනවා. කෑමට කිසිවක් ඉතුරු වුණේ නැහැ.

දුප්පත් ඉවාන්ට බොහොම තරහ ආවා:

"නපුරු හිම යකා! නුඹ සෙල්ලම් කරනවා, මගේ ළමයින් බඩගින්නේ අඬනවා! නුඹට මම යස පාඩමක් උගන්වන්නම්!"

දුප්පත් ඉවාන් හිම සහ සීත සුළං හොයාගෙන ගියා. හිම සහ සීත තණ පිටිය හරහා දිව්වා. දුප්පත් ඉවාන් එය අල්ලාගන්ට තණ පිටිය හරහා දිව්වා. හිම සහ සීත කැලෑවට ගියා. දුප්පත් ඉවානුත් කැලෑවට ගියා. හිම සහ සීත ලොකු හිම සහ අයිස් කැට ගොඩක් අස්සේ හැංගුණා. දුප්පත් ඉවාන් එතැනටත් ගියා.

අන්න එතකොට තමා හිම සහ සීත දුප්පත් ඉවාන්ව දැක්කේ.

"ඉවාන් නුඹ මාව බලන්ට ආවා ද?"

''ඔව්. මගේ ළමයින්ට පිළුණු වෙච්ච සුප් ටිකක් ගෙන යනකොට නුඹ ඇවිත් එය සීතල කරලා අයිස් කැටයක් බවට පත්කළා. දැන් ඉතින් මම ගෙදර යන්නේ කොහොම ද? සුළඟ තෑගි දීපු මේස රෙද්දයි ඉර තෑගි දීපු රත්රන් කාසි දෙන එළුදෙනයි දෙකම මගේ අයියා උදුරා ගත්තා. නුඹ මගේ සුප් ටික අයිස් කැටයක් කළා.'' දුප්පත් ඉවාන් කිව්වා.

''ආ, එහෙමද! මම නුඹට පිහිට වෙන පෙට්ටියක් දෙන්නම්. නුඹ පෙට්ටියට මෙහෙම කියපන්: 'දෙකක් එළියට!' එතකොට පොලු දෙකක් එළියට ඒවි. 'දෙකක් ඇතුළට!' කී හැටියේම ඒ පොලු දෙක ආපහු පෙට්ටිය ඇතුළට යාවි.

දුප්පත් ඉවාන් හිමට ආචාර කරලා පෙට්ටියත් කරේ තියාගෙන ගෙදර ආවා. පෙට්ටිය ඉදිරිපිට හිටගෙන ඔහු මෙහෙම කිව්වා.

''දෙකක් එළියට!''

මහා ලොකු පොලු දෙකක් එළියට ඇවිල්ලා දුප්පත් ඉවාන්ගේ පිටට පහර දෙන්නට පටන් ගත්තා. ඒ පොලු දෙක මෙහෙම කිව්වා:

''දුප්පතා, පොහොසතාව විශ්වාස කරන්නට එපා! නුඹේ අයියා, පොහොසතාව විශ්වාස කරන්ට එපා. නුවණ ලබාගනින්!''

හොඳටම ගුටිකාපු ඉවාන් යන්තම් මෙහෙම කිව්වා:

''දෙකක් ඇතුළට.''

පොලු දෙක කීකරු වෙලා පෙට්ටිය ඇතුළට ගියා. පෙට්ටියේ පියන වැසුණා.

හවස් වුණාම පොහොසත් ඉවාන් මල්ලීව බලන්ට ආවා.

''මල්ලියේ නුඹ ගියේ කොහි ද? ගෙනාවේ මොනවා ද?''

''අයියේ මම හිම සීත සොයාගෙන ගියා. එයා මට හරි පුදුම පෙට්ටියක් තෑගි කළා. දෙකක් එළියට කී හැටියේම, දෙකක් එළියට ඇවිල්ලා ඕනෑම වැඩක් කර දෙනවා.''

''අනේ දුප්පත් ඉවාන් මගේ මල්ලියේ, ඔය පුදුම පෙට්ටිය මට එක දවසකට දීපන්. අපේ ගෙදර වහළෙ කැඩිලා. හදවන්නට කෙනෙක් නැහැ'' පොහොසත් ඉවාන් කීවා.

''පොහොසත් ඉවාන් අයියේ අරගෙන පලයන්.''

පොහොසත් ඉවාන් පුදුම පෙට්ටිය ගෙදර ගෙනැල්ලා දොර වහලා පෙට්ටියට මෙහෙම කිව්වා:

"දෙකක් එළියට!"

එතකොටම මහා ලොකු පොලු දෙකක් එළියට ඇවිල්ලා පොහොසත් ඉවාන්ට පහර දෙන්නට පටන් ගත්තා. පහර දෙන ගමන් පොලු කතකළා:

"පොහොසතා, නුඹ දුප්පතාව රවටන්නට එපා! නුඹ දුප්පතාගෙන් ගත්ත මේස රෙද්දයි, එළු දෙනයි එයාට ගිහිල්ලා දීපන්" කිය කියා පහර දුන්නා.

පොහොසත් ඉවාන් පහර කකා දුප්පත් ඉවාන් ළඟට දිව්වා. පොලු දෙක පොහොසතාව එළව, එළවා ඔහුට පහර දෙනවා.

"අනේ මල්ලියේ මාව බේරාගනින්! නුඹෙන් ගත්ත මේස රෙද්දයි, එළුදෙනයි මම ගෙනැවිත් දෙන්නම්!" පොහොසත් ඉවාන් කිව්වා.

"දෙකක් ඇතුළට!" කියලා දුප්පත් ඉවාන් කෑ ගැසුවා.

පොලු දෙක පෙට්ටිය ඇතුළට ගියා. හොඳටම ගුටි කාපු පොහොසත් ඉවාන්, දුප්පත් ඉවාන්ට හිතූ දේ ලබාදෙන මේස රෙද්දයි, රත්රන් කාසි ලබා දෙන එළුදෙනයි ගෙනැවිත් බාර දුන්නා.

ඔන්න ඉතින් එදා ඉඳලා දුප්පත් ඉවාන් ළමයින් එක්ක ඉතා සැපෙන් ජීවත් වෙනවා. දැන් ඉවාන් ගේ ළමයි හත්දෙනා ම බංකුව උඩ වාඩි වෙලා කැඳ බොනවා. හත්දෙනා ම කැඳ බොන්නේ රත්රන් හැඳි වලින්. කැඳ බීලා මී පැණි කනවා.



නුවණැති රාජාලියා

එකෝමත් එක රටක ගොවියෙක් හිටියා. ඔහුගේ බිරිඳ මළා. ගොවියාට දුවරුන් තුන්දෙනෙක් ඉන්නවා. ගෙදර වැඩ පළ කරන්ට වැඩ කාරයකුව ගෙන්වා ගන්ට ඕන කියලා ගොවියා කිව්වා. ගොවියා ගේ බාල දූ මර්යූෂ්කා තාත්තාට කතා කළා:

"තාත්තේ වැඩ කාරයන් ඕන නැහැ. ගෙදර වැඩ කරන්ට මට පුළුවනි."

ගොවියා කැමති වුණා. බාල දුව මර්යූෂ්කා ගෙදර වැඩ කරන්නට පටන් ගත්තා. ඇ ගෙදර වැඩට බොහොම දක්සයි. හැම දෙයක්ම ඇයට කරන්ට පුළුවනි. තාත්තා මර්යූෂ්කාට බොහොම ආදරෙ යි. මේ තරම් නුවණැති, වැඩ කිරීමට දක්ස ළමයකු ඉන්න නිසා ගොවියා බොහොම සතුටු වුණා. ඒ වගේම මර්යූෂ්කා බොහොම ලස්සන ළමයෙක්. ඇගේ අක්කලා දෙන්නා අනුන්ට ඉරිසියා කරනවා, ඒ වගේම කැදර යි. මේ ගොල්ල අවලස්සන ගැනු ළමයින් දෙදෙනෙක්. ඒ වුණාට බොරු ඔපයට අඳින්ට පළඳින්ට ආශා කරන මෝස්තර කාරියෝ දෙදෙනෙක්. මූණේ පුයර දානවා, තොල් රතු කරනවා, මාල පළඳිනවා, ලස්සන ගවුම් අඳිනවා, ලස්සන සපත්තු අඳිනවා, ලස්සන ලේන්සු පාවිච්චි කරනවා.

තාත්තා කඩ පොළට යන්ට ඉස්සෙල්ලා දුවරුන්ට අඬ ගැහුවා.

"නුඹලාට ඕන මොනවද, නුඹලා සතුටු කරන්න මොනවද ගෙනෙන්ට ඕන."

"තාත්තේ අපට ලොකු සේද සළුවක් ගෙනෙන්ට. ලොකු ලේසන මල් තියෙන, රත්රන් නූලෙන් මහපු සළුවක් ගෙනෙන්ට" කියලා වැඩිමල් දුව යි, මද්දුම දුව යි කීවා. මර්යූෂ්කා බාල දුව පැත්තකට වෙලා කතා නො කර ඉන්නවා තාත්තා බාල දුවට කතා කළා.

"පොඩි දුවේ නුඹට මොනව ද ගෙනෙන්ට ඕන?"

"තාත්තේ මට නුවණැති රාජාලියකුගේ පිහාටුවක් ගෙනෙන්ට."

තාත්තා පොළට ගිහිල්ලා ලොකු දුවටයි, මද්දුම දුවටයි සේද සළු දෙකක් ගෙනාවා. රාජාලි පිහාටු තිබුණේ නැහැ.

තාත්තා දෙවැනි අවසේත් කඩ පොළට යන්ට ලැස්ති වුණා.

"ඉතින් ළමයිනේ නුඹලාට ඕන දේ කියපල්ලා" තාත්තා කීවා.

"රිදී අඩි තියෙන සපත්තු අපට ගෙනෙන්න" කියලා ලොකු දුවයි, මද්දුම දුවයි බොහොම සතුටින් තාත්තාට කීවා.

"අනේ තාත්තේ මට නුවණැති රාජාලියකු ගේ පිහාටුවක් ගෙනෙන්ට" ආයෙමත් බාල දුව මර්යූෂ්කා කීවා.

තාත්තා කඩ පොළට ගිහිල්ලා දවස තිස්සේම ඇවිදලා සපත්තු මිලදී ගත්තා, රාජාලි පිහාටු හොයාගන්ට ඔහුට බැරි වුණා.

ටික කලකට පස්සේ තාත්තා තුන්වැනි වරටත් කඩ පළට යන්ට සූදානම් වුණා. ලොකු දුව යි, මද්දුම දුව යි තාත්තට කතා කළා:

"අපට ගවුමක් බැගින් ගේන්ට."

මර්යූෂ්කා තාත්තාට මතක් කළා:

"අනේ තාත්තේ නුවණැති රාජාලියකු ගේ පිහාටුවක් ගෙනෙන්ට."

තාත්තා කඩ පොළට ගිහිල්ලා හැම තැනම ඇවිදිදා. රාජාලි පිහාටුවක් හොයාගන්ට බැරි වුණා. ඔහු නගරයෙන් පිටවුණා ම ඔහුට බොහොම මහලු සීයා කෙනෙකු හමු වුණා.

"ආයුබෝවන් සීයේ!"

"ආයුබෝවන්, ගොවිරාළ බැහැරක් යනවද?"

"සීයේ මම ගමට යනවා. මගේ හිතට ලොකු දුකක්. මගේ පොඩි දුවට නුවණැති රාජාලි පිහාටුවක් මිලදී ගන්ට මට බැරි වුණා."

"මා ළඟ තියෙනවා එක පිහාටුවක්. ඒක බොහොම වටිනා පිහාටුවක්. ගුණවත් මිනිහකුට නම් මම ඒක දෙන්නට ලැස්තියි." සීයා කීවා.

සීයා රාජාලි පිහාටුව ගොවියාට දුන්නා. ඒක බොහොම සාමාන්‍ය

පිහාටුවක්. "මගේ පොඩි දුව මර්යූෂ්කා මේ වගේ පිහාටුවක් ඉල්ලුවේ මොකට ද?" තාත්තා හිතුවා.

තාත්තා තෑගි ගෙනැවිත් දූවරුන්ට බෙදා දුන්නා. ලොකු දුවයි, මද්දුම දුවයි ගවුම් ඇඳලා හැඩ බල බලා, මර්යූෂ්කා නංගීට විහිළු කරනවා:

"මෙකී එදත් මෝඩි, අදත් මෝඩි. නුඹගේ ඔය පිහාටුව හිසේ ගහගෙන ඔප දමාගනින්."

මර්යූෂ්කා නිහඬව පැත්තකට වෙලා හිටියා. ගෙදර හැම දෙනාම රෑ නින්දට ගියාට පස්සෙ ඇ පිහාටුව බිම දාලා මතුරන්ට පටන් ගත්තා.

"නුවණැති රාජාලියා, මගේ මනාලයා මා ඉදිරියේ පෙනී හිටින්න."

ඇ ඉදිරියේ බොහොම ලස්සන තරුණයෙක් පෙනී හිටියා. උදේ වන විට තරුණයා බිම වැටිලා රාජාලියකු ගේ වෙස් ගත්තා. මර්යූෂ්කා ජනේලය ඇරියා විතරයි, රාජාලියා නිල් පාට අහසට පියාඹා ගියා.



දවස් තුනක් ඇතුළත මර්යූෂ්කා තරුණයා ගේ සිත් තමා වෙත ඇද ගත්තා. දහවල් කාලයේ ඔහු නිල් පැහැති අහසට නැග පියාඹනවා. රෑට මර්යූෂ්කා ගේ ගෙදරට පියාඹා එන ඌ කඩවසම් තරුණයකු ගේ වෙස් ගන්නවා.

හතරවැනි දවසේ දී නපුරු අක්කලා තරුණයා දැකලා නංගීට විරුද්ධව තාත්තාට කේලාම් කීවා.

"අනේ මගේ ළමයිනි, නුඹලා නුඹලා ගැනම බලා ගන්නවා නම් මීට වැඩිය හොඳයි" තාත්තා කීවා.

"හොඳයි බලමුකො මීට පස්සෙ මොනව ද වෙන්නෙ කියල" අක්කලා දෙදෙනා සිතුවා.

ජනේල රාමුවට මුවහත් උල්

පිහිතල බැඳලා අක්කලා දෙදෙනා හැංගිලා බලාගෙන හිටියා.

රාජාලියා පියාඹා ආවා. ඔහුට ජනේලය ඇතුළට රිංගන්ට බැහැ. රාජාලියා රිංගන්නට හැදුවා, හැදුවා මර්යූෂ්කා ගේ කාමරයට යන්න. උල් පිහි තල නිසා ඔහුගේ පපුව සීරිලා තුවාල වුණා. මර්යූෂ්කා අක්කලා අටවපු උගුල දන හිටියේ නැහැ. ඇ නිදා හිටියා. එවිට රාජාලියා මෙහෙම කීවා:

"උවමනා කෙනෙකුට මාව හොයා ගන්න පුළුවනි. හැබැයි එය ලෙහෙසි වෙන්නේ නැහැ. යකඩ සපත්තු කුට්ටම් තුනක් ගෙවී ගිය දාට, යකඩ හැරමිටි තුනක් ගෙවී ගිය දාට, යකඩ හිස්වැසුම් තුනක් කැඩිලා ගිය දාට පසුව තමා මාව හමුවීමට පුළුවන්."

මේ කතාව මර්යූෂ්කාට ඇහිලා ඇඳෙන් නැගිටලා ජනේලය දිහා බැලුවා. රාජාලියා හිටියේ නැහැ. ලේ පැල්ලම් විතරක් ජනේලයේ තිබුණා. මර්යූෂ්කා බොහොම කනගාටු වෙලා කඳුළු වගුරුවා හැඬුවා. ඇගේ කඳුළු වලින් ජනේලයේ ලේ පැල්ලම් මැකිලා ගියා. ඊට පස්සේ ඇ තවත් ලස්සන වුණා.

මර්යූෂ්කා තාත්තා ළඟට ගිහිල්ලා මෙහෙම කිව්වා:

"තාත්තේ මට බනින්ට එපා. මට ඇත ගමනක් යන්ට තියෙනවා එයට අවසර දෙන්න. පණ තිබුනොත් මම ඔහු හමුවෙනවා. මළොත් එය ලබා උපන් හැටි තමා."

තාත්තා වැඩියෙන් ම ආදරේ බාල දුවටයි. ඇයට යන්නට ඉඩ දීමට සිදුවන හන්දා ඔහුට බොහොම දුකයි. ඒ වුණත් ඇයට යන්නට අවසර දුන්නා.

මර්යූෂ්කා යකඩ සපත්තු කුට්ටම් තුනකුයි, යකඩ හැරමිටි තුනකුයි, යකඩ හිස්වැසුම් තුනකුයි හදවා ගත්තා. ඒවා අරගෙන ගමනට පිටත් වුණා. තමාගේ හිත දිනා ගත් රාජාලියාව සොයා ඇ ගියා. තණ බිම් හරහා, අඳුරු කැලෑ මැදින්, උසැති කඳු උඩින් ඇ ගමන් කළා. කුරුල්ලෝ ලස්සන ගී ගයලා ඇගේ හිත සතුටු කළා. පුංචි දිය පාරවල් ඇගේ මූණ සෝදලා පිරිසුදු කළා. අඳුරු කැලෑ ඇය සැනසුවා. කිසි කෙනෙකුට මර්යූෂ්කාට අනතුරු කිරීමට බැරිවුණා. වෘකයෝ, වලස්සු, හිවල්ලු අනිකුත් සත්තු ඇ ළඟට දුව ආවා. සපත්තු කුට්ටමක් ගෙවුණා. මර්යූෂ්කා යකඩ රිටක් කැඩුවා. යකඩ හිස්වැසුමක් ඉරා දැම්මා.

මර්යූෂ්කා තණ පිටියකට ආවා. කුකුළෙකු ගේ කකුල් වලින් හිටගත්



ගෙයක් ඈ දුටුවා. ඒ ගෙය තමා වටේටම කැරකැවෙනවා.

"ගෙදර, ගෙදර වනයට පිටුපා මට මුහුණ ලා හිටගන්න. මට ගේ ඇතුළට ගිහිල්ලා පාන් කෑල්ලක් කෑමට අවසර දෙන්න." මර්යූෂ්කා කිව්වා.

ගෙය වනයට පිටු පා, මර්යූෂකාට මුහුණ ලා හිට ගත්තා. ඈ ගෙට ඇතුළු වුණා. එතැන බාබායිගා යකින්න වාඩිවෙලා හිටියා. ඇගේ කකුල් බොහොම දිගයි. ඇගේ දෙතොල් බොහොම දිග නිසා එය රාක්කයක් උඩ තිබුණා. ඇගේ නහය වහළට වැදෙන්ට තරම් උසයි.

බාබායිගා යකින්න මර්යූෂ්කා දුක්කා.

"අපොයි, අපොයි, මිනිස් ගඳයි. රතු කෙල්ල, නුඹ කාවහරි හොයනව ද, කාගෙන් හරි පැනලා යනව ද?" යකින්න ඇහුවා.

"ආච්චියේ මම හොයනවා. මගේ රාජාලියාව හොයනවා."

"අනේ, ලස්සන කෙල්ලේ නුඹට බොහෝ කාලයක් හොයන්ට සිද්ද වේවි! නුඹේ රාජාලියා බොහොම ඈත මුහුදු හතකට එහා රටවල් හතකට එහා රටක වාසය කරනවා. මන්තරකාර රැජින ඉනා බේතක් නුඹේ රාජාලි- යාට පොවලා ඔහුව කසාද බැඳගත්තා. මම නුඹට උදවු කරන්නම්. මම නුඹට රිදී පීරිසියකුයි, රත්තරන් බිත්තරයකුයි දෙන්නම්. නුඹ එයත් අර- ගෙන මන්තරකාර රැජින ඉන්න රටට ගිහිල්ලා ඈ ළඟ රස්සාවක් ඉල්ලා ගනින්. වැඩ ඉවර වුණාම රිදී පීරිසිය උඩ රත්තරන් බිත්තරය තබාපන්. එය ඉබේම ගමන් කරාවි. මිනිස්සු එය සල්ලි වලට ඉල්ලාවි. නුඹ විකුනන්න එපා. රාජාලියාව බලන්ට ඕන කියලා ඔවුන්ට කියපන්." බාබායිගා යකින්න කිව්වා.

බාබායිගා යකින්නට මර්යූෂ්කා ස්තුති කරලා ගමනට පිටත් වුණා. දැන් මර්යූෂ්කා බොහොම අඳුරු මූකළන් කැලෑවක් දිගේ යනවා, යන්නත් බයයි. එතරම් අඳුරුයි. පූසෙක් ඉස්සරහට ආවා. පූසා මර්යූෂ්කා ගේ ඇඟට පැනලා මුරු මුරු ගෑවා:

"මර්යූෂ්කා නුඹ බයවෙන්ට එපා. ඉදිරියට පලයන්. ඉස්සරහට තවත් බයානකයි. නුඹ ඉස්සරහට පලයන්. ආපහු හැරීලා බලන්නට එපා."

පූසා මර්යූෂ්කා ගේ පිට කැසුවා විතරයි ඈ ඉදිරියට ගමන් කළා. කැලෑව වඩ වඩාත් අඳුරුයි. කැලෑව මැදින් ඔහොම යනකොට, යනකොට ඈ ඇඳලා හිටිය යකඩ සපත්තු කුට්ටම ගෙවී ගියා. ඇගේ යකඩ රිට ගෙවිලා, කැඩිලා ගියා. යකඩ හිස්වැස්ම ඉරී ගියා. ඈ කුකුළෙකුගේ කකුල් වලින් හිටගත්තු

ගෙයක් ළඟට ආවා. ඒ ගේ වටේට ලොකු ඉනි වැටක්. ඉනි උඩ හිස් කබලක් බැගින් තියෙනවා. හිස් කබල් ගින්දර වගේ දිලිසෙනවා.

මර්යූෂ්කා ගේ ඉස්සරහ හිටගෙන මෙහෙම කිව්වා:

''මේ ගෙය කරුණාකරලා කැලෑවට පිටුපා මට මූණලා හිට ගන්න. මට ඔය ගෙට ඇතුළු වෙලා බඩගිනි නිවාගන්න පාන් කෑල්ලක් කෑමට අවසර දෙන්න.''

ගෙය කැලෑවට පිටු පා මර්යූෂ්කාට මූණා ලා හිට ගත්තා. මර්යූෂ්කා ගෙට ඇතුළු වුණා. ඔන්න ඒ ගෙදරත් යකින්නක් ඉන්නවා. ඇගේ කකුල් දෙකත් බොහොම දිගයි. ඇගේ තොල් දෙක බොහොම දිග හන්දා ඒවා රාක්කයක් උඩ තබා තිබුණා. ඇගේ නහය ගෙයි වහළට වැදෙන තරම් උසයි.

යකින්න මර්යූෂ්කාව දැකලා නහය හකුළුවා ගත්තා.

''අපොයි, අපොයි, මිනිස් ගඳයි, මිනිස් ගඳයි. රතු ලස්සන කෙල්ලේ නුඹ කාව හොයාගෙන යනව ද, කාගෙන් පැනලා යනව ද?'' කියලා යකින්න ඇහුවා.

''අනේ ආච්චියේ රාජාලියාව හොයාගෙන යනවා.''

''නුඹ මගේ නංගී බාබායිගා යකින්න ළඟට ගියා ද?''

''ගියා. ආච්චියේ ගියා.'' මේ යකින්න බාබායිගා යකින්න ගේ අක්කා.

''හොඳයි ලස්සන කෙල්ලේ මම නුඹට උදවු කරන්නම්. මෙ රිදී කෙඳියි, රත්තරන් ඉඳි කටුවයි අරගනින්. මේ ඉඳි කටුව රත්තරන් සහ රිදී කෙඳි වලින් අම්පාට විලූද රෙදි වල මහව්. මේවා මිලදී ගන්ට මිනිස්සු ඒවි. විකුණන්ට එපා. රාජාලියාව හමුවන්නට ඕනෑ කියාපන්.''

මර්යූෂ්කා යකින්නට ස්තුති කරලා ගමනට පිටත් වුණා. කැලෑව මැදින් යනකොට, ගෙරවීම්, හෙණ හඬ, හූ හඬ ඇහෙනවා. හිස්කබල් කැලෑව ආලෝක කරනවා. මර්යූෂ්කා බොහොම බයවුණා. ඔන්න හිටි හැටියේ ම බල්ලෙක් දුවගෙන ආවා.

''හව්, හව්'' ගාලා බල්ලා බිරුවා. ''බයවෙන්ට එපා හොඳ ළමයෝ. ඉස්සරහට යන කොට තවත් වැඩිය බයවේවි. ආපහු හැරිලා බලන්නට එපා. දිගටම පලයන්.''

බල්ලා එහෙම කියලා අතුරුදහන් වුණා. කැලෑව හොඳටම අඳුරු වුණා. මර්යූෂ්කා යනකොට ඇගේ කකුලෙන් කවුදෝ අදිනවා, අතින් කවුදෝ

අදිනවා... මර්යූෂ්කා දිගටම යනවා. ආපහු හැරී බලන්නේ නැතුව දිගටම යනවා.

අඳුරු කැලෑව මැදින් ඔහොම යනකොට යකඩ සපත්තු ගෙවිලා ගියා, යකඩ හැරමිටිය ගෙවිලා, කැඩිලා ගියා. යකඩ හිස්වැස්ම ඉරිලා ගියා. මර්යූෂ්කා තණ පිටියකට ආවා. එතැනත් කුකුළෙකු ගේ කකුල් වලින් හිටගත්තු ගෙයක් තියෙනවා. ගේ වටේට ලොකු ඉනි වැටක්. ඉනිවල අස්වයින්ගේ හිස් කබල් තියෙනවා. හැම හිස් කබලකින්ම ගිනි පිටවෙන්නා වගේ එළිය විහිදෙනවා.

මර්යූෂ්කා මෙහෙම කිව්වා:

"කැලෑවට පිටු පා මට මූණ ලා හිටගන්න."



ගෙය මර්යූෂ්කා කී හැටියට හිටගත්තා. මර්යූෂ්කා ගෙට ඇතුළු වුණා. එතැනත් යකින්නක් ඉන්නවා. ඇගේ කකුල් බොහොම දිගයි. ඇගේ දෙතොල් දිග හන්දා ඒවා රාක්කයක් උඩ තියලා. ඇගේ නහය වහළට වැදෙනවා. එය එතරම් උසයි. යකින්න දලි අඟුරු වගේ කළු පාටයි. කට කපුටු හොටක් වගේ. යකින්න මර්යූෂ්කාව දැකලා නහය හකුළුවා ගත්තා.

"අපොයි, අපොයි, මිනිස් ගඳයි, මිනිස් ගඳයි. ලස්සන කෙල්ලේ නුඹ කාව හරි හොයා ගෙන යනව ද, කාගෙන් හරි පැනලා යනව ද?" මහ යකින්න ඇසුවා.

"හොයනවා. මගේ රාජාලියාව හොයනවා, ආච්චියේ" මර්යූෂ්කා කිව්වා.

"නුඹේ රාජාලියාව හොයා ගන්ට බොහොම අමාරුයි. මම නුඹට උදවු

කරන්නම් ලස්සන කෙල්ලේ. මම නුඹට මූණ බලන රිදී තැටියකුයි, නූල් කටින්ට රත්තරන් ඉද්දකුයි දෙන්නම්. ඉද්ද අතට ගත්තු හැටියේම එය ඉබේටම නූල් කටින්නට පටන් ගනීවි. නිකම් නූල් එහෙම නොවෙයි, රත්තරන් නූල්.'' මහ යකින්න කිව්වා.

''ආච්චිට බොහොම ස්තුතියි.''

''ස්තුති කරන්ට පස්සෙ පුළුවනි. දැන් මා කියන දේ අහපන්. මා කියන විදිහට කරපන්. රත්තරන් ඉද්ද මිලදී ගන්ට මිනිස්සු කැමති වේවි. විකුණන්ට එපා. රාජාලියාව බලන්නට ඕනෑ කියලා කියපන්.''



මර්යූෂ්කා යකින්නට ස්තුති කරලා ගමනට පිටත් වුණා. මහා මූකළන් කැලෑව. හඬ නගනවා. හූ කියනවා. බස්සෝ වටේට ඉගිලෙනවා. මීයෝ හැම තැනම දුවනවා. මර්යූෂ්කා ගේ ඇඟ උඩින් පවා උන් දුවන්නට පටන් ගත්තා. ඔන්න හිටි හැටියේම ඇය ඉදිරියට වෘකයෙක් දුවගෙන ආවා.

''ළමයා කනගාටු වෙන්ට එපා. නුඹ මගේ පිට උඩ වාඩිවෙයන්. ආපහු හැරිලා බලන්නට එපා.'' වෘකයා කිව්වා.

මර්යූෂ්කා උගේ පිට උඩ වාඩිවුණා විතරයි, ඌ බොහොම හයියෙන් දුවන්නට පටන් ගත්තා. ස්ටෙප්ස් තැන්න පහුකරගෙන, රතු පාට ගොහොරු බිම් පහු කරගෙන, ගංගාවලට උඩින් පැනගෙන, ඉවුරු දිගේ දිව්වා. වලාකුළුවල ගෑවෙන තරම් උස කඳුවලට උඩින් ඌ පැන්නා. වෘකයා මර්යූෂ්කාව පිට උඩ තබාගෙන දුවනවා. ඔන්න හිටිහැටියේම පළිඟු වලින් හදපු මාලිගාවක් පෙනුණා. මාලිගා වාසල කැටයමින් හදලා. මාලිගා ජනේල මල් කැටයම් වලින් හදලා. රැජින ජනේලයෙන් එපිට බලාගෙන ඉන්නවා.

''මර්යූෂ්කා දැන් ඉතින් බැහැපන්. ගිහිල්ලා රැජින ළඟ වැඩ කරපන්.'' වෘකයා කිව්වා.

මර්යූෂ්කා වෘකයා පිටින් බැහැලා යකින්නියන් තුන්දෙනා දීපු තෑගි පොදියත් අතට අරගෙන වෘකයාට ස්තුති කරලා පළිඟු මාලිගාවට ගියා. ඈ රැජිනට හිස නමා ආචාර කරලා කතා කළා:

''ඔබ තුමීගේ නම මම දන්නේ නැහැ. ඔබ තුමීට වැඩකාරියක් එහෙම ඕන කරනව ද?''

''මම බොහොම කාලයක් තිස්සේ වැඩකාරියක් හොය හොයා හිටියා. මට ඕන නූල් ගොතන්න, රෙදි වියන්ට, මහන්ට දන්නා කෙනෙක්.'' රැජින කීවා.

''මට ඒ වැඩ ඔක්කොම කරන්ට පුළුවනි.''

''එහෙනම් මෙහාට ඇවිල්ලා වැඩ පටන් ගනින්.''

මර්යූෂ්කා මාලිගාවේ වැඩ කරනවා. දවල් කාලෙදී වැඩ කරලා රෑ වුණාම ඈ රිදී පීරිසියයි, රත්රන් බිත්තරයයි අරගෙන මෙහෙම කියනවා:

''රත්තරන් බිත්තරය, රත්තරන් බිත්තරය රිදී පීරිසිය වටේට කැරකියන්, මගේ ආදරනීය රාජාලියාව පෙන්නාපන්.''

රත්රන් බිත්තරය රිදී පීරිසිය වටේ කැරකිලා රාජාලියාව ගෙනාවා. මර්යූෂ්කා රාජාලියා දිහා බලා අඬන්ට පටන් ගත්තා.

''අනේ මගේ ආදරනීය රාජාලියෝ, නුඹ ගැන දුක්වෙවී අඬන්ට මට ඉඩ තිබ්බේ ඇයි...''

රැපිනට මේ කතාව ඇහුනා.


''මර්යූෂ්කා නුඹ මට රිදී පීරිසියයි, රත්තරන් බිත්තරයයි විකුණාපන්.'' රැපින කීවා.

''බැහැ, ඒවා විකුණන්නේ නැහැ. රැපින මට රාජාලියාව අතගාන්ට ඉඩ දුන්නොත් මම ඒවා ඔබතුමීට තෑගි දෙනවා.''

රැපින කල්පනා කළා, කල්පනා කළා.

''හොඳයි, රෑට එයා නිදාගන්නා කොට මම එයාව පෙන්වන්නම්.'' රැපින කීවා.

රෑ වුණා. මර්යූෂ්කා රාජාලියා නිදන කාමරයට ගියා. කාටවත් අවදි කරවන්ට බැරි නින්දකින් ඇගේ ආදරනීය රාජාලියා නිදාගන්නා හැටි ඈ දැක්කා. මර්යූෂ්කා බලනවා, බලනවා, කොච්චර බැලුවත් හිත පිරෙන්නේ නැහැ. ඈ ඔහුගේ දෙතොල් සිපගත්තා, පපුවට තුරුල් වුණා. රාජාලියා නැගිට්ටේ නැහැ. නිදාගෙන හිටියා. පහුවදා එළිය වැටුණා. රාජාලියාව අවදි කරවා ගන්ට මර්යූෂ්කාට බැරිවුණා...



අවල් කාලයේදී ඈ මාලිගාවේ වැඩ කරන්ට පටන් ගත්තා. හවස් වුණාම මර්යූෂ්කා රිදී කෙඳියි, රත්රන් ඉඳිකටුවයි අර ගෙන මහන්ට පටන් ගත්තා. මහන ගමන් මෙහෙම කිව්වා:

"ඉඳිකටුව, ඉඳිකටුව, මගේ රාජාලියාට උදේ නැගිටලා මූණ පිහදාන්ට ලස්සන වැඩ දාපු තුවායක් මහන්න."

රැපිනට මේ කතාව ඇහුණා:

"මර්යූෂ්කා නුඹ ඔය රිදී කෙඳියි රත්තරන් ඉඳි කටුවයි මට විකුණාපන්" රැපින කීවා.

"අපොයි, බැහැ. රැපින මට රාජාලියාව බලන්ට අවසර දෙනවා නම්, මම මේවා ඔබ තුමියට තෑගි දෙනවා."

රැපින කල්පනා කළා, කල්පනා කළා.

"හොඳයි කමක් නැහැ. රෑට වරෙන්" රැපින මර්යූෂ්කාට කීවා.

රෑ වුණා. මර්යූෂ්කා රාජාලියාගේ ඇඳ ළඟට ආවා. රාජාලියා තද නින්දේ පසු වුණා.

"අනේ මගේ ආදරනීය රාජාලියෝ නැගිටින්න, නැගිටින්න!" මර්යූෂ්කා කිව්වා.

රාජාලියා හොඳටම නිදි. ඔහුව අවදි කරන්නට මර්යූෂ්කාට බැරි වුණා.

පහුවදා උදේ එළි වුණාට පසු ඈ මාලිගාවේ වැඩට ගියා. මර්යූෂ්කා රිදී තැටියයි, රත්රන් ඉද්දයි අතට ගත්තා. රැපින එය දැක්කා.

"ඕවා මට විකුණාපන්. විකුණාපන්!" රැපින මර්යූෂ්කාට කිව්වා.

"අපොයි, බැහැ. රැපින මට රාජාලියා සමග පැයක් හරි ගත කරන්ට ඉඩ දෙනවානම්, මම මේවා ඔබතුමීට දෙනවා."

"හොඳයි" රැපින කීවා.

"රාජාලියාව කවදාවත් අවදි කරන්ට බැහැ." රැපින කල්පනා කළා.

රෑ වුණා. මර්යූෂ්කා රාජාලියාගේ නිදන කාමරයට ගියා. රාජාලියා හොඳටම නිදි.

"අනේ මගේ රාජාලියෝ නැගිටින්න. ඇහැ ඇරලා බලන්න!" මර්යූෂ්-කා කිව්වා.

රාජාලියාට ඇහෙන්නේ නැහැ. ඔහු එතරම් තද නින්දේ.

මර්යූෂ්කා රාජාලියාව අවදි කළා, කළා. අවදිකරන්ට බැරිවුණා. දැන් ඉතින් එළිය වැටෙන්නටත් ළඟයි.



මර්යූෂ්කා අඬන්ට පටන් ගත්තා.

''අනේ මගේ ආදරනීය රාජාලියෝ. නැගිටින්නකො, නැගිටලා ඔබේ මර්යූෂ්කා දිහා බලන්නකෝ. මාව හදවතට තුරුළු කර ගන්නකො.''

මර්යූෂ්කාගේ කඳුළු බින්දුවක් රාජාලියාගේ ඇඟට වැටුනා. උණු කඳුළු නිසා රාජාලියාට ඇහැරුණා. ඔහු නැගිටලා බලනකොට මර්යූෂ්කාව දැක්කා. ඔහු ඇය බදාගෙන සිප ගත්තා.

''මර්යූෂ්කා ඒ නුඹ ද? යකඩ සපත්තු, යකඩ හැරමිටි, යකඩ හිස්වැසුම්

ගෙවෙන තුරු, කැඩෙන තුරු ඇවිද්දා ද? මාව හොයාගෙන ආවා නේද? දැන් ඉතින් අපි ගෙදර යමු.''

දෙදෙනාම ගෙදර යාමට සූදානම් වුණා. රැපින මෙය දැකලා නළා පිඹින්නට අණ කළා. රැපිනගේ ස්වාමියා, රැපිනට විරුද්ධ වුණා කියලා දැන්වීමට අණ කළා.

කුමාරවරු, සිටුවරු, වෙළෙන්දෝ රැස්වෙලා, රාජාලියාට දඬුවම් කරන හැටි කල්පනා කළා.

එවිට රාජාලියා ලස්සන කුමාරයකුගේ වෙස් ගෙන මෙහෙම කිව්වා:

''කවුද හැබෑ බිරිඳ? ආදරය කරන එක්කෙනා ද, මාව විකුණන මාව රවටන එක්කෙනා ද?''

රාජාලියා ගේ වෙස් ගෙන හිටි ලස්සන කුමාරයාගේ බිරිඳ මර්යූෂ්කා කියලා රාජ සභාව තීරණය කළා.

මේ දෙදෙනා තමන් ගේ රටට එන්නට ලැහැස්ති වුණා. මවුබිමට එන විට රට වැසියෝ බෙර ගහලා, නළා පිඹලා, ආචාර වෙඩි මුර තියලා ඔවුන් පිළිගත්තා. බොහොම ජයට මගුල් කෑවා. අදත්, තවම ඒ මගුල ගැන කතා කරනවා.



අලෝනුෂ්කා අක්කා සහ ඉවානුෂ්කා මල්ලී

එකෝමත් එක රටක මහල්ලෙකු යි, මැහැල්ලකු යි හිටියා. මේ දෙදෙනාට දුවකුයි, පුතකුයි හිටියා. දුව ගේ නම අලෝනුෂ්කා. පුතා ගේ නම ඉවානුෂ්කා.

මහලු දෙදෙනා මිය ගියා. අලෝනුෂ්කා හා ඉවානුෂ්කා විතරක් ගෙදර තනි වුණා.

අලෝනුෂ්කා මල්ලීවත් අඬගහගෙන රස්සාවක් හොයාගෙන ගියා. දෙදෙනා ම බොහොම දුර ගමන් කළා. ඔහොම යනකොට, යනකොට ඉවානුෂ්කාට වතුර පිපාසයක් ඇති වුණා.

''අලෝනුෂ්කා අක්කේ, මට වතුර තිබහයි!'' මල්ලී කිව්වා.

''මල්ලියෙ ලිඳක් හොයාගන්නා තුරු ඉවසාපන්.''

දෙදෙනාම යනවා, යනවා. ඉර මුදුන් වෙලා. ලිඳ බොහොම ඈතයි, රස්නෙත් වැඩියි. දහඩියත් දාන්ට පටන් අරගෙන. හරක් කුරයක් වගේ පොඩි වතුර වළක වතුර ටිකක් ඉතුරු වෙලා තියෙනවා.

''අලෝනුෂ්කා අක්කේ මේ හරක් කුර වළේ තියන වතුර ටික මම බොන්නම්'' මල්ලී කීවා.

''අනේ මල්ලියෙ බොන්ට එපා. නුඹ වහු පැටියෙකු වේවි.''

මල්ලී කීකරු වෙලා, වතුර නොබී යන්ට ගියා.

දෙදෙනාම යනවා, යනවා, ඉර මුදුන් වෙලා, ලිඳ බොහොම ඈතයි, රස්නෙත් වැඩියි. ආඩිය දාන්නටත් පටන් අරගෙන. අස්ස කුරයක් වගේ

වළක වතුර ටිකක් ඉතුරු වෙලා තියෙනවා.

"අලෝනුෂ්කා අක්කේ, අස්ස කුරය වැනි වළේ තියෙන වතුර ටික බොන්නම්" මල්ලී කීවා.

"අනේ මල්ලියෙ බොන්ට එපා. නුඹ අස්ස පැටියකු වේවි."

ඉවානුෂ්කා සුසුම් ලෑවා. අක්කාට කීකරු වෙලා වතුර නොබී ගියා.

දෙදෙනාම යනවා. ඉර මුදුන් වෙලා. ලිඳ බොහොම ඈතයි, රස්නෙත් වැඩියි, ඩහදිය දානවා. එළුවකු ගේ කුරයක් වගේ වළක වතුර ටිකක් තියෙනවා.

ඉවානුෂ්කාට පිපාසෙ ඉවසා ඉන්ට බැහැ.

"අනේ අලෝනුෂ්කා අක්කේ, දැන්නම් ඉතින් ඉවසන්ට බැහැ. මේ වලේ තියෙන වතුර මම බොනවා."

"මල්ලියෙ බොන්ට එපා. නුඹ එළු පැටියකු වේවි." අක්කා කීවා.

ඉවානුෂ්කා ඒ වර අක්කාට අකීකරු වෙලා එළු කුරය වගේ වලේ තියෙන වතුර ටික බීවා.

වතුර බිව්වා විතරයි, ඉවානුෂ්කා එළු පැටියෙක් වුණා.



අලෝනුෂ්කා මල්ලීට අඬ-ගහනවා. මල්ලී වෙනුවට එළු පැටියෙක් දුවගෙන එනවා.

අලෝනුෂ්කා පිදුරු ගො-ඩක් ළඟ වාඩි වෙලා අඬන්ට පටන් ගත්තා. එළු පැටියා උඩ පැන, පැන ඈය වටේ යනවා. මේ වේලාවේදී වෙළෙන්දෙක් එතැනින් ගියා.

"ලස්සන කෙල්លේ නුඹ මොකද අඬන්නේ?"

අලෝනුෂ්කා සිදුවුණ විපත ගැන ඔහුට කීවා.

"මම නුඹව කසාද බැඳ ගන්නම්. රිදී—රත්තරන් තැගි



දෙන්නම්. එළු පැටියාත් අප ළඟ ඉඳීවි.''

අලෝනුෂ්කා කල්පනා කරලා, කරලා, වෙළෙන්දා සමග විවාහ වුණා.

මේ දෙදෙනා සැපෙන් ජීවත් වුණා. එළු පැටියාත් ඒ ගෙදරම ඉන්නවා. අලෝනුෂ්කා බත් කන පිඟානෙන් ම ඌත් බත් කනවා. ඒ කෝප්පයෙන් ම වතුර බොනවා.

එක දවසක් වෙළෙන්දා ගෙදර හිටියේ නැහැ. කොහේදෝ ඉඳලා යකින්නක් ආවා. මේ යකින්න අලෝනුෂ්කා ගේ කාමරයේ ජනේලය ළඟ ඉඳගෙන ගඟට නාන්ට එන ලෙස බොහොම කරුණාවෙන් අලෝනුෂ්කාට කතා කළා.

යකින්න අලෝනුෂ්කාව ගඟට අඬගහගෙන ආවා. ඇගේ ඇඟට කඩා පැනලා ඇගේ බෙල්ලට ගලක් බැඳලා ගඟට වීසි කළා.

යකින්න අලෝනුෂ්කාගේ වෙස් අරගෙන ඇගේ ඇඳුම් ඇඳගෙන

වෙළෙන්දා ගේ ගෙදරට ආවා. ගෙදර වැඩ කාරයින්ට යකින්නව අඳුනා ගන්ට බැරි වුණා. වෙළෙන්දා ගෙදර ආවා. ඔහුටත් අඳුනා ගන්ට බැහැ. එළු පැටියා විතරක් දැනගත්තා මේ අලෝනුෂ්කා නො වේය කියලා.



ඌ ඔළුව පාත් කර ගෙනැ නොකා, නොබී හිටියා. උදේටයි හවසටයි ගඟ ළඟට ගිහිල්ලා අක්කාට අඬ ගහනවා:

"අලෝනුෂ්කා මගේ අක්කේ! පීනාගෙන මෙගොඩ එන්න."

ඒ ගැන දැනගත් වෙස්ගත්ත යකින්න, වෙළෙන්දාට කිව්වා එළු පැටියාව මරා අමන්න කියලා...

වෙළෙන්දාට කනගාටුයි. ඔහු එළු පැටියාට කැමතියි. යකින්න බොහොම ආදරෙන්, චාටුවෙන් වෙළෙන්දාට කියනවා කොහොම හරි එළු පැටියාව මරා අමන්න කියලා. අවසානයේ දී වෙළෙන්දා කැමති වුණා:

"එළු පැටියාව මරාපියව්!" වෙළෙන්දා අණ කළා.

ගිනි මැලයක් ගොඩ ගැහුවා. කටාරමක් රත් කළා. පිහි මුවත් තැබුවා...

තමාව ඉක්මනින්ම මරා අමන බව එළු පැටියා දැනගත්තා. ඌ වෙළෙන්දාට කතා කළා:

''මාව මරන්ට ඉස්සෙල්ලා ගඟට ගිහිල්ලා, වතුර ටිකක් බීලා, බඩවැල් හෝදා ගන්ට අවසර දෙන්න.''

''හොඳයි ගිහින් වරෙන්'' වෙළෙන්දා කීවා. එළු පැටියා ගඟ ළඟට ගිහිල්ලා දුකින් මෙහෙම ගායනා කළා:

''අලෝනුෂ්කා මගේ අක්කේ. පීනාගෙන මෙගොඩ එන්න. ගිනි-ගොඩවල් ඇවිලෙනවා. යකඩ හට්ටි රත් කරලා උල් පිහියා මුවත් කරලා මා මරන්ට සැරසෙනවා.''

අලෝනුෂ්කා ගඟේ ඉඳලා පිළිතුරු දුන්නා:

''ඉවානුෂ්කා මගෙ මල්ලි මා ඉන්නේ ගඟ පතුලේ. ගලක් බැඳල මගෙ බෙල්ලේ යකින්න මා තල්ලු කළා.''

යකින්න එළු පැටියාව හොයන්ට පටන් ගත්තා. හොයාගන්ට බැරිවුණ හන්දා වැඩ කාරයකුට කීවා ඌව හොයාගෙන එන්ටයි කියලා.

''නුඹ කොහොම හරි එළු පැටියාව හොයගෙන වරෙන්.''

වැඩකාරයා ගඟ ළඟට ගියා. එළු පැටියා ගංඉවුරේ දුවමින් දුක කිය කියා අක්කාට අඬ ගහනවා:

''අලෝනුෂ්කා මගෙ අක්කේ පීනාගෙන මෙගොඩ එන්න. ගිනිගොඩවල් ඇවිලෙනවා යකඩ හට්ටි රත්කරලා උල් පිහියා මුවත් කරලා මා මරන්ට සැරසෙනවා.''

අලෝනුෂ්කා ගඟේ ඉඳලා පිළිතුරු දෙනවා:

''ඉවානුෂ්කා මගෙ මල්ලි මා ඉන්නේ ගඟ පතුලේ. ගලක් බැඳල මගෙ බෙල්ලේ යකින්න මා තල්ලු කළා.''

එළු පැටියා ගේ විලාපය යි, අලෝනුෂ්කා ගේ පිළිතුර යි අහගෙන හිටිය වැඩ කාරයා, ගෙදර ගිහිල්ලා ඒ ගැන වෙ-ළෙන්දාට විස්තර කළා. වෙළෙන්දා මිනිසුන් රැස් කරලා ගඟට ගිහිල්ලා,

සේද නූලෙන් හැදූ දැලක් ගහට වීසි කරලා අලෝනුෂ්කාව ගොඩ ගත්තා. බෙල්ලේ බැඳලා තිබුණු ගල ඉවත් කළා. පිරිසුදු උල්පත් ජලය තියෙන තැනට ඇය ගෙනියලා, ලස්සන ගවුමක් ඇඳලා, වතුරෙන් ඇය නාවා බෙහෙත් කළා. ඇට· පණ ලැබුණා. ඈ ඉස්සරටත් වඩා ලස්සන වුණා.

එළු පැටියා බොහොම සතුටු වෙලා තුන් පාරක් කරණම් ගැහුවා. එවිට ඌ ආයෙමත් ඉවානුෂ්කා බවට පත් වුණා.

මිනිස්සු එකතු වෙලා යකින්නව අශ්වයකු ගේ වලිගයට බැඳලා, ඌ එළවා දැම්මා. ඌ යකින්නත් ඇදගෙන පිටියක් හරහා දුවන්ට පටන් ගත්තා.



පුදුම අශ්වයා

එකෝමත් එක රටක මහල්ලෙක් හිටියා. ඔහුට පුත්තු තුන්දෙනෙක් හිටියා. ලොකු පුත්තු දෙදෙනා සල්ලි වියදම් කිරීමට කැමතියි, හොඳට අඳින්ට කැමතියි. බලා පුතා ඉවාන්-මෝඩයා ඔහෙ හිටියා. බිම්මල් ඇහිඳින්නට කැලයට යාමට ඔහු ආශා කළා. ගෙදර ඉන්න කොට ඔහු උදුන උඩ තියෙන පඩියට නැගලා නිදාගන්ට ආශා කළා.

මහල්ලාට මැරෙන්නට වේලාව ආවා. තාත්තා පුතුන්ට නියමයක් කළා:

''මම මළාම නුඹලා රෑ තුනක් පිට පිටම පාන් අරගෙන මගේ වළ ළඟට එන්නට ඕන.''

මහල්ලා මළ පසු ඔහුව වළ ලා දැම්මා. රෑ වුණා. ලොකු පුතා පාන් අරගෙන මිනී වළ ළඟට යන්ට ඕන. ඔහු කම්මැලි හින්දා හරි, බය හින්දා හරි, එහෙම යන්ට කැමති වුණේ නැහැ. ඔහු බාල මල්ලී ඉවාන්ට කතා කරලා මෙහෙම කීවා:

''ඉවාන් අද මා වෙනුවට තාත්තා ගේ වළ ළඟට පළයන්. මම නුඹට විස්කෝතු අරන් දෙන්නම්.''

ඉවාන් පානුත් අරගෙන තාත්තාගේ වළ ළඟට ගියා. තාත්තා ගේ අවතාරය එන තුරු ඔහු එතැන හිටියා. රෑ දොළහට වළ දෙබෑ වෙලා තාත්තා වළෙන් එළියට ඇවිල්ලා කතා කළා:

''කවුද ඔතන මගේ වැඩිමල් පුතා ද? අපේ රටේ මොනව ද වෙන්නේ කියලා කියපන්. බල්ලෝ බුරනව ද, වෘකයෝ හූ කියනව ද, නැතිනම් මගේ ළමයින් අඬනව ද?''

ඉවාන් මෙහෙම පිළිතුරු දුන්නා:

''ඒ මමයි, ඔබ ගේ බාල පුතා. අපේ රටේ කිසි වෙනසක් නැහැ.''

තාත්තා පාන් කා වළ ඇතුළට ගියා. ඉවාන් ගෙදර ආවා. එන ගමන් අතර මගදී බිම්මල් එකතු කළා. ලොකු අයියා ඉවාන් ගෙන් තොරතුරු ඇහුවා.

''තාත්තාව දැක්ක ද?'' අයියා ඇහුවා.

''දැක්කා'' මල්ලී කිව්වා.

''තාත්තා පාන් කෑව ද?''

''ඔව්, බඩ පිරෙන කල් පාන් කෑවා.''

දෙවැනි දවසෙත් රෑ වුණා. මද්දුම අයියා තාත්තාට පාන් ගෙනියන්ට ඕන. ඔහුටත් කම්මැලි හින්දා හරි, බය හින්දා හරි, මල්ලීට කතා කරලා කියනවා:

''ඉවාන් පලයන් තාත්තා ගේ වළ ළඟට පාන් අරගෙන. මම නුඹට සෙරෙප්පු දෙකක් පංචලින් ගොතලා දෙන්නම්.''

''හොඳයි'' කියලා ඉවාන් කැමති වුණා.

ඉවාන් පානුත් අරගෙන වළ ළඟට ගිහිල්ලා තාත්තා එන තුරු බලා හිටියා. රෑ යාමෙට වළ දෙබෑ වෙලා, තාත්තා එළියට ආවා. ඔහු කතා කළා:

''ඔය කවුද? ඔය මගේ මද්දුම පුතා ද? අපේ රටේ මොනව ද වෙන්නේ කියලා කියපන්. බල්ලෝ බුරනව ද, වෘකයෝ හූ කියනව ද, නැත්නම් මගේ ළමයින් අඬනව ද?''

ඉවාන් මෙහෙම පිළිතුරු දුන්නා:

''තාත්තේ මේ මම. ඔබ ගේ බාල පුතා. අපේ රටේ කිසි වෙනසක් නැහැ.''

තාත්තා පාන් කාලා වළ ඇතුළට ගියා. ඉවාන් ගෙදර යන ගමන් ආ-යෙමත් බිම්මල් එකතු කළා. මද්දුම අයියා ඉවාන්ගෙන් තොරතුරු ඇසුවා:

''තාත්තා පාන් කෑව ද?''

''ඔව්. බඩ පිරෙන කල් කෑවා.''

තුන්වැනි අවසේදී ඉවාන් ගේ වාරයයි. ඔහු අයියලා දෙදෙනාට කතා කළා:

"මම රෑ දෙකක්ම තාත්තාගේ වළ ළඟට ගියා. අද නුඹලා දෙදෙනා පලයල්ලා. මම විවේක ගන්නම්."

අයියලා දෙදෙනා මෙහෙම කිව්වා:

"ඉවාන් දැන් නුඹට එහි ගිහිල්ලා පුරුදු නොවැ. නුඹ ම පලයන්."

"හොඳයි" ඉවාන් එකඟ වුණා.

ඉවාන් පානුත් අරගෙන තාත්තා ළඟට ගියා. රෑ යාමෙට වළ දෙබෑ වෙලා තාත්තා එළියට ආවා. ඔහු පුතාට කතා කළා:

"ඔය කවු ද? ඔය මගේ බාල පුතා ඉවාන් ද? රටේ මොනවා ද වෙන්නේ කියලා කියාපන්. බල්ලෝ බුරනව ද? වෘකයෝ හූ කියනව ද? මගේ ළමයින් අඬනව ද?"

ඉවාන් මෙහෙම පිළිතුරු දුන්නා:

"මම ඔබ ගේ පුතා ඉවාන්. අපේ රටේ කිසි වෙනසක් නැහැ."

තාත්තා පාන් කාලා ඉවාන්ට කතා කළා:

"නුඹ විතරයි මගේ ඉල්ලීම ඉටුකළ එකම පුතා. බය නැතුව අවස් තුනක්ම මගේ වළ ළඟට ආවා. නුඹ තණ පිට්යට ගිහිල්ලා මෙහෙම කෑ ගහපන්: "ඕ ගිරිං, ගිරිං, පුදුම අස්වයා මගේ ළඟට ඇවිත් හිටගනින්." එතකොට අස්වයෙක් ඒවි. නුඹ උගේ දකුණු කනින් රිංගලා වම් කනින් එළියට වරෙන්. නුඹ මෙහෙම කළාම බොහොම අපූරු තරුණයෙක් වේවි. අස්වයා පිට නැගලා පලයන්."

ඉවාන් කටකලියාවත් කරේ තියාගෙන තාත්තාට ස්තුති කරලා ගෙදර ගියා. ගෙදර යන ගමන් බිම්මල් එකතු කළා. ගෙදර ගියාම අයියලා ඉවාන්-ගෙන් විස්තර අහනවා:

"තාත්තාව දැක්කද?"

"දැක්කා."

"තාත්තා පාන් කෑව ද?"

"තාත්තා බඩ පුරා පාන් කාලා කිව්වා මීට පස්සේ එන්ට එපයි කියලා." ඉවාන් කිව්වා.

ටික කලකට පස්සේ රටේ රජතුමා මෙහෙම නියෝගයක් කළා: රටේ ඉන්න සියලු තරුණයෝ, විවාහ නොවූ තනිකඩයෝ රාජ මාලිගාවේ මිදුලට


පැමිණිය යුතුයි. රජ තුමාගේ දුව, බොහොම ලස්සන කුමරිය තට්ටු දොළහක මාලිගාවේ දොළොස් වෙනි තට්ටුවේ අසුනක වාඩිවෙලා ඉඳීවි. අස්වයකුගෙ පිට උඩ නැගලා ඌව දොළොස් වෙනි තට්ටුවට පන්නලා, කුමරියගේ මුහුණ සිපගැනීමට පුළුවන් තරුණයාට කුමරිය අයිති වෙනවා. කිසිම ජාති, ආගම්, කුල, දුප්පත්, පොහොසත් බේදයක් සලකන්නේ නැහැ. මෙලෙස කුමරිය අයිතිකර ගත් තැනැත්තාට රටින් බාගයකුත් තෑගි දෙනවා.

ඉවාන් ගේ අයියලාට මේ ආරංචිය දැනගන්ට ලැබිලා ඔවුන් මෙහෙම කීවා:

"අපිත් වාසනාව උරගා බලමු!"

අයියලා දෙන්නා තමන් ගේ අස්වයින්ට හොඳ කොල්ලු කවලා, හොඳ ඇඳුම් ඇඳගත්තා. හිස පීරා ගත්තා. උඳුන උඩ වාඩිවෙලා ඉන්න ඉවාන් අයියලාට කතාකරලා මෙහෙම කීවා:

"අනේ අයියේ මාවත් අරගෙන පලයල්ලා. මාත් කැමතියි වාසනාව උරගා බලන්ට."



"මෝඩයා, පලයන් කැලේට, ගිහිල්ලා බිම්මල් එකතු කරපන්. මිනිසුන්ව හිනස්සන්න හදනව ද."

අයියලා දෙදෙනා අස්වයින් පිට නැගලා වේගයෙන් යන්ට ගියා.

ඉවාන් කටකලියාවත් අර ගෙන තණ පිට්යට ගියා. තාත්තා කියාදුන් හැටියට ඔහු මෙහෙම කීවා: "ඕ ගිරිං, ගිරිං පුදුම අස්වයා මා ළඟට ඇවිත් හිටගනින්!"

කොහේ ඉඳලද දන්නේ නැහැ, අස්වයෙක් දුවගෙන එනවා. මහ පොළොව දෙදරනවා, උගේ නහයෙන් ගින්දර වගේ දුම් පිට වෙනවා, කන්වලින් ගිනි දළු පිටවෙනවා. ඌ ඉවාන් ඉදිරිපිට හිටගත්තා.

"නුඹට ඕන මොනව ද?"

ඉවාන් අස්වයා ගේ පිට අත ගාලා ඌට කටකලියාව අන්දලා, උගේ දකුණු කනින් රිංගලා වම් කනින් පිට වුණා. එතකොට ඉවාන් කොතරම් ලස්සන වුණා ද කීවොත්, හිතල ඉවර කරන්නත්, කියල ඉවර කරන්නත්, ලියල ඉවර කරන්නත් බැරි තරම් ලස්සන වුණා. ඉවාන් අස්වයා පිට නැගලා රාජ මාලිගාවට ගියා.

පුදුම අස්වයා දුවනවා, මහ පොළොව දෙදරනවා, කඳු උඩින් එක පිම්මට පනිනවා. මහා ගංගා හරහා එක පිම්මට පනිනවා.

ඔන්න ඉතින් ඉවාන් රාජ මාලිගාවේ මිදුලට ආවා. එතැන සෙනඟ පිරිලා. තට්ටු දොළහක මාලිගාවක දොළොස් වෙනි තට්ටුවේ අසුනක ලස්සන කුමරිය වාඩි වෙලා ඉන්නවා.

රජතුමා මාලිගා මිදුලට ඇවිත් කතා කළා:

"මගේ දූ කුමරිය ළඟට අස්වයා පන්නලා, ඇගේ මුහුණ සිපගත්



තරුණයාට, මගේ දූ කුමරිය සරණ පාවා දෙනවා, රටින් භාගයක් තෑගි දෙනවා.''

එවිට, රැස්වෙලා හිටිය තරුණයෝ, ''මාලිගාව බොහොම උසයි, ඔය තරම් උසට අසුන් පන්නන්ට අපට බැහැ'' කියලා කීවා. ඉවාන් ගේ අයියලා දෙදෙනා අසුන් පැන්නුවා. ඔවුන්ගේ අස්වයින් හයවැනි තට්ටුව ළඟට විතරයි පැන්නේ. ඊළඟට ඉවාන් ගේ වාරයයි.

ඔහු පුදුම අස්වයා පිට නැගලා ඌ වේගයෙන් පැන්නුවා. ඌ හේසාරව කරලා උඩ පැනලා දහවෙනි තට්ටුවට ළංවුණා. දෙවැනි පාර ආයෙමත් හේසාරව කරලා උඩ පැනලා එකොළොස් වෙනි තට්ටුවට ළං වුණා. තුන්-වෙනි පාර අස්වයා නහයෙන් කනින් ගිනි දලු පිට කරලා හේසාරව කරලා උඩ පැන්නා. හරියට ම කුමාරි වාඩි වෙලා හිටිය දොළොස් වැනි තට්ටුවට. අස්වයා ගේ පිට උඩ හිටිය ඉවාන් කුමරිය ගේ ලස්සන මුහුණ සිප ගත්තා. කුමරිය පේරුස් මුද්දෙන් ඉවාන් ගේ නළලේ ලකුණක් තැබුවා.

රැස්වෙලා හිටිය සෙනඟ මහ හඬින් කෑ ගැසුවා:

''ඔහුව අල්ලා ගනිල්ලා ගනිල්ලා!''

කොහෙ අල්ලන්නට ද, ඉවාන් වේගයෙන් අසු පන්නලා අතුරුදහන් වුණා.


තණ පිටියට ඇවිත් ඉවාන් අසු පිටින් බැහැලා, උගේ වම් කනින් රිංගලා දකුණු කනින් පිට වුණා. ඔහු නැවත මෝඩ ඉවාන් වුණා. අස්වයාට යන්ට ඉඩ හැරලා, බිම්මල් ටිකක් එකතු කර ගත්තා. නළලේ ලකුණ නොපෙනෙන්ට රෙදි පටියක් එතුවා. ගෙදර ගිහිල්ලා ඉවාන් උදුන උඩට නැගලා ඉන්නවා.

අයියලා දෙ දෙනා ගෙදර ඇවිල්ලා, රජ ගෙදර විත්ති ගැණ කිව්වා.

''එතැන බොහොම දක්ස අය ඇවිත් හිටියා. එක්කෙනෙක් අනිත් හැම දෙනාටම වඩා දක්සයි. එයා කුමාරි ළඟට ම පැනලා ඇගේ මුහුණ සිප ගත්තා. කොහෙන් ආවා ද කියල දැක්කා. කොහේ ගියා ද කියල නම් දැක්කේ නැහැ.''

උදුන උඩ වාඩිවෙලා හිටි ඉවාන් අයියලාගෙන් මෙහෙම අහනවා:

''උඩ පැනලා කුමාරිව සිප ගත්තේ මම නොවෙයි ද?''





''ඕන්න, මෝඩයා. මෝඩ කතා කියනවා. උඳුන උඩට වෙලා බිම්මල් කාපිය.''

අයියලා දෙදෙනා තරහෙන් කීවා.

ඉවාන් නළලේ ඔතා තිබුණු රෙදි පටිය ඉවත් කළා. කුමරිය ඉවාන්ගේ නළලෙහි කළ ලකුණ දිලිසෙන්නට වුණා. ඉවාන්ලා ගේ ගෙදර හරියට ගිනි ගත්තා වගේ ආලෝක වුණා. අයියලා දෙදෙනා බොහොම බයවෙලා කෑ ගැසුවා:

''මෝඩයා නුඹ මොනවා කරනවා ද? ගෙට ගිනි තියන්ට හදනව ද?''

ඊට පහුවදා රජ තුමා සෙනවි වරුන්ට කුමාර වරුන්ට, වෙළෙන්දන්ට, පොහොසතුන්ට, දුප්පතුන්ට, මහල්ලන්ට, තරුණයින්ට, සියලු දෙනාටම රජගෙදර රජ බොජුන් සාදයකට එන්ට කියලා අණ කළා.

ඉවාන් ගේ අයියලා දෙදෙනාත් සාදයට යන්ට ලෑස්ති වුණා. ඉවාන් අයියලාට කතා කළා:

''අනේ මාවත් ගෙනියපල්ලා!''

''නුඹ වාගේ මෝඩයකු සාදයට ගිහිල්ලා මොනවා කරන්ට ද, මිනිස්සු හිනාවේවි! උදුන උඩට වෙලා නුඹ ගෙනා බිම්මල් උයාගෙන කාපන්.''

අයියලා දෙදෙනා අශ්වයින් පිට නැගලා ගියා. ඉවාන් පයින් ගමන් කළා. රජ ගෙදරට ඇවිල්ලා ඉවාන් මුල්ලක වාඩි වුණා. රජ තුමා ගේ දුව බොහොම ලස්සන කුමරිය මී පැණි වීදුරුවලට පුරවලා සාදයට ආ අයට බෙදා දෙනවා. මී පැණි දෙන ගමන් හොඳට නළල දිහා බලනවා පේරුස් මුද්දේ ලකුණ තියනව ද කියලා.

අවසානයේ දී ඉවාන් ළඟට ආවා. ඇගේ හදවත ගැහෙන්නට වුණා. ඉවාන් කුණු තවරා ගෙන ඉන්නවා. ඔහුගේ හිස කෙස් අවුල් වෙලා.





රජ කුමරිය ඉවාන්ගෙන් මෙහෙම ඇසුවා:

''නුඹ කවුද? කොහෙ ඉඳලද? නළල වටේ රෙදි පටියක් බැඳලා තියෙන්නේ මොකට ද?''

''නළල තුවාල වුණා.''

කුමරිය රෙදි පටිය ලිහා දැම්මා. එතකොට මුලු රජ මාලිගාවම ආලෝක වුණා.

''මෙන්න මා තැබූ ලකුණ. මේ තමා මගේ ආදරවන්තයා'' කුමරිය සතුටින් කෑ ගහලා කිව්වා.

රජතුමා ඇවිත් ඉවාන් දෙස බැලුවා.

''මොන ආදරවන්තයෙක් ද! කුණු තවරා ගෙන ඉන්න මෝඩයෙක්!''

''මට මූණ සෝදාගන්න අවසර දෙන්න!'' ඉවාන් රජ තුමාගෙන් ඉල්ලා හිටියා.

රජ තුමා අවසර දුන්නා. ඉවාන් මිදුලට ගිහිල්ලා තාත්තා උගැන්වූ විදිහට කෑ ගැසුවා.

''ඕ ගිරිං ගිරිං පුදුම අස්වයා මා ළඟට ඇවිත් හිටගනින්!''

කොහෙ ඉඳලද දන්නේ නැහැ අස්වයා දුවගෙන එනවා. මහ පොළොව දෙදරනවා. නහයෙන් කටින් ගිනි පිටවෙනවා. ඉවාන් අස්වයාගේ දකුණු කනින් රිංගලා වම් කනින් පිටවුණා. එවිට ඉවාන් බොහොම ලස්සන වුණා. හිතින් හිතා, ඇහින් බලා, අතින් ලියා ඉවර කරන්න බැරි තරම් දැන් ඉවාන් ලස්සනයි. මිනිස්සු ඉවාන්ව දැකලා පුදුම වුණා.

රජ තුමා සතුටු වෙලා කුමරිය ඉවාන්ට සරණ පාවා දී ලා රටින් බාගයක් තෑගි කළා.



හිම සීයා

බොහොම ඉස්සර කාලේ සීයා කෙනෙකුයි, ආච්චි කෙනෙකුයි හිටියා. ඒ ආච්චි සීයා ගේ දෙවැනි බිරිඳ. ඒ සීයාටත් දුවෙකු හිටියා, ආච්චිටත් දුවෙකු හිටියා. කුඩම්මලා ළඟ ජීවත්වීම අමාරු බව කවුරුත් දන්නවා. වැඩක් කළත් වැරදියි, නො කළත් වැරදියි. තමන්ගේ දුව මොනවා කළත් හොඳයි, ඇගේ හිස අත ගාලා ඈ හොඳ ළමයකු බව කියනවා.

කුඩම්මා ළඟ වැඩ කරන ගෑණු ළමයා උදේ හිරු පායන්නටත් ඉස්සෙල්ලා නැගිටලා එළදෙනුන්ට තණ කවලා, දර ගෙනැල්ලා, ලිපට දර දමලා, ගිනි මොළවලා, ගෙය සෝදලා ඉවර කළා... මැහැල්ල ඒත් ඒ දුවට කැමති නැහැ. මැහැල්ල ඒ ළමයාගෙ කුඩම්මා. ඈ කරන වැඩ වල ඇද පලුදු විතරයි මැහැල්ලට පෙනෙන්නේ.

සුළඟ වුනත් හඬ නගා හමනවා, පස්සේ සන්සුන් වෙනවා, ඒ වුණාට මැහැල්ලට තරහ ගියා ම, ඉක්මනට සන්සුන්වීමක් නැහැ. ඔන්න කුඩම්මා මේ ළමයාව විනාශ කරන්න උපායක් කල්පනා කළා.

''නාකියා, නුඹේ මේ කෙල්ලව මේ ගෙදරින් ඕනෑම තැනකට ගෙනියපන්. මගේ ඇසට පෙනෙන්ට තියන්ට එපා! කැලෑවට ගෙනියපන්, බොහොම තද සීතලට අසුවෙන්ට ගෙනියපන්.'' මැහැල්ල අණ කළා.

මහල්ලා දුක් වුණා, ඇඬුවා. කරන්ට වෙනත් දෙයක් නැහැ. මැහැල්ල

එක්ක තර්ක කරන්ට බැහැ. අස්වයින්ව හිම යානයට බැන්දා.

"සුන්දර දුවේ, හිම යානයට නැගපන්." මහල්ලා අසරණ ළමයාව කැලෑවට ගෙනගියා. නත්තල් ගහක් යට හිම ගොඩකට ඇයව ආලා යන්ට ගියා.

ළමයා නත්තල් ගහ යට වාඩි වෙලා සීත හන්දා වෙවුලන්නට වුණා. ඇඟ බොහොම සීතල වෙලා ගැහෙන්නට පටන් ගත්තා. මායාකාර හිම සීයා සීත වැඩි කරනවා. සීත උහුලාගන්ට බැරුව නත්තල් ගහේ අතු ශබ්දයක් ඇති කළා. හිම සීයා ගහේ අතු වලට තට්ටු කරන්ට පටන් ගත්තා. ළමයා වාඩිවෙලා ඉන්න අත්ත ළඟට හිම සීයා ඇවිත් ළමයාගෙන් ඇසුවා:

"නුඹට රස්නෙ ද ළමයෝ?" කියලා.

"රස්නෙයි, හිම සීයේ, රස්නෙයි."

මායාකාර හිම සීයා පහළ අතුවලට ගිහින් ඒවාට තට්ටු කළා. සීත වැඩිවෙලා ශබ්ද ඇතිවුණා.

"ළමයෝ නුඹට රස්නෙ ද? ලස්සන ළමයෝ නුඹට රස්නෙ ද?"



ඈ බොහොම අමාරුවෙන් පිළිතුරු දුන්නා:

"රස්නෙයි, හිම සීයේ, රස්නෙයි."

හිම සීයා පහළ බැහැලා තව තවත් සීත වැඩි කළා. දූන් නම් බොහොම සීතයි.

"ළමයො නුඹට රස්නෙ ද? ලස්සන ළමයො නුඹට රස්නෙ ද? හුරතල් කෙල්ලේ නුඹට රස්නෙ ද?" හිම සීයා ඇහුවා.

සීත හන්දා ළමයා ගල් ගැහෙන්ට පටන් අරගෙන. දූන් ඇයට පුළුවන් දිව සොළවන්ට විතරයි.

"ඔව්. රස්නෙයි, හොඳ සීයේ!" ළමයා කිව්වා.

එවිට මායාකාර හිම සීයා උණුසුම් හිම කබායක් ළමයා ගේ ඇඟට අන්දවලා ඇය උණුසුම් කළා. වූලන් සලුවකින් ඇය එතුවා.

කුඩම්මා ළමයා මළයි කියා හිතාගෙන මළබත උයන්ට ලෑහැස්ති වුණා. ඈ, ළමයා ගේ තාත්තාට කතා කරලා මෙහෙම කිව්වා:

"ඒයි, නාකියා, නුඹගේ දුව දූන් මැරිලා ඇති. වළලන්ට මළ මිනිය අරගෙන වරෙන්."

කැලෑවට ගිය මහල්ලා, තමා ගේ දුවව අතහැර දමා ගිය තැනට ආවා. ලොකු නත්තල් ගහක් යට ඔහුගේ දුව වාඩිවෙලා ඉන්නවා. ඈ බොහොම වටිනා, බොහොම හොඳ හිම කබායක් ඇඳගෙන සතුටින් ඉන්නවා. ඈගේ මුහුණ රතු පාටයි. ඈගේ කන්වල රත්රන් අරුංගල්, කරෙහි රත්රන් මාල, අත්වල රත්රන් සහ රිදී වළලු. ඈ ළඟ වටිනා තෑගි වලින් පිරුණු පෙට්ටියක්.

මහල්ලා බොහොම සතුටු වෙලා, තෑගි පෙට්ටිය හිම යානයේ තැබුවා. දුව හිම යානයට නංවා ගත්තා. හිම යානය දක්කා ගෙන ගෙදර ගියා.

ගෙදර කුඩම්මා මළ බත උයනවා. බල්ලා මේසය යට ලැගලා ඉන්නවා.

"හව්, හව්, මහල්ලා ගේ දුව රත්රන්, රිදී පොරොවාගෙන එනවා. මැහැල්ල ගේ දුවට මනාලයෙක් හොයා ගන්ට බැරිවෙනවා." බල්ලා බුර බුරා කීවා.

මැහැල්ල බල්ලාට රොටියක් දීලා මෙහෙම කීවා:

"බල්ලෝ ඔහොම බුරන්ට එපා! මෙහෙම කියාපන්: මැහැල්ල ගේ දුව ගන්ට මනාලයෙක් ඇවිල්ලා මහල්ලා ගේ දුව ගේ ඇට කටු ගෙනල්ලා."

බල්ලා රොටිය කාලා නැවත බිරුවා. "හව්, හව්, මහල්ලා ගේ දුව රත්රන්, රිදී පොරොවාගෙන එනවා. මැහැල්ල ගේ දුවට මනාලයෙක් හොයා

ගන්ට බැරිවෙනවා.''

මැහැල්ල තවත් රොටියක් බල්ලාට දීලා, ඌට පහරක් ගැහුවා. බල්ලා ඉස්සෙල්ලා කී දේ නැවත කීවා.



ඔන්න ගෙවැටේ දොර ඇරගෙන, ගෙදර දොරත් ඇරගෙන මහල්ලා ගේ දුව ආවා රිදී, රත්රන් අරුංගල්, මාල, වළලු ඈ ඇඳලා හිටියා. ඇගේ තාත්තා ඈට තෑගි ලැබුණු තෑගි පෙට්ටිය උස්සාගෙන ආවා. තෑගි පෙට්ටිය බොහොම බරයි. මැහැල්ල මෙය දකලා පුදුම වුණා...

:''ඒයි නාකියා, හිම යානයට වෙනත් අස්පයකු බැඳපන්. මගේ දුවව එහි නංවාගෙන, ඉස්සෙල්ලා නුඹේ දුව ගෙනගිය තැනටම ගෙනියපන්...'' මැහැල්ල මහල්ලාට කිව්වා.

මහල්ලා මැහැල්ල ගේ දුවව හිම යානයට නංවා ගෙන, තමා ගේ දුව හිටිය තැන ලොකු නත්තල් ගහ යට හිම ගොඩට ගෙනගොස් ඇය ඇරලුවා.

සීත නිසා මැහැල්ල ගේ දුව වෙවුලන්ට පටන් ගත්තා.

මායාකාර හිම සීයා සීත වැඩි කර කර ගස් වලට තට්ටු කර කර හැම තැනම යනවා. ඔහු මැහැල්ල ගේ දුව දිහා බලා කතා කළා.

''ළමයෝ නුඹට රස්නෙ ද?''

''අනේ නැහැ. මට බොහොම සීතයි. හිම සීයේ සීත වැඩි කරන්ට එපා...''

හිම සීයා පහළට බැහැලා තවත් සීත වැඩිකලා. සීත උහුලා ගන්නට බැරිව ගස් පුපුරන්නා වගේ හඬක් ඇති වුණා.

''ළමයෝ නුඹට රස්නෙ ද? ලස්සන කෙල්ලේ නුඹට රස්නෙ ද?''

''අපොයි නැහැ අත පය හිරි වැටිලා. හිම සීයේ පලයන් යන්ට, පලයන්.'' මැහැල්ල ගේ දුව කීවා.

හිම සීයා තවත් පහළ බැහැලා සීත වැඩි කරලා මෙහෙම ඇසුවා:

''ළමයෝ නුඹට රස්නෙ ද? ලස්සන කෙල්ලේ නුඹට රස්නෙ ද?''

''අපොයි, නැහැ. සීත හන්දා මා ගල්ගැහිලා! නපුරු හිම සීයේ නුඹට හෙණ හතක් වදින්ට ඕන!'' කියලා මැහැල්ල ගේ දුව මායාකාර හිම සීයාට බැණවැදුනා.

හිම සීයා බොහොම තරහ වෙලා සීත තවත් බොහොම වැඩි කළා. සීත උහුලා ගන්ට බැරිව මැහැල්ල ගේ දුව මළා.

පසු ආ එළිය වැටුණු හැටියේම මැහැල්ල මහල්ලාට කතා කළා:

''ඒයි නාකියා, ඉක්මනට අස්පයො හිම යානයට බැඳපන්. මගේ දුවයි, ඇට තෑගි ලැබුණු රත්රන්, රිදී බඩුයි අරගෙන වරෙන්...''

මහල්ලා ගියා. බල්ලා, මේසය යටට වෙලා බුර බුරා මෙහෙම කිව්වා.

''හව්, හව් මහල්ලා ගේ දුව ගන්ට මනාලයෙක් ඒවි, මැහැල්ල ගේ දුවගේ ඇට කටු මල්ලක් ආගෙන ඒවි.''

මැහැල්ල බල්ලාට මස් රොටියක් දුන්නා:

''බල්ලා මෙහෙම කියාපිය! මැහැල්ල ගේ දුව රිදී, රත්තරන් පොරවාගෙන එනවා...''

බල්ලා ඉස්සෙල්ලා කී දේ නැවත කිව්වා.

''හව්, හව්. මැහැල්ල ගේ දුව ගේ ඇටකටු මල්ලක් ආ ගෙන ඒවි...''

ගෙවැටේ දොර හරින හඬක් ඇසුණා. මැහැල්ල දුව පිළිගන්නට ඉස්සරහට ආවා. හිම යානය වහලා තිබුණ පැදුර ඈ ඉවත් කළා. දුව ගේ මළ කඳ හිම යානයේ තිබෙනවා ඈ දැක්කා.

මැහැල්ල මර හඬ දී හැඬුවා. එහෙත් පමා වුණා වැඩියි.



නීල කොබෙයියා

එකෝමත් එක රටක රජකෙනෙක් හිටියා. එයා තනිකඩයෙක්. එයාට බිසවක් හිටියේ නැහැ. මේ රජු ළඟ සේවය කළා දුනු ශිල්පියෙක්. ඔහුගේ නම අන්ද්රේ.

දවසක් දා අන්ද්රේ දඩයම් කරන්ට කැලයට ගියා. දවස තිස්සේ ම කැලෑව පුරා ඇවිද්දා. දඩයමට සතකු හොයාගන්නට බැරිවුණා. හවස් වුණා ම ඔහු ආපහු ගෙදර යන ගමන් කනගාටු වුණා. ඔන්න හිටි හැටියේම ගහක අත්තක උඩ කොබෙයියකු වහලා ඉන්නා හැටි ඔහු දැක්කා.

"මේ කොබෙයියාට හරි විදින්න ඕන." ඔහු කල්පනා කළා.

දුන්න අරගෙන ඊයක් අමුනලා විද්දා. කොබෙයියා ඊ පහර කා ගෙන ගහෙන් බිමට වැටුනා. අන්ද්රේ ඌව අරගෙන උගේ බෙල්ල කඩලා දඩයම් මල්ලට දමන්න ලැහැස්ති වුණා.

එතකොට කොබෙයියා මිනිහෙක් වගේ කතා කළා:

"අන්ද්රේ දුනු ශිල්පියා මාව මරන්ට එපා. මාව පණ පිටින් ගෙදර ගෙනියපන්. ජනේලය ළඟ තියලා ඇති කරපන්. මම නිදි කිරා වැටෙනකොට මට දකුණු අත දිගපැරලා පාරක් ගහපන්. එතකොට නුඹට වාසනාව ළඟා වේවි."

මිනිහකු වගේ කතා කරන කොබෙයියාව දැකලා අන්ද්රේ පුදුම වුණා. බලන කොට කුරුල්ලකු වගෙයි, කතා කරනවා මිනිහකු වගේ. කොබෙයියාව



ගෙදර ගෙනියලා ජනේලය ළඟ තැබුවා. ඌ නිදි කිරා වැටෙන තුරු බලා ගෙන හිටියා.

ටික , වේලාවක් ගත වුණා. කොබෙයියා බෙල්ල අත් තටුව යට හංගාගෙන නිදියගන්ට පටන් ගත්තා. කොබෙයියාගේ කීම මතක් වෙලා අන්ද්රේ දකුණු අත දිග හැරලා ඌට පහරක් ගැසුවා. කොබෙයියා බිම වැටිලා කුමාරිකාවක් වුණා. ඇගේ නම මාර්යා. ඈ බොහොම ලස්සනයි. එතරම් ලස්සන අය ඉන්නවයි කියලා හිතාගන්නවත් බැහැ. කතන්දර වල විතරයි එතරම් ලස්සන අය ඉන්නෙ.

මාර්යා රජ කුමරිය දුනු ශිල්පියාට කතා කළා:

''මාව අල්ලාගන්ට ඔයාට පුළුවන් වුණා. දැන් ඉතින් මාව ඔයා ළඟම

තියාගන්න. ඉක්මනට ඔයා මාව සරණ පාවා ගන්න. ඔයාට අවංක, හොඳ බිරිඳක් වෙන්නම්.''

දෙදෙනාම කැමතිවුණා. අන්ද්‍රේ දුනු ශිල්පියා මාර්යා කුමාරිව සරණ පාවා ගෙන හොඳින් ජීවත් වෙනවා. රාජ කාරිය ගැන අමතක කරන්නේ නැහැ. හිමිදිරි පාන්දර කැලේට ගිහිල්ලා සතුන් දඩයම් කරලා රජ ගෙදර කුස්සියට බාර දෙනවා.

අන්ද්‍රේ සහ මාර්යා කුමරිය ඔහොම ටික කලක් ජීවත් වුණා.

''අන්ද්‍රේ ඔයා බොහොම දුප්පත්'' මාර්යා කුමරිය දවසක් කියනවා.

''ඔව්. ඇත්ත.''

''කොහොම හරි රූබල් සියයක් විතර හොයා ගන්න, පට නූල් මිලදී ගන්න. මම ඔයාට ඉතුරු හරිය කර දෙන්නම්.''

කුමරිය ගේ කීම අහලා අන්ද්‍රේ යාලුවන් ගෙන් සල්ලි ණයට අරගෙන පට නූල් බිරිඳට ගෙනත් දුන්නා.

''අන්ද්‍රේ ඔයා දැන් නිදාගන්න. රෑට නැති නුවණ උදේට පහළ වෙනවා.'' පටනූල් අරගෙන කුමරිය කිව්වා.

අන්ද්‍රේ නිදා ගන්ට ගියා.

මාර්යා කුමරිය පලසක් වියන්ට පටන් ගත්තා. එතරම් ලස්සන පලසක් කවදාවත් වියලා නැහැ. රටේ තියෙන හැම දෙයක්ම ඒ පලසෙහි තියෙනවා: නගර, ගම්, කැලෑ, ගංගා, අහසේ පියාසර කරන කුරුල්ලෝ, කැලෑවේ කඳුවල ජීවත් වන සත්තු, මුහුදේ ඉන්න මාළුවෝ, ඉර, හඳ පායලා.

උදේ පාන්දර මාර්යා කුමරිය පලස අන්ද්‍රේ අතට දුන්නා.

''මේ පලස අරගෙන කඩ පොළට යන්න. පොහොසත් වෙළෙන්දන්ට එය විකුණන්න. මිලක් ඉල්ලන්ට එපා. දුන්න දෙයක් අරගෙන එන්න.''

පලස අරගෙන අන්ද්‍රේ කඩ පොළට ගියා.

එක් වෙළෙන්දෙක් පලස දැකලා දුවගෙන ආවා:

''මේ අහපන් යාළුවා මේ පලසට නුඹ කීයක් ඉල්ලනවද?''

''නුඹ වෙළෙන්දෙක්. නුඹම මිල නියම කරපන්.''

වෙළෙන්දා කල්පනා කළා, කල්පනා කළා. මිල නියම කරන්ට බැහැ. තවත් වෙළෙන්දෝ රැස් වුණා. ඔහොම මහ ගොඩක් වෙළෙන්දෝ රැස් වුණා. පලස දිහා බලනවා. පුදුම වෙනවා. මිලක් නියම කරන්ට බැහැ.

මේ වෙලාවේදී රජුගේ ඇමතියා ඒ ළඟින් ගියා. වෙළෙන්දෝ රැස්වෙලා

ඉන්නා හැටි දැකලා, ඒ ගැන හොයා බලන්ට ඔහු කල්පනා කළා. ඔහු රියෙන් බැහැලා සෙනඟ පීරාගෙන ඇවිල්ලා කතා කළා:

"ආයුබෝවන් වෙළෙන්දෙනි, පිටරට සිට ආ අමුත්තෙනි, මොකද මෙතැන රැස්වෙලා?"

"මෙන්න බොහොම අපූරු පලසක්, මිලක් නියම කරන්ට බැරිව අපි කල්පනා කරනවා."

රජුගේ ඇමතියා පලස දැකලා බොහොම පුදුම වුණා.

"දුනු ශිල්පියා නුඹ මට ඇත්ත කියාපන්. මේ ලස්සන පලස නුඹ කොහෙන් ද ලබා ගත්තේ?"

"මගේ බිරිය මෙය වියලා දුන්නා."

"නුඹ මේ පලසට කීයක් ඉල්ලනවද?"

"මම දන්නේ නැහැ. මිල නියම කරන්ට එපයි කියලා බිරිය කීවා. දෙන ගණනක් ගන්ට කිව්වා."

"දුනු ශිල්පියා මෙන්න නුඹට රුබල් දහදාහක්."

අන්ද්‍රේ පලස ඇමතිට දීලා සල්ලි අරගෙන ගෙදර ගියා. ඇමතියා පලස අරගෙන රජ ගෙදරට ගිහිල්ලා එය රජුට පෙන්නුවා.

රජතුමා පලස අරගෙන බලා පුදුම වුණා. රටේ තියෙන හැම දෙයක්ම පලසෙහි තියෙනවා.


"ඇමතිය, නුඹට ඕන දෙයක් දෙන්නම්, පලස විතරක් ඉල්ලන්ට එපා!"

රජතුමා රුබල් විසිදාහක් ඇමතිට දීලා පලස අරගත්තා. ඇමතියා සල්ලි අරගෙන මෙහෙම කල්පනා කරනවා. "කමක් නැහැ. ඔයිට වැඩිය හොඳ පලසක් මම වියන්ට කියන්නම්."

ඇමතියා රියට නැගලා අන්ද්‍රේ දුනු ශිල්පියා ඉන්න කුඩා ගෙය හොයාගෙන ගිහිල්ලා, දොරට තට්ටු කලා. මාර්යා කුමරිය දොර හැරියා. ඇමතියා එක පයක් ගේ ඇතුළට තැබුවා. අනිත් පය දොරින් එපිට. ආ කාරණය ගැන ඔහුට අමතක වුණා. කුමරිය කියන්ට බැරි තරම් ලස්සනයි, ඇස් ඇරගෙන අවුරුදු සීයක් වුණත් ඇගේ ලස්සන දිහා බලාගෙන ඉන්නට පුළුවනි.

මාර්යා කුමරිය ඇමති ආපු කාරණය ගැන කියන තුරු බලාගෙන හිටියා.

ඇමතියා ගල් ගැහිලා වගේ ඇය දෙස බලාගෙන ඉන්නවා. කුමරිය ආපහු හැරිලා දොර වැසුවා. ඇමතිට සිහිය ආවේ ඉන් පසුවයි. ඔහු බො-



හොම අමාරුවෙන් ගෙදර ගියා. එදා සිට ඔහු කෑවත්, බීවත්, ආවත්, ගියත්, හැම තිස්සේම ධුනු ශිල්පියාගේ බිරිය ගැන හිතන්නට වුණා.

ඇමතිගේ අමුතු හැසිරීම ගැන රජු දකලා ඔහුගෙන් තොරතුරු ඇසුවා.

එවිට ඇමතියා රජුට මෙහෙම කිව්වා:

"අනේ රජ්ජුරුවන් වහන්ස. මම ධුනු ශිල්පියාගේ බිරිඳව දැක්කා. ඒ වේලාවේ සිට මම ඇය ගැන විතරයි හිතන්නේ. දැන් මට කන්නත් බෑ. බොන්නත් බැහැ. මොනවා කළත් ඇයව අමතක කරන්න බැහැ."

ධුනු ශිල්පියාගේ බිරිය බලන්ට යන්ට රජුට ආසා හිතුනා. රජු නිකම් මිනිහකු වගේ ඇඳගෙන, ධුනු ශිල්පියා ගේ ගෙය හොයා ගෙන ගිහිල්ලා දොරට තට්ටු කළා. මාර්යා කුමරිය දොර ඇරියා. රජු එක පයක් ගේ ඇතුළට තියලා, අනික් පය මිදුලේ තබා ගෙන, ඇය දිහා බලාගෙන ඉන්නවා. ගල් ගැහුණ වගේ, ඇගේ ලස්සන රූපය දිහා බලාගෙන ඉන්නවා.

මාර්යා කුමරිය බලා හිටියා. ආ මිනිහා කතා කරයි කියලා. ඔහු කතාවක් නැතුව ඇය දිහා බලාගෙන ඉන්නවා. කුමරිය ආපහු හැරිලා දොර වැහුවා. රජුගේ හදවත රිදෙන්නට වුණා: "මම මොකද මෙච්චර කල් තනිකඩයෙක් වෙලා හිටියෙ? මා දැක්ක ලස්සන ගැහැණිය සරණ පාවා ගන්ට ඕන. ධුනු ශිල්පියා ගේ බිරිය වෙන්ට ඇට ඉඩදීමට බැහැ. ඇය රජ බිසවක් වෙන්ට ම ඕන." රජු කල්පනා කළා.

රජු බොහොම අමාරුවෙන් මාලිගාවට ආවා. ධුනු ශිල්පියා ගේ බිරිය තමාට අයිතිකරගන්ට ඕනෑ කියලා ඔහු සිතුවා. රජු ඇමතිට අඬගහලා මෙ-හෙම කිව්වා:

"අන්ද්රේ ධුනු ශිල්පියා ගේ බිරිය මට ඕනෑ කියලා ඔහුට දන්වන හැටියක් ගැන කල්පනා කරපන්. උපායක් කල්පනා කළොත් නුඹට නගර, ගම්, රත්තරන් තෑගි දෙනවා. කල්පනා නො කොළොත් නුඹේ හිස ගසා දමනවා."

ඇමතිට බොහොම කනගාටුයි. ධුනු ශිල්පියාට කීමට උපායක් කල්පනා කළා, කළා. බැරිවුණා. කනගාටුව නිසා ඔහු වයින් ටිකක් බොන්ට තැබෑ-රුමකට ගියා.

වැරහැලි ඇඳුමක් ඇඳගෙන සිටි පිනට තැබෑරුම්වලින් බොන මිනි-හෙක් ඉදිරියට ආවා.

"අපේ මහ රජුගේ ඇමති තුමනි! ඔබතුමා කනගාටුවෙන්නේ මොක ද?"

''පලයන්, පලයන්, යන්ට.''

''ඔබ තුමා මාව එළවන්ට එපා. මට වයින් වීදුරුවක් අරන්දෙන්න. එතකොට මම ඔබ තුමාට හොඳ උපායක් කියා දෙන්නම්.''

ඇමති තුමා වයින් වීදුරුවක් ඒ මිනිහාට අරගෙන දීලා, තමාගේ දුක ඔහුට කිව්වා.

''අන්ද්‍රේ දුනු ශිල්පියාට ඔය ගැන දන්වීම අමාරු වැඩක් නො වෙයි. මිනිහා බොහොම චාම්. එයා ගේ ගෑනි කපටියි. ඈට උදව් කරන්ට බැරි වැඩක් අපි අන්ද්‍රේට බාර කරමු. ඇමති තුමා රජ්ජුරුවන් වහන්සෙට කියන්ඩ අන්ද්‍රේට මෙහෙම කියන්ට කියලා, මගේ පිය මහ රජතුමාගේ දුක සැප දැනගන එන්ට අන්ද්‍රේ නුඹ එලොව පලයන්. අන්ද්‍රේ යන්ට ම යාවි. ආපහු එන්නේ නැහැ.'' ඒ මිනිහා ඇමතිට කියා දුන්නා.

ඇමතියා ඒ මිනිහාට ස්තුති කරලා රජු ළඟට එක පිම්මට දිව්වා. ගිහින් උපාය ගැන රජුට කීවා.

අන්ද්‍රේව එලොව යවන්ට ඕන කියලා ඔහු රජුට දැන්නුවා. රජතුමා බොහොම සතුටුවෙලා අන්ද්‍රේ ගෙන්වලා ඔහුට අණකළා...

''අන්ද්‍රේ නුඹ මට බොහොම හොඳට අවංකව සේවය කළා. නුඹ-ගෙන් මම තව සේවයක් බලාපොරොත්තු වෙනවා. නුඹ එලොව ගිහිල්ලා, එහි ඉන්න මගේ පිය රජතුමා ගේ සුව දුක් දැනගෙන වරෙන්. මෙය නො කොළොත් මම නුඹේ හිස ගසා දමනවා...''

අන්ද්‍රේ ගෙදර ගිහිල්ලා බොහොම කනගාටුවෙන් බංකුවක් උඩ වාඩිවෙලා හිටියා. මාර්යා කුමරිය ඔහු ළඟට ආවා.

''ඔයා මොකද කනගාටුවෙන් ඉන්නේ? ඔයාට විපතක් සිදු වුණාද?'' ඈ ඇසුවා.

රජුගේ නියමය ගැන අන්ද්‍රේ ඈට කිව්වා.

''ඕකත් වැඩක් ද, ඕක බොහොම පොඩි වැඩක්. ලොකු වැඩ පසුවට ඇතිවෙයි. දැන් ඔයා නිදාගනින්. රෑට නැති නුවණ උදේට පහළ වේවි.'' මාර්යා කුමරිය මෙහෙම කියලා අන්ද්‍රේව සැනසුවා.

උදේ පාන්දර අන්ද්‍රේ නැගිට්ට හැටියේම මාර්යා කුමරිය රුළං විස්-කෝත්තු මල්ලකුයි, රත්රන් මුද්දකුයි ඔහුට දුන්නා:

''ඔයා රජු ඉදිරියට ගිහිල්ලා මේ ගමනට ඔයාත් එක්ක යන්ට ඇමතියත් එන්ට ඕනයි කියලා කියන්න. නැතිනම් ඔයා එලොව ගියාට සාක්කි කාර-



යෝ නැති නිසා ඒක විශ්වාස නොකරාවි කියලා කියන්න. ඇමතියත් එක්ක ගමනට පිටත් වුණු හැටියම රත්තරන් මුද්ද වීසි කර ලා යන්න. ඔයාට ඕන තැනට මුද්ද ඔයාව ගෙනයා වි.''

අන්ද්‍රේ විස්කෝතු මල්ලයි, මුද්දයි අරගෙන, බිරියගෙන් සමුගෙන ගමනට සාක්කිකාරයකුව ඉල්ලා ගන්ට රජතුමා ළඟට ගියා. අන්ද්‍රේ මාර්යා



කුමරිය කී විදිහටම රජතුමාට කියා හිටියා. රජතුමාට සිද්ද වුණා, ඔහුගේ ඇමතියාව අන්ද්රේත් සමග එලොවට යවන්නට.

ඔන්න ඉතින් දෙදෙනාම ගමනට පිටත් වුණා. අන්ද්රේ මුද්ද වීසිකළා. එය රෝදයක් වගේ කරකැවී යන්ට පටන් ගත්තා. විශාල කැලෑ, මඩ ගොහොරු බිම්, තණ පිට්ටනි හරහා මුද්ද ගියා. ගංගා සහ පොකුණු හරහා මුද්ද පීනුනා. අන්ද්රේ ඇමතියාවත් ඇදගෙන මුද්ද පස්සෙන් යනවා.

දෙදෙනාම මහන්සි වුණා ම, වාඩිවෙලා විස්කෝතු කාලා ආයෙමත් ගමනට පිටත් වෙනවා.

ඔහොම ගිහිල්ලා, ගිහිල්ලා මේ දෙදෙනා බොහොම අඳුරු කැලෑවකට ආවා. එතන මහා විසාල වළක් ළඟ රත්රන් මුද්ද නැවතුනා.

එතන වාඩිවෙලා දෙදෙනා ම විස්කෝතු කෑවා. වළ ළඟින් යක්කු දෙදෙනෙක් කරත්තයක් අක්කනවා. කරත්තය ඇදගෙන යන්නේ අන්ද්-රේලා ගේ රජු ගේ පියරජ. ඔහු බොහොම මහලුයි. එක යකෙක් වම් පැත්-



තෙන් මහලු රජුට කෙවිටකින් අනිනවා. අනික් යකා ඔහුට දකුණු පැත්තෙන් පහර දෙනවා.

"ඔන්න, බලපන් මේ අපේ රජතුමා ගේ පිය රජතුමා නේද?" අන්ද්‍රේ ඇසුවා.

"නුඹ හරි. ඔහු දර අදිනවා." ඇමතියා කීවා.

අන්ද්‍රේ යකුන්ට කතා කළා:

"යක් රාළහාමිලාට ආයුබෝවන්! මට අපේ මහලු රජතුමා ගෙන් තොරතුරු ටිකක් දැන ගන්ට ඕන. එයාව පොඩ්ඩකට නිදහස් කරන්න."

"ඇයි බන් මිනිහෝ එතකොට කවුද දර අදින්නේ, අපිද?"

"ඒ වැඩේ අපේ ඇමති ගෙන් කරවා ගන්න පුළුවනි."

යක්කු දෙදෙනා මහලු රජුව කරත්තෙන් ලිහලා, ඇමතියාව කරත්තෙට බැඳලා ඔහුට පහර දී, දී වැඩ ගත්තා.

අන්ද්‍රේ මහලු රජතුමා ගෙන් දුක සැප ඇසුවා.

"අනේ අන්ද්‍රේ දුනු ශිල්පියා මම බොහොම දුක් විඳිනවා. මගේ පුතාට මගෙන් සුබ පැතුම් බාර දීපන්. රට වැසියන්ට කරදර කරන්ට එපා කියලා මම ඔහුට අණකළ බව කියපන්. නැතිනම් ඔහුටත් මට වගේම දුක් විඳින්ට සිද්ද වේවි." මහලු රජ කීවා.

එතකොටම යක්කු දෙදෙනා හිස් කරත්තෙ අරගෙන ආවා. අන්ද්‍රේ මහලු රජ යකුන්ට බාරදීලා ඇමතියාවත් අරගෙන ආපහු තම රටට ගියා.

තමන්ගේ රටට ඇවිත් රජ ගෙදරට ඇතුළු වුණා. රජ දුනු ශිල්පියා දැකලා බොහොම තරහයෙන් කෑ ගැසුවා:

"නුඹ කොහොම ද එලොව ගිහින් මෙලොව ආවේ?"

"එහෙමයි, රජ්ජුරුවන් වහන්ස! එලොව ගිහිල්ලා ඔබ තුමාගේ පිය රජතුමා සමග කතා කළා. පිය රජතුමා එලොව දුකින් පසුවෙනවා. රටවැසියන්ට කරදර කරන්ට එපයි කියලා ඔබ තුමාට ඔබේ පියතුමා දැන්නුවා." අන්ද්‍රේ රජතුමාට කීවා.

"නුඹ එලොව ගිහිල්ලා මගේ පියරජතුමාව දැක්කයි කියලා ඔප්පු කරන්නේ කොහොම ද?"

"ඔබ තුමා ගේ ඇමතියා ගේ පිට දෙපැත්තේ කෙවිටි පහර වල ලකුණු ඇති. ඒ කෙවිටි පහර ගැහුවේ යකුන් දෙදෙනෙක්."

ඇමතියා අන්ද්‍රේ ගේ කතාව ඇත්ත කියලා කිව්වා. රජුට කරන්ට

කිසිවක් නැහැ. අන්ද්රේට ගෙදර යන්ට අවසර වුන්නා. ඔහු ගියාට පස්සෙ රජ ඇමතිට ආයෙමත් කතා කරලා මෙහෙම කීවා:

"අන්ද්රේ ගේ බිරිය මට ඕන කියලා ඔහුට අන්වන උපායක් කල්පනා කරපන්. නැතිනම් නුඹේ හිස ගහලා දමනවා."

ඇමතියා හිතේ කනගාටුව හන්දා වයින් වීදුරුවක් බොන්ට තැබෑරුමට ගියා. පුටුවක වාඩි වෙලා වයින් වීදුරුවක් ඉල්ලුවා. ඔහු ළඟට තැබෑරුම්වල පිනට බොන මිනිහා දුවගෙන ආවා.

"මොකද අද අපේ ඇමතිතුමා කනගාටුවෙන් ද? මටත් වයින් වීදුරු-වක් අරන් දෙන්න, මම ඔබට යස උපායක් කියා දෙන්නම්."

ඇමතියා පිනට බොන තැබෑරුම් කාරයට වයින් වීදුරුවක් අරන් දීලා ඔහුට තමා ගේ දුක ගැන කිව්වා. තැබෑරුම් කාරයා වයින් බීලා ඇමති-යාට මෙහෙම කියනවා:

"ඔබ වහාම රජගෙදරට ගිහිල්ලා මෙහෙම කියන්න: රටවල් තිස් අටක් පහු කරගෙන තිස් නව වෙනි රටට ගිහින්, ඒ රටේ ඉන්න නිදි මන්-තරකාර පූසාව අල්ලාගෙන එන්ටයි කියලා වුනු ශිල්පියාට අණ කරන්න කියන්න..."

ඇමතියා සතුටුවෙලා රජ ගෙදරට දුවගෙන දුවගෙන ගිහිල්ලා උපාය ගැන රජුට කීවා, රජ අන්ද්රේට එන්ටයි කියලා අණ කළා:

"අන්ද්රේ නුඹ මට සේවයක් කළා. දැන් තවත් සේවයක් කරපන්. තිස්නව වෙනි රටට ගිහිල්ලා ඒ රටේ ඉන්න නිදි මන්තරකාර පූසාව අල්ලා ගෙන වරෙන්. නැතිනම් නුඹේ හිස ගහලා දමනවා."

අන්ද්රේ බොහොම කනගාටුවෙලා ගෙදර ගිහින් මාර්යා කුමරියට රජුගේ නියමය ගැන කීවා.

"ඒක කනගාටුවෙන්ට කරුණක් තමා! ඒ වුණාට එය බොහොම පොඩි වැඩක්. ලොකු වැඩ පසුවට. ගිහින් නිදාගන්න. රෑට නැති නුවණ උදේට පහළ වෙනවා!" මාර්යා කුමරිය කීවා.

මාර්යා කුමරිය යකඩ කම්මල් කාරයා ළඟට ගිහිල්ලා, කම්මල් බාස්ලට කියලා යකඩ හිස්වැසුම් තුනකුයි, යකඩ අඬුවකුයි, රිටි තුනකුයි හදවා ගත්තා. එක රිටක් යකඩ, අනික් රිට තඹ, තුන් වැනි රිට ටීයම්.

පහුවදා උදේ පාන්දර මාර්යා කුමරිය අන්ද්රේට කතා කළා:

"මෙන්න ඔයාට හිස්වැසුම් තුනකුයි, රිටි තුනකුයි, අඬුවකුයි, මේවාත්

අරගෙන ඔයා තිස් නව වැනි රටට යන්න. ඒ රටේ ගව් තුනක් යනකොට නිදිමත හැදේවි. ඔයා නිදා ගන්ට එපා. නිදි මන්තරකාර පූසා ඔයාව නිදි කරන්ට හදනවා. ඇත් දෙපැත්තට වීසි කර, කර කකුල් අද්ද අද්දා යන්න. ඉඳ හිටලා පෙරලි, පෙරලී යන්න ඔයා නිදා ගත්තොත් නිදි මන්තරකාර පූසා ඔයාව මරා දමාවි.''

මොනව කළ යුතු ද, කොහොම කළ යුතු ද කියලා මාර්යා කුමරිය අන්ද්‍රේට උගැන්නුවා.

අන්ද්‍රේ රටවල් තිස් අටක් පහුකර ගෙන තිස්නව වැනි රටට ඇවිල්ලා, ගව් තුනක් යනකොට, ඔහුට නිදිමත හැදුණා. අන්ද්‍රේ යකඩ හිස්වැසුම් තුන හිසෙහි දමාගෙන, අත් දෙපැත්තට වීසි කර, කර, දෙපා අද්ද, අද්දා යනවා, පෙරලි පෙරලී යනවා.

කොහොම හරි නිදිමත නැති කර ගත්තා.

අන්ද්‍රේ උස කණුවක් ළඟට ආවා.

නිදි මන්තරකාර පූසා අන්ද්‍රේව දැකලා කණුව උඩ ඉඳලා ඔහුගේ ඔළුවට පැන්නා. එක හිස්වැස්මක් කැඩුණ. දෙවැනි හිස්වැස්මත් කැඩුණා. පූසා තුන්වැනි හිස්වැස්ම කඩන්ට ලැස්ති වෙනකොට, අන්ද්‍රේ ඌව යකඩ අඬුවෙන් අල්ලා ගත්තා. අන්ද්‍රේ ඌට යකඩ රීටෙන් ගහන්ට පටන් ගත්තා. යකඩ රීට කැඩුණා. අන්ද්‍රේ තඹ රීටෙන් ඌට ගැහැව්වා. තඹ රීටත් කැඩුණ. ඊට පස්සෙ ඊයම් රීටෙන් ගහන්ට පටන් ගත්තා.

ඊයම් රීට කැඩෙන්නෙ නැහැ. නැමෙනවා විතරයි. නිදි මන්තරකාර පූසා ගේ පිටි කොන්ද වටේ රීට එතුනා. අන්ද්‍රේ පූසාට පහර දෙනවා. පූසා අන්ද්‍රේට නින්ද යන්නට කතන්දර කියන්ට පටන් ගත්තා: ඌ පූජකයින් ගැන, අන්නව් රාළලා ගැන, පූජකයින් ගේ දූවරුන් ගැන කතන්දර කිව්වා. අන්ද්‍රේ උගේ කතන්දර අහන්නේ නැතුව ඌට පහර දුන්නා.

පූසාට බොහොම රිදෙනවා. අන්ද්‍රේව නිදි කරවන්ට බැරි බව ඌට තේරුණා. ඌ බැරිම තැන අන්ද්‍රේට කන්නලව් කළා:

''මාව අතහැර දාපන්. හොඳ මනුස්සයෝ. මම නුඹට ඕන උදව්වක් කරන්නම්.''

''නුඹ මාත් එක්ක එනව ද?''

''ඕන තැනකට එන්නම්.''

අන්ද්රේ නිදි මන්තරකාර පූසාවත් අර ගෙන ආපහු ගියා. තම රටට ගිහිල්ලා රජු ඉදිරියේ පෙනී හිටියා.

"රජ තුමනි! ඔබ තුමා ගේ අණ අනුව නිදි මන්තරකාර පූසාව ගෙනාවා" අන්ද්රේ කිව්වා.

රජ බොහොම පුදුම වුණා.

"නිදි මන්තරකාර පූසා නුඹේ හපන්කම් පෙන්නපන්" රජ අණ කළා.

ඔන්න පූසා නියපොතු මුවහත් තියන්නට පටන් ගත්තා. මොකටද දන්නව ද රජුගේ පපුවට කඩා පැනලා ඔහු ගේ හදවත එළියට ගන්ට.

රජ බයවුණා.

"අනේ අන්ද්රේ මේ පූසාව සන්සුන් කරපන්" රජු ඉල්ලා හිටියා.

අන්ද්රේ පූසාව සන්සුන් කරලා උං කූඩවක ආලා වහලා ගෙදර ගියා. ලස්සන, තරුණ මාර්යා කුමරියත් සමග අන්ද්රේ ජීවත් වෙනවා. රජුට මාර්යා කුමරියව කොහොමටවත් අමතක කරන්ට බැහැ. ඔහු ආයෙමත් ඇමතිට මෙහෙම කිව්වා:

"කොහොම හරි මට මාර්යා කුමරියව ඕන. අන්ද්රේට ඒ ගැන කියන්ට උපායක් කල්පනා කරපන්. නැත්නම් නුඹේ හිස ගහලා දමනවා."

ඇමතියා ආයෙමත් වයින් බොන්ට තැබෑරුමට ගියා. වැරහැළි ඇඳගත්, තැබෑරුම්වලින් පිනට බොන මිනිහා එතන හිටියා. ඇමතියා ඔහු ළඟට ගිහිල්ලා වයින් වීදුරුවක් අරන් දීලා ඔහු ගෙන් උදවු ඉල්ලුවා. ඒ මිනිහා වයින් වීදුරුවක් බීලා කට පිසදාලා මෙහෙම කිව්වා:

"රජතුමා ළඟට ගිහිල්ලා මා කියන විදිහට කියාපන්. අන්ද්රේ දුනු ශිල්පියාව නැති රටට යවලා, නැති දෙයක් ගෙනෙන්ට කියලා ඔහුට අණ කරන්න කියාපන්."

ඇමතියා බොහොම සතුටුවෙලා රජ ගෙදරට දුවගෙන ගිහිල්ලා ඔහු ගේ උපාය ගැන රජුට කිව්වා. රජ අන්ද්රේ ගෙන්වා ගත්තා.

"නුඹ මට ලොකු සේවයන් දෙකක්ම කළා. තවත් සේවයක් කරන්න ඕන. නැති රටට ගිහිල්ලා නැති රටෙන් නැති දෙයක් ගෙනෙන්. මගේ අණ ඉටු කළොත් නුඹට තෑගි දෙනවා. නැතිනම් හිස ගහලා දමනවා."

අන්ද්රේ ගෙදර ගිහිල්ලා බංකුව උඩ වාඩිවෙලා අඬන්ට පටන් ගත්තා. මාර්යා කුමරිය ඔහුගෙන් ඇහුවා:



"මගේ ආදරනීය අන්ද්රේ ඔයා මොක ද අඬන්නේ. විපතක් සිදු වුණා ද?"

"අනේ සුන්දර කුමරිය ඔයාගේ උදවු නිසා මම රජුට සේවය කළා. ඔයා ගේ ලස්සන රූපය නිසා තමා මේ කරදර. නැති රටකින් නැති දෙයක් ගෙනෙන්ට කියලා රජ තුමා මට අණ කළා."

"හැබෑටම ඒක තමා නියම රාජ කාරිය. කමක් නැහැ ඔයා ගිහින් නිදාගන්න. රෑට නැති නුවණ උදේට පහළ වෙනවා."

මාර්යා කුමරිය පොතක් අර-ගෙන කියවන්නට පටන් ගත්තා. මුල ඉඳලා අගටම කියැව්වා. නැති රටක් ගැන තොරතුරු ඒ පොතේ නැහැ. ඈ පොත විසිකරලා හිස බදා ගත්තා. මාර්යා කුමරිය ගෙයි පිළිකන්නට ගිහිල්ලා ලේන්සුවක් වැනුවා. එත-කොට ලෝකයේ ඉන්න කුරුල්ලෝ සහ සත්තු එතැනට ආවා.

මාර්යා කුමරිය ඔවුන්ගෙන් නැති රටක් ගැන තොරතුරු ඇහුවා.

"කැලෑවේ ඉන්න සතුනි, අහ-සේ පියාසර කරන කුරුල්ලෙනි, නුඹ-ලා යනවා, හැම තැනම පියාසර කර-නවා. නැති රටට යන්නේ කොහොම ද? නැති රටෙන් නැති දෙයක් ගේන්-නේ කොහොම ද?"

"මාර්යා කුමරියනි, ඒ වගේ

රටක් ගැන අපි කවදාවත් අහලා නැහැ.'' සත්තු සහ කුරුල්ලෝ පිළිතුරු දුන්නා.

මාර්යා කුමරිය ආයෙමත් ලේන්සුව වැනුවා විතරයි සත්තුයි, කුරුල්ලොයි අතුරු දහන් වුණා. ඈ තවත් වරක් ලේන්සුව වැනුවා. ඇය ඉදිරිපිට යෝධයින් දෙදෙනෙක් පෙනී හිටියා.

''අඩ ගැහුවේ මොකද? උවමනා මොනවද?''

''මගේ හිතවත් සේවකයිනි මාව මහා සාගරය මැදට ගෙනියපල්ලා.''

යෝධයෝ දෙදෙනා මාර්යා කුමාරිව උස්සා ගෙනැ මහා සාගරය මැදට ගියා. ඔවුන් දෙදෙනා මාර්යා කුමරිය උස්සා ගෙනැ සාගරය මැද කණු වගේ හිටගෙන හිටියා. මාර්යා කුමරිය ලේන්සුව වැනුවා විතරයි, මහ මූදේ ඉන්න මාළුවොයි, මූදු සත්තුයි ආවා.

''මගේ ආදරනීය මාළුවෙනි, මුහුදු සතුනි, නුඹලා මූදුවලයි, සාගරවලයි පීනනවා. නුඹලා නැති රටට යන හැටි දන්නේ නැද්ද, නැති රටින් නැති දෙයක් ගෙනෙන හැටි දන්නේ නැද්ද?''

''මාර්යා කුමරියනි අපි එහෙම රටක් ගැන අහලා නැහැ.''

මාර්යා කුමරිය බොහොම දුක්වුණා. ඇයව ගෙදර ගෙනියන්ට කියලා යෝදයින්ට කිව්වා. යෝදයෝ දෙදෙනා ඇය උස්සාගෙන අන්ද්රේ ගේ ගෙදරට ගෙනල්ලා එළිපත්ත උඩ තැබුවා.



උදේ මාර්යා කුමරිය අන්ද්රේව නැගිට්ටවලා ඔහුට නූල් බෝලයකුයි, තුවායකුයි දුන්නා:

''ඔයා ගමනට පිටත් වෙලා මේ නූල් බෝලය විසි කරන්න. එය යන තැනට ඔයත් යන්න. යන හැම තැනදීම මූණ හෝදන්න. අනුන් ගේ තුවාය පාවිච්චි කරන්ට එපා. මගේ තුවාය විතරක් පාවිච්චි කරන්න.''

අන්ද්රේ මාර්යා කුමරිය ගෙන් සමුගෙන හතර පැත්තටම වැඳලා

ගමනට පිටත් වුණා. නූල් බෝලය විසි කළා. නූල් බෝලය යන පාර දිගේ ඔහුත් ගියා.

ඔන්න ඔහොම ඉතින් නූල් බෝලය යන මග දිගේ අන්ද්‍රේ යනවා. රට, රටවල් පහුකර ගෙන යනවා. නූල් බෝලය අන්ද්‍රේට මග පෙන්වනවා. නූල් බෝලය එන්ට, එන්ටම කුඩා වුණා. දැන් ඒක කුකුළෙකු ගේ ඔළුවක් තරම් පුංචියි. තවත් දුර යන කොට නූල් බෝලය නො පෙනෙන තරම් පුංචි වුණා... අන්ද්‍රේ දැන් හිටගෙන ඉන්නේ කුකුල් කකුල් උඩ තියෙන පොඩි ගෙයක් ඉදිරිපිට. ඒක කැරකැවෙනවා.

"පුංචි ගෙය, පුංචි ගෙය, කැලෑවට පිටු පා, මට මූණ ලා හිටගනින්."

අන්ද්‍රේ ගෙට ඇතුළු වුණා. ඒ ගෙයි ඇතුළේ බොහොම වයසක මැහැල්ලක් ලොම් වලින් නූල් කටිනවා.

"අපොයි, අපොයි, මිනිස් ගඳයි මිනිස් ගඳයි. දැන් මගේ ගෙදරට මිනිහෙක් ඇවිල්ලා. මම ඒ මිනිහව මරලා බැදගෙන කාලා, ඔහුගේ ඇට කටු උඩ නටනවා." මැහැල්ල කිව්වා.

"බාබායිගා යකින්න, නුඹ මොනවා කියනව ද, රට රටවල් ගානේ ඇවිද්ද මගේ ඇඟ පතේ කුණු ගොඩයි. ඉස්සෙල්ලා නුඹ වතුර උණු කරලා මාව නාවලා, පස්සෙ මාව කාපන්" කියලා අන්ද්‍රේ ඇට කිව්වා.

බාබායිගා යකින්න අන්ද්‍රේට නාන්ට වතුර උණු කළා. අන්ද්‍රේ උණු වතුර නාලා මාර්යා කුමරිය දුන් තුවායෙන් ඇඟ පිහදාන්ට පටන් ගත්තා.

"නුඹට කොයින්ද ඔය තුවාය? ඔය තුවාය මගේ දුවටයි අයිති." බාබායිගා යකින්න ඇහුවා.

"නුඹේ දුව මගේ බිරිඳ. ඇය තමා මේ තුවාය මට දුන්නේ."

"අනේ මගේ හොඳ බෑණා! නුඹට සත්කාර කරන්නේ කොහොම ද?"

බාබායිගා යකින්න කෑම මේසය පිළියෙල කළා. වයින් සහ මී පැණි ගෙනාවා. අන්ද්‍රේ ආඩම්බර කම් නැතුව මේසයට ඉඳ ගෙන කෑවා, බීවා. බාබායිගා යකින්න මාර්යා කුමරිය ගැන විපරම් කළා. කසාද බැඳලා හොඳින් ජීවත් වෙනවද කියලා ඇසුවා. අන්ද්‍රේ සියලු විස්තර ඇට කීවා. රජ තුමා නැති රටින් නැති දෙයක් ගේන්ට කියලා අණ කළ හැටි ත් ඇයට කීවා.

"අනේ නැන්දම්මේ මට උදවු කරන්න!"

"බෑණෝ මම නැති රට ගැන උපන්තේකට අහලා නැහැ." බාබායිගා යකින්න කිව්වා.



''ඔය ගැන දන්න ගෙම්බෙක් ඉන්නවා. උං අවුරුදු තුන්සීයක් තිස්සේ මඩ ගොඩේ ඉන්නවා... දැන් ඉතින් කමක් නැහැ. රෑට නැති නුවණ උදේට පහළ වෙනවා. නුඹ දැන් නිදාගනින්.''

අන්ද්‍රේ නිදාගත්තා. බාබායිගා යකින්න ඉපල් දෙකක් අරගෙන ගෙම්බාව හොයාගෙන අහසින් ගියා. මඩ ගොහොරුවට ගිහිල්ලා ගෙම්බාට කතා කළා:

''වයසක ගෙම්බා තවම ඉන්නවද?''

''ඉන්නවා.''

''කරුණාකරලා මා ළඟට එන්න.''

මහලු ගෙම්බා එළියට ආවා.

''නුඹ දන්නවද නැති රට ගැන. නැති රටේ නැති දේ ගැන?'' බාබායිගා යකින්න අහනවා.

''දන්නවා.''

''කරුණාකරලා නැති රටට යන යන පාර පෙන්නාපන්. මගේ බෑණාට එහි යන්නට රජ්ජුරුවෝ අණ කරලා. නැති රටින් නැති දෙයක් ගේන්ට ඕන කියලා ඔහුට රජා අණ කරල තියෙනවා.''

''මම ඔහුට පාර පෙන්වන්නම්. මම දැන් බොහොම මහලුයි. මට පනින්ට බැහැ. පිරිසුදු එළ කිරිවල ආලා මාව ගිනි ගඟ ළඟට ගෙනියන්ට කියලා නුඹේ බෑණාට කියාපන්. එතැනදී මම ඔහුට කියා දෙන්නම්.''

බාබායිගා යකින්න ගෙම්බාව අරගෙන ගෙදර ගිහිල්ලා එළදෙනගෙන් මුට්ටියකට කිරි දොවලා, ගෙම්බාවත් ඒ මුට්ටියට දැම්මා. උදේ පාන්දර අන්ද්‍රේව කුද්දලා ඔහුට බාබායිගා යකින්න මෙහෙම කිව්වා:

''බෑණෝ නැගිටපන්, මේ කිරි මුට්ටියේ ගෙම්බා ඉන්නවා. උංව අරගෙන මගේ අස්පයා පිට නැගලා ගිනි ගඟ ළඟට පලයන් අස්පයාට යන්ට ඉඩ දීලා ගිනි ගඟ ළඟදී ගෙම්බාව කිරි බඳුනෙන් එළියට ගනින්. ගෙම්බා නුඹට ඕන දේ කියාදේවි.''

අන්ද්‍රේ ඇඳගෙන කිරි මුට්ටියත් අරගෙන අස්වයා පිට නැග්ගා. අස්වයා බොහොම වේගයෙන් දුවලා, දුවලා ගිහිල්ලා ගිනි ගඟ ළඟට ආවා. ගිනි ගඟ හරහා කිසිම සතෙකුට පනින්ට බැහැ. ගඟට උඩින් කිසිම කුරුල්ලෙකුට පියාඹන්ට බැහැ.

අන්ද්‍රේ අසු පිටින් බැස්සා විතරයි ගෙම්බා ඔහුට කතා කළා:

"තරුණයා මාව එළියට ගනින්, අපට ගහ හරහා යන්ට ඕන."

අන්ද්‍රේ ගෙම්බාව කිරි බඳුනෙන් එළියට අරගෙන බිම තැබුවා.

"තරුණයා නුඹ මගේ පිට උඩ නැගපන්."

"අනේ නුඹ බොහොම පුංචියි, මම නැග්ගොත් නුඹ පොඩි වී යාවි."

"නුඹ බයවෙන්ට එපා. මගේ පිටඋඩ නැගලා හයියෙන් අල්ලා ගනින්."

අන්ද්‍රේ උගේ පිටඋඩ නැග්ගා විතරයි, ඌ පිම්බෙන්ට පටන් ගත්තා. ඌ පිම්බිලා, පිම්බිලා ලොකු පිදුරු ගොඩක් තරම් ලොකු වුණා.

"නුඹ මාව හයියෙන් අල්ලාගෙන ඉන්නව ද?"

"ඔවු. ඔවු."

ගෙම්බා ආයිමත් පිම්බිලා, පිම්බිලා පොඩි කන්දක් තරම් ලොකුවුණා.

"නුඹ මාව හයියෙන් අල්ලාගෙන ඉන්නව ද?" ගෙම්බා ඇහුවා.

"ඔවු. ඔවු."

ගෙම්බා අයෙමත් පිම්බෙන්ට පටන් ගත්තා. ඔහොම පිම්බිලා, පිම්බිලා, පිම්බිලා ලොකු කන්දක් තරම් විසාල වුණා. ඌ දැන් ලෝකෙ තියෙන උසම ගහට වඩා උසයි. ගෙම්බා එක පිම්මට ගිනි ගහ හරහා පැන්නා. ගහෙන් එහාට පැන්නට පස්සෙ ඌ ආයෙමත් පොඩි ගෙම්බෙක් වුණා.

"තරුණයා ඔය අඩිපාර දිගේ පලයන්. ඔහොම යනකොට ගෙයක් පෙනේවි. ගෙයක් කියල කියන්නන්, මඩුවක් කියල කියන්නත් බැහැ. නුඹ එතැන උඳුන ළඟ හිටගනින්. නැති රටේ නැති දෙය එතනදි ලැබේවි." ගෙම්බා කීවා.

අන්ද්‍රේ අඩිපාර දිගේ ගියා. ඔන්න තියෙනවා ගෙයක් වගේ මඩුවක්. නැහැ, මඩුවක් වගේ ගෙයක්. එය වටේට වැටක්. ඒ ගෙදරට පිළිකන්නක් නැහැ. ජනේල නැහැ. අන්ද්‍රේ ඒ ගෙදර උඳුනට මුවා වෙලා හිටියා.

ටික වේලාවක් ගත වුණා. කැලෑව පැත්තෙන් සද්දයක් ඇහෙනවා. දිග නියපොතු ඇති, වැළමිට ළඟට යටි රැවුලක් ඇති මිනිහෙක් එනවා. ඔහු ඇවිත් කෑ ගැසුවා: "ඒයි, නවුම් මස්සිනා. බඩ ගිනියි කෑම දීපන්."

කොහේ ඉඳලද අන්නේ නැහැ. එකපාරටම මේසයක් මතුවුණා. මේසය උඩ බීර පීප්පයකුයි, තෙලෙන් තම්බපු ලොකු හරකෙකුයි. තම්බපු හරකාගේ ඇඟට පිහියක් ඇනලා තියෙනවා. යටි රැවුළා මේසය ළඟ වාඩිවෙලා මස් කෑලි වලට කපලා සුඳුළූනුත් එක්ක කෑවා. කන ගමන් පුරසාරම් දොඩවනවා.

හරකාගේ මස් ඔක්කොම කාලා බීර පීප්පයම බිව්වා.

"නවුම් මස්සිනා මේසය අස් කරපන්." යටි රැවුලා කී හැටියේම මෙසය අතුරුදහන් වුණා.

එතැන මස්කටු, හිස් බීර පීප්පය කිසිම දෙයක් තිබුණේ නැහැ... ඔක්කොම අතුරුදහන් වුණා. යටි රැවුලා යනතුරු අන්ද්‍රේ හැංගිලා හිටියා. අන්ද්‍රේ උදුන මුල්ලේ ඉඳලා එළියට ඇවිත් බය නැතුව මෙහෙම කිව්වා:

"ඒයි, නවුම් මස්සිනා මට කෑම දීපන්!"

කිව්ව හැටියේම, කොහෙ ඉඳලද දන්නේ නැහැ කෑම බීම මහ ගොඩකුත් එක්ක මේසයක් දිස්වුණා. මේසය උඩ කෑම විතරක් නොවෙයි, වයින් තියෙනවා, මී පැණි තියෙනවා.

අන්ද්‍රේ මේසයට වාඩි වුණා.

"නවුම් මස්සිනා. මාත් එක්ක මේසයට වාඩිවෙලා කාපන්, බීපන්." අන්ද්‍රේ කිව්වා.

නොපෙනෙන මිනිහා ඔහුට පිළිතුරු දුන්නා:



''නුඹට බොහොම ස්තුතියි. නුඹ බොහොම කරුණාවත් මිනිහෙක්. මම අවුරුදු කීයක් තිස්සේ සේවය කරනවද, මට පාන් වාටියක් වත් දුන්නේ නැහැ. නුඹ මට මේසයට වාඩිවෙලා කෑම කෑමට අඬ ගැසුවා.''

අන්ද්‍රේට කට හඬ ඇහෙනවා. කතා කරන මිනිහා ගේ රූපය පේන්නේ නැහැ. මේසය උඩ තියෙන කෑම ජාති ඉක්මනින් අඩුවෙන හැටි පේනවා. වයින් ඉබේටම වීදුරුවට වත් කරනවා. නොපෙනෙන මිනිහා ඒවා බොනවා. වයින් අඩුවෙන හැටි විතරයි පෙනෙන්නේ. බොන හැටි පෙනෙන්නේ නැහැ.

''නවූම් මස්සිනා මා ඉදිරියේ පෙනී හිටපන්.'' අන්ද්‍රේ ඉල්ලා හිටියා.

''මාව කාටවත් පේනේනේ නැහැ. මම තමයි නැති දේ.''

''නවූම් මස්සිනා නුඹ මට සේවය කරන්ට ලෑස්ති ද?''

''අකැමැති වෙන්ට කාරණයක් තියෙනව ද? නුඹ බොහොම හොඳ මනුස්සයෙක් බව පේනවා.''

දෙදෙනාම කෑවා, බීවා.

''නවූම් මස්සිනා දැන් ඉතින් නුඹගේ බඩුත් අරගෙන මාත් සමග ගමනට පිටත් වෙමු.''

අන්ද්‍රේ ගමනට පිටත් වුණා:

''නවූම් මස්සිනා නුඹ මෙතැනද?''

''ඔවු. ඔවු. මම මෙතන. මම නුඹව අත්හැරලා යන්නේ නැහැ. නුඹ බයවෙන්ට එපා.'' නොපෙනෙන මිනිහා කියන හැටි අන්ද්‍රේට ඇහුණා.

අන්ද්‍රේ ගිනි ගඟ ළඟට ආවා. එතැන ඔහු එනතුරු ගෙම්බා බලාගෙන ඉන්නවා.

''කොහොම ද නැති දේ හොයාගත්ත ද?''

''ඔවු. හොයාගත්තා.''

''මගේ පිටඋඩ නැගපන්.'' ගෙම්බා අන්ද්‍රේට කීවා.

ගෙම්බා කන්දක් විතර ලොකුවන තුරු පිම්බිලා, ගිනි ගඟෙන් එගොඩට එක පිම්මට පැන්නා.

අන්ද්‍රේ ගෙම්බාට බොහොම ස්තුති කරලා තමා ගේ රටට යන්නට පිටත් වුණා. ඔහු ගිහිල්ලා, ගිහිල්ලා පස්ස හැරීලා කතා කරනවා.

''නවූම් මස්සිනා නුඹ මෙතැනද?''

''මම මේ නුඹ ළඟමයි. නුඹ බයවෙන්ට එපා! නුඹ අතහැර ආලා මම යන්නේ නැහැ.''

අන්ද්‍රේ යනවා, යනවා, යනවා. ඔහුගේ දෙපා වලට බොහොම මහන්සියි. ඇත්වලට බොහොම තෙහෙට්ටුයි.

''අනේ, අනේ, මට කොතරම් මහන්සිද!'' අන්ද්‍රේ තමාටම කියාගත්තා.

''නුඹ ඇයි මට ඉස්සෙල්ලා නොකීවේ? මම නුඹව ඉක්මනට ගෙනියන්නම්.'' නොපෙනෙන නවූම් මස්සිනා ඔහුට කිව්වා.

අන්ද්‍රේ හිටිහැටියේම අහසින් යන්ට පටන් ගත්තා. කඳු, කැලෑ, නගර සහ ගම් කුඩාවට පෙනෙනවා. අන්ද්‍රේ නිල්පාට මහ මුහුදට උඩින් පියාසර කළා. ඔහුට බය හිතුණා.

''නවූම් මස්සිනා මට පොඩ්ඩක් විවේක ගන්න ඕන!''

අන්ද්‍රේ ඉබේටම පාත වැටෙන්නට පටන් ගත්තා. මූදට ළං වෙන කොට මහ මූද මැද පොඩි දූපතක් තියෙනවා. එතන මාලිගාවක්. මාලිගාවේ වහළ රත්රන්. මාලිගාව වටේ ලස්සන මල් වත්තක්. නොපෙනෙන මිනිහා අන්ද්‍රේට මෙහෙම කීවා:

''නුඹ විවේක ගනින්, කාපන්, බීපන්. මූද දිහා බලපන්. මේ දූපත ළඟින් වෙළඳ නැව් තුනක් යාවි. ඒ නැව් තුනේ වෙළෙන්දන් තුන්දෙනාට අඬ ගහපන්. ඒගොල්ලන්ට හොඳට කන්ට, බොන්ට දීපන්. ඒගොල්ල ළඟ තියෙනවා වටිනා දේවල් තුනක්. නුඹ ඒවා තුනට මාව හුවමාරු කර ගනින්. නුඹ බයවෙන්ට එපා. මම ආපහු නුඹ ළඟටම එනවා.''

ඔන්න ඔහොම අන්ද්‍රේ මාලිගාවට වෙලා මුහුද දිහා බලාගෙන ඉන්නකොට, වෙළඳ නැව් තුනක් ආවා. මාලිගාවේ රත්තරන් වහලයි, ලස්සන මල් වත්තයි දැකලා වෙළෙන්දෝ පුදුම වුණා.

''මේක හරිම පුදුමයක් නේද? අපි මෙතැනින් කී පාරක් ගියා ද, මෙතන කිසිම දූපතක් තිබුණේ නැහැ. අපි මාලිගාවට යමු!'' වෙළෙන්දෝ කීවා.

නැව් තුන නැංගුරම් ආලා නවත්වලා වෙළෙන්දෝ තුන්දෙනා පුංචි බෝට්ටුවකින් දූපතට ආවා. අන්ද්‍රේ මේ තුන්දෙනාව පිළිගන්ට ඉදිරියට ආවා.

''කරුණාකරලා මාලිගාවට එන්න.''

වෙළෙන්දෝ මාලිගාව බලනව, රත්රන් වහල දිහා බලනවා. මල්



වත්තේ ලස්සන කුරුල්ලෝ ගී ගයනවා. ලස්සන මූව පැටවුන්, හාවුන් දුවනවා.

''ඔබට මේ තරම් ලස්සන මාලිගාවක් හැදුවේ කවු ද?'' වෙළෙන්දෝ ඇහුවා.

''මගේ යාළුවා නවූම් මස්සිනා මේ සේරම එක රෑට හැදුවා.''

අන්ද්රේ වෙළෙන්දන්ව මාලිගාවට ගෙනාවා.

''නවූම් මස්සිනා මේ අයට කන්ට බොන්ට ඕන. ලෑහැස්ති කරන්න.''

ඔන්න හිටි හැටියේම ලොකු මේසයක් පුරා කෑම බීම ජාති තියෙනවා. වෙළෙන්දෝ පුදුමවෙලා කට ඇරගන බලාගෙන ඉන්නවා.

''අපි අපේ ළඟ තියෙන ඕනෑම දෙයකට නුඹේ නවූම් මස්සිනාව හුවමාරු කරගන්න කැමතියි'' කියලා වෙළෙන්දෝ කීවා.

''හුවමාරු කරගන්නේ මොනවාට ද? නුඹලා ළඟ තියෙන දේ මොනවා ද?''

එක වෙළෙන්දෙක් මන්තර පොල්ලක් පෙන්නුවා:

''මේක පුදුම පොල්ලක්. ඔය මිනිහට ගහපිය කියලා කී හැටියම පොල්ල



ඇඩි බිඩි ගාලා ඕනෑම මිනිහකුට පහර දෙනවා. ඕනෑම චන්ඩියෙකු ගේ ඇට කටු කඩාවි.''

අනිත් වෙළෙන්දා පොරොවක් අරගෙන, පොරොවේ මිට උඩට හරවලා මෙහෙම කිව්වා.

''පොරොව වැඩ පටන් ගනින්.'' පොරොව පට පට ගාලා දර පලලා ලස්සන නැවක් හැදුවා. පට පට ගාලා තවත් නැවක් හැදුවා. ඒ නැවේ රුවල් තියෙනවා. කාල තුවක්කු තියෙනවා. නැව ඇතුළෙ පණ ඇති නාවිකයෝ වැඩ කරනවා. නැව් මුහුදේ යනවා. කාල තුවක්කු වෙඩි තියනවා නිර්භීත නාවිකයෝ වැඩ කරනවා.

පොරොවේ මිට පහළට හැරෙව්වා විතරයි, නැව්, නාවිකයෝ සියලු දේම අතුරුදහන් වුණා.

තුන්වෙනි වෙළෙන්දා සාක්කුවෙන් බට නළාවක් අරගෙන වාදනය



කළා. යුද්ධ හමුදාවක් ආවා. අසරු හමුදාවකුයි, පාබල හමුදාවකුයි ආවා. යුද අවි, කාලතුවක්කු අරගෙන හමුදාව ගමන් කරනවා. යුද්ධ සංගීත ඇහෙනවා. කොඩි ලෙලදෙනවා. අසරු බටයෝ යුද්දෙට සැරසෙනවා.

නළාවේ අනිත් කොනින් වාදනය කළා විතරයි හමුදාව, අශ්වයෝ, යුද අවි සේරම අතුරුදහන් වුණා.

අන්ද්‍රේ වෙළෙන්දන්ට කතා කළා:

''නුඹලා ළඟ තියෙන දේ හොඳයි. නමුත් මගේ යාළුවා මට බොහොම වටිනවා. පොල්ලයි, පොරොවයි, නළාවයි තුනම මට දෙනවානම් මම නුඹලාට මගේ යාළුවාව බාර දෙන්නම්.''

''නුඹ බොහොම වැඩියෙන් ඉල්ලනවා නේද?'' වෙළෙන්දෝ ඇහුවා.

''කැමැති නැතිනම් අපි මේ කතාව නවත්වමු.''

වෙළෙන්දෝ කල්පනා කරලා, කරලා තීරණය කළා: ''අපිට මො-

කටද පොල්ලයි, පොරොවයි, නළාවයි. නවූම් මස්සිනාව ලබාගත්තොත් අපිට කිසි කරදරයක් නැතිව හොඳට කාලා, හොඳට බීලා ඉන්ට පුළුවනි.''

නැව් අයිතිකාර වෙළෙන්දෝ තුන් දෙනා අන්ද්රේට පොල්ලයි, පොරොවයි, නළාවයි තෑගි දුන්නා. ඒ ගොල්ල නොපෙනෙන මිනිහට කතා කළා:

''නවූම් මස්සිනා අපි නුඹ අයිති කර ගත්තා. නුඹ අප සමග වරෙන්! නුඹ අපට කීකරුව සේවය කරනව ද?''

ඔන්න එතකොට නොපෙනෙන මිනිහාගේ කට හඬ ඇහෙනවා:

''සේවය කරන්ට මොකද බැරි? කා ළඟ හිටියත් කාට සේවය කළත් මට එකයි!''

වෙළෙන්දෝ තුන් දෙනා නැව්වලට ඇවිල්ලා නවූම්ට කියලා කෑම, බීම ගෙන්වා ගෙන කන්ටයි, බොන්ටයි පටන් ගත්තා. බීලා වෙරිවෙලා කෑ ගහනවා:

''නවූම් මස්සිනා තවත් බීම, තවත් බීම ගෙනෙන්!''

වෙළෙන්දෝ තුන් දෙනා බීලා බීලා හොඳටම වෙරිවෙලා වැටුණ තැන ගොරව, ගොරවා නිදා ගත්තා.

අන්ද්රේ මාලිගාවට වෙලා කනගාටු වුණා.

''අනේ, අනේ, මගේ හොඳ යාළුවා නවූම් මස්සිනා දැන් කොහිද?''

''මම මෙතැන. නුඹට මොනවාද ඕන?'' නොපෙනෙන මිනිහා ඇහුවා.

අන්ද්රේ බොහොම සතුටු වුණා.

''මට දැන් මගේ රටට යන්ට, මගේ සුන්දර බිරිය ළඟට යන්ට වේලාව හරි නේද? මාව ගෙදර ගෙනියන්න.''

ඔන්න ආයෙමත් අන්ද්රේ ඉබේටම අහසින් යන්නට ගත්තා. ඔහු තමාගේ රටට ගියා.

බීලා වෙරිවෙලා නිදා ගත්තු වෙළෙන්දෝ නැගිටලා ආයෙමත් බීම ඉල්ලන්ට වුණා.

''ඒයි නවූම් මස්සිනා අපිට කෑම-බීම විගහට ගෙනෙන්!''

කොහේ ද, නොපෙනෙන මිනිහා අහලකවත් හිටියේ නැහැ. දූපතත් නැහැ. මාලිගාවත් නැහැ. එතැන මුහුද විතරයි. රැළි නගන හඬ විතරයි. නැව් අයිතිකාර වෙළෙන්දෝ කනගාටු වුණා. ''අර නපුරු මිනිහා අපව රැවටුවා!'' කරන්ට දෙයක් නැහැ. ඒ ගොල්ලා නැව් පදවාගෙන යන්ට ගියා.

අන්ද්රේ දුනු ශිල්පියා අහසින් ඇවිල්ලා ගෙදරට පාත් වුණා, එතැන ගෙයක් නැහැ, ගේ වෙනුවට ගින්නට අහුවෙලා කළු පාට වුණු යකඩ පයිප්පයක් විතරයි ඉතිරි වෙලා තිබුණේ.

අන්ද්රේ බොහොම කනගාටු වෙලා, නගරයේ ඉඳලා මහ මුහුද අයිනේ පාළු තැනකට ගිහිල්ලා කල්පනා කළා. කොහේදෝ ඉඳලා නිල්පාට කොබෙයියෙක් පියාඹාගෙන ඇවිත්, අන්ද්රේ ළඟ බිම වැටිලා එකපාරටම ලස්සන කුමාරියක් බවට පත්වුණා. ඒ තමා මාර්යා කුමරිය.

දෙදෙනාම සිප ගත්තා. වැළඳ ගත්තා. තම තමාට වුණු දේ ගැන කතා කරන්නට වුණා.

"ඔයා ගෙදරින් පිට වී ගිය දා ඉඳලා මම නිල්පාට කොබෙයියෙක් වෙලා පියාසර කරනවා. රජ්ජුරුවෝ මට එන්ටයි කියලා පණිවුඩ තුනක්ම එවුවා. මාව අල්ලන්ට ආවා. මා හිටියේ නැහැ. රජුගේ සේවකයෝ අපේ ගෙයට ගිනි තැබුවා." මාර්යා කුමරිය කිව්වා.

"නවුම් මස්සිනා, මූද ළඟ මේ පාළු ඉඩමේ නුඹට බැරිද මාළිගාවක් හදන්නට." අන්ද්රේ නොපෙනෙන මිනිහා ගෙන් ඇහුවා.

"බැරි මොකද? මේ දැන් වහාම හදන්නම්."

මොහොතක් ගියේ නැහැ ලස්සන මාලිගාවක්. රජුගේ මාලිගාවටත් වඩා හොඳයි. මාලිගාව වටේට මල් වත්තක්. ගස් උඩ ලස්සන කුරුල්ලෝ ලැගලා ඉන්නවා. ලස්සන මුව පැටවු හාපැටවු වත්ත හැමතැනම දුවනවා.

අන්ද්රේ මාර්යා කුමරිය ගේ අතින් අල්ලාගෙන මාලිගාව ඇතුළට ගියා. මේ දෙදෙනා ජනේලයක් ළඟ වාඩිවෙලා සිප ගන්නවා, ආදර බස් කියනවා, හුරතල් කරනවා. ඔහොම සැපෙන් සතුටෙන්, මාස දෙකක්, තුනක්ම කල් ගත කළා.

ඒ අතර රටේ රජ්ජුරුවෝ දඩයම් කරන්ට මුහුද ළඟ කැලෑවට ආවා. ඉස්සර පාළු ඉඩමේ දැන් මාලිගාවක් තියෙනවා දැකලා රජුට තරහ ආවා:

"කොයි ආඩම්බර කාරය ද මගෙන් අවසර නැතුව මෙතන මාලිගාවක් හැදුවේ?"

රජුගේ මෙහෙකාරයෝ මාලිගාව ළඟට ගිහින් හොයා බැලුවා. ආපහු ඇවිත් රජුට ඒ ගැන කිව්වා. ඒ මාලිගාව අන්ද්රේ දුනු ශිල්පියා හදලා තියෙන්නේ. එතන ඔහු මාර්යා කුමරිය සමග ජිවත් වෙනවා.

ඒ වතාවේ රජුට බොහොම තරහ ආවා. ''අන්ද්රේ නැති රටට ගිහිල්ලා නැති රටින් නැති දේ ගෙනාවද කියලා හොයා දැනගෙන වරෙල්ලා'' රජ මෙහෙකරුවන්ට අණ කළා.

මෙහෙකරුවෝ ගිහිල්ලා විපරම් කරලා ඇවිත් රජුට දන්වනවා:

''රජ්ජුරුවන් වහන්ස අන්ද්රේ දුනු ශිල්පියා නැති රටට ගිහිල්ලා නැති දේ අරගෙන ඇවිත් ඉන්නවා.''

ඒ පාර රජාට තවත් තරහ ගියා. වහාම මුහුදු වෙරළට ගිහිල්ලා මාලිගාව විනාශ කරලා අන්ද්රේවයි, මාර්යා කුමරියවයි අල්ලා අස වද දීලා මරා දමන්ට කියලා රජ හමුදාවට නියම කළා.

රජුගේ යුද්ද හමුදාව මාලිගාව විනාස කරන්ට එන හැටි අන්ද්රේ දැක්කා. ඉක්මනට පොරාව අතට අරගෙන මිට ඉහළට හරවලා මෙහෙම කිව්වා: ''හදපන් නැවක්. හදපන් නැව් දෙකක්. හදපන් නැව් සීයක්.'' කිව්ව හැටියේම පොරොව නැව් සීයක් හැදුවා. ඒවා දැන් මුහුදේ ගමන් කරනවා.





අන්ද්රේ බට නළාව අරගෙන වාදනය කළා. අස්ව හමුදාවන් ආවා. පාබල හමුදාවන් අවි ගෙනාවා, කාල තුවක්කු ගෙනාවා, යුද කොඩි ගෙනාවා.

සෙනවිවරු අන්ද්රේ අණදෙන තුරු බලා ඉන්නවා. අන්ද්රේ යුද්දෙ පටන් ගන්නට අණ කළා. යුද බෙර ගහනවා, නළා පිඹිනවා. හමුදාව ඉස්සරහට ගියා. පාබල හමුදා රජුගේ සේනාවට පහර දුන්නා. අස්ව හමුදා ඉදිරියට ගියා. රජුගේ බටයින් සිර බාරයට ගත්තා. මුහුදු වෙරළේ ඉඳලා නැව් සීයක් කාල තුවක්කුවලින් වෙඩි තැබුවා. රජුගේ අගනුවරට වෙඩි වැදුණා.

තමාගේ හමුදා පරාද වෙලා දුවන හැටි රජ්ජුරුවො දුටුවා. ඔහු හමුදාව නවත්වන්න ඉදිරියට ආවා. එතකොට අන්ද්රේ පොල්ලට කතා කළා:

"පොල්ල දුස්ට රජාගේ ඇට කටු කඩාපන්!"

පොල්ල රෝදයක් වගේ කරකැවිලා රජ්ජුරුවන්ගේ පස්සෙන් එළවාගෙන ගිහිල්ලා, රජුගේ නළලට පහරක් ගැහුවා. ඒ පහරට මෝඩ, නපුරු රජා මළා.

යුද්දෙ නැවතුණා. නගරවල හිටිය මිනිස්සු අන්ද්රේ හොයාගෙන එන්නට පටන් ගත්තා. රට පාලනය කරන්ටයි, රජ කම බාර ගන්ටයි කියලා මිනිස්සු අන්ද්රේගෙන් ඉල්ලා හිටියා.

අන්ද්රේ රට වැසියන් ගේ ඉල්ලීමට කැමති වුණා. ඔහු රට වැසියන්ට ලොකු උත්සවයක් ලෑස්ති කළා. බොහෝ කල් යන තුරු මාර්යා රජ බිසවයි අන්ද්රේ රජුයි බොහොම හොඳින් රට පාලනය කළා.



හංසයෝ

එකෝමත් එක රටක ගමයෙකුයි, ගම මහගෙ කෙනෙකුයි හිටියා. ඒ ගොල්ලන්ට දුවකුයි, පුංචි පුතෙකුයි හිටියා.

"දුවේ, අපි ගොවිතැන් වැඩට යනවා. නුඹ මල්ලීව බලාගනින්. ගෙවත්තෙන් එළියට යන්ට එපා. අපි නුඹට ඔළුවේ බඳින ලේන්සුවක් ගෙනත් දෙන්නම්." අම්මා කීවා.

අම්මයි, තාත්තයි වැඩට ගියා. දුව මල්ලීව ජනේලය ළඟ වාඩි කරවලා පාරට ගිහින් සෙල්ලම් කළා. මහ පාරේ ඇවිද්දා. ඇයට මල්ලි ගැන අමතක වුණා.

හංසයෝ අහසේ පියාඹා යන ගමන් පුංචි ළමයාව දැකළා, ඔහුව ඩැහැගෙන, පියාපත් වල වාඩිකරවා ගෙන ගියා.

අක්කා සෙල්ලම් කරලා ගෙදර ආවා. මල්ලී නැහැ. වට පිට හැමතැනම හොයලා බැලුවා. මල්ලී හිටියේ නැහැ!

ඈ මල්ලීට අඬ ගැහුවා. අඬ, අඬා හැම තැනම සෙව්වා. මල්ලී ආවේ නැතිනම් අම්මයි තාත්තයි මට දඬුවම් කරාවි කියලා මල්ලීට ඇහෙන්ට ඈ කීවා. කොහේද? මල්ලී! ඔහු එතන අහලකවත් හිටියේ නෑ.

ඈ තණ පිටියට දුවගෙන ගියා. හංසයෝ රැළක් පියාඹා කැලෑවෙන් එහාට යන හැටි යම්තම් ඈ දැක්කා. මගේ මල්ලීව හංසයෝ ගෙනයනවා

කියලා ඈ කල්පනා කළා. හංසයෝ පුංචි ළමයින්ව ගෙනයනවා කියන කතාවක් ගමේ පැතිර තිබුණා.

හංසයින්ව අල්ලන්ට ඈ දුවන්ට පටන් ගත්තා. ඔහොම දුවලා, දුවලා යනකොට ඇයට ලිපක් හමුවුණා. ඈ ලිපට කතා කළා:

"අනේ, අනේ, මගේ මල්ලිව හංසයින් ගෙනිච්චා නුඹ දැක්කේ නැතිද?"

"නුඹ මගේ ලිපේ පුච්චපු, රයි පිටි වලින් හදාපු රොටියක් කාපන්. එතකොට මම කියන්නම් හංසයෝ පියාඹා ගියේ කොහාට ද කියලා?"

"මට බැහැ ඔය බාල පිටි වලින් හදාපු රොටී කන්න. අපේ ගෙදර තිරිඟු පිටිවලින් හදන රොටී පවා මම කන්නේ නැහැ..."

ලිප කතා නොකර හිටියා. ඈ තවත් දුර දුවගෙන ගිහිල්ලා ඇපල් ගහක් ළඟට ආවා.

"ඇපල් ගහ, ඇපල් ගහ හංසයෝ පියාඹා ගියේ කොහාට ද කියලා කියන්න?"

"මගේ ගහෙන් වල් ඇපල් ගෙඩියක් කාපන්, එතකොට මම උන් ගිය දිහා නුඹට පෙන්වන්නම්."

"අපේ ගෙවත්තේ තියෙනවා බොහොම රස ඇපල්. මම ඒවා වුණත් කන්නේ නැහැ."



ඇපල් ගහ කතා නොකර හිටියා. ගෑණු ළමයා දුවන්ට පටන් ගත්තා. ඔහොම දුවලා, දුවලා ගිහිල්ලා කිරි උතුරන ගහක් ළඟට ආවා. ගහ දෙපැත්තෙ පැණි.

"කිරි ගහ, පැණි ඉවුර, කරුණාකරල කියන්න හංසයෝ පියාඹා ගියේ කොහාට ද කියල?"

"කිරියි, පැණියි කාපන් එතකොට මම කියන්නම්."

"අපේ ගෙදර මුදවපු කිරි තියෙනවා. ඒවා වුණත් මම කන්නේ නැහැ." ඈ කීවා.

ගහ කතා නොකර හිටියා.



ආයෙමත් ඇ දුවන්ට පටන් ගත්තා. ඇ දූන් කැලෑ මැදින් දුවනවා. හිරු බහින්නට පටන් ගත්තා. හවස් වේ ගෙන එනවා. ගෙදර යන්ට ඕනෑ කියලා ඇ කල්පනා කළා. කුකුළු කකුල් වලින් හිටගත්තු කුඩා ගෙයක් ඇ දුටුවා. ඒ ගෙයි එක ජනේලයක් විතරයි තියෙන්නේ. ඒ ගෙය තමා වටේටම කැරකැවෙනවා.

ගේ ඇතුළේ බාබායිගා යකින්න ලොම්වලින් නූල් කටිනවා. ඇ ළඟ බංකුවක් උඩ ගෑනු ළමයාගේ මල්ලි වාඩිවෙලා රිදී පාට ඇපල් ගෙඩි එක්ක සෙල්ලම් කරනවා.

ගෑනු ළමයා ගෙට ඇතුළු වුණා.

"ආයුබෝවන් ආච්චියේ!"

"ආයුබෝවන්, කෙල්ලේ, නුඹ මොකටද මෙහාට ආවේ?"

"මම මේ මඩගොඩේ, කැලෑවේ ඇවිදලා ඇඳුම් තෙමුණු හන්දා ඒවා වේලාගන්ට ආවා."

"වාඩිවෙලා නූල් කටින්න පටන් ගනින්."

බාබායිගා යකින්න නූල් කටින ඉද්ද ඇයට බාර දීලා යන්ට ගියා. ඇ නූල් කටිනවා. ලිප යටින් මීයෙක් එළියට ඇවිල්ලා ඇට කතා කළා:

"කෙල්ලේ, කෙල්ලේ මට කැඳ පොඩ්ඩක් දීපන්. මම නුඹට උදවු කරන්නම්."

ගෑනු ළමයා ඌට කැඳ ටිකක් දුන්නා.

"බාබායිගා යකින්න ගියා වතුර උණු කරන්න. ඇ නුඹව නාවලා, ඊට පස්සේ නුඹව මරාගෙන කාලා, නුඹගේ ඇට කවු උඩ නටාවි."



ඇ බොහොම බය වුණා. අඬන්ට පටන් ගත්තා. මීයා ඇට මෙහෙම කීවා:

"නුඹ යකින්න එනකල් ඉන්න එපා. මල්ලීවත් අරගෙන පලයන්. මම නුඹ වෙනුවට නූල් කටින්නම්."

ගෑනු ළමයා මල්ලීව වඩාගෙන පැන දිව්වා. බාබායිගා යකින්න ජනේ-ලය ළඟට ඇවිත් බලනවා, අහනවා:

"කෙල්ලේ නුඹ නූල් කටිනවද?"

මීයා ගෑනු ළමයා වගේ හීන් හඬින් මෙහෙම කිව්වා:

"කටිනවා, ආච්චියේ..."

බාබායිගා යකින්න වතුර උණු කරලා කෙල්ලට අඬගහන්ට ගියා. ගෙදර කවුරුවත් හිටියේ නැහැ. බාබායිගා යකින්න කෑ ගහනවා:

"හංසයිනි, හංසයිනි! අක්කා මල්ලීව ගෙනිච්චා. ඔවුන් අල්ලා ගනිල්ලා, අල්ලා ගනිල්ලා!.."

අක්කා මල්ලීවත් අරගෙන කිරි ගහ ළඟට ගියා. හංසයෝ ඇය අල්ලා-ගන්ට එන හැටි ඇ දුක්කා.

"කිරි ගහ, කිරි ගහ, මා හංගාපන්!"

"නුඹ කිරියි, පැණියි කාපන්."

ඇ ඉක්මනට කිරියි, පැණියි කෑවා. ගහට ස්තුති කළා. කිරි ගහ ඇය පැණි ඉවුරට යවලා හැංගුවා.

හංසයෝ ඇය දැක්කේ නැහැ. උන් පියාඹා ගියා.

අක්කා මල්ලීවත් අරගෙන ආපහු දුවන්ට පටන් ගත්තා. හංසයෝ අක්කාව යි, මල්ලීව යි හොයන්ට ආපහු පියාඹන්ට පටන් ගත්තා. දැන්, දැන්, හංසයින්ට අහුවේවි. මොනවා කරන්ට ද? විපතක් වෙන්ට පුළුවනි. ඇපල් ගහ ළඟම තියෙනවා.

''අනේ, ඇපල් ගහ මාව හංගන්ට!''

''කාපන් මගේ ගහෙන් වල් ඇපල් ගෙඩියක්.''

ඈ විගහට වල් ඇපල් ගෙඩියක් කාලා ගහට ස්තුති කළා. ඇපල් ගහ අතුවලින් අක්කාවයි මල්ලීවයි වැහුවා.



හංසයෝ ඇය දුක්කේ නැහැ. උන් තවත් දුර පියාඹා ගියා.

අක්කා මල්ලීවත් වඩාගෙන ආපහු දුවනවා. ගෙදරට යන්න තව ටික දුරයි තියෙන්නේ. හංසයෝ ආපහු පියාඹා ඇවිත් ඇය දුටුවා. උන් ඈට හොටෙන් ඇනලා මල්ලීව උදුරා ගන්ට හදනවා.

ඈ කොහොම හරි ලිප ළඟට දුවගෙන ගියා:

"ලිප මාව කොහොම හරි හංගන්න!"

"මගේ ලිපේ පුච්චපු රොටියක් කාපන්!"

ඈ රොටියක් කාලා, ලිපට ස්තුති කළා. ඈ මල්ලීත් අරගෙන ලිප් බොක්කට වැදිලා හැංගුණා.

හංසයෝ වටේටම පියාඹලා ඇය සෙව්වා. උන් ඇය දුක්කේ නැහැ. පස්සේ බාබායිගා යකින්න ළඟට පියාඹා ගියා.

ඈ ආයෙමත් ලිපට ස්තුති කරලා මල්ලීවත් වඩාගෙන ගෙදර ගියා.

ඊට පස්සේ තමයි අම්මයි, තාත්තයි කුඹුරු වැඩ කරලා ගෙදර ආවේ.



රිදී පීරිසිය හා රත්‍රන් හඳවත

මහල්ලෙකුට යි, මැහැල්ලකට යි දූවරු තුන්දෙනෙක් හිටියා. ලොකු දූලා දෙන්නා බොරු මෝස්තර කාරියෝ. ඒ වගේ ම ආඩම්බර කාරියෝ. ඒ ගොල්ල ඇන්දේ මල් වැටුණු ලස්සන ගවොම්, අඩි උස සපත්තු, රත්‍රන් ගාපු මාල. බාල දුව මාෂෙන්කාගේ ගවොම කළු පාටයි. ඒ වුණාට ඇගේ ඇස් දෙක බොහොම ලස්සනයි. හරියට මුව පැටියෙකුගෙ වගෙයි. ඇගේ හිසකේ බොහොම සිනිඳුයි, කොණ්ඩය බිමට ගෑවෙන්ට තරම් දිගයි. ඇගේ කොණ්ඩයට මල් ඇමිනෙනවා. ලොකු දූලා වැඩට හොරයි, කම්මැලි යි, බාල දුව උදේ හිට රෑ වන තුරු වැඩ කරනවා. කුඹුරු වැඩට උදව්වෙනවා. ගෙවත්තේ වැඩ කරනවා. මල් පාත්තිවලට වතුර ඉහිනවා. එළදෙනුන් ගෙන් කිරි දොවනවා. තාරා පැටවුන්ට කෑම දෙනවා. කාට හරි මොනවා හරි ඕනෑ වුණොත් මාෂෙන්කා ගෙන් තමා ඉල්ලන්නේ. ඈ වචනයක්වත් කතා නොකර ඉල්ලන දේ ගෙනත් දෙනවා. මාෂෙන්කා හැමදෙනාට ම උදවු කරන්ට කැමතියි. අක්කලා දෙන්නා හැම තිස්සේම ඇයට අණ කරනවා. ඔවුන්ගේ වැඩ ත්, ඇයට ම කියලා කරවා ගන්නවා. මාෂා නිහඬව ඒ වැඩ ඔක්කොම කරනවා.

මේ ගොල්ල ඔහොම ජීවත් වුණා.

තාත්තා පිදුරු මිටි බැඳලා සල්පිලට ගෙනියන්ට ලෑහැස්ති වුණා. දූවරු-

න්ට තෑගි ගෙනත් දෙනවා කියලා ඔහු පොරොන්දු වුණා. වැඩිමල් දුවට ඕන දේ එයා ගේන්නට කිවා:

"ගවොමකට සේද රෙදි ගේන්ට තාත්තේ."

මද්දුම දුවත් එයාට ඕන දේ ගෙනත් දෙන්ට යි කියලා කිව්වා:

"තාත්තේ මට රතු පාට විලූද ගේන්ට."

මාෂා පොඩි දුව නිහඬව ඉන්නවා. තාත්තාට දුක හිතුණා:

"මාෂෙන්කා නුඹට මොනවද ගේන්ට ඕන?"

"මගේ හොඳ තාත්තේ, ඉදුණු ඇපල් ගෙඩියකු යි රිදී පිරිසියකු යි ගේන්ට."

අක්කලා දෙන්නා මහ හයියෙන් හිනා වුණා.

"අනේ මාෂෙන්කා, නුඹ හැබෑ මෝඩ කෙල්ලක්! අපේ ගෙවත්තේ ඕන තරම් ඇපල් තියෙනවා නේද!"

"නැහැ. අක්කලා දන්නේ නැහැ. ඉදුණු ඇපල් ගෙඩිය රිදී පිරිසිය වටේ කරකවලා මම මතුරනවා. ඒවා මට කියලා දුන්නේ ආච්චි කෙනෙක්. මම ඇයට පාන් ගෙඩියක් දුන්නා."

"හොඳයි. නංගීට හිනාවෙන්ට එපා. තුන් දෙනාටම කැමති තෑගි ගෙනෙන්නම්." තාත්තා කිවා.

සල්පිල කාලෙදී මහල්ලා පිදුරු මිටි විකුණලා තෑගි මිලදී ගත්තා. වැඩිමල් දුවට නිල් පාට සේද රෙද්දකු යි, මද්දුම දුවට රතු පාට විලූද රෙද්දකුයි, මාෂෙන්කාට ඉදුණු ඇපල් ගෙඩියකු යි, රිදී පිරිසියකුයි මිලදී ගත්තා.

අක්කලා දෙන්නා බොහොම සතුටු වුණා. රෙදි වලින් ගවුම් මහන්ට පටන් ගත්තා. මාෂෙන්කා දිහා බලලා අක්කලා දෙන්නා හිනාවෙනවා:

"මෝඩ කෙල්ලෙ ඇපල් ගෙඩියත් එක්ක ඉඳපන්..."

මාෂෙන්කා සාලයේ මුල්ලක වාඩිවෙලා ඇපල් ගෙඩිය රිදී පිරිසිය වටේ යවන්නට පටන් ගත්තා. එහෙම කරන ගමන් මතුරනවා:

"ඉදුණු ඇපල් ගෙඩිය රිදී පිරිසිය වටේට පලයන්, කැරකිලා පලයන්. මට පෙන්නාපන් නගර, ගම්, කුඹුරු, මට පෙන්නාපන් කැලෑ, මහ මුහුද, උස කඳු පෙන්නාපන්, නිල් අහස පෙන්නාපන්. රුසියාවේ ලස්සන පෙන්නාපන්."

ඔන්න හිටිහැටියේ ම රිදී පිරිසිය හඬක් නැගුවා. ගෙයි සාලය ආලෝක වුණා. ඇපල් ගෙඩිය පණ ඇති සතකු වගේ රිදී පිරිසිය වටේ යන්නට පටන් ගත්තා. රිදී පිරිසිය ඇතුළේ නගර, ගම් පේනවා. කුඹුරු පේනවා. යුද පිටියේ

යුද හමුදා, මහ මුහුදේ නැව් පේනවා. උස කඳු, ලස්සන අහස පේනවා. පැහැදිලි ඉර, බබළන හඳ පේනවා. අහසේ තරු නටනවා, විලෙහි හංසයෝ ගී ගයනවා, මේවා සියල්ල ම පේනවා. අංජනම් එළියක් වගෙයි.

අක්කලාත් පීරිසිය දිහා බැලුවා. ඒ ගොල්ලන්ට ඉරිසියා හිතුනා. මාෂෙන්කා ගෙන් පීරිසිය යි, ඇපල් ගෙඩිය යි උදුරාගන්නේ කොහොමද යි කියලා අක්කලා දෙන්නා කල්පනා කළා. මාෂෙන්කා කොහොමටවත් පීරිසියයි, ඇපල් ගෙඩිය යි දෙන්ට කැමති නැහැ. හුවමාරු කරගන්ටත්



කැමති නැහැ. හැමදාම හවසට මාෂෙන්කා මතුරලා පීරිසිය වටේට ඇපල් ගෙඩිය යවලා නගර, ගම්, කුඹුරු, අහස, තරු වගේ දේවල් පීරිසියෙන් බල බලා සතුටු වුණා.

අක්කලා මාෂෙන්කාව කැලයට අඬගහගෙන යන්ට කල්පනා කළා:

"අනේ සුදු නංගියේ, කැලේ තියෙනවා රස පලතුරු ජාති. අපි තාත්තට යි, අම්මට යි පලතුරු කඩාගෙන එමු."

තුන්දෙනා ම කැලයට ගියා. පලතුරු හොයා ගන්ට බැහැ.

මාෂෙන්කා ඇපල් ගෙඩියයි, රිදී පීරිසිය යි අරගෙන මතුරන්ට පටන් ගත්තා:

"ඇපල් ගෙඩිය, ඇපල් ගෙඩිය රිදී පීරිසිය වටේ කැරකියන්, කැලේ වැව්ලා තියෙන පලතුරු ජාති පෙන්නාපන්. සමන් පිච්ච මල් තියෙන තැන පෙන්නාපන්."

ඔන්න හිටි හැටියේම හඬක් ඇතිවුණා. ඇපල් ගෙඩිය පණ ඇති සතකු වගේ රිදී පීරිසිය වටේට ගියා. හරියට කණ්ණාඩියකින් බලනවා වගේ කැලෑව පීරිසියෙන් පෙනුණා. මෙන්න පලතුරු තියෙන තැන් පේනවා. සමන් පිච්ච මල් තියෙන තැන් පේනවා. හතු පිපිලා ඇති තැන් පේනවා. උල්පත් ඇති තැන්, විල්වල හංසයෝ ගී කියන තැන් පේනවා.

අක්කලා මේක දැක්කා. ඔවුන් ගේ ඇස් තරහයෙන් දිලිසුණා. ගහකින් ලොකු අත්තක් කඩලා අක්කලා දෙන්නා එකතුවෙලා මාෂාට ගහලා, ගහලා ඇව මරා දැම්මා. බිරියෝසා ගහක් යට ඇව වළලා දමලා, ඇපල් ගෙඩියයි, රිදී පීරිසියයි අරගත්තා. පලතුරුවලින්, හතුවලින් කූඩ පුරවා ගෙනැ හවස් වෙලා ගෙදර ඇවිත් අක්කලා අම්මටයි තාත්තටයි කියනවා:

"මාෂෙන්කා පැනලා ගියා. අපි එයාව හැමතැනම සෙව්වා. වෘකයෝ ඇව මරාගෙන කෑවා වෙන්ට ඇති."

අම්මා ඇඬුවා. තාත්තා මෙහෙම කිව්වා:

"ඇපල් ගෙඩිය පීරිසිය වටේට යවමු. සමහර විට, අපේ මාෂෙන්කා ඉන්න තැන පෙන්නාවි."

අක්කලා හරියට මැරුණා වගේ සුදුමැලි වුණා. ඇපල් ගෙඩිය පීරිසිය වටේ යන්නේ නැහැ. පීරිසියෙන් එළියක් වැටුනෙත් නෑ. වෙන්දා වගේ පීරිසියෙන් කැලෑ, කුඹුරු, කඳු, අහස පෙනුණෙත් නැහැ.

ඔන්න ඉතින් ටික කලකට පස්සේ, එක එඬේර කොල්ලෙක් නැතිවුණු

එළු පැටියකුව හොයා ගෙන කැලයට ආවා. එක තැනක සුදුපාට බිරියෝසා ගහක් තියෙනවා, වටේට පස් ගොඩැල්ලක්. වටේටම සමන් පිච්ච මල් වැවිලා. මල් මැද බට ගහක් වැවිලා. එඬේර කොල්ලා ඔය ගහෙන් බටලීයක් කපලා නළාවක් හැදුවා. බට නළාව පිම්බා විතරයි, මෙන්න ඒ බට නළාව ඉබේටම ගීයක් කියන්ට පටන් ගත්තා:

''ගයපන්, ගයපන් බට නළාව, ගී ගයපන්, එඬේර කොල්ලගේ හිත සනසන්නට ලස්සන ගී ගයපන්. අසරණ මා මරාදැම්මා. තරුණ මාව අපරාදේ මරාදැම්මා. ඇපල් ගෙඩියකට ආසාවෙලා, පීරිසියකට ආසා වෙලා අක්කලා මා මරාදැම්මා.''

එඬේර කොල්ලා මේ ගීය අහලා බොහොම බය වුණා. ඔහු ගමට දුවගෙන ගිහිල්ලා ගම්මුන්ට මේ ගීය ගැන කිව්වා. ගම්මු එකතු වෙලා බොහොම දුක් වුණා.

සෙනහ ගොඩට මාෂෙන්කාගේ තාත්තාත් ආවා. තාත්තා බට නළාව අතට ගත්තා විතරයි, ආයෙමත් එය ඉබේටම ගී කියන්ට පටන් ගත්තා:



''ගයපන්, ගයපන් බට නළාව, ගී ගයපන්. මගේ තාත්තාගේ හිත සනසන්නට ගී ගයපන්. අසරණ මා මරාදැම්මා, තරුණ මාව මරා දැම්මා, ඇපල් ගෙඩියකට ආසාවෙලා, පීරිසියකට ආසා වෙලා, අක්කලා මා මරා දැම්මා.''

තාත්තා ඇඬුවා:

''අනේ එඬේර කොල්ලෝ, හොඳ ළමයා වගේ නුඹ මේ බට නළාව කපා ගත්ත තැන මට පෙන්නාපන්.''

එඬේර කොල්ලා බිරියෝසා ගහ ළඟ පස්ගොඩැල්ල පෙන්නුවා. බිරියෝසා ගහ ළඟ සමන් පිච්ච මල් වැවිලා. බිරියෝසා ගහේ අතුවල ඉඳගෙන කුරුල්ලෝ ගී කියනවා.

පස් ගොඩැල්ල හාරලා බැලුවා. එතැන මාෂේන්කාගේ මිනිය තියෙනවා. හරියට පණ පිටින් හිටියාටත් වඩා ලස්සනයි. කම්මුල් රතු පාටයි, රස්නෙයි. මාෂෙන්කා නිදාගෙන ඉන්නවා වාගෙයි.

බට නළාව දිගටම ගී කියනවා:

''ගයපන්, ගයපන්, බට නළාව ගී ගයපන්. අසරණ මා මරාදැම්මා, තරුණ මාව මරා දැම්මා. ඇපල් ගෙඩියකට ආසාවෙලා, පීරිසියකට ආසාවෙලා, අක්කලා මා මරා දැම්මා. බට නළාව ගී ගයන්න. තාත්තෙ, තාත්තෙ මේ අහන්න. රජුගේ ළිඳෙන් වතුර ගෙනත් ඉහින්න මට පණ ලැබෙන්න.''

අක්කලා දෙදෙනාට මේ ගීය ඇහිලා ඒ ගොල්ලන් ගේ ඇඟ පණ නැතිව ගියා. දෙදෙනාම දණින් වැටුණා. දෙදෙනා ම නංගීව මරාපු බව පිළි ගත්තා. රජ තුමා නඩු අහලා තීන්දුව දෙන තුරු අක්කලා දෙදෙනාව යකඩ මාලිගාවක හිරකළා.

මහල්ලා රජු ගේ ළිඳෙන් පණ දෙන වතුර ගෙනෙන්නට නගරයට ගියා.

මහල්ලා ගිහිල්ලා රජුගේ අගනුවරට ආවා. රජ මාලිගාවේ සඳළුතලයේ ඉඳලා රජ පැමිණියා.

මහල්ලා රජුට ආචාර කරලා කතාව විස්තර කරලා කීවා.

රජ ඔහුට මෙහෙම පැවසුවා:

''මහල්ලා, මගේ ළිඳෙන් පණ දෙන වතුර අරගෙන ගිහිල්ලා නුඹේ දුවට පණදීපන්. ඇට පණ ලැබුණාට පස්සේ ඇයවයි, ඇගේ ඇපල් ගෙඩියයි, පීරිසියයි, නංගීව මරාපු අක්කලාවයි මා ළඟට ගෙනෙන්.''

මහල්ලා සතුටු වෙලා, රජුට ආචාර කරලා, පණ දෙන වතුරත් අරගෙන ගෙදර ගියා.

පණදෙන වතුර ඉස්සා විතරයි, මාෂෙන්කාට පණ ලැබුණා. ඈ තාත්තාගේ බෙල්ල බදාගෙන සිප ගත්තා.

මිනිස්සු ඇවිල්ලා බොහොම සතුටු වෙලා ඈ දිහා බැලුවා.

මහල්ලා මාෂෙන්කාවයි, ඇය මරාපු අක්කලා දෙන්නාවයි අරගෙන රජ මාලිගාවට ගියා.



රජ ඇවිල්ලා මාෂෙන්කා දිහා බැලුවා. මාෂෙන්කා උදෑසන පිපෙන ලස්සන මලක් වගෙයි. ඇස් දෙක හිරු එළිය වගේ බැබළෙනවා. ඇගේ මුහුණේ හිනාව අරුණාලෝකය වගෙයි. කම්මුල් දිගේ කඳුලු කැට ගලා යනවා. ඒවා හරියට මැණික් ගල් වගෙයි.

රජ මාෂෙන්කාගෙන් අහනවා:

"නුඹේ රිදී පීරිසිය කොහෙද? ඇපල් ගෙඩිය කොහෙද?"

මාෂෙන්කා රිදී පීරිසිය උඩ ඇපල් ගෙඩිය තියලා, එය කරකවන්ට පටන් ගත්තා.

ඔන්න හිටි හැටියේම සීනු හඬක් වගේ හඬක් ඇහුණා. පීරිසිය හරියට කණ්ණාඩියක් වගේ, එය දිහා බැලුවාම රුසියාවේ නගර පේනවා, ඒ නගර වල යුද්ධ සේනා කොඩි අරගෙන යන හැටි පේනවා. පෙළ ගැසී සීරුවෙන් සිටින හැටි පේනවා. සෙබළ නායකයෝ, සෙනවිවරු සේනා හසුරුවන හැටි පේනවා. සෙබළු පෙළ ගැසී ගමන් කරන හැටි පේනවා. වෙඩි තියනවා, දුම් ගුළි නගිනවා. වලාකුළු දුම් ගුළි වලට වැසෙනවා, මේවා දිහා බලාගෙන ඉඳලා මිනිසුන් ගේ ඇස් කඳුළු වලින් තෙමුණා.

ඔන්න ආයෙමත් රිදී පීරිසිය වටේ ඇපල් ගෙඩිය යනවා. පීරිසියෙන් මහ මුහුද පේනවා. රැළි උඩ යනවා, පාත්වෙනවා. හරියට හංසයින් වගේ නැව් මහ මුහුදේ යනවා. නැව්වල කොඩි ළෙල දෙනවා. කාල තුවක්කු වෙඩි තියනවා. දුම් වළා අහසට නගිනවා. බලාගෙන ඉන්නා මිනිසුන්ගේ ඇස් කඳුළු වලින් තෙමුණා.

ඇපල් ගෙඩිය රිදී පීරිසිය වටේට කරකැවෙනවා. පීරිසියෙන් අහස පේනවා. අහසේ හිරු බබළනවා. සඳ පායනවා. තරු නටනවා. හංසයෝ අහසේ ගී ගයනවා.

රජ තුමා මේ පුදුම පීරිසිය දැකලා මවිත වුණා. මාෂෙන්කා අඬ අඬා රජුට මෙහෙම කියනවා:

"මගේ පීරිසියයි, ඇපල් ගෙඩියයි ඔබ තුමා අරගන්න. මගේ අක්කලා දෙදෙනාව නිදහස් කරන්න. මා නිසා ඒ ගොල්ලන්ට දඬුවම් දෙන්ට එපා."

රජ මාෂෙන්කාගේ අතින් අල්ලා ගත්තා:

"නුඹ ගේ පීරිසිය රිදී, නමුත් නුඹගේ හදවත රත්තරන්. නුඹ කැමතිද මගේ බිරිය වීමට, නුඹ කැමතිද රටේ රැජිණිය වීමට? නුඹගේ ඉල්ලීම හන්දා නුඹව මරා දමාපු නුඹේ අක්කලාට මම සමාව දෙනවා."

ළමයි අහලා ඇති නේද, රජ ගෙදර කොච්චර කෑම ජාති, බීම ජාති තියෙනවද කියලා. මාෂෙන්කා රජුගේ බිසව වුණු හන්දා මහා ලොකු මඟුල් කෑමක් ඇති කළා. රජ ගෙදරට ආ ගෑණු, පිරිමි කෑවා, බීවා, සින්දු කීවා, නැටුවා. හැම දෙනාම බොහොම සතුටු වුණා.



මාළුවෙකුගේ අණ

ඒකෝමත් එක රටක මහලු මිනිහෙකුට පුත්තු තුන්දෙනෙක් හිටියා. වැඩිමල් දෙදෙනා නුවණක්කාරයෝ. බාලයා මෝඩයෙක්. එයාගේ නම එමේලියා.

අයියලා දෙදෙනා වැඩ කරනවා. එමේලියා උදුන උඩට නැගලා ඉන්නවා. කිසි වැඩක් පලක් කරන්ට ඔහු කැමති නැහැ.

දවසක් දා අයියලා දෙදෙනා කඩපොළට ගියා. එමේලියාගේ නැනලා දෙදෙනා ඔහුට කතා කළා:

"එමේලියා ගිහින් වතුර ගෙනෙන්."

ඔහු උදුන උඩ ඉඳගෙන ඉන්නවා.

"මට බැහැ..."

"එමේලියා වතුර ගෙනෙන්. නැතිනම් නුඹට අයියලා ගෙන් තෑගි ලැබෙන්නේ නැහැ."

"හොඳයි. වතුර ගේන්නම්."

එමේලියා උදුනෙන් බිමට බැස්සා. සපත්තු දාගත්තා. කබාය ඇඳගත්තා. බාල්දි දෙකකුයි පොරෝවකුයි අරගෙන ගඟට ගියා.


ගඟේ වතුර මිදිලා. එමේලියා අයිස් තට්ටුවක් පොරෝවෙන් කඩලා හිලක් හදාගත්තා. අයිස් තට්ටුවට යටින් වතුර. ඔහු බාල්දි දෙකටම වතුර පුරවාගත්තා. අයිස් තට්ටුවට යටින් ගඟේ මාළුවෙක් ඉන්නා හැටි එමේලියා දැක්කා. ඔහු හෙමින් සීරුවේ මාළුවාගේ වලිගයෙන් අල්ලා ඌ ගොඩ ගත්තා.

''ලොකු මාළුවෙක්. මුව තම්බාගෙන කනවා.''
ඔන්න හිටිහැටියේම මාළුවා මිනිහෙක් වගේ කතා කරනවා:
''එමේලියා නුඹ මාව ගඟට දාපන්. මම නුඹට පිහිට වෙන්නම්.''
එමේලියා අත් විරිත්තලා හිනාවුණා.
''නුඹ කොහොම ද පිහිට වෙන්නෙ... නැහැ. නුඹව මගේ නැනලාට දෙනවා. මාළු සුප් හොද්දක් හදවා ගන්නවා. බොහොම රසට හිටී වි.''
මාළුවා ආයෙමත් කන්නලව් කළා:
''එමේලියා, එමේලියා, නුඹ මාව ආපහු ගඟට දාපන්. නුඹ කියන හැම දෙයක් ම මම නුඹට කර දෙන්නම්.''
''නුඹ මාව රවටන්නේ නැතෙයි කියලා ඉස්සෙල්ලා මට ඔප්පු කරපන්. අන්න එතකොට මම නුඹව ගඟට දාන්නම්.''
''එමේලියා, එමේලියා නුඹට දැන් ඕන මොනවා ද කියලා කියාපන්.'' මාළුවා කීවා.
''වතුර එක බින්දුවක්වත් ඉහිරෙන්නේ නැතුව මේ වතුර බාල්දි දෙක ගෙදර යන්ට ඕන...''
''එහෙනම් මා කියන හැටි මතක තියා ගෙන නුඹට ඕන වේලාවට එහෙම කියපන්.'' මාළුවා කීවා.
''මාළුවාගේ අණ අහපන් මට ඕනෑ දේ කරපන්.''
එමේලියාත් ඒ විදිහටම කීවා:
''මාළුවාගේ අණ අහපන් මට ඕනෑ දේ කරපන්. වතුර බාල්දි ගෙදර යමන්.'' කිව්වා විතරයි, වතුර බාල්දි දෙක පණ ඇති සතුන් දෙදෙනෙකු වගේ කන්ද නගිනවා. එමේලියා පුදුම මාළුවාව ගඟට දාලා බාල්දිවලට පිටුපසින් ගියා.
වතුර බාල්දි දෙක ගම හරහා යනවා. ගම්මු මේක දැකලා පුදුම වුණා. එමේලියා හිනා වෙවී යනවා... වතුර බාල්දි දෙක දොර ඇරගෙන ගෙදරට ඇතුළු වෙලා දිය මැස්ස උඩ නැගලා ඉන්නවා.
ටික වේලාවක් ගියාට පස්සේ ආයෙමත් නැනලා එමේලියාට කතා කළා:
''එමේලියා මොකද නුඹ උදුන උඩට වෙලා නිදාගෙන ඉන්නේ. පලයන් දර කඩා ගෙන වරෙන්.''
''මට බැහැ...''

"නුඹ දර කඩාගෙන ආවේ නැතිනම් නුඹට අයියලාගෙන් තෑගි බෝග ලැබෙන්නේ නැහැ."

එමේලියා බොහොම අකමැත්තෙන් උඳුනෙන් බිමට බැස්සා. මාළුවා ගැන මතක් වෙලා ඔහු හෙමිහිට මෙහෙම කිව්වා:

"මාළුවාගෙ අණ අහපන්
මට ඕනෑ දේ කරපන්
පොරොව ගිහින් දර කපපන්,
දර ඉබේටම ඇවිත් ලිප ළඟ ගොඩ ගැසියන්."



පොරොව පණ ඇති සතෙකු වගේ ගිහිල්ලා දර කපනවා, පලනවා. දර කෑලි පෙළ ගැහිලා ලිප ළඟ හිටගත්තා.

ඔන්න ටික කාලයක් ගතවුණා. ආයෙමත් නෑනලා එමේලියාට කතා කළා:

"දර ඉවර වුණා. නුඹ කැලෑවට ගිහිල්ලා දර කඩාගෙන වරෙන්."

"නුඹලා ඉන්නේ මොකට ද?" එමේලියා උඳුන උඩ ඉඳගෙන අහනවා.

"අපි ඉන්නේ මොකට ද? කැලේට ගිහිල්ලා දර කැඩීම අපේ වැඩක් ද?"

"මට යන්න හිත නැහැ."

"එහෙනම් නුඹට තෑගි ලැබෙන්නේ නැහැ."

නොගිහින් ඉන්ට බැහැ. එමේලියා උඳුනෙන් බිමට බැස්සා. සපත්තු දා ගත්තා. කබාය ඇඳ ගත්තා. කඹයකුයි, පොරවයි අරගෙන හිම යානය උඩ වාඩි වුණා:

"කෙල්ලනේ කඩුල්ල ඇරපල්ලා!"

"මෝඩයා නුඹට පිස්සු ද? අස්පයා බඳින්නෙ නැතුව මොකද හිම යානයේ වාඩි වුණේ?"

"මට අස්පයෝ එපා!"

නැනලා කඩුල්ල ඇරියා. එමේලියා හෙමින් මෙහෙම කිව්වා:

"මාළුවාගේ අණ අහපන්
මට ඕනෑ දේ කරපන්!
හිම යානය කැලේට පලයන්..."

හිම යානය ඉබේටම කැලේට යන්ට පටන් ගත්තා. අස්වයින්ටත් බැහැ ඒ තරම් වේගයෙන් දුවන්ට.

කැලයට යන පාර තියෙන්නේ නගරය හරහා. ඉබේ ගමන් කරන හිම යානයට මිනිසුන් හැප්පෙනවා. උන් යට වෙනවා. ඔන්න ඒ පාර මිනිස්සු කෑ ගහන්ට පටන් ගත්තා: "ඔය මිනිහාව අල්ලාපියව්, අල්ලාපියව්! හිම යානය එළවන මිනිහාව අල්ලාපියව්!" කොහේ අල්ලන්නටද, එය කැලයට ආවා.

එමේලියා කිව්වා:

"මාළුවාගේ අණ අහපන්
මට ඕනෑ දේ කරපන්!
පොරොව, හොඳට වේළිලා තියෙන දර කපාපන්.
කැපිච්ච දර නුඹලා හිම යානයට ගොඩ ගැසියන්.
කඹය නුඹ දර ගොඩ හොඳට බැඳපන්..."

පොරොව වේලුණු දර හොය හොයා ගිහින් කපනවා. දර කැලි ඉබේටම



ගොඩ ගැහෙනවා. කඹය දරගොඩ එක්කරලා හොඳට බැන්දා. ඊට පස්සේ එමේලියා පොරවට අණ කළා හොඳ පොල්ලක් කපාගෙන එන්නට. එමේලියා හිම යානය උඩ වාඩිවෙලා මෙහෙම කිව්වා:

''මාළුවාගේ අණ අහපන්
මට ඕනෑ දේ කරපන්
හිම යානය ඉබේටම ගෙදර පලයන්...''

ඔන්න ආයෙමත් හිම යානය නගරය හරහා යනවා. ඒ නගරයේ මිනිසුන් තමා හිම යානයට හැප්පුණේ, යට වුණේ. නගරෙ මිනිස්සු හිමයානය එනකල් ඉන්නවා ඒක අල්ලා ගන්ට. එමේලියාව මිනිස්සු අදිනවා, ගහනවා, ඔහුට බණිනවා.

එන පොට හොඳ නැහැ. එමේලියා හෙමිහිට් මාළුවාගේ අණ මැතුරුවා:

''මාළුවාගේ අණ අහපන්
මට ඕනෑ දේ කරපන්
තඩි පොලලෙන්,
මට ගහපු එවුන්ට බැට දීපන්...''

පොල්ල දුන්නක් වගේ පැනලා මිනිසුන්ට පට පට ගාලා බැට දෙනවා. මිනිස්සු බයේ පැනලා දිව්වා. එමේලියා ගෙදර ඇවිත් උඳුන උඩට නැගලා සැපට ඉන්නවා.

ඔහොම ටික දවසක් ගතවුණා. රටේ රජතුමාට එමේලියාගේ හපන්කම් ගැන ආරංචි වුණා. ඔහු ඇමතියකු යැව්වා එමේලියාව අඬගහගෙන එන්ට.



ඇමතියා එමේලියා ඉන්න ගමට ඇවිල්ලා, ඔහු ගේ ගෙපැල හොයාගෙන, ඇතුළු වුණා:

''තෝද බොල මෝඩ එමේලියා?''



එමේලියා උදුන උඩට වෙලා අහනවා:

"නුඹට මොනව ද ඕන?"

"ඉක්මනට ඇඳ ගනින්. රජතුමා ළඟට මම නුඹව ගෙනියන්නම්."

"මට යන්ට බැහැ..."

ඇමතියාට කේන්ති ගිහිල්ලා ඔහු එමේලියාගේ කම්මුලට පහරක් ගැහුවා.

එමේලියා හෙමිහිට මෙහෙම කිව්වා:

"මාළුවාගේ අණ අහපන්
මට ඕනෑ දේ කරපන්
අර පොල්ලෙන් ඇමතියාට ගහපන්..."

පොල්ල දුන්නක් වගේ පැනලා, ඇමතියා ගේ පිටට පට, පට ගාලා පහර දුන්නා. ඇමති බොහොම අමාරුවෙන් පැනලා දිව්වා.

ඇමතියාට රජුගේ කීම ඉටුකරන්ට බැරිවුණ හන්දා රජතුමා පුදුම වුණා. එමේලියාව ගෙනෙන්ට මහ ඇමතියාව පිටත් කළා:

"නුඹ ගිහිල්ලා එමේලියා මෝඩයාව කැඳවා ගෙන වරෙන්. නැතිනම් නුඹේ හිස ගහලා දමනවා."

මහ ඇමතියා පලතුරු, පැණිරස කැවිලි අරගෙන එමේලියා හමුවෙන්ට ගියා:

"එමේලියා, එමේලියා, නුඹ මොකද ලිප උඩට වෙලා ඉන්නේ? අපි යමු රජතුමා බලන්ට."

"මෙතන උණුහුම්, සැපයි..."

"එමේලියා, එමේලියා රජතුමා නුඹට රජ බොජුන් දේවි. අපි යමු."

මහ ඇමති කීවා.

"මට යන්ට බැහැ..."

"එමේලියා, එමේලියා රජතුමා නුඹට රතු කබායකුයි, සපත්තු දෙකකුයි තෑගි දේවි."

එමේලියා කල්පනා කරලා, කල්පනා කරලා මෙහෙම කිව්වා:

"හොඳයි, ඇමතිතුමා ඉස්සරහින් යන්න, මම පස්සෙන් එන්නම්."

මහ ඇමතියා ගියා. එමේලියා ලිප උඩ වාඩි වෙලා මාළුවාගේ අණ මැතුරුවා:

"මාළුවාගේ අණ අහපන්
මට ඕනෑ දේ කරපන්
ලිප මාත් අරගෙන රජගෙදරට පලයන්."

ගෙදර බිත්ති පුපුරලා ගියා වහල දෙදරුවා. උදුනයි, ලිපයි පණ ඇති සතකු වගේ පාර දිගේ දුවනවා.

රජතුමා ජනේලයෙන් බලා පුදුම වුණා:

"මේ මහා පුදුමය මොකක් ද?"

මහ ඇමතියා රජුට විස්තර කළා: "එමේලියා ඔබ වහන්සේ හමුවෙන්ට එනවා."

රජ මිදුලට ආවා.


"එමේලියා නුඹට විරුද්දව මිනිස්සු පැමිණිලි කරනවා. නුඹ මිනිසුන්ව හිම යානයට යට කරලා තියෙනවා." රජ කීවා.

"ඒ ගොල්ල මොකට ද මගේ හිම යානයට රිංගන්ට ආවේ?" එමේලියා ඇහුවා.

මේ වෙලාවේදී රජු ගේ දුව මාර්යා කුමාරි ජනේලයෙන් එමේලියා දිහා බැලුවා. එමේලියා කුමරියව දැකලා හෙමිහිට මාළුවාගේ අණ මැතුරුවා:

"මාළුවාගේ අණ අහපන්
මට ඕනෑ දේ කරපන්
රජුගේ දූ කුමරිය මට ආලය කරපන්...
ලිප මාත් අරගෙන ගෙදර පලයන්!"

ලිපයි, උදුනයි පණ ඇති සතකු වගේ වේගයෙන් ගෙදර ගිහිල්ලා හිටි තැනම හිටියා. එමේලියා උදුන උඩට වෙලා සැපට ඉන්නවා.



රජ ගෙදර මහා කලබොලයක්. මාර්යා කුමරිය එමේලියා ගැන හිත හිතා අඬනවා. ඔහු නැතුව ජීවත් වෙන්ට බැරිය කියනවා. පිය රජතුමාට කියනවා එමේලියාට ඇයව සරණ පාවා දෙන්ටයි කියලා. රජා කෝප වුණා. මහ ඇමතියාට අණ කළා:

"නුඹ ගිහිල්ලා එමේලියාව පණ පිටින් හරි, මරලා හරි මා ඉදිරියට ගෙනෙන්. නැතිනම් නුඹේ හිස ගහලා දමනවා."

මහ ඇමතියා වයින්, රස කෑම අරගෙන එමේලියා හමුවෙන්ට ගියා. එමේලියාගේ ගෙදරම ගිහිල්ලා ඔහුට මිදි වයින් පොවලා කෑම කැව්වා. එමේලියා කෑම කාලා වයින් බීලා වෙරි වෙලා නිදාගත්තා. මහ ඇමතියා ඔහුව කරත්තයක තබාගෙන රජ ගෙදරට ගෙනගියා.

රජා එමේලියාවයි, දූ කුමරියවයි, ලොකු පීප්පයකට දාලා, එය වටේට යකඩ පටි සවි කරලා, පීප්පයට ඉටිමල ලාටු ගාලා, මහ මුහුදට දමන්නට නියම කළා. රාජ සේවකයෝ රජ අණ ඉටු කළා.

පීප්පය පා වෙනවා. නිදාහිටිය එමේලියාගේ වෙරි හිඳිලා ඔහුට ඇහැරුණා. පීප්පය ඇතුළේ කලුවරයි, තදබදයයි.

"මම කොහේ ද?" එමේලියා අහනවා.

"බොහොම කම්මැලියි, කලුවරයි. අපි දෙදෙනාව පීප්පකට දාලා, පීප්පයට ඉටිමල ලාටු ගාලා මහ මුහුදට දැම්මා." කවුදෝ කීවා.

"නුඹ කවුද?"

"මම මාර්යා රජ කුමරිය"

එමේලියා මැතුරුවා:

"මාළුවාගේ අණ අහපන්
මට ඕනෑ දේ කරපන්
මහ මූදේ රැල්ල අපේ පීප්පය සුදු වැල්ලට වීසිකරපන්..."

මහ මුහුදේ ලොකු රැල්ලක් ඇති වෙලා පීප්පය සුදු වැල්ලට ගොඩවුණා. එමේලියායි, මාර්යා කුමරියයි පීප්පයෙන් එළියට ආවා.

"ආදරනීය එමේලියා අපි නවතින්නේ කොහි ද? පොඩි ගෙයක් හදන්න."

"මට කම්මැලියි."

කුමරිය තව වරක් ඉල්ලා හිටියා. එමේලියා හෙමිහිට මැතුරුවා:

"මාළුවාගේ අණ අහපන්
මට ඕනෑ දේ කරපන්.
රත්තරන් වහලක් එක්ක
ලස්සන මාලිගාවක් හදාපන්..."

කිව්වා විතරයි. රත්තරන් වහලක් ඇති ලස්සන මාලිගාවක් මැවුනා. මාලිගාව වටේට ලස්සන මල් වත්තක්. එහි කුරුල්ලෝ ගී ගයනවා. කුමරියයි, එමේලියායි මාලිගාවට ඇතුළු වෙලා ජනේලය ළඟ වාඩි වුණා:

"එමේලියා ඔයාට ලස්සන තරුණයෙක් වෙන්න බැරිද?"

"මාළුවාගේ අණ අහපන්
මට ඕනෑ දේ කරපන්.
මාව ලස්සන තරුණයෙක් කරපන්..."

එවිට එමේලියා කොතරම් ලස්සන තරුණයෙක් වුණා ද, ඒ ගැන කියල



ඉවර කරන්ටත් බැහැ, ලියලා ඉවර කරන්ටත් බැහැ.

ටික කාලයකට පස්සේ රජ දඩයමට ගියා. ඉස්සර පාළු ඉඩමක ලොකු, ලස්සන මාලිගාවක් දැකලා ඔහු පුදුම වුණා.

"මගෙන් අවසර ගන්නේ නැතුව මේ රටේ මාලිගාවක් හදාපු උද්දච්ච මිනිහා කවුද?"

තොරතුරු හොයාගෙන එන්ට රජ සේවකයින් පිටත් කළා.

සේවකයෝ ගිහිල්ලා මාලිගාවේ ජනේලයට තට්ටු කරලා ඇසුවා.

එමේලියා ඔවුන්ට පිළිතුරු දුන්නා:

"රජ තුමාට එන්ටයි කියන්ට, මම එතුමාව පිළි අරගෙන සංග්‍රහ කරන්නම්. මම එතුමාට මා ගැන කියන්නම්."

රජ ආවා. එමේලියා රජු පිළි අරගෙන මාලිගාවට කැඳවා ගෙන ගිහිල්ලා කෑම මේසයට වාඩිකෙරෙව්වා. කෑමට, බීමට පටන් ගත්තා. රජ කෑවා, බීවා:

"ලස්සන තරුණයා නුඹ කාගේ කවුද?"

"උදුනත් එක්ක රජ ගෙදරට ආපු එමේලියා මෝඩයාව රජතුමාට මතක ද? රජ කුමරියත් එක්ක පීප්පයකට දාලා මහ මුහුදට වීසි කරපු එමේලියාව මතක ද? ඒ තමා මම. මට ඕන නම් රජ තුමාගේ රටට ගිනි තියලා විනාශ කරන්ට පුළුවනි."

රජ බොහොම බය වුණා. එමේලියා ගෙන් සමාව ඉල්ලා හිටියා.

"එමේලියා නුඹ මගේ දුවව සරණ පාවා ගනින්. මගේ රටත් නුඹම අරගනින්. මාව මරන්ට විතරක් එපා!"

රජ මාලිගාවේ මහ විශාල කෑමක් ලෑස්ති කළා. එමේලියා මාර්යා කුමරියව සරණ පාවා ගෙන රජකමට පත්වුණා.



නුවණැති කුමරිය

බොහොම ඉස්සර කාලේ එක රජකුට පුත්තු තුන්දෙනෙක් හිටියා. පුතුන් ලොකු වුණා ම රජ්ජුරුවෝ ඔවුන් කැඳවා මෙහෙම කිව්වා:

"මගේ හොඳ පුතුනි, මම මහලු වෙන්ට ඉස්සෙල්ලා නුඹලා කසාද බැඳලා ඉන්නවා දකින්නට මා කැමතියි. නුඹලා ගේ ළමයින්ව, මගේ මුනුපුරන්ව දකින්නට මා ආසයි."

"පිය රජතුමානෙනි! අපට ආසීර්වාද කරන්න. අපි සරණ පාවා ගන්නේ කාව ද?" පුත්තු තුන්දෙනා ඇහුවා.

"පුතුනේ, නුඹලා එක් එක්කෙනා එක, එක ඊයක් බැගින් අරගෙන එළිමහන් පිට්ටනියකට ගිහිල්ලා විදපල්ලා. ඊය වැටෙන්නෙ කොතැනට ද එතන තමා නුඹලා ගේ ඉරණම."

පුත්තු තාත්තාට හිසනමා ආචාර කරලා, ඊයක් බැගින් අරගෙන එළිමහන් පිට්ටනියකට ගිහිල්ලා දුනු දිය ඇදලා ඊය විද්දා.

ලොකු පුතාගේ ඊය සිටුවරයෙකු ගේ ගෙවත්තට වැටුණා. සිටු දුව ඊය ඇහින්දා. මද්දුම පුතාගේ ඊය මහා ලොකු වෙළෙන්දෙකු ගේ ගෙදර ළඟ වැටුණා. වෙළෙන්දා ගේ දුව ඊය ඇහිඳ ගත්තා.

බාල පුතා ඉවාන් කුමාරයා දුන්නෙන් විද්දා. ඒ ඊය කොහේ ගියාද කියලා ඔහුම දන්නේ නැහැ. ඉවාන් ඊය හොයාගෙන ගිහිල්ලා ගිහිල්ලා මඩ ගොඩක් ළඟට ආවා. ඒ මඩ ගොඩේ හිටිය ගෙම්බියක් ඒ ඊය ඇහිඳ

ගත්තා. ඉවාන් කුමාරයා ඈට කතා කළා:

"ගෙම්බියේ, ගෙම්බියේ ඊය මට දෙන්න."

"මාව සරණ පාවා ගනින්!" ගෙම්බිය කීවා.

"එහෙම කොහොම ද, ගෙම්බියක්ව මම සරණ පාවා ගන්නේ කොහොම ද?"

"මාව ගනින්. ඒ තමා නුඹේ ඉරණම."

ඉවාන් කුමාරයා කනගාටු වුණා. කරන්නට දෙයක් නැහැ, ගෙම්බිය අරගෙන මාලිගාවට ආවා. සාර් රජ මගුල් කෑම් තුනක් නියම කළා. ලොකු පුතාට සිටු දුව පාවා දුන්නා, මද්දුම පුතාට වෙළෙන්දාගේ දුව පාවා දුන්නා. අවාසනාවත් ඉවාන් කුමාරයාට ගෙම්බිය පාවා දුන්නා.

රජතුමා පුතුන්ට අඬ ගැසුවා: "නුඹලාගේ බිරියන් ගෙන් මහන්ට දක්ස කවුද කියලා දැනගන්ට මම කැමති යි. ඒ ගොල්ලා එක් එක්කෙනා කමිසයක් බැගින් මහලා හෙට වෙන කොට ගේන්ට ඕන."

පුත්තු තුන්දෙනා හිසනමා ආචාර කරලා යන්ට ගියා.

ඉවාන් කුමාරයා ගෙදර ගිහිල්ලා හිස බදාගෙන කල්පනා කරනවා. ගෙම්බිය ගෙබිම දිගේ පැන පැන ඇවිත් අහනවා: "ඉවාන් කුමාරයා ඔළුව බදාගෙන කල්පනා කරන්නේ මොකද? විපතක් සිදුවුණා ද?"

"නුඹට පිය රජ කීවා, හෙට උදේ වෙනකොට කමිසයක් මහන්ට කියලා."

"ඉවාන් කුමාරයා ඔයා කනගාටු වෙන්ට එපා. ගිහින් නිදාගන්න. රෑට නැති නුවණ උදේට පහළ වෙනවා." ගෙම්බිය පිළිතුරු දුන්නා.

ඉවාන් කුමාරයා නිදා ගන්ට ගියා. ගෙම්බිය එළිපත්තට ගිහිල්ලා ගෙඹි හම විසි කරලා ලස්සන වසීලිස්සා බවට පත් වුණා. එතරම් ලස්සන කෙනෙකු ගැන කියලා ඉවර කරන්නට බැහැ.

නුවණැති වසීලිස්සා අත්පුඩි ගහලා මෙහෙම කිව්වා:

"අම්මලා, නැන්දලා, එක්කාසු වෙයල්ලා, ලැහැස්ති වෙයල්ලා! මගේ තාත්තා ළඟ තියෙන කමිසය වගේ ලස්සන කමිසයක් හෙට උදේ වෙන කොට මහලා දියල්ලා!"

ඉවාන් කුමාරයා උදේ නැගිට්ටා. ගෙම්බිය ආයෙමත් ගෙබිම දිගේ පැන පැන යනවා. තුවායක ඔතාපු කමිසයක් මේසය උඩ තියෙනවා. ඉවාන් කුමාරයා සතුටුවෙලා කමිසයත් අරගෙන මාලිගාවට ගියා. ඒ වේලාවේ

දී රජ්ජුරුවෝ ලොකු පුතුන් දෙදෙනාගේ කමිස පිළිගනිමින් හිටියා. ලොකු පුතා කමිසය දුන්නා. රජතුමා කමිසය අරගෙන මෙහෙම කිව්වා:

"මේ කමිසය වැඩ කරන කොට අඳිනවා."

මද්දුම පුතා එයා ගෙනා කමිසය දුන්නා.

"නාන්ට යනකොට අඳින්නට මේ කමිසය හොඳා" රජ තුමා කීවා.

ඉවාන් කුමාරයා කමිසය දිග හැරියා. බොහොම ලස්සනයි. රිදී, රත්-තරන් වැඩ දාලා. අපූරු මල් වැඩ දාලා. රජ තුමා කමිසය දිහා බැලුවා.

"මෙන්න මේ තමා කමිසය. උත්සවයට අඳින්න හොඳයි."



අයියලා දෙන්නා ගෙදර යන ගමන් මෙහෙම කතා කළා:

"අපි ඉවාන් මල්ලි ගේ ගෙම්බිය දිහා බලලා හිනා වුණා. ඒක වැරදියි. එයා මායා කාරියක් වෙන්ට ඕන..."

රජතුමා නැවත පුතුන්ට අඬගැසුවා:

"හෙට නුඹලා ගේ කුමරියන් තුන් දෙනා මට පාන් පුච්චාගෙන එන්නට ඕන. කාගේ පාන්ද රස කියලා මම කාලා 'බලන්නම්."

ඉවාන් කුමාරයා ගෙදර ගිහිල්ලා, වාඩිවෙලා ඔළුව බදාගෙන කල්පනා කරනවා.

"මොකද කණගාටු වෙන්නේ?" ගෙම්බිය ඔහුගෙන් ඇසුවා.

"හෙට උදේ වෙනකොට පිය රජතුමාට පාන් ගෙනියන්නට ඕන" ඉවාන් කුමාරයා කිව්වා.

"කනගාටුවෙන්ට එපා. ඔයා නිදාගන්න. රෑට නැති නුවණ උදේට පහළ වෙනවා."

ඉස්සෙල්ලා ගෙම්බිය දිහා බලලා හිනාවුණු අයියලාගේ බිරියන් දෙදෙනා, ආච්චි කෙනෙකුව යැව්වා ඔත්තු බලන්න. ගෙම්බිය පාන් පුච්චන හැටි බලාගෙන එන්න කියලා ආච්චිව පිටත් කළා.


ගෙම්බියට මේ බව ඉව වැටුණා. ඈ පිටි අනලා ලිපේ ගිනි අඟුරු තියෙන තැන වළක් හාරලා අනපු පිටි ගුළිය එය ඇතුළට දැම්මා. ඔත්තු බලාපු ආච්චිය අයියලා ගේ බිරියන් දෙදෙනාට ගෙම්බිය කළ වැඩේ ගැන කිව්වා. ඒ දෙදෙනාත් ඒ විදිහට ම පිටි අනලා ලිප ඇතුළට දැම්මා.

ගෙම්බිය එළිපත්තට පැනලා, ආයෙමත් නුවණැති වසීලිස්සා බවට පත් වුණා. ඈ අත්පුඩි ගහලා මෙහෙම කිව්වා:

"අම්මලා, නැන්දලා, එක්කහු වෙන්න, ලෑහැස්ති වෙන්න. උදේ වෙන කොට මගේ තාත්තා ළඟදී මම කාපු රසැති බොහොම මොළොක් පාන් ගෙඩි වගේ ගෙඩියක් පුච්චලා දෙන්න."

ඉවාන් කුමාරයා උදේ නැගිට්ටා, මේසය උඩ පාන් ගෙඩියක් තියෙනවා. පාන් ගෙඩිය වටේට සීනි වලින් ලස්සන මල් වැඩ ආලා.

ඉවාන් කුමාරයා බොහොම සතුටු වෙලා පාන්ගෙඩිය තුවායක ඔතා-ගෙන පිය රජතුමා ළඟට ගියා. ඒ වේලාවේ දී රජතුමා ලොකු පුතුන් දෙදෙනා ගේ බිරියන් හදාපු පාන් පිළිගනිමින් හිටියා. ඔත්තු බලන්ට ගිය ආච්චි කී විදිහට ඒ දෙදෙනා අනාපු පිටි ගුළි ලිප ඇතුළට දැමූ හන්දා අඟුරු වගේ



කළුපාට පාන් ගෙඩි විතරයි ඒ ගොල්ලන්ට ලැබුණේ. රජතුමා ලොකු පුතා ගෙනා පාන් ගෙඩිය දිහා බලලා එය වැඩකාරයින් ගේ කෑමට යැව්වා. මද්දුම පුතා ගෙනා පාන් ගෙඩියත් වැඩකාරයින් ගේ කෑමට යැව්වා. ඉවාන් කුමාරයා ගෙනා පාන් ගෙඩිය රජ තුමාට දුන්නා.

"මෙන්න බලාපල්ලා පාන් ගෙඩියක හැටි. මේ වගේ පාන් උත්සව දවසට කෑමට හොඳයි."

හෙට උදේට තමන් ගේ බිරියන් එක්ක පෙනී හිටින්ට ඕනෑ කියලා රජතුමා පුතුන්ට අණ කළා.

ආයෙමත් ඉවාන් කුමාරයා ගෙදර ගිහිල්ලා, කනගාටු වෙලා හිස බදාගෙන කල්පනා කරනවා. ගෙම්බිය ගෙබිම දිගේ පැන පැන ආවා:

''බක, බක, ඉවාන් කුමාරයා ඔයා කනගාටුවෙන්නේ මොකද? පිය රජතුමා ඔයාට සැරවුණා ද?''

''අනේ ගෙම්බියේ කනගාටු නොවී කොහොම ද? පිය රජතුමා හෙට රජබොජුන් සාදයක් පවත්වනවා. ඔයත් එක්ක එන්ට කියලා මට නියම කළා. මම කොහොමද ඔයාව මිනිසුන්ට පෙන්වන්නේ?''

''ඔයා කනගාටුවෙන්ට එපා, ඉවාන් කුමාරයා, ඔයා සාදයට යන්න. මම නුඹේ පිටුපසින් එන්නම්. ලොකු හඬකුයි, ශබ්දයකුයි ඇහෙන්නට පුළුවන්. ඒකට බයවෙන්ට එපා. ඔයා මෙහෙම කියන්න. ''ඒ මගේ ගෙම්බිය රියකින් එනවා.''

ඉවාන් කුමාරයා තනියම ගියා. අයියලා දෙන්නා බිරියන් සමග සාදයට ඇවිල්ලා. ඉවාන් කුමාරයාගේ නෑනලා දෙදෙනා බොහොම ලස්සනට ඇඳලා, ඒ ගොල්ලන් ගේ කම්මුල් රතු පාටයි. ඒ ගොල්ල ඉවාන් කුමාරයා දෙස බලා හිනා වුණා:

''මොකද මල්ලියේ නුඹ තනියම ආවේ. නුඹේ බිරිඳව තුවායක ඔතා-ගෙන එන්ට තිබුණා නොවේ ද. ඔයතරම් ලස්සන කෙනෙකුව හොයාගත්-තේ කොහෙන් ද? මඩ ගොඩ පුරාම ඇවිදලා නේද.''

රජතුමා, පුතුන්, ලේලිලා, ඇමතියන්, අමුත්තන් සමග කෑම මේසයට වාඩි වුණා. ඕක් ලීයෙන් හදාපු මේසය උඩ රටා දමාපු මේස රෙද්දක් දමලා. රජ බොජුන් මේසය උඩ පිරිලා. ඔන්න එතකොටම ලොකු හඬකුයි, සද්-දයකුයි ඇහුණා. මුළු රජ මාලිගාවම හෙලවුණා. අමුත්තෝ කලබල වෙලා නැගිට්ටා.

''බය වෙන්ට එපා, ආදරනීය අමුත්තෙනි, ඒ මගේ ගෙම්බිය, රියෙන් එනවා.'' කියලා ඉවාන් කුමාරයා කීවා.

රජ මාලිගාවේ වාසල අසලට රත්රන් පාට රියක් සුදුපාට අශ්වයින් හයදෙනෙක් ඇදගෙන ආවා. රියෙන් බිමට බැස්සා නුවණැති වසිලිස්සා. දිලිසෙන ගවොමක් ඈ ඇඳලා හිටියා. ගවොමේ තරු දිලිසෙනවා. හිස් වැසුමේ අඩ සඳ. ඒ තරම් ලස්සන කුමරියක් ගැන හිතින් හිතාගන්ටවත් බැහැ. ඒ තරම් ලස්සන අය ඉන්නේ කතන්දරවල විතරයි. ඈ ඉවාන් කුමා-රයා ගේ අතින් ගෙන මේසයට වාඩි වුණා.

අමුත්තෝ කාලා, බීලා, සතුටුවෙන්ට පටන් ගත්තා. නුවණැති වසිලිස්සා රසැති පානයක් බීලා ගවුමේ වම් අතට, ඒ පානයෙන් ටිකක් වත් කර ගත්තා.

හංස මස් කෑල්ලක් කාලා කටුවක් ගවුමේ දකුණු අතට දැම්මා.

වසිලිස්සා කළ හැටි දැක්ක ඉවාන් කුමාරයා ගේ නෑනලා දෙන්නාත් ඒ විදිහටම කළා.

කාලා, බීලා, නැටුම් පටන් ගත්තා. නුවණැති වසිලිස්සා ඉවාන් කුමාරයා සමග නටන්න පටන් ගත්තා. ඈ නටලා, නටලා බමරයක් වගේ කරකැවිලා, කරකැවිලා ලස්සනට නටන හැටි බලන අමුත්තෝ පුදුම වුණා. වම් අත ගැස්සුවා විතරයි පොකුණක් මැවුණා. දකුණු අත ගැස්සුවා විතරයි, සුදු පාට හංසයෝ පොකුණේ පීනන්නට පටන් ගත්තා. රජතුමාත් අමුත්තෝත් පුදුම වුණා.

වැඩිමල් අයියලාගේ බිරියෝ දෙදෙනාත් නටන්නට පටන් ගත්තා. ඒ ගොල්ලොත් වම් අත ගැස්සුවා විතරයි ළඟ හිටිය අයගේ ඇඳුම් තෙමුණා. දකුණු අත ගැස්සුවා විතරයි මස් කටු කෑලි විසිවුණා. රජතුමාගේ ඇහැකට කටුවක් වැදුණා රජතුමාට කේන්ති ගිහිල්ලා ඒ දෙදෙනාව රජගෙදරින් පන්නා ගත්තා.

මේ වේලාවේ දී ඉවාන් කුමාරයා කාටවත් නොකියා ගෙදර ගිහිල්ලා ගෙඹිහම හොයාගෙන ලිපට දාලා පිච්චුවා.

නුවණැති වසිලිස්සා ගෙදර ඇවිල්ලා ගෙඹි හම සෙව්වා. ඈ වාඩිවෙලා බොහොම කනගාටු වුණා, දුක් වුණා.

"අනේ ඉවාන් කුමාරයා ඔයා මොනවා කළාද! ඔයා තව දවස් තුනක් ඉවසා හිටියානම්, මම සදහටම ඔයාගේ බිරිඳ වීමට ඉඩ තිබුණා. දැන් ඉතින් ඔයාට ආයුබෝවන්. මාව ඔයාට ඕන නම් ඔයා රටවල් තිස් නවයක් පහුකර-ගෙන හතළිස් වෙනි රටට එන්ට ඕන. නොමැරෙන කසේයි රාක්සයා ළඟ මාව හොයන්න."

නුවණැති වසිලිස්සා අළු පාට කොහෙකු වෙලා ජනේලයෙන් එළියට පියාඹා ගියා. ඉවාන් කුමාරයා අඬලා, අඬලා, හතර පැත්තටම හිස නමලා ආචාර කරලා නුවණැති වසිලිස්සාව හොයන්ට ඔළුව හැරුණු පැත්තට ගියා. ඉවාන් කුමාරයා ගිහිල්ලා, ගිහිල්ලා, බොහොම ඈත රටවලට ගියා. ඔහුගේ සපත්තු ගෙවී ගියා. කබාය ඉරුණා. තොප්පිය වැස්සට තෙමිලා දිරලා හිල් වුණා. ඉවාන් කුමාරයාට බොහොම මහලු සීයා කෙනෙකු හමුවුණා.


"ආයුබෝවන් තරුණයා! හොයන්නේ මොනවා ද? යන්නේ කො-හේ ද?"

ඉවාන් කුමාරයා කතාව මුල සිටම සීයාට විස්තර කළා. තමා ගේ දුක ගැන කීවා.

"අනේ ඉවාන් කුමාරයා, නුඹ ගෙඹි හම පුච්චා දැම්මේ මොකටද? ඒ හම එයාට ඇන්දෙව්වේ නුඹ නොවෙයි, ගලවන්නට නුඹට අයිතියක් නැහැ. නුවණැති වසීලීස්සා එයාගේ තාත්තාට වඩා කපටියි, නුවණක්කා-රයි, ඒ නිසා තාත්තා තරහවෙලා, අවුරුදු තුනක් තිස්සේ ගෙඹි හමක් අඳින්-ටත් ගෙම්බියක් වෙලා ඉන්ටත් ඇයට නියම කළා. දැන් ඉතින් මේ නූල් බෝලේ අර ගෙනැ වීසිකරලා ඒක යන දිහාවට නුඹත් බයනැතුව පලයන්."

සීයා මෙහෙම කියලා ඉවාන් කුමාරයාට නූල් බෝලයක් දුන්නා.

මහලු සීයාට ඉවාන් කුමාරයා ස්තුති කරලා නූල් බෝලය වීසි කරලා යන්ට



ගියා. නූල් බෝලය පෙරලී පෙරලී, යනවා. ඉවාන් කුමාරයා ඒ පස්සේ යනවා. එළිමහන් පිට්ටනියක් මැදින් යනකොට වලසෙකු හමුවුණා. ඉවාන් කුමාරයා ඌව මරන්ට ලැහැස්ති වුණා. වලසා මිනිහෙක් වගේ කුමාරයාට කතා කළා:

"ඉවාන් කුමාරයා නුඹ මාව මරන්ට එපා, මම නුඹට කවදාහරි පිහිට වෙනවා."

වලසා ගැන ඉවාන් කුමාරයාට දුක හිතිලා ඌව නොමරා යන්ට ගියා. තාරාවෙක් ඉවාන් කුමාරයාගේ හිසට උඩින් පියාසර කළා. ඔහු දුන්න අරගෙන තාරාවාට විදින්ට ලැහැස්ති වුණා. එවිට තාරාවා මිනිහකු වගේ කතාකරලා මෙහෙම කිව්වා:

"ඉවාන් කුමාරයා, නුඹ මාව මරන්ට එපා. මම නුඹට කවදාහරි පිහිට වෙනවා."



ඔහුට තාරාවා ගැන දුක හිතිලා ඌව නොමරා යන්ට ගියා. ටිකක් දුර ඔහොම යනකොට හාවෙක් දුවගෙන එනවා. ඉවාන් කුමාරයා ඌව මරන්ට ලැහැස්ති වුණා.

"ඉවාන් කුමාරයා මාව මරන්ට එපා. මම නුඹට කවදාහරි පිහිට වෙන්ට එනවා." හාවා කියුවා.

හාවාව නොමරා ඔහු යන්ට ගියා. ඉවාන් කුමාරයා මහ මුහුද ළඟට ආවා. මුහුදු වෙරළේ මාළුවෙක් හති දම දමා පැත්තකට පෙරලිලා ඉන්නවා.

"අනේ ඉවාන් කුමාරයා මට අනුකම්පා කරපන්. මාව ආපහු මහ මුහුදට දාපන්!"

ඔහු මාළුවාව මහ මුහුදට දමලා වෙරළ දිගේ යන්නට ගියා. ඔහොම ගිහිල්ලා, ගිහිල්ලා, ගිහිල්ලා ඔහුගේ නූල් බෝලය කැලෑවකට ආවා. එතැන කුකුල් කකුල් වලින් හිටගත්තු ගෙයක් තමා වටේටම කැරකැවෙනවා.

"ගේ පොඩ්ඩ, ගේ පොඩ්ඩ අම්මා කියාපු විදිහට කැලයට පිටුපා, මට මූණ ලා හිට ගන්න."

ගෙය ඔහුට මුහුණ ලා කැලයට පිටුපා හිටගත්තා. ඉවාන් කුමාරයා ගෙට ඇතුළු වුණා. ගෙයි ලිප මහ විසාලයි. ලිපේ නමවැනි ගඩොල් කැටය උඩ බාබායිගා යකින්න වාඩිවෙලා ඉන්නවා. ඇගේ කකුලක් බොහොම දිගයි. දෙතොල් රාක්කය උඩ තියෙලා. නහය වහළට ගැවෙන්නට තරම් උසයි.

"තරුණයා නුඹ මොකට ද මාව හොයාගෙන ආවේ? නුඹ කාව හරි හොයනව ද? කාගෙන් හරි හැංගෙන්ට හදනව ද?" බාබායිගා යකින්න ඇසුවා.

"අනේ බාබායිගා ආච්චියේ නුඹ හරි කපටියි, නුඹ මට ඉස්සෙල්ලා කෑම, බීම දීලා, නාන්ට වතුර ටිකක් උණු කරලා දීලා හිටපන්කො. ඔන්න ඊට පස්සෙ මගෙන් අහපන්."

බාබායිගා යකින්න වතුර උණු කරලා, කෑම බීම දීලා විස්තර ඇසුවා. ඉවාන් කුමාරයා තමාගේ බිරිඳ නුවණැති වසිලිස්සාව හොයන බව ඇට කීවා.

"මම දන්නවා, දන්නවා. නුඹේ බිරිඳ දැන් නොමැරෙන කසේයි රාක්සයා ළඟ ඉන්නවා. නුඹට ඒ රාක්සයාව පරද්දන්ට බැහැ. ඔහුගේ පණ තියෙන්නේ ඉඳිකටු තුඩක. ඒ ඉඳිකටු තුඩ තියෙන්නේ බිත්තරයක, බිත්තරය තියෙන්-

නෙ තාරාවාකුගේ බඩේ, තාරාවා ඉන්නේ හාවකුගේ බඩ ඇතුළේ, ඒ හාවා ඉන්නේ ගල් පෙට්ටගමක් ඇතුළේ, ඒ ගල් පෙට්ටගම බොහොම උස ඕක් ගහක් උඩ තියෙනවා. නොමැරෙන කශ්චෙයි රාක්සයා ඕක් ගහ එයාගේ ඇහැ වගේ ආරක්සා කරනවා.'' බාබායිගා යකින්න ඉවාන් කුමාරයාට කිව්වා.

ඉවාන් කුමාරයා බාබායිගා යකින්නගේ ගෙදර රෑ ගත කළා. උදේ පාන්දර උස ඕක් ගහ තියෙන තැන ඈ ඔහුට පෙන්නුවා. ඉවාන් කුමාරයා ගිහිල්ලා, ගිහිල්ලා උස ඕක් ගහට ළඟට ආවා. ගහේ අතු වැනෙන කොට සද්ද ඇහෙනවා. ගහ උඩ ගල් පෙට්ටගමක් තියෙනවා. එය අර ගන්නට අමාරුයි.

හිටිය හැටියේම වලසා ඇවිල්ලා ඕක් ගහ හොලවලා, එය මුල පිටින්ම උදුරා දැම්මා. ගල් පෙට්ටගම බිම වැටිලා බිඳුණා. ඒක ඇතුළේ හිටිය හාවා එළියට පැනලා දුවන්ට පටන් ගත්තා. එතකොට ඉවාන් කුමාරයාට පිහිට වෙනවයි කියාපු හාවා ඌ පස්සේ දුවලා ගිහිල්ලා ඌව කෑලි, කෑලි වලට ඉරා දැම්මා. හාවාගේ බඩ ඇතුළේ හිටිය තා-



රාවා අහසට පියාඹා ගියා. ඉවාන් කුමාරයාට පිහිට වෙනවයි කියාපු තාරාවා ඇවිල්ලා පියාඹා ගිය තාරාවාට හොටෙන් ඇන්නා. ඒ තාරාවාගේ බඩ ඇතුළේ තිබුණු බිත්තරය මහ මුහුදට වැටුණා.

එවිට ඉවාන් කුමාරයා අඬන්ට වුණා. මහ මුහුදට වැටුණ බිත්තරය කොහෙන් හොයන්ට ද? ඔන්න හිටි හැටියේම, ඉවාන් කුමාරයා මුහුදට දමාපු මාළුවා බිත්තරයත් හොයාගෙන වතුර උඩට ආවා. ඉවාන් කුමාරයා බිත්තරය බිඳලා ඉඳිකටුව අරගෙන තුඩ කඩන්ට පටන්ගත්තා. එතකොට නොමැරෙන කසේයි රාක්සයාට පණ නැතිව ගියා, ඔහු ගේ හදවත ගැහෙන්නට වුණා. කසේයි රාක්සයා ගැහෙනවා, දඟලනවා. ඉවාන් කුමාරයා ඉඳිකටු තුඩ කැඩුවා විතරයි කසේයි මළා.

ඉවාන් කුමාරයා කසේයි රාක්සයාගේ කිරි ගරුඬ මාලිගාවට ගියා. නුවණැති වසීලිස්සා දුවගෙන ඇවිල්ලා ඉවාන් කුමාරයාව සිපගත්තා. ඉවාන් කුමාරයා නුවණැති වසීලිස්සා සමග ගෙදර ඇවිල්ලා බොහෝ කලක් සැපෙන් හා සතුටින් ජීවත් වුණා.



රතු එළදෙන

මේ ලෝකේ හොඳ මිනිස්සුත් ඉන්නවා, තරමක් හොඳ අයත් ඉන්නවා, මිනිස් කමට නින්දා කරන අයත් ඉන්නවා.

එකෝමත් එක රටක පුංචි කෙල්ලක් හිටියා. ඈගේ දෙමාපියෝ මැරිලා. අහළ පහළ උදවිය මේ පුංචි කෙල්ලව හදලා, කෑම, බීම දීලා, වැඩ උගැන්නුවා. ඈට රෙදි වියන්ට පුළුවනි, නූල් කටින්ට පුළුවනි, ගේ අතු ගාන්ට පුළුවනි, හැම දෙයක්ම කරන්ට පුළුවනි.

පුංචි කෙල්ල එක ගෙදරක වැඩකාර කම් කළා. ඒ ගෙදර අයිතිකාරියට දූවරු තුන්දෙනෙක් හිටියා. ලොකු දුව ගේ නම නෙත්තා, මද්දුම දුව ගේ නම දෙනෙත්තා, පොඩි දුව ගේ නම තිනෙත්තා.

මේ දූලා තුන්දෙනා වැට අයිනට වෙලා ඉන්නවා, මහ පාර දිහා බලා-ගෙන ඉන්නවා, පුංචි කෙල්ල් ඒ ගොල්ලන්ට ඕන වැඩ ඔක්කොම කරනවා, ඔවුන්ගේ ඇඳුම් මහනවා, ඒ ගොල්ලන්ට ඕන රෙදි වියනවා, නූල් කටිනවා. කවුරුවත් පුංචි කෙල්ලට හොඳ කියන්නේ නැහැ.

ඉඳ හිටලා පුංචි කෙල්ල තණ පිටියට ගිහිල්ලා රතු එළදෙනව බදාගෙන, ඇගේ බෙල්ලට හේත්තු වෙලා, ඇගේ දුක කියනවා. ජීවත්වීම අමාරුයි කියලා කියනවා.

"රතු එළදෙන, මගේ කිරි අම්මේ, ඒ ගොල්ල මට ගහනවා, බණිනවා පාන් කෑල්ලක්වත් දෙන්නේ නෑ. අඩන්ටවත් උන් දෙන්නේ නැහැ, මෙට

උදේ වෙන්ට ඉස්සෙල්ලා රාත්තල් සීයක් කෙඳි පීරලා, නූල් වියලා, ඒවා සුදු පාට කරලා, ඔතලා දෙන්ට ඕන.''

රතු එළදෙන ඇයට උත්තර දුන්නා:

''මගේ ලස්සන පුංචි කෙල්ලේ, නුඹ මගේ එක් කනකින් රිංගලා, අනික් කනින් පිටවෙයන්. වැඩ ඉබේටම කෙරේවි.''

කිව් හැටියට ම වුණා. පුංචි කෙල්ල එක් කනකින් රිංගලා, අනික් කනින් එළියට ආවා. වැඩ ඉබේටම කෙරුණා. කෙඳි පීරිලා, නූල් වියලා, සුදු පාට කරලා, ඔතලා ඉවරයි.

පුංචි කෙල්ල ඇඳුම් පැළඳුම් අරගෙන ගෙදර අයිතිකාරිය වෙත ගෙනගියා. ඈ ඒවා අතගාලා, නවලා, පෙට්ටගමේ දාලා වැහුවා. පුංචි කෙල්ලට තවත් වැඩියෙන් වැඩ දුන්නා.

පුංචි කෙල්ල ආයෙමත් රතු එළදෙන ළඟට ඇවිල්ලා ඇයව බදාගෙන ඇගේ බෙල්ලට හේත්තු වෙලා, එක කනකින් රිංගලා අනික් කිනින් පිට වෙනවා.

අයිතිකාරිය ලොකු නෙත්තාට අඬ ගහලා මෙහෙම කිව්වා:

''අනේ මගේ හොඳ දුවේ, මගේ ලස්සන දුවේ ගිහිල්ලා බලපන් කවුද අම්මා තාත්තා නැති කෙල්ලට රෙදි වියන්ට, නූල් කටින්ට, නූල් ඔතන්ට උදව් වෙන්නේ කියලා.''



නෙත්තා පුංචි කෙල්ලත් එක්ක කැලෑවට ගියා. එයා එළිමහන් පිට්ටනියක තණ බිස්සක වාඩි වෙලා, ඉර අව්ව තපිනවා. අම්මා කී දේ ගැන හොයන්නට නෙත්තාට අමතක වුණා. පුංචි කෙල්ල ඇයව නලවනවා: ''නිදාගනින් නෙත්තා, නිදාගනින්! ඇහැ වහගෙන නිදාගනින්.''

නෙත්තාට තියෙන්නෙ එක ඇහැයි. ඒ ඇස වහගෙන ඈ නිදා ගත්තා. ඈ නිදා හිටින විට, පුංචි

කෙල්ල රතු එළදෙනගෙ කනකින් රිංගලා අනික් කනින් පිට වුණා. ඈ නූල් වියලා, සුදු පාට කරලා ඒවා ඔතලා ඉවර වුණා. අයිතිකාරියට කිසි දෙයක් දැන ගන්ට බැරි වුණා. ඈ දෙවෙනි දවසේදී දෙනෙත්තාට කතා කළා:

"අනේ මගේ ලස්සන දුවේ, මගේ හොඳ දුවේ. අම්මා තාත්තා නැති පුංචි කෙල්ලට වැඩ කරන්ට කවුද උදව් කරන්නේ කියලා හොයලා බලාපන්."

දෙනෙත්තා පුංචි කෙල්ලත් එක්ක කැලයට ගියා. එයා එළිමහන් පිට්ටිනියක තණ බිස්සක වාඩි වෙලා, ඉර අව්ව තපිනවා. දෙනෙත්තාටත් අම්මා කී දේ ගැන අමතක වුණා. පුංචි කෙල්ල ඇයව නැලෙව්වා:

"දෙනෙත්තා ඇහැක් වහගෙන නිදාගනින්,
දෙනෙත්තා අනිත් ඇහැත් වහගෙන නිදාගනින්!"

දෙනෙත්තා නිදාගත්තා. පුංචි කෙල්ල නූල් වියලා, සුදු පාට කරලා, රෝදාවලට ඔතලා ඉවර කළා. ඈ වැඩ කරලා ඉවර වුණා. දෙනෙත්තා තවමත් නිදි.

අයිතිකාරියට තුන්වෙනි දවසේදී බොහොම තරහ ආවා. ඇය පුංචි කෙල්ලට වැඩ ගොඩක් බාර දීලා තිනෙත්තාව යැව්වා. පුංචි කෙල්ලට කවුද උදවු කරන්නේ කියලා බලන්ට තිනෙත්තාට කිව්වා. තිනෙත්තා හිරු අව්වට වෙලා, උඩ පැන, පැන සෙල්ලම් කළා. හොඳටම හති වැටිලා ඈ තණ බිස්ස උඩ වැටුණා. පුංචි කෙල්ල තිනෙත්තාව නැලෙව්වා:

"තිනෙත්තා එක ඇහැක් වහගන්න!
අනිත් ඇහැත් වහගන්න!
දැත් ඉතින් නිදා ගන්න!"

ඈට තිනෙත්තා ගේ තුන්වෙනි ඇහැ ගැන අමතක වුණා.

තිනෙත්තා ගේ ඇස් දෙකක් නිදා ගෙන තුන්වෙනි ඇහැ ඇරගෙන බලනවා. පුංචි කෙල්ල රතු එළදෙනගේ එක කනකින් ගිහිල්ලා, අනික් කනින් එළියට ආපු හැටි ඒ ඇහැට පෙනුණා. එතකොට වැඩ ඔක්කොම ඉබේටම කෙරුණා.

තිනෙත්තා ගෙදර ගිහිල්ලා වුටු දේ අම්මාට කීවා.

අයිතිකාරිය අනිත් දවසේ දී ඇගේ සැමියාට මෙහෙම කිව්වා:

"රතු එළදෙනව මරා දාපන්!"

සැමියා කැමැති වුණේ නැහැ.



''නුඹට පිස්සුද? රතු එළදෙන නාකි නැහැ. මරන්න ඕන නැහැ. එළදෙන හොඳයි!''

''නෑ! ඌව මරා දමාපන්!'' අයිතිකාරිය ඉල්ලා හිටියා.''

කරන්නට දෙයක් නැහැ. ඔහු පිහිය මුවහත් තියන්ට පටන් ගත්තා. පුංචි කෙල්ලට මේ ගැන දැනගන්ට ලැබුණා. ඈ තණ පිටියට ගිහිල්ලා රතු එළදෙන බදාගෙන ඇට මෙහෙම කිව්වා:

''රතු එළදෙන මගේ කිරි ළම්මේ! උන් නුඹව මරන්ට හදනවා!''

''ලස්සන පුංචි කෙල්ලේ නුඹ මගේ මස් කන්න එපා, මගේ කටු ටික එකතු කරලා ලේන්සුවකින් බැඳලා, වළක් හාරලා, වළලාපන්. කිසිම දවසක මාව අමතක කරන්ට එපා. හැමදාම උදේට කටුවලට වතුර වත්කරපන්.''

රතු එළදෙන ඇට කිව්වා.

අයිතිකාරිය ගේ සැමියා රතු එළදෙන මැරුවා. පුංචි කෙල්ල එළදෙන ගේ මස් කටේවත් තිබ්බේ නැහැ. ඇට හොඳටම බඩ ගිනියි. නමුත් මස් කෑවේ නැහැ. ඈ එළදෙනගේ කටු ඔක්කොම වළලා දැම්මා. දවස් පතාම කටුවලට වතුර වත්කළා.

කටු වළලාපු තැන පුදුම ඇපල් ගහක් වැවුණා. ගෙඩි බොහොම ලස්සනයි. ඒ ගහේ කොළ රත්රන්, අතු රිදී ඇපල් ගහ ළඟින් යන අය නැවතිලා ගහ දිහා බලනවා. ඈතින් යන අය ගහ දිහා ඕනෑකමින් බලනවා.

ඔහොම කල් ගෙවුණා. නෙත්තා යි, දෙනෙත්තා යි, තිනෙත්තා යි වත්තේ ඇවිද, ඇවිද හිටියා. දවසක් ආ ගෙවත්ත ළඟින් බොහොම හයිය ඇති, පොහොසත්, ලස්සන, තරුණයෙක් ගියා. ලස්සන ඇපල් ගහ දැකලා ඔහු තරුණියන්ට කතා කළා:

"නුඹලාගෙන් කවුද මට ඇපල් ගෙඩියක් කඩාගෙන එන්නේ. මම ඇයව සරණ පාවා ගන්නවා."

තුන්දෙනාම දිව්වා ඇපල් ගහ ළඟට.

ඇපල් ගෙඩි බොහොම පහළින් තිබුණා. මේ ගොල්ලෝ තුන්දෙනා ළං වෙන කොට ගහ උස් වුණා. අතු ඔළුවටත් උඩින් උසට හිටියා.

ඇපල් ගෙඩිවලට ගල් ගැහුවා. කොළ ඇහැට වැටුණා. දර කෝටුවලින් ගැහැව්වා, ඒත් වැටුනේ නැහැ. ඇපල් කඩන්ට කොතරම් මහන්සි ගත්තත් හරිගියේ නැහැ. අත්වල හම සීරිලා තුවාල වුණා.

ගෙදර වැඩ කළ පුංචි කෙල්ල දැන් ලස්සන තරුණියක්. ඈ ඇපල් ගහ ළඟට ආවා විතරයි, ගහේ අතු පාත් වුණා. ඈ ඇපල් ගෙඩියක් කඩලා, තරුණයාට දුන්නා. ඒ තරුණයා ඇයව සරණ පාවා ගත්තා. එදා ඉඳලා ඈ දුකක් නැතුව සතුටින් ජීවත්වෙනවා.



මාරියා මොරේව්නා

ඔන්න එකෝමත් එක රටක ඉවාන් කියල කුමාරයෙක් හිටියා. ඔහුට නංගිලා තුන්දෙනකි. එක්කෙනෙකු ගේ නම මාර්යා කුමාරී. අනිත් එක්කෙනා ගේ නම ඕල්ගා කුමාරී. තුන්වැනියා ගේ නම ආන්නා කුමාරී.

මේ ගොල්ලන් ගේ දෙමාපියෝ මැරීලා. පිය රජතුමා මැරෙන විට, පුතාට කතා කරලා මෙහෙම කිව්වා:

''නුඹ ගේ නංගිලා සරණ පාවා ගන්ට ඉස්සෙල්ලාම එන අයට ඒ ගොල්ලන්ව සරණ පාවා දීපන්. නංගිලාව නුඹ ළඟ වැඩිකල් තියාගන්ට එපා.''


ඉවාන් කුමාරයා දෙමාපියන්ව වළලා දුක ඉවසාගන්ට බැරුව නංගිලාත් සමග මල් වත්තට ඇවිදින්ට ගියා.

ඔන්න හිටි හැටියේ ම කළුපාට වළාකුළු අහසේ පාවෙන්නට වුණා. අහස ගොරවන්නට පටන් ගත්තා.

''අනේ කුමරියනි අපි ඉක්මනින් මාලිගාවට යමු'' ඉවාන් කුමාරයා කිව්වා.

මාලිගාවට ආවා විතරයි, ගොරවලා හෙණ පහරක් වැදිලා මාලිගා වහල දෙබෑ වුණා. අහසේ ඉඳලා උකුස්සෙක් මාලිගාවට ආවා. උකුස්සා බිම හැප්පිලා ලස්සන කුමාරයෙක් බවට පත් වුණා. ඉතින් ඒ කුමාරයා කියනවා:

''ආයුබෝවන් ඉවාන් කුමාරයා! ඉස්සර මම ආවේ අමුත්තකු හැටියට.



අද ආවේ මනමාලයකු හැටියටයි. මම කැමතියි නුඹේ ලොකු නංගී, මාර්යා කුමරියව සරණ පාවා ගන්ට.''

''නුඹ එයාට ආදරේ නම්, එයාව සරණ පාවා ගනින්. එයාට නුඹ එක්ක යන්ට පුළුවනි!''

මාර්යා කුමරිය කැමති වුණා. ඔහු ඇය සරණ පාවාගෙන, ඔහුගේ රටට ගෙනගියා.

පැය ගෙවී ගියා, දවස් ගෙවී ගියා. ඔහොම අවුරුද්දක්ම ගෙවී ගියා. ඉවාන් කුමාරයා නංගිලා දෙන්නත් එක්ක මල් වත්තේ ඇවිදින්න ගියා. ආයෙමත් අහසේ කළු වළාකුළු පායන්නට වුණා. විදුලි කොටන්ට පටන් ගත්තා.

''කුමරියනි, මාලිගාවට යමු!'' ඉවාන් කුමාරයා කීවා.

මාලිගාවට ආවා විතරයි, අකුණක් වැදිලා මාලිගා වහල දෙබෑ වුණා. රාජාලියෙක් මාලිගාවට ඇතුළු වුණා. ඌ ඔළුව බිම හප්පා ගත්තා විතරයි, ලස්සන කුමාරයෙක් වුණා. ඉතින් ඒ කුමාරයා කියනවා:

''ආයුබෝවන් ඉවාන් කුමාරයා, ඉස්සර මම ආවේ අමුත්තකු හැටියටයි. අද නම් ආවේ මනමාලයකු හැටියටයි. මා කැමතියි ඕල්ගා කුමරියව සරණ පාවා ගන්න.''

''නුඹ එයාට ආදරේ නම්, නුඹ ඇයව සරණ පාවා ගනින්. මම ඒ අදහසට කැමතියි.''

ඕල්ගා කුමරිය රාජාලියාට කැමති වුණා. ඔහු ඇයව සරණ පාවාගෙන තමා ගේ රටට ගෙනගියා.

අවුරුද්දක් ගත වුණා. ඉවාන් කුමාරයා බාල නංගීට කතා කළා:

''අපි මල් වත්තේ ඇවිදින්නට යමු.''

පොඩ්ඩක් වෙලා ඇවිදින විට, අහස කළුපාට වුණා. ගොරවන්ටයි, විදුලි කොටන්ටයි පටන් ගත්තා.

''නංගියේ අපි මාලිගාවට යමු!''

මාලිගාවට ආවා විතරයි, අකුණක් වැදුණා. මාලිගාවේ වහල දෙකට දෙබෑ වුණා. කාක්කෙක් මාලිගාවට ඇතුළු වෙලා ඔළුව බිම හප්පලා බොහොම ලස්සන කුමාරයෙක් බවට පත් වුණා. ඉස්සෙල්ලා ආපු උකුස්සයි, රාජාලියයි දෙන්නාම ලස්සනයි. මේ කාක්කා කුමාරයෙක් වුණාට පස්සේ අර දෙදෙනාටත් වැඩිය ලස්සනයි.



''ඉවාන් කුමාරයා ඉස්සර මම ආවේ අමුත්තකු හැටියටයි, දැන් ආවේ මනමාලයකු හැටියටයි, මම කැමතියි ආන්නා කුමරියව සරණ පාවා ගන්න.''

''නුඹ මගේ නංගීට ආදරේ නම්, නුඹ ඇයව සරණ පාවා ගන්නවාට මම කැමතියි.''

ආන්නා කුමරිය සතුටු වුණා. කාක කුමාරයා ආන්නා කුමරියව සරණ පාවා ගෙන එයාගේ රටට ගියා.

ඔන්න දැන් ඉතින් ඉවාන් කුමාරයා අවුරුද්දක් තිස්සේම නංගිලා නැතිව තනිවම ඉන්නවා. එයාට දැන් කාන්සියි.

''නංගිලාව බලන්ට යන්ට ඕන.'' ඉවාන් කුමාරයා කල්පනා කළා.

ඉවාන් කුමාරයා ගමනට පිටත් වුණා. ඔහු ගිහිල්ලා, ගිහිල්ලා, එක තැනකට ආවා. එතන විනාශ වුණු ලොකු යුද්ද හමුදාවක් වැටිලා ඉන්නවා.

ඉවාන් කුමාරයා මෙහෙම ඇහුවා:

''මෙතන මිනිහෙක් පීවත්වෙලා ඉන්නවා නම් පිළිතුරු දීපල්ලා. මේ මහා යුද්ද හමුදාව විනාස කෙරුවේ කවුද?''

මිනිහෙක් ඔහුට පිළිතුරු දුන්නා:

''මේ මහා යුද්ද හමුදාව විනාස කෙරුවේ මාරියා මොරේව්නා කුමාරි, අපේ සුන්දර රැජිණිය.''

ඉවාන් කුමාරයා තවත් දුර ගියා. සුදුපාට කූඩාරම් තියෙන රටකට ඔහු ආවා. ඒ රටේ රැජිණිය මාරියා මොරේව්නා ඉවාන් කුමාරයාව පිළිගන්ට ආවා.

''ආයුබෝවන් ඉවාන් කුමාරයා, කොහෙ ද ඔයා යන්නේ, නිදහසේ යනවා ද? නිදහස නැති හින්දා යනවා ද?''

''වීර කුමාරයෝ නිදහස නැති හින්දා රට රටවල්වලට යන්නේ නැහැ.'' ඉවාන් කුමාරයා පිළිතුරු දුන්නා.

''ඉතින් ඔයාට හදිසියක් නැති නම් මගේ කූඩාරමක නැවතිලා විවේක ගන්න.''

ඉවාන් කුමාරයා සතුටු වුණා. රෑ දෙකක්ම කූඩාරමේ ගත කළා. ඉවාන් කුමාරයාට මාරියා මොරේව්නා ගැන හිතක් ඇතිවෙලා එයාව සරණ පාවා ගත්තා.

සුන්දර රැජිණිය මාරියා මොරේව්නා ඉවාන් කුමාරයාත් සමග ඇගේ රටට ගියා. ඔහොම ඉතින් ටික කාලයක් දෙදෙනා ම එකට ජීවත් වුණා. මාරියා මොරේව්නාට හිතුණා යුද්ද කරන්නට ඕන කියලා. යුද්ද හමුදාවත් අරගෙන යුද්දෙට යන්ට ලැස්තිවෙලා මාරියා මොරේව්නා ඉවාන් කුමාරයාට අණ කළා:

''ඔයා මගේ රටේ හැම තැනම ගිහිල්ලා, හැම තැනම බලන්න. හැබැයි, මේ ගබඩා කාමරේට විතරක් යන්ට එපා.''

ඉවාන් කුමාරයාට ඉවසුම් නැහැ. මාරියා මොරේව්නා ගිය හැටියේම ඉවාන් කුමාරයා ගබඩා කාමරේට ගිහිල්ලා දොර ඇරලා බැලුවා. එතැන ඉන්නවා නොමැරෙන කසේයි නැමැති රාක්ෂයා. ඔහුව දම්වැල් දොළහකින් බැඳලා.

කසේයි ඉවාන් කුමාරයාව දැකලා මෙහෙම කිව්වා:

''මට බොහොම වතුර තිබහයි. වතුර ටිකක් දෙන්න. අවුරුදු දහයක් තිස්සේ මම වද විඳිනවා, කෑවෙත් නැහැ, බීවෙත් නැහැ. මගේ උගුර කට වේලිලා.''

ඉවාන් කුමාරයා ඔහුට වතුර බාල්දියක්ම දුන්නා. ඔහු ඒක බීලා තවත් වතුර ඉල්ලුවා:

"එක වතුර බාල්දියක් බීලා මට මදි. තවත් වතුර දෙන්න."

ඉවාන් කුමාරයා තවත් වතුර බාල්දියක් දුන්නා. කශ්චෙයි රාක්සයා ඒක බීලා තවත් වතුර බාල්දියක් ඉල්ලුවා. තුන්වැනි වතුර බාල්දිය බීපු හැටියේම ඔහුට ආයෙමත් බොහොම සවි සක්තිය ලැබුණා. ඔහු දම්වැල් දොළහම කඩා දැම්මා.

"ඉවාන් කුමාරයා නුඹට බොහොම ස්තුතියි. දැන් ඉතින් නුඹට කවදාක්වත් නුඹේ මාරියා මොරේව්නා බලන්ට ලැබෙන්නේ නැහැ." කශ්චෙයි රාක්සයා කිව්වා.

කශ්චෙයි රාක්සයා කුණාටුවක් වගේ ජනේලයෙන් ඉගිළිලා ගිහිල්ලා සුන්දර රැජිණිය මාරියා මොරේව්නාව අල්ලා ගත්තා. රාක්සයා ඇය තමාගේ රටට ගෙනගියා.

ඉවාන් කුමාරයා බොහොම අඬලා, අඬලා, ගමනට ඕන කරන බඩුත් අරගෙන පිටත් වුණා:

"මොනවා වුණත්, මාරියා මොරේව්නාව හොයා ගන්නවාමයි!"

දවසක් ගියා, දෙකක් ගියා, තුන්වෙනි දවසේදී උදේ පාන්දර ඔහු ලස්සන මාලිගාවක් දැක්කා. මාලිගාව ඉස්සරහ ලොකු ඕක් ගහක් තියෙනවා. එතැන උකුස්සෙක් ඉන්නවා. උකුස්සා පියාඹා ඇවිල්ලා ඔළුව බිම ගහලා කුමාරයෙක් වුණා.

"ආ ඉවාන් කුමාරයා මගේ මස්සිනා ඇවිල්ලා!" කියලා ඔහු කෑ ගැසුවා.

මාර්යා කුමරියා දුවගෙන ඇවිල්ලා බොහොම සතුටු වෙලා, අයියාගෙන් සැප සනීප ගැන ඇසුවා. තොරතුරු සේරම ඇසුවා. ඉවාන් කුමාරයා මාලිගාවේ දවස් තුනක් නැවතිලා හිටියා.

"මීට වැඩිය නුඹලාගේ මාලිගාවේ මට නවාතැන් ගන්ට බැහැ. මගේ සුන්දර රැජිණ, මාරියා මොරේව්නා හොයන්නට මම යනවා." ඉවාන් කුමාරයා කිව්වා.

"එයාව හොයන්ට ලේසි නැහැ. කොහොම වුණත් නුඹගේ රිදී හැන්ද මෙහි තියලා පලයන්. හැන්ද දිහා බල, බලා නුඹ ගැන මතක් කරන්නම්." උකුසු කුමාරයා කිව්වා.

ඉවාන් කුමාරයා උකුස්සාට රිදී හැන්ද දීලා ගමනට පිටත් වුණා.

දවසක් ගියා, දෙකක් ගියා, තුන්වැනි දවසේ උදේ පාන්දර ඉස්සෙල්ලා දැකපු මාලිගාවටත් වඩා ලස්සන මාලිගාවක් ඉවාන් කුමාරයා දැක්කා. මාලි-

ගාව ළඟ ඕක් ගහක් තියෙනවා. ගහ උඩ රාජාලියෙක් වහලා ඉන්නවා.

රාජාලියා ගහෙන් පියාඹලා බිමට ඇවිල්ලා, ඔළුව බිම හප්පලා ලස්සන කුමාරයෙක් වෙලා කෑ ගැහුවා:

"ඕල්ගා කුමරිය නැගිටින්න. අපේ ආදරනීය අයියා ඇවිල්ලා!"

ඕල්ගා කුමරිය දුවගෙන ඇවිල්ලා අයියාව බදාගෙන සිපගත්තා. සැප දුක් ගැන ඇහුවා. තොරතුරු ඇහුවා. ඉවාන් කුමාරයා මද්දුම නංගිලාගේ මාලිගාවේ දවස් තුනක් ඉඳලා මෙහෙම කිව්වා.

"නුඹලා ගේ මාලිගාවේ මීට වැඩිය ඉන්ට බැහැ. සුන්දර රූපිණිය, මාරියා මොරේව්නා හොයාගෙන මම යනවා." රාජාලි කුමාරයාට කිව්වා.

"එයාව හොයාගන්ට ලෙහෙසි වෙන එකක් නැහැ. නුඹව මතක් කරලා බල, බලා ඉන්ට නුඹේ රිදී ගැරුප්පුව අපට දීලා පලයන්."

ඉවාන් කුමාරයා රිදී ගැරුප්පුව ඔවුන්ට දීලා ගියා.

දවසක් ගියා, දවස් දෙකක් ගියා, තුන්වැනි දවසේදී උදේපාන්දර ඉස්සෙල්ලා දැකපු මාලිගා දෙකටත් වඩා ලස්සන මාලිගාවක් ඉවාන් කුමා-රයා දැක්කා.

මාලිගාව ළඟ ඕක් ගහක හිටියා කාක්කෙක්. එකපාරටම කාක්කා පියාඹලා බිමට බැහැලා, ඔළුව බිම හප්පා ගත්තා විතරයි, බොහොම ලස්සන කුමාරයෙක් වුණා.

"ආන්නා කුමරියනි ඉක්මනට එන්න, අපේ අයියා ඇවිල්ලා!"

ආන්නා කුමරිය දුවගෙන ඇවිල්ලා අයියාව සතුටින් පිළි අරගෙන, බදාගෙන සිපගත්තා. සැප දුක් ගැන ඇසුවා. තොරතුරු ඇසුවා.

ඉවාන් කුමාරයා බාල නංගි ළඟ දවස් තුනක් ඉඳලා ගමනට පිටත් වෙලා මෙහෙම කිව්වා:

"ආයුබෝවන්, දැන් ඉතින් මම යනවා, මගේ සුන්දර රූපිණිය, මාරිය මොරේව්නා හොයාගෙන."

"නුඹට මාරියා මොරේව්නා හොයන්ට ලෙහෙසි නැහැ. නුඹ ගැන මතක් කරලා බල බලා ඉන්නට නුඹේ රිදී පුටුව අපට දීලා පලයන්" කාක කුමාරයා කීවා.

ඉවාන් කුමාරයා රිදී පුටුව ඔවුන්ට දීලා, සමුගෙන යන්ට ගියා.

දවසක් ගියා, දවස් දෙකක් ගියා. තුන්වැනි දවසේදී මාරියා මො-රේව්නා ළඟට ගියා.

මාරියා මොරේව්නා ඉවාන් කුමාරයාව දැකලා, ඔහුව බදාගෙන අඬ අඬා මෙහෙම කිව්වා:

"අනේ ඉවාන් කුමාරයා, ඔයා මගේ කීම ඇහුවේ නැත්තේ ඇයි? ඔයා ගබඩා කාමරේට ගිහිල්ලා නොමැරෙන කසේයි රාක්ෂයාව නිදහස් කළේ ඇයි?"

"මාරියා මොරේව්නා, මට සමාවෙන්න. පරණ දේ මතක් කරන්ට එපා. නොමැරෙන කසේයි රාක්ෂයා අහල පහල පෙන්නට නැහැ, අපි යමු. ඔහුට අපව අල්ලා ගන්ට බැරිවේවි."

ඉවාන් කුමාරයයි, මාරියා මොරේව්නායි පැනලා ගියා. කසේයි රාක්ෂයා දඩයමේ ගිහින්. හවස ඔහු ගෙදර ආවා. ඔහුගේ අස්වයා කකුල් අද්ද, අද්දා යනවා.

"නුඹ මොකද ඔහොම යන්නේ, කෑවා මදිද? නැතිනම් විපතක් ඉව වැටුණ ද?"

"ඉවාන් කුමාරයා ඇවිත් මාරියා මොරේව්නාව ගෙනගියා." අස්වයා පිළිතුරු දුන්නා.

"ඒ ගොල්ලන්ව අල්ලා ගන්ට පුළුවන් ද?"

"තිරිඟු වපුරලා, ඒවා වැවෙන කල් බලාගෙන ඉඳලා, අස්වැන්න කපලා, තිරිඟු කොටලා, පිටි කරලා, පිටි වලින් පෝරනු පහක පාන් පුච්චලා, ඒ පාන් කෑවාට පස්සේ, එළවාගෙන ගියත්, ඒ ගොල්ලන්ව අල්ලා ගන්ට පුළුවනි." අස්වයා කීවා.

කසේයි රාක්ෂයා අස්වයා පිට නැගලා ඉවාන් කුමාරයා ළඟටම ආවා.

"පළමුවැනි වතාවට මම නුඹට සමාව දෙනවා, නුඹ මට කරුණාවෙන් වතුර ගෙනැවිත් දීපු හන්දා. දෙවැනි වතාවටත් මම නුඹට සමාව දෙනවා. තුන්වෙනි වතාවේ දී, අහු වුණොත් මම නුඹව කෑලි කෑලි වලට කපනවා. නුඹ ප්‍රවේසම් වෙයන්."

මාරියා මොරේව්නාව උදුරාගෙන රාක්ෂයා ආපහු ගියා. ඉවාන් කුමා-රයා ගලක් උඩ වාඩිවෙලා අඬන්ට පටන් ගත්තා.

අඬලා, අඬලා, ආපහු මාරියා මොරේව්නාව හොයාගෙන ගියා. කසේයි රාක්ෂයා ගෙදර හිටියේ නැහැ.

"මාරියා මොරේව්නා අපි යමු."

"අනේ, ඉවාන් කුමාරයා, රාක්ෂයා අපව අල්ලා ගනී වි."

''ඒකට කමක් නැහැ. පැයක් හරි, දෙකක් හරි අපට එක්වෙලා ඉන්නට පුළුවනි!''

දෙදෙනාම එක්වෙලා යන්ට ගියා.

නොමැරෙන කසේයි රාක්සයා ගෙදර ආවා. ඔහුගේ අස්වයා හෙමින් එනවා.

''නුඹ මොකද හෙමින්, හෙමින් යන්නේ? කෑවා මදි ද? නැතිනම් විපතක් ඉව වැටුණ ද?''

''ඉවාන් කුමාරයා ඇවිත් මාරියා මොරේව්නාව ගෙනගියා.''

''ඒ ගොල්ලන්ව අල්ලා ගන්ට පුළුවන් ද?''

''බාර්ලි වපුරලා, වැවෙන කලියෙන් බලා ඉඳලා, අස්වැන්න කපලා, බීර හදලා, වෙරිවෙනතුරු බීර බීලා, හොඳට නිදාගෙන ඉඳලා, නැගිටලා, ඊට පස්සේ ගියත් උන්ව අපට අල්ලා ගන්ට පුළුවනි.''

කසේයි රාක්සයා ගිහිල්ලා ඉවාන් කුමාරයාව අල්ලා ගත්තා.

''මම නුඹට කිව්වා නේද, ආයෙත් කවදාවත් මාරියා මොරේව්නාව නුඹට දකින්නට ලැබෙන්නේ නැහැයි කියලා.'' රාක්සයා කිව්වා.

කසේයි රාක්සයා මාරියා මොරේව්නාව උදුරාගෙන යන්ට ගියා.



ඉවාන් කුමාරයා තනි වුණා. ඔහු අඬලා, අඬලා, ආපහු මාරියා මොරේව්නා හොයන්නට ගියා. එදත් කසේයි රාක්සයා ගෙදර හිටියේ නැහැ.

''මාරියා මොරේව්නා, අපි යමු!''

''අනේ ඉවාන් කුමාරයා රාක්සයා ඇවිත් ඔයාව අල්ලාගෙන කෑලි, කෑලි වලට ඉරා දමාවි නේද!''

''එහෙම කළාට කමක් නැහැ. මට ඔයා නැතුව බැහැ!''



දෙදෙනා ම යන්ට ගියා. නොමැරෙන කසේයි රාක්සයා අස්වයා පිට යනවා, අස්වයා හෙමින් හෙමින් යනවා.

''මොකද නුඹ හෙමින්, හෙමින් යන්නේ? විපතක් ඉව වැටුණ ද?''

''ඉවාන් කුමාරයා ඇවිල්ලා, මාරියා මොරේව්නාව ගෙනගියා.''

කසේයි රාක්සයා ඉක්මනට ගිහින්, ඉවාන් කුමාරයාව අල්ලාගෙන, ඔහුව කෑලි කෑලි වලට කපලා, ලාටු පීප්පයක දමලා, පීප්පය වටේ යකඩ පටි ගහලා, ඒක මහ මුහුදට දැම්මා. මාරියා කුමාරියව අරගෙන ගියා.

රාක්සයා ඉවාන් කුමාරයාව කෑලි, කෑලි වලට කපාපු හැටියේ ම, එයා නංගිලා ගේ සැමියන්ට දීපු රිදී හැන්දයි, රිදී ගෑරුප්පුවයි, රිදී පුටුවයි කළුපාට වුණා.

''අනේ, අපොයි, විපතක් වෙලා!'' ඒ කුමාරයෝ තුන්දෙනා ම කිව්වා.

උකුස්සා පියාඹා ගිහිල්ලා මහ මූදේ තිබුණ පීප්පය අරගෙන ගොඩ දැම්මා.

රාජාලියා ගියා, පණදෙන වතුර හොයාගෙන එන්නට. කාක්කා ගියා

පණ ගන්න වතුර ගෙනෙන්නට.

තුන්දෙනාම එකතුවෙලා පිප්පය ගළවලා ඉවාන් කුමාරයා ගේ ඇගේ මස් කෑලි හා ඇට කටු එළියට අරගෙන, ඒවා හරි විදිහට තිබ්බා.

කාක්කා පණ ගන්න වතුර ඉහපු හැටියේම මස් කෑලි ඇට කටු ඔක්කොම බොහොම හොඳට, ඉස්සෙල්ලා තිබුණා වගේ පෑස්සුණා. රාජාලියා පණදෙන වතුර ඇඟට ඉහපු හැටියේම ඉවාන් කුමාරයාට පණ ආවා. ඔහු නැගිටලා මෙහෙම කියනවා:

"මඳෑ, මම හුඟාක් වේලා නිදා ගත්තා නේද!"

"අපි නැතිනම්, නුඹ තව බොහෝ කාලයක් නිදාගනී වී." කුමාරයෝ තුන්දෙනා කීවා. "දැන් ඉතින් අපේ මාලිගාවලට එන්න!" කියලා ඒ ගොල්ල ඉවාන් කුමාරයාට අඬ ගැහුවා.

"සහෝදරවරුනි, අනේ මට බැහැ! මම යනවා මාරියා මොරේව්නාව හොයගෙන."

මාරියා මොරේව්නා ළඟට ඇවිල්ලා ඉවාන් කුමාරයා මෙහෙම කියනවා:

"නුඹ නොමැරෙන කෂේයි රාක්ෂයාගෙන් අහලා දැනගනින්, කොහෙන්ද එයා ඔය තරම් හොඳ අශ්වයකු හොයා ගත්තේ කියලා."

මාරියා මොරේව්නා හොඳ වේලාවක් බලාගෙන ඉඳලා අස්වයා ගැන ඇහුවා:

"රට, රටවල් තිස් නවයකට එපිට, හතළිස් වැනි රටේ ගිනි ගඟ ළඟ ඉන්නවා බාබායිගා යකින්න. එයාට ඉන්නවා වෙළඹක්. ඔය වෙළඹගේ පිට උඩ නැගලා තමයි, බාබායිගා යකින්න අහසේ පියාඹන්නේ. ඈ ළඟ තව ඒ වගේ හොඳ වෙළඹියන් ඉන්නවා. මම බාබායිගා යකින්න ළඟ දවස් තුනක්ම එඬේර රස්සාව කළා. මට වෙළඹක් දුන්නේ නැහැ. අස්ස පැටියෙක් විතරක් දුන්නා."

"නුඹ කොහොම ද ගිනි ගඟ හරහා ගියේ?" මාරියා මොරේව්නා ඇහුවා.

"මගේ ළඟ තියෙනවා මායාකාර ලේන්සුවක්. ඔය ලේන්සුව තුන් පාරක් දකුණු පැත්තට වනාපු හැටියේම ගිනි ගඟ හරහා උසට, උසේ ලොකු පාලමක් මැවෙනවා. ගිනි දැල් ඒ පාලමට වැදෙන්නේ නැහැ." කෂේයි රාක්ෂයා කීවා.

මාරියා මොරේව්නා මේ කතාව ඉවාන් කුමාරයාට කිව්වා.

ඈ මායාකාර ලේන්සුවත් හොරෙන් අරගෙන ඉවාන් කුමාරයාට දුන්නා.

ඉවාන් කුමාරයා ලේන්සුවේ බලෙන් ගිනි ගඟෙන් එගොඩ වෙලා, බාබායිගා යකින්න ළඟට ගියා. ඔහුට දවස් ගණනක් කෑමත් නැහැ, බීමත් නැහැ. කිරිල්ලියකු යි, කුරුළු පැටවු හත් දෙනෙකු යි එනවා දැකලා ඉවාන් කුමාරයා මෙහෙම කියනවා:

"එක කුරුළු පැටියකුට කන්ට ඕන."

"ඉවාන් කුමාරයා පැටවු කන්ට එපා. නුඹට ඕන වෙලාවට මම නුඹට පිහිට වෙන්නම්." කිරිල්ලිය කන්නලව් කළා.

ඉවාන් කුමාරයා නොකා යනවා. කැලයක මී වදයක් තියෙනවා ඔහු දැක්කා.

"පැණි ටිකක් කන්ට ඕන." ඉවාන් කුමාරයා කීවා.

මී වදයේ මී මැසි රැජිණ කතා කළා:

"ඉවාන් කුමාරයා, මගේ මී වදය කඩන්ට එපා. මම නුඹට පිහිට වෙන්-නම්."

මී වදය නොකා ඔහු යන්ට ගියා. ඔන්න ඒ පාර සිංහදෙනකුයි, සිංහ පැටියකුයි ඉස්සරහට එනවා.

"මේ සිංහ පැටියාව හරි මරාගෙන කන්ට ඕන. දැන්නම් හොඳටම බඩ ගිනියි." ඉවාන් කුමාරයා කිව්වා.

"සිංහ පැටියාව මරන්ට එපා. නුඹට පිහිට වෙන්ට මම එනවා." සිංහ-දෙන කීවා.

"හොඳයි, නුඹේ කැමැත්තක්!"

බඩගින්නේ ගිහිල්ලා, ගිහිල්ලා, බාබායිගා යකින්නගේ ගේ ළඟට ආවා. ඒ ගේ වටේට කණු දොළහක් හිටවලා තියෙනවා. කණු එකොළහක මිනී ඔළු. එක කණුවක විතරයි, මිනී ඔළුවක් නැත්තේ.

"ආයුබෝවන් ආච්චියේ!"

"ආයුබෝවන්, ඉවාන් කුමාරයා! හිතේ කැමැත්ත අනුව ආවා ද? උවමනාවකට ආවා ද?"

"නුඹ ළඟ වැඩ කරලා යෝද අස්වයකු ලබාගන්නට ආවා."

"ඉවාන් කුමාරයා මා ළඟ අවුරුද්දක් වැඩ කරන්ට ඕන නැහැ. දවස් තුනක් මා ළඟ ඉන්න. වෙළඹියන්ට තණකොළ කැව්වොත්, ඒ ඇති. එතකොට මම නුඹට යෝද අස්වයකු තෑගි දෙන්නම්. නැතිනම් කනගාටු වෙන්ට එපා. අර කණුවේ නුඹේ ඔළුව හිටවනවා."

ඉවාන් කුමාරයා එකඟ වුණා.

බාබායිගා ඔහුට කෑම බීම දීලා කරන්ට ඕන වැඩ කියා දුන්නා.

ඉවාන් කුමාරයා වෙළඹියන්ව තණ පිටියට ගෙනගියා විතරයි, උන් වලිග වනලා, හැම තැනම දුවලා ගියා. ඇස් වහලා, ඇස් ඇර බලන්ටත් ඉස්සෙල්ලා වෙළඹියන් ආ ගිය අතක් නැහැ.

ඉවාන් කුමාරයා අඬලා, අඬලා, ගළක් උඩට වෙලා නිදාගත්තා.

හිරු බැහැලා යන්ට වුණා. කිරිල්ලිය ඉවාන් කුමාරයා නිදා හිටි තැනට ඇවිල්ලා ඔහුට කතා කළා:

''නැගිටපන්, ඉවාන් කුමාරයා. නුඹගේ වෙළඹියෝ ඔක්කෝම ගෙදර ඇවිල්ලා!''

ඉවාන් කුමාරයා ගෙදර ගියා. බාබායිගා යකින්නට තරහ ඇවිත් වෙළඹියන්ට කෑ ගහනවා, බණිනවා:

''නුඹලා ගෙදර ආවේ මොකට ද?''

ගෙදර නැවිත් පුළුවන්ද, ලෝකේ ඉන්න ඔක්කොම කුරුල්ලෝ ඇවිල්ලා අපේ ඇස්වලට කොටන්ට පටන් ගත්තා නෙව.'' වෙළඹියෝ කීවා.

''හෙට නුඹලා තණ පිට්ටනිවලට දුවන්ට එපා. මූකලන් කැලෑවට පලයල්ලා.''

ඉවාන් කුමාරයා රෑ නිදා ගත්තා. පහුවදා උදේ බාබායිගා යකින්න ඉවාන් කුමාරයාට මෙහෙම කියනවා:

''එක වෙළඹියකුටවත් තණකොළ නොදී තිබුණොත්, එක වෙළඹියක් හරි නැති වුණොත් එහෙම නුඹ ගේ ඔළුව කපලා අර කණුව උඩ හිටවනවා.''

ඔහු වෙළඹියන් අරගෙන එළියට ගියා විතරයි, උන් වලිග වනලා, මූකලන් කැලෑවට පැනලා ගියා. ආයෙමත් ඉවාන් කුමාරයා අඬලා, අඬලා නිදා ගත්තා. හිරු බැස ගියා. සිංහදෙන දුවගෙන ආවා:

''නැගිටපන්, ඉවාන් කුමාරයා, නුඹේ වෙළඹියන් ඔක්කෝම ගෙදර ඇවිත්.''

ඉවාන් කුමාරයා නැගිටලා ගෙදර ගියා. බාබායිගා යකින්න ඉස්සර අවසටත් වැඩියෙන් වෙළඹියන්ට කෑ ගහන්ටයි, බණින්ටයි පටන් ගත්තා:

''නුඹලා මොකට ද ගෙදර ආවේ?''

''ගෙදර නැවිත් කොහොම ද? කැලෑවේ හැම පැත්තකින්ම නපුරු සත්තු ඇවිල්ලා අපව මරා දමන්නට ලෑස්ති වුණා!''

"එහෙනම් හෙට නුඹලා මහ මුහුද පැත්තට දුවපල්ලා."

එදා රෑ ඉවාන් කුමාරයා බාබායිගා යකින්න ගේ ගෙදර නිදා ගත්තා. උදේ පාන්දර ඉවාන් කුමාරයාට බාබායිගා යකින්න මෙහෙම කිව්වා:

"අද නුඹ මගේ වෙළඹියන්ට කෑම නුදුන්නොත් නුඹේ ඔළුව අර කණුව උඩ තියෙනවා."

ඔහු වෙළඹියන්ව තණ පිටියට ගෙනගියා. උන් වළිග වනලා, එකවරම මහ මුහුද පැත්තට දුවලා ගියා. උන් මුහුදට බැහැලා බෙල්ල විතරක් උඩ තියාගෙන ඉන්නවා. ඉවාන් කුමාරයා ගලක් උඩ වාඩිවෙලා අඬලා, අඬලා නිදාගත්තා. හිරු බැහැලා ගියා. මී වදයේ රැජිණ ඉගිලිලා ඇවිත් මෙහෙම කියනවා:

"ඉවාන් කුමාරයා නැගිටපන්. නුඹේ වෙළඹියන් ගෙදර ගියා. නුඹත් ගෙදර පලයන්. හැබැයි, බාබායිගා යකින්න ගේ ඇහැට පෙනෙන්ට ඉන්ට එපා. අස්ස ගාලට ගිහිල්ලා අස්ස පැටවුන් ඉන්න තැන හැංගියන්. එතැන එක මුරණ්ඩු අස්ස පැටියෙක් ඉන්නවා. ඌ ගොම ගොඩේ ලැගලා ඉන්නවා. රෑ යාමට නුඹ ඒ අස්ස පැටියාවත් අරගෙන නුඹ ගේ රටට පලයන්."

ඉවාන් කුමාරයා නැගිටලා අස්ස ගාලට ගිහිල්ලා, අස්ස පැටවුන් ඉන්න තැනට වෙලා නිදා ගත්තා. බාබායිගා යකින්න වෙළඹියන්ට කෑ ගහනවා, බණිනවා:

"නුඹලා මොකට ද ගෙදර ආවේ?"

"ගෙදර නැවිත් කොහොම ද? අහස පුරා මී මැස්සෝ ඇවිත් අපට දස්ට කළා. අපි ගෙදර ආවා." වෙළඹියෝ කීවා.

බාබායිගා යකින්න නිදා ගත්තා. රෑ යාමෙට ඉවාන් කුමාරයා මුරණ්ඩු අස්ස පැටියාවත් අරගෙන උගේ පිට උඩ නැගලා ගිනි ගඟ ළඟට ආවා. මායාකාර ලේන්සුව අතට අරගෙන දකුණු පැත්තට හැරිලා තුන් පාරක් වැනුවා. එතකොට, කොහොම ,මැවුණ ද කියන්ට දන්නේ නැහැ, ගිනි ගඟ හරහා බොහොම උස, බොහොම ලස්සන පාලමක් මැවුණා.

ඉවාන් කුමාරයා පාලම හරහා ගිහිල්ලා ලේන්සුව අතට අරගෙන වම් පැත්තට හැරිලා දෙවරක් වැනුවා. එතකොට පාලම බොහොම හීන් වුණා.

උදේ බාබායිගා යකින්න නැගිටලා බලනවා. මුරණ්ඩු අස්ස පැටියාව හොයනවා. ඌ පේන්නවත් හිටියේ නැහැ. බාබායිගා යකින්න යකඩ වංගෙඩිය උඩ නැගලා, යකඩ මෝල් ගහෙන් කොට, කොටා, කොස්සෙන්



අතුගගා, අහසින් යනවා, අස්ස පැටියාව හොයන්නට.

ගිනි ගඟ ළඟට ඇවිල්ලා පාලම දිහා බලා කල්පනා කරනවා:

''හොඳ පාලමක්!''

බාබායිගා යකින්න පාලම දිගේ ගිහිල්ලා මැදට ආවා විතරයි, පාලම කඩා වැටුණා. බාබායිගා යකින්න ගිනි ගඟට වැටිලා පිච්චිලා මළා.


ඉවාන් කුමාරයා අස්ස පැටියා තණ පිටියට ගෙනියලා ඌට තණ කැව්වා. ඌ බොහොම හොඳ අස්වයෙක් වුණා.

ඔය අස්සයා පිට නැගලා ඉවාන් කුමාරයා මාරියා මොරේව්නා ළඟට ආවා. ඈ ඇවිත් ඔහු බදාගෙන සිප ගත්තා.

''ඔයා කොහොම ද නොමැරී බේරුණේ?''

ඉවාන් කුමාරයා විස්තර කළා. ''අපි යමු'' කියලා ඔහු මාරියා මොරේව්නාට කිව්වා.

''ඉවාන් කුමාරයා, ආයෙමත් කශ්චෙයි රාක්ෂයා ඔයාව අල්ලා ගත්තොත් ඔයාව මරා දමාවි යි කියලා මට බයයි!''



''නැහැ! දැන් ඉතින් එයාට මාව අල්ලා ගන්ට බැහැ! මා ළඟ ඉන්නවා අපූරු අස්සයෙක්. ඌ සුළඟ වගේ වේගයෙන් දුවනවා.''

ඉවාන් කුමාරයයි, මාරියා මොරේව්නායි අස්වයා පිට උඩ නැගිලා යන්ට ගියා.

නොමැරෙන කසේයි රාක්සයා ගෙදර එනවා. ඔහුගේ අස්වයා හෙමින්, හෙමින් එනවා.

''අස්සයා නුඹට බඩගිනි ද? නැතිනම් විපතක් ඉව වැටිලා ද?''

''ඉවාන් කුමාරයා ඇවිල්ලා මාරියා මොරේව්නාව ගෙනගියා.''

''ඔවුන්ව අල්ලා ගන්ට පුළුවන් ද?''

''අන්නේ නැහැ. ඉවාන් කුමාරයාගේ අස්වයා බොහොම සවිබල තියෙන සතෙක්. මටත් වඩා හොඳයි.'' අස්වයා කීවා.

''බැහැ. ඉවසාගෙන ඉන්ට බැහැ! උන්ව අල්ලා ගන්ට යනවා.''

කසේයි රාක්සයා ගිහිලිලා, ගිහිල්ලා ඉවාන් කුමාරයාගේ බෙල්ල කපන්ට කඩුව ඇදලා ගත්තා. එතකොට ඉවාන් කුමාරයාගේ අස්වයා

නොමැරෙන කසේයි රාක්සයාට පයින් පහරක් ගැහුවා. රාක්සයාගේ ඔළුව පැළුණා. ඉවාන් කුමාරයා රාක්සයාට පොල්ලකින් ගැහුවා.

ඊට පස්සේ ඉවාන් කුමාරයා දර ගොඩක් ගහලා, රාක්සයාව දර ගොඩට ඇද අමලා ගිනි තිබ්බා. රාක්සයාගේ අළු අරගෙන හුළඟේ පා කරලා හැරියා.

මාරියා මොරේව්නා රාක්සයා ගේ අස්වයා ගේ පිට උඩ නැග්ගා. ඉවාන් කුමාරයා එයාගේ අසු පිට නැග්ගා. ඉස්සෙල්ලාම කාක කුමාරයා ගේ මාලිගා-වට ගියා. පස්සේ රාජාලියා ගේ මාලිගාවට ගියා. අවසානයේදී උකුස්සා ගේ මාලිගාවට ගියා. නංගිලා තුන්දෙනයි, ඒ ගොල්ලන්ගේ කුමාරයොයි බොහොම ආදරයෙන් මේ දෙදෙනාව පිළිගත්තා.

''අනේ ඉවාන් කුමාරයා නුඹව දකිමට පවා අපි හිතුවේ නැහැ. නුඹ උත්සාහ ගත්තේ නිකමට නොවෙයි: මාරියා මොරේව්නා තරම් ලස්සන කුමරියක් මේ මුළු ලෝකේ කොහේවත් නැහැ'' කුමරයෝ තුන්දෙනා කීවා.

නංගිලා තුන්දෙනා ගේ මාලිගාවල දී හොඳට කාලා, බීලා, සතුටු වෙලා, පසුව ඒ ගොල්ලන්ගේ රටට ගියා.

ඉවාන් කුමාරයායි, මාරියා මොරේව්නායි බොහොම සැපෙන්, සතුටින් ජීවත් වෙනවා. යහපත් වැඩ කරනවා, මී පැණි බොනවා.



ලොකු නුවණක්කාර පුංචි ඉවාන්

එකෝමත් එක රටක ආච්චි කෙනෙකුයි සීයා කෙනෙකුයි හිටියා. සීයා කුරුල්ලන් සහ සතුන් දඩයම් කිරීමෙන් ජීවත් වුණා. ඒ ගොල්ලෝ බොහෝ කල් හිටියට පොහොසත් වුණේ නැහැ. ආච්චි කනගාටු වෙලා මෙහෙම කිව්වා:

"මුළු ජීවිත කාලයේම වැඩ කළා. රස කෑමක් කැවේ නැහැ. රස බීමක් බිව්වේ නැහැ. හොඳ ඇඳුමක් ඇන්දේ නැහැ. අපට දූ දරුවොත් නැහැ. අපේ මහලු කාලේදී අපට පිහිට වෙන්නේ කවුද?"

"ආච්චියේ නුඹ කනගාටුවෙන්ට එපා. අතේ හයිය තියෙන කලියෙන්, පයින් ගමන් කරන්ට හයිය තියෙන කලියෙන් බඩගින්නේ ඉන්නේ නැහැ. ඉදිරි කාලය ගැන හිතන්ට ඕන නැහැ." සීයා කිව්වා.

මෙහෙම කියලා සීයා දඩයම් කරන්ට ගියා.

කැලේට ගිහිල්ලා උදේ ඉඳලා හවස් වෙන කල් ඇවිද්දා, ඇවිද්දා. කුරුල්ලන්, සතුන් දඩයම් කිරීමට බැරි වුණා. දඩයමක් නැතුව ගෙදර යාමට ඔහු කැමති වුණේ නැහැ. මොනවා කරන්ට ද? ඉර බැහැලා යනවා. ගෙදර යන්නත් ඕන.

ගෙදර යන්ට ලෑස්ති වුණා විතරයි, සීයා ළඟින්ම, කුරුල්ලෙක් පියාපත් සට සට ගාලා, ගහලා අහසට නැග්ගා, ඒ තරම් ලස්සන කුරුල්ලෙක් මීට ඉස්සෙල්ලා දැකලා නැහැ.

සීයා දුන්න අරගෙන විදින්නට ඉස්සෙල්ලා කුරුල්ලා පියාඹා ගියා.



"ඌ මට අයිති නැතුවා වගෙයි." සීයා කීවා.

කුරුල්ලා හැංගිලා හිටිය පඳුර දිහා සීයා බැලුවා. ඔන්න ඒ පඳුර අස්සේ කුරුළු බිත්තර තිස් තුනක් තියෙනවා.

"මේ බිත්තර වලින් හරි ප්‍රයෝජන ගන්ට ඕන."

සීයා බඳ පටිය තදකරගෙන බිත්තර තිස් තුන කමිසය යටට දමාගෙන ගෙදර ගියා.

සීයා ඔහොම යනකොට, යනකොට, ඔහුගේ බඳ පටිය බුරුල් වෙලා බිත්තර එකින් එක බිමට වැටෙන්නට පටන් ගත්තා.

එක බිත්තරයක් බිමට වැටුණා. ඒක බිඳිලා, තරුණයෙක් උපන්නා. තවත් බිත්තරයක් වැටුණා, තවත් තරුණයෙක් උපන්නා. ඔහොම බිත්තර තිස් දෙකක් බිම වැටිලා තරුණයෝ තිස් දෙදෙනෙක් උපන්නා.

සීයා බඳ පටිය තද කරගත්තු නිසා තිස් තුන්වෙනි බිත්තරය බිම වැටුණේ නැහැ. සීයා ආපසු හැරිලා බැලුවා. තරුණයෝ තිස් දෙදෙනෙක් ඔහුගේ පිටුපසින් එනවා. මුහුණු එක වගේමයි, උස එක වගේමයි, හිස කෙස්



එකම පාටයි. ඇහැට පේන දේ සීයාට විශ්වාස කරන්න බැහැ. තිස් දෙදෙනාම එකවර කතා කරලා මෙහෙම කිව්වා:

''ඔබ අපව හොයාගත්තා. දැන් ඉතින් ඔබ තමා අපේ තාත්තා. අපි ඔබගේ දරුවෝ. අපව ගෙදර ගෙනියන්න.''

''අපට එක ළමයෙක් වත් හිටියේ නැහැ. දැන් එකපාරටම ළමයින් තිස් දෙදෙනෙක්.'' මහලු සීයා කල්පනා කළා.

ගෙදර ඇවිල්ලා සීයා කතා කරනවා:

''ආච්චියේ, නුඹ හැමදාම අපට ළමයින් නැතැයි කියලා කණගාටු වුණා. ඇඬුවා. ඔන්න එකපාරටම අපට පුතුන් තිස් දෙදෙනෙකු ලැබිලා තියෙනවා. පුතුන්ට කෑම දීපන්.'' ළමයින් ලැබුණු සීයා ආච්චිට විස්තර කළා.

ආච්චි හිටගෙන ඉන්නවා විතරයි, ඇට එක වචනයක්වත් කතා කරන්ට බැහැ. ඔහොම ඉඳලා, ඉඳලා, දෑත වනලා, කෑම මේසය පිළියෙල කරන්ට ගියා. සීයා බඳ පටිය බුරුල් කරලා, උඩ කබාය ගැලෙව්වා විතරයි තිස් තුන්-

වැනි බිත්තරය බිම වැටිලා, තිස් තුන්වැනි තරුණයාත් උපන්නා.

"නුඹ ආවේ කොහෙ ඉඳල ද?"

"මම ඔබ ගේ පුතා. පුංචි ඉවාන්."

සීයාට මතක් වුණා:

"හැබැටම පඳුරේ බිත්තර තිස් තුනක් තිබුණා නෙවද. පුංචි ඉවාන්, වාඩිවෙලා කෑම කාපන්."

තරුණයෝ තිස් තුන්දෙනා මේසයට වාඩි වෙලා ආච්චි දීපු කෑම සියල්ලම ඉක්මනට කාලා ඉවර කළා. ඒ ගොල්ලන්ට බඩ ගිනිත් නැහැ. ඒ ගොල්ලන්ගේ බඩ පිරුණෙත් නැහැ.

ඒගොල්ල රෑ නිදාගත්තා. උදේ පාන්දර නැගිටලා පුංචි ඉවාන් තාත්තාට මෙහෙම කියනවා:

"තාත්තා අපව හොයා ගත්තානම්, තාත්තා අපට රස්සාවල් හොයලා දෙන්නත් ඕන."

"අනේ ළමයිනේ මම නුඹලාට රස්සාවල් හොයලා දෙන්නේ කොහොම ද? අපට ඉඩම් නැහැ, කුඹුරු නැහැ. ගොවිතැන් කරන්නේ නැහැ. අපට හරකුන්, අස්පයින් නැහැ. ඇකැති නැහැ."

"නැහැ කියලා හරියන්නේ නැහැ. අපි මිනිසුන් ළඟට ගිහිල්ලා රස්සාවල් හොයා ගන්නම්. තාත්තා කම්මල් බාස් ළඟට ගිහිල්ලා මිට දිගට තියෙන කැති තිස් තුනක් හදවලා දෙන්න."

තාත්තා කම්මලට ගිහිල්ලා ඇකැති හදවගන්නවා. පුතාලා එකතුවෙලා දිග රීටි තිස් තුනකුයි, දෑතිපෝරු තිස් තුනකුයි හදාගත්තා.

තාත්තා ඇකැති අරගෙන ගෙදර ආවා. පුංචි ඉවාන් ඇකැති තිස් තුනයි, දෑතිපෝරු තිස් තුනයි අයියලාට බෙදලා දුන්නා.

"අපි කොහේ හරි ගිහිල්ලා රස්සාවල් හොයා ගනිමු. සල්ලි හම්බ කරලා, ඉඩම් අරගෙන ගොවිතැන් කරමු. අම්මාටයි, තාත්තාටයි උදව් කරමු" පුංචි ඉවාන් කීවා.

පුත්තු තිස් තුන්දෙනා අම්මාගෙනුයි, තාත්තාගෙනුයි සමුගෙන රස්සාවල් හොයන්ට ගියා. ඔහොම ගිහිල්ලා, ගිහිල්ලා, ඒ ගොල්ල මහ නගරයකට ආවා. රජ මාලිගාවේ වැඩ කරන ලොක්කෙක් රියකින් ඇවිත් මේ ගොල්ලන්ට ළං වුණා. ළං වෙලා මෙහෙම අහනවා:

"තරුණයිනි නුඹලා වැඩ කරලා ගෙදර යනව ද, නැතිනම් වැඩ හො-

යාගෙන යනව ද? නුඹලා වැඩ හොයා යනවානම්, කරන්න වැඩ දෙන්නම්.''

''ඔබ තුමා ළඟ තියෙන වැඩ මොනවා ද?'' පුංචි ඉවාන් අහනවා.

''අමාරු වැඩ නොවෙයි. රජ්ජුරුවන්ගේ වතුවල තණකොළ කපන්න ඕන. තණකොළ වේලා ගන්ට ඕන. පිදුරු මිටි වලට බැඳලා ගොඩගහන්ට ඕන කවුද නුඹලාගේ නායකයා?''

හැම දෙනාම නිහඬවෙලා හිටියා. පුංචි ඉවාන් ඉස්සරහට ඇවිත් කතා කළා:

''හොඳයි. කරන්ට ඕන වැඩ පෙන්වන්න.''

ඒ ගොල්ලන්ව රාජ මාලිගාවට අයිති තණ පිටියට ගෙනාවා.

''සුමාන තුනකින් වැඩ ඉවර කරන්ට පුළුවන් ද?'' රජ ගෙදර වැඩ බලන ලොක්කා ඇහුවා.

''කාල ගුණය හොඳනම්, දවස් තුනකින් ඉවර කරන්නම්.'' පුංචි ඉවාන් කීවා.

මාලිගාවේ වැඩ බලන ලොක්කා සතුටු වුණා. ''තරුණයිනි වැඩ පටන් ගනිල්ලා. හොඳ වැටුප් ගෙවන්නම් ඉල්ලන කෑම ජාති ගෙනත් දෙන්නම්.''

''අපට ඕන බැදපු හරකුන් තිස් තුන්දෙනක්. වයින් බාල්දි තිස් තුනක්. පාන් ගෙඩි තිස් තුනක්. වෙන කිසිදෙයක් ඕන නැහැ.''

මාලිගාවේ වැඩබාර ලොක්කා යන්ට ගියා. සහෝදරවරු තිස් තුන්-දෙනා ඇකැති මුවහත් කරලා වැඩ පටන් ගත්තා. ගිනිරාමෙට වැඩ කළා. හැන්දෑ වෙන කොට තණකොළ ඔක්කොම කපලා ඉවර කළා. මේ වෙලා-වේ දී රජ ගෙදර කෝකි අප්පුලා බැදපු හරකුන් තිස් තුන්දෙනෙකුයි, වයින් බාල්දි තිස් තුනකුයි, පාන් ගෙඩි තිස් තුනකුයි ගෙනාවා. සහෝදරවරු වයින් බාල්දියෙන් බාගයක් බැගින් බීලා, බැදපු හරකුන්ගෙන් බාගයක් බැගින් කාලා, පාන් ගෙඩිවලින් බාගයක් බැගින් කාලා, නිදාගත්තා.

පහුවදා ඉර අව්ව යම්තම් ඇතිවුණා විතරයි තණකොළ වේලෙන්ට ඇලා තණකොළ මිටි බැන්දා. හැන්දෑ වෙනකොට මිටි බැඳලා ඉවර කරලා, ඒගොල්ල ආයෙමත් වයින් බාල්දි බාගයක් බැගින් බීලා, බැදපු හරක් බාගය බැගින් කැවා. පාන් ගෙඩි වලින් බාගයක් බැගින් කැවා.

''අයියා රජ ගෙදරට ගිහිල්ලා කියන්න, වැඩ ඉවර කළා, ඒක බාර ගන්න කියලා.'' පුංචි ඉවාන් අයියා කෙනෙකු රජ ගෙදරට යැව්වා.

අයියා ආපහු ආවා. එයත් එක්ක රජ ගෙදර ලොක්කයි, රජතුමයි ආවා.

රජ තුමා තණ පිටිය වටේට ගිහිල්ලා ගණන් කරලා බැලුවා. එක තණකොළ ගහක්වත් ඉතුරු වෙලා තිබුණේ නැහැ.

''තරුණයිනි, නුඹලා බොහොම ඉක්මනට තණ කොළ කපලා, වේලලා, මිටි බැන්දා. නුඹලා වැඩට බොහොම දක්සයි. නුඹලාට වැටුප් හැටියට රුබල් සීයක් බැගින් එක් එක් කෙනාට ගෙවන්නම්, එක්කෙනාට වයින් පිප්පයක් බැගින් තෑගි දෙන්නම්. දැන් නුඹලා තණකොළ මුර කරන්ට ඕන. හැම අවුරුද්දෙම කවුදෝ ඇවිල්ලා තණකොළ හොරකම් කරනවා. හොරාව අල්ලා ගන්ට බැරි වුණා.'' රජතුමා කීවා.

''මහ රජතුමනි, අයියලාට ගෙදර යන්ට අවසර දෙන්න. පිදුරු මිටි මම මුරකරන්නම්.''

රජතුමා කැමති වුණා. අයියලා රජ ගෙදරට ගිහිල්ලා සල්ලියි, වයිනුයි ලබා ගත්තා. රජ ගෙදරින් රෑ කෑම කාලා ගෙදර ගියා.

පුංචි ඉවාන් රජ ගෙදර තණ පිටියට ඇවිල්ලා මුර කළා. රෑට නිදාගන්නේ නැතුව මුර කරනවා. දවල්ට රජ ගෙදරින් කෑම කාලා, එතනම නිදා ගන්නවා.

සරත් කාලය ආවා. සරත් කාලේදී දවල් කාලය අඩුවෙලා අඳුරු රෑ කාලය වැඩි වෙනවා. පුංචි ඉවාන් පිදුරු මිටියකට වෙලා නිදාගන්නේ නැතුව බලාගෙන ඉන්නවා.

ඔන්න හිටිහැටියේම, මහ දවල් ඉර පෑව්වා වගේ, මහ රෑ, මහ එළියක් ඇති වුණා. පුංචි ඉවාන් හොඳට බලනවා: මහ මුහුදේ ඉඳලා රන් කෙඳි අස්වයා ඇවිල්ලා තණ කොළ මිටි වලට පැන්නා. රන් කෙඳි අස්වයා දුවනවා, මහ පොළව දෙදෙරනවා, අස්වයාගේ බෙල්ලේ රන් කෙඳි දිලිසෙනවා. උගේ නාස් පුඩුවලින් ගිනි පිටවෙනවා. උගේ කන් වලින් දුම් පිටවෙනවා.

රන් කෙඳි අස්වයා දුවගෙන ඇවිල්ලා තණ කොළ කන්ට පටන් ගත්තා. පුංචි ඉවාන් උගේ පිට උඩට පැන්නා. රන් කෙඳි අස්වයා රජ්ජුරුවන් ගේ තණ පිටිය පුරාම දුවන්ට පටන් ගත්තා. පුංචි ඉවාන් අස්වයා පිට වාඩිවෙලා එක අතකින් උගේ බෙල්ල අල්ලාගෙන ඉන්නවා.

අනිත් අතින් කසයක් අරගෙන රන් කෙඳි අස්වයාට ගහනවා. පුංචි ඉවාන් අස්වයාව මඩ ගොඩට එලෙව්වා.

අස්වයා මඩ ගොඩේ දුවලා, දුවලා, උගේ බඩ ළඟට එනතුරු, මඩ ගොඩේ එරුණා. එතකොට අස්වයා නැවතිලා මිනිහෙක් වගේ කතා කළා:

''පුංචි ඉවාන් නුඹ මාව අල්ලා ගත්තා, නුඹ මගේ පිට උඩ නැගලා

මාව මෙල්ල කළා, මට ගහන්න එපා, මට වද දෙන්න එපා, මම නුඹට හොඳට සේවය කරන්නම්.''

පුංචි ඉවාන් රන් කෙඳි අස්වයාව රජ ගෙදර ඉස්තාලෙට ගෙනිල්ලා යතුරු දාලා වැහැව්වා. ඊට පස්සේ රජ ගෙදර කුස්සියට ගිහිල්ලා කෑම කාලා නිදාගත්තා. ඊට පහුවදා රජතුමා ළඟට ගිහිල්ලා මෙහෙම කිව්වා:

''මහ රජ තුමනි, ඔබ තුමා ගේ රාජකීය තණ පිට්යේ තණ කොළ කන හොරාව මම අල්ලා ගත්තා. ඔබ තුමාට හොරාව පෙන්වන්නට පුළුවනි.''

රජතුමා රන් කෙඳි අස්වයාව දැකලා පුදුම වුණා, සතුටු වුණා:

''ඉවාන් නුඹ පුංචි වුණාට ලොකු නුවණක්කාරයෙක්. නුඹට මගේ අස්ස ඉස්තාලේ නායක කම බාර දෙනවා.''



ලොකු නුවණක්කාර පුංචි ඉවාන් හැටියට එදා ඉඳලා ඔහු ප්‍රසිද්ධ වුණා.

ඔන්න ඉතින් පුංචි ඉවාන් රජ්ජුරුවන් ගේ ඉස්තාලේ වැඩ. ඔහු රෑට නිදා ගන්නේ නැහැ. අස්වයින්ට සාත්තු කරනවා. රජුගේ අස්වයෝ තරයි, දිලිසෙනවා, උන්ගේ කෙඳි හරියට සේද වගේ දිලිසෙනවා. පුංචි ඉවාන් උන් ගේ බෙල්ලේ කෙඳි පීරලා වලිගය පීරලා. ලස්සනයි. බලන්න බැරි තරම් ලස්සනයි.

රජතුමා ඉවාන් ගේ වැඩවලට බොහොම සතුටු වුණා, කොතරම් සතුටු වුණා ද, කීවොත් කටින් කියන්න බැරි තරම් සතුටු වුණා.

''ලොකු නුවණක්කාර පුංචි ඉවාන්, මගේ උපන් තේකට මෙහෙම ඉස්තාලයක් මට තිබුණේ නැහැ.''

ඉස්සර ඉඳලා ඉස්තාලේ වැඩ කළ අයට ඊරිසියා හිතුණා:

''අපට වැඩිය ඉහළින් පිටිසර ගමයකුව තියලා. රාජකීය ඉස්තාලේ නායකකම එයාට දෙන්ට පුළුවන් ද?''

පුංචි ඉවාන්ට හතුරු කම් කරන්ට ඒ ගොල්ල කල්පනා කළා. ලොකු නුවණක්කාර පුංචි ඉවාන් එයාගේ වැඩ කර ගෙන ගියා. ඔහුට නපුරක් වේවි කියලා හිතුවේ නැහැ.

ඔන්න එක දවසක් දා රජ ගෙදරට ආවා මහලු පොලිස් කාරයෙක්. ඔහු රා බොන්න හරි ආසයි. අස් ගොව්වන්ට කතා කරලා ඔහු මෙහෙම කිව්වා:

''අනේ තරුණයිනි! මාව රා තැබෑරුමට ගෙනියපල්ලා. මගේ ඔළුව කැක්කුමයි. රා ටිකක් බීලා මම නුඹලාගේ නායක අස් ගොව්වාට හොඳ පාඩමක් උගන්වන්න උපායක් කියලා දෙන්නම්.''

අස් ගොව්වෝ පොලිස් කාරයාව රා තැබෑරුමට අසු පිටින් ගෙන ගියා. පොලිස් කාරයා රා බීලා උපායක් කියා දුන්නා:

''අපේ රජතුමාට බොහොම ආසයි, ඉබේ වයන පුදුම වීනාවයි, නටන තාරාවයි, පිනුම් ගහන පූසයි ලබාගන්ට. සමහර තරුණ වීරයෝ කැමැත්තෙන් ගියා ඔය තුන ගේන්නට. සමහර තරුණයින්ව බලෙන් යැව්වා ඕවා ලබාගන්ට. ඒ ගොල්ල ගියා ගියාමයි, ආපහු ආවේ නැහැ. ලොකු නුවණක්කාර පුංචි ඉවාන්ව යවලා ඒවා ලබාගන්ට කියලා රජතුමාට කියාපල්ලා. එයාට ඒ වැඩේ බොහොම ලේසියි කියලා කියපල්ලා. රජතුමාව පුංචි ඉවාන්ව පිටත් කරාවි. ඔහු ආපහු එන්නේ නැහැ.''

අස් ගොව්වෝ පොලිස් කාරයාට තවත් රා පොවලා, ඔහුට ස්තුති කරලා, රජ ගෙදර මිදුලට ඇවිත් කතා කර, කර හිටියා. රජතුමා මිදුලට ඇවිල්ලා අස් ගොව්වන් ගෙන් අහනවා:

"නුඹලා මොනවා ගැන ද අහන්නේ? නුඹලාට ඕනෑ මොනවා ද?"

"මහරජ තුමාණෙනි! අපේ නායක අස් ගොව්වා, ලොකු නුවණක්කාර පුංචි ඉවාන් පුරසාරම් දොඩවනවා. එයාට පුළුවන්ලු ඉබේ වයන වීනාවයි, නටන තාරාවයි, පිනුම් ගහන පූසාවයි ගේන්ට. අපි ඔය ගැන කතා වුණා. අපේ සමහරු කියනවා එයාට ඒවා ගේන්ට පුළුවන් කියලා, සමහරු කියනවා එයා නිකම් බොරුවට පුරසාරම් දොඩවනවා කියලා."

මේ කතාව ඇහුණ වේලාවේ ඉඳලා රජතුමා ගේ මූණ වෙනස් වුණා. අත්, පා වෙවුලන්ට පටන් ගත්තා. "මට මේ අපූරු දේවල් ලබා ගන්ට පුළුවන් නම්, අනිත් රජවරු එතකොට මගේ ලොකු කම ගැන හිතලා මට ඉරිසියා කරාවි. කොතරම් මිනිසුන්ව යැව්ව ද, ඒ ගොල්ලෝ ආපහු ආවේ නැහැ නෙව ද." රජතුමා කල්පනා කළා.

රජතුමා වහාම නායක අස් ගොව්වාට, පුංචි ඉවාන්ට එන්ට කියලා අණ කළා. ඔහු ආ හැටියේ ම රජතුමා කෑ ගහනවා:

"වහාම ගිහිල්ලා ඉබේ වයන වීණාව යි, නටන තාරාව යි, පිනුම් ගහන පූසාව යි අරගෙන වරෙන්."

"අනේ මහරජ තුමාණෙනි, මා උපන් තේකට එහෙම දේවල් ගැන අහලා නැහැ! මා කොහේ යන්ට ද?" පුංචි ඉවාන් කීවා.

රජතුමාට කේන්ති ඇවිල්ලා අඩි පොළොවේ හප්පලා කෑ ගහනවා:

"නුඹ මගේ රජ ගෙදර පුරසාරම් දෙඩෙව්වා නේද, නුඹ මගේ අණට විරුද්ධ වෙනව ද! මා කී දේවල් ගෙනත් දුන්නොත් නුඹට තෑගි දෙනවා. නැතිනම් නුඹේ හිස ගහලා දමනවා."

ලොකු නුවණක්කාර, පුංචි ඉවාන් කනගාටු වෙලා හිස පහත දමාගෙන ඉස්තාලෙට ගියා. ඔහු රන් කෙඳ අස්වයා දිහා බලාගෙන හිටියා. එතකොට අස්වයා කතා කළා:

"මොක ද හාම්පුතා නුඹ කනගාටු වෙනව ද? නැතිනම් නුඹට විපතක් සිදු වුණා ද?"

"මට කනගාටු නොවී ඉන්ට පුළුවන් ද? රජතුමා මට අණ කළා ඉබේ වයන වීණාව යි, නටන තාරාව යි, පිනුම් ගහන පූසව යි ගේන්ට කියලා.

මම ඒවා ගැන දන්නෙත් නැහැ, අහලත් නැහැ.''

''ඒක ඔයතරම් ලොකු දෙයක් නොවෙයි, නුඹ මගේ පිට උඩ නැගපන් අපි යමු බාබායිගා යකින්න ළඟට. එයාගෙන් අහලා දැනගනිමු කොහොම ද ඒවා ලබා ගන්ට ඕන කියලා.'' රන් කෙඳි අස්වයා පුංචි ඉවාන්ට කීවා.

ලොකු නුවණක්කාර පුංචි ඉවාන් ගමනට ලෑස්ති වෙලා අස්වයා පිට නැග්ගා. ඔහු රන්කෙඳි අස්වයා පිට නගිනවා විතරක් මිනිස්සු දැක්කා. ඔහු යන හැටි කවුරුවත් දැක්කේ නැහැ.

රන් කෙඳි අස්වයාව එළවාගෙන ගිහිල්ලා, ගිහිල්ලා, පුංචි ඉවාන් මූකලන් කැලෑවකට ආවා. ඒක බොහොම ලොකු අඳුරු කැලෑවක්. ඔය කැලෑව දිගේ ගිහිල්ලා අස්වයාට මහන්සියි. පුංචි ඉවාන්ටත් මහන්සියි. දෙදෙනා ම එළිමහන් පිට්යකට ආවා. ඔන්න කුකුළු කකුලකින් හිටගත්තු ගෙයක් තියෙනවා. ඒ ගේ නැගෙනහිර ඉඳලා බටහිරට කරකැවෙනවා. පුංචි ඉවාන් ගේ ළඟට ඇවිල්ලා කතා කළා:

''ගේ පොඩිත්ත, ගේ පොඩිත්ත කැලේට පිටු පාලා මට මූණ පා හිට-ගන්න. හැමදාම නොවෙයි, එක රැයකට විතරක් නවතින්න ඉඩ දෙන්න.''

ගෙය පුංචි ඉවාන්ට මූණ පාලා හිට ගත්තා. ඔහු රන් කෙඳි අස්වයාව කණුවක බැඳලා ගෙට ගියා. ගෙයි දොර ඉබේටම ඇරුණා.

ගේ ඇතුලේ බාබායිගා යකින්න වාඩිවෙලා ඉන්නවා. එයා ගේ කකුල බොහොම දිගයි. එයා ගේ නහය වහළෙට වැදෙන තරම් උසයි.

බාබායිගා යකින්න පුංචි ඉවාන්ව දැකලා කතා කළා:


''බොහොම කාලෙකින් මිනිස් ගඳක් දැනුනේ නැහැ. මෙන්න මිනිහෙක් මගේ ළඟටම ඇවිල්ලා. තරුණයා කියාපන්, මෙහාට ආවේ මොකට ද?''

''අනේ ආච්චියේ ගෙදර ආපු කෙනෙකුට ඔහොමත් කතා කරනව ද. මට හිතලයි, බඩගිනියි. ඔන්න අපේ රටේ රුසියාවේ, ගෙදරට ආපු අමුත්-තෙකුට ඉස්සෙල්ලාම කෑම, බීම දීලා, නාන්ට වතුර උණු කරලා දීලා, නැවට පස්සේ රෑට නිදාගන්ට ඇඳ හදලා දීලා, ඊට පස්සේ තමයි වග තුග අහන්නේ.'' කියලා පුංචි ඉවාන් කීවා.

බාබායිගා යකින්න මෙහෙම කිව්වා:

''අනේ තරුණයා නුඹ නුඹලාගේ රටේ සිරිත් ගැන කියන්ට එපා. නුඹ මට සමාවෙයන්. මම නාකි ගෑණියෙක්! නුඹට ඕන විදිහට වැඩ කරන්නම්.''

බාබායිගා යකින්න මේසය අස් කරලා, කෑම, බීම ගෙනල්ලා පුංචි



ඉවාන්ට දුන්නා. ඊට පස්සේ වතුර උණු කරලා නාන්ට දුන්නා. ලොකු නුවණක්කාර පුංචි ඉවාන් උණු වතුර නෑවා. බාබායිගා යකින්න ඇඳ හදලා පුංචි ඉවාන්ට නිදා ගන්ට කීවා. බංකුව උඩ වාඩිවෙලා බාබායිගා යකින්න අහනවා:

"තරුණයා, නුඹ මෙහාට ආවේ කැමැත්තෙන් ද, අකැමැත්තෙන් ද? නුඹ යන්නේ කොහි ද?"

"අපේ රජතුමා මට අණ කළා ඉබේ වයන වීණාව යි, නටන තාරාව යි, පිනුම් ගහන පූසාව යි හොයා ගෙන එන්ට කියලා. අනේ ආච්චියේ ඒවා තියෙන තැන මට කියා දෙන්න. ආච්චිව කවදාවත් මම අමතක කරන්නේ නැහැ." කියලා පුංචි ඉවාන් පිළිතුරු දුන්නා.

"අනේ කොල්ලෝ මම දන්නවා, ඒවා තියෙන තැන. නමුත් ඒවා ගන්ට බොහොම අමාරුයි. ඒවා අරගන්ට වීර තරුණයෝ බොහොම දෙ-නෙක් ගියා. ඒ ගොල්ලෝ ගියා මිසක් ආපහු ආවේ නැහැ."

"ආච්චියේ වෙන්ට තියෙන දේ වළක්වන්ට බැහැ. ආච්චි මගේ දුකට පිහිට වෙන්න. මම ආච්චිව ආදරයෙන් මතක් කරන්නම්."

"නුඹ ගැන බොහොම දුකයි, කරන්ට දෙයක් නැහැ. නුඹට උදව් වෙන්ට ඕන. නුඹේ රන් කෙඳි අස්වයාව මා ළඟ තියලා පලයන්. ඌව මම බලාගන්නම්. මෙන්න නුඹට නූල් බෝලයක්. හෙට උදේ ගමනට පිටත් වෙලා ඔය නූල් බෝලේ වීසි කරපන්. නූල් බෝලේ නුඹට මග පෙන්වාවි. නුඹ ඒ මග දිගේ පලයන්. මගේ මද්දුම අක්කා ළඟට නූල් බෝලය ගිහිල්ලා නවතීවි. එතකොට නුඹ මගේ මද්දුම අක්කාට නූල් බෝලය පෙන්නාපන්. එයා නුඹට ලොකු අක්කා ළඟට යන පාර කියා දේවි. ඒ ගොල්ල නුනුඹට උදවු කරාවි." බාබායිගා යකින්න පුංචි ඉවාන්ට කියා දුන්නා.

පහුව දා උදේ බාබායිගා යකින්න පුංචි ඉවාන්ව කුද්දලා, කෑම බීම දීලා, මිදුලට අඬගහගෙන ගිහිල්ලා පාර පෙන්නුවා. ලොකු නුවණක්කාර පුංචි ඉවාන් බාබායිගා යකින්නට ස්තුති කරලා ගමනට පිටත් වුණා. කතන්ද-රේ කටින් කිව්වට, පයින් යන්ට ගියාම ලේසි නැහැ නොවැ. නූල් බෝලේ ඉස්සරහින් යනවා, පුංචි ඉවාන් පිටි පස්සෙන් යනවා.

ඔහොම දවසක් ගියා, දෙකක් ගියා, දවස් තුනක්ම ගියා. නූල් බෝලය කපුටු කකුලක් උඩ තියෙන ගෙයක් ඉදිරිපිට නැවතුණා. ඒ ගේත් කරකැවි-ලා නැවතුණා. පුංචි ඉවාන් ගෙට කතා කරලා මෙහෙම කිව්වා:

''ගේ පොඩිත්ත, ගේ පොඩිත්ත මට මුහුණ පාලා, කැලයට පිටු පාලා හිටගන්න.''

ගේ ඉවාන්ට මූණ පාලා හිටගත්තා. පුංචි ඉවාන් එලිපත්ත ළඟට ගිහිල්ලා දොර ඇරියා. ගෙදර අයිතිකාරිය අසතුටු වෙලා පුංචි ඉවාන් පිළිගත්තා.

''බොහොම කාලෙකින් නහයට මිනිස් ගඳක් දැනුනේ නැහැ. මෙන්න දැන් මිනිහෙක් මා ළඟටම ඇවිත් ඉන්නවා. නුඹට ඕන මොනවා ද කියාපන්!''

ලොකු නුවණක්කාර පුංචි ඉවාන් නූල් බෝලය මද්දුම අක්කාට දුන්නා. එයා නූල් බෝලය බලලා බොහොම සතුටු වුණා.

''නුඹ පිට කෙනෙක් නොවෙයි. අපේම කෙනෙක්. මගේ නංගි නුඹව මා ළඟට එව්වා! නුඹ ඇයි එහෙම කීවේ නැත්තේ.''

මද්දුම අක්කා දුවලා පැනලා ඉක්මනට කෑම මේසය ලෑස්ති කළා. බීම ජාති ගෙනාවා.

''කාපන්, බීපන්, හොඳට විවේක ගනින්.ආ කාරණය ගැන පස්සේ කතා කරමු.''

ලොකු නුවණැති පුංචි ඉවාන් කාලා, බීලා, ඇඳේ වැතිරිලා විවේක ගත්තා. බාබායිගා යකින්නගේ මද්දුම අක්කා ඇඳේ ඉහද්දර වාඩි වෙලා තොර තුරු ඇසුවා. පුංචි ඉවාන් වෙච්ච් සිද්දිය ඇට විස්තර කළා.

''එතරම් දුර බැහැරක් යන්ට ඕන නැහැ. නුඹ පණ බේරාගෙන ඒවිද කියලා මට කියන්ට බැහැ. ඉබේ ගයන වීනාවයි, නටන තාරාවයි, පනින පූසයි අපේ බෑණ-නපුරු නාගයා ළඟයි තියෙන්නේ. බොහොම මිනිස්සු ඒවා ගන්ට ගියා මිසක්ආපහු පණ පිටින් ආවේ නැහැ. නපුරු නාගයා ඒ මිනිසුන්ව මරලා දැම්මා. නපුරු නාගයා අපේ ලොකු අක්කා ගේ පුතා. සාස්තර කියන්ට දන්න මගේ කපුටුහාමිව මම හෙට ලොකු අක්කා ළඟට යවන්නම්. එයාට මේ ගැන කල් ඇතුව දැනුම් දෙන්ට ඕන. නුඹ දැන් නිදාගනින්. හෙට උදේට මම නුඹව කුද්දන්නම්.''

පුංචි ඉවාන් රෑ සැපට නිදාගෙණ උදේ පාන්දර නැගිටලා ගමනට ලෑස්ති වුණා. බාබායිගා යකින්න ගේ මද්දුම අක්කා ඔහුට රතු පාට නූල් බෝලයක් දුන්නා. ඔහුට යන පාර පෙන්නලා සමු ගත්තා. ලොකු නුවණක්කාර පුංචි ඉවාන් රතු නූල් බෝලය පිටි පස්සෙන් යනවා.

ඔන්න ඉතින් ඔහු යනවා, උදේ හිට රෑ වන තුරු යනවා, රෑ හිට උදේ වන තුරු යනවා. ගිහිල්ලා, ගිහිල්ලා මහන්සි වුණාම උල්පතක් ළඟ වාඩි-

වෙලා රුළං විස්කෝතු කාලා පිරිසුදු වතුර බොනවා. ආයෙමත් යනවා.

තුන්වෙනි දවසේ දී හවස් වෙන කොට නූල් බෝලය ගෙයක් ළඟ නැවතුණා. කණු දොළහක් උඩ ගල් දොළහක්. ඒක උඩ ගෙයක්. ගෙය වටේට උස ඉනි වැටක්.

බල්ලා බිරුවා. බාබායිගා යකින්නගේ ලොකු අක්කා පිළි කන්නට ආවා. බල්ලාව එළවලා, කතා කළා:

''තරුණයා මම දන්නවා නුඹ ආපු කාරණාව. මද්දුම නංගී මට සාස්තර කියන කපුටාව එව්වා. කොහොම හරි මම නුඹට පිහිට වෙන්නම්. මගේ ගෙට වරෙන්. ඇවිත් වාඩිවෙයන්. නුඹට ගමන් මහන්සිය ඇති නේද.''

ලොකු අක්කා පුංචි ඉවාන්ට කෑම බීම දුන්නා.

''දැන් ඉතින් නුඹව හංගන්නට ඕන. ඉක්මනින්ම මගේ පුතා නපුරු නාගයා ඒවි. එයා බඩගින්නේ තරහ වෙලා තමයි එන්නේ. නුඹ එයාට පේන්න ඉන්ට එපා.''

ලොකු අක්කා බිම් ගෙයි දොර ඇරියා.

''බිම් ගෙයට රිංගලා හැංගිලා ඉඳපන්. මම අඩගහන තුරු එළියට එන්ට එපා.''

පුංචි ඉවාන් බිම් ගෙයි හැංගුනා විතරයි. මහ පොළොව හෙළවුණා. මහ හඬක් ඇහුණා. දොර ඇරුණා. නපුරු නාගයා පියාඹා ආවා.

''අපොයි, මිනිස් ගඳයි.''

''අනේ පුතේ නුඹ මොනවා කියනව ද, අවුරුදු ගණනක් තිස්සේ මෙහාට වෘකයෙක් වත්, රාජාලියෙක්වත් ආවේ නැහැ. නුඹ ලෝකෙ හැමතැනම යනවා, ඒ තැන් වලදී නුඹට මිනිස් ගඳ දැනෙන්නට ඇති.'' බාබායිගා යකින්නගේ ලොකු අක්කා කිව්වා.

ඈ හැම තැනම දුවලා කෑම මේසේ ලෑස්ති කළා. අවුරුදු තුනක් වයස ඇති වහු පැටියකු බැදලා, මේසය උඩ තිබ්බා. බාල්දියක් පිරෙන්ට රා වත්කරලා මේසය උඩ තිබ්බා. රා බීලා වහු පැටියාව කාලා නපුරු නාගයා සතුටු වුණා.

''අනේ අම්මේ, මම හරිම කැමතියි බූරුවා අතක් සෙල්ලම් කරන්න කා එක්ක හරි. කෙනෙක් ඉන්නව ද?'' නපුරු නාගයා අහනවා.

''පුතේ කෙනෙකුව හොයලා දෙන්ට පුළුවනි. බූරුවා සෙල්ලම් කරන්ට. නුඹ ඒ මිනිහව මරා දමාවි කියල මට බයයි.''

''අම්මේ, මම කාටවත් නපුරක්කරන්නේ නැහැ. මම කැමතියි කාට හරි පැරදෙන්ට.''

''පුතේ නුඹ දැන් දුන් පොරොන්දුව කඩ කරන්ට එපා.'' නපුරු නාගයගේ අම්මා, බාබායිගා යකින්නගේ ලොකු අක්කා බිම් ගෙයි දොර ඇරියා.

''ලොකු නුවණක්කාර පුංචි ඉවාන්, මෙහාට වරෙන්. ගෙදර හාම්පුතා එක්ක කාඩ් සෙල්ලම් කරපන්. හාම්පුතාට ගරු කරපන්.''

දෙදෙනාම වාඩි වෙලා කාඩ් සෙල්ලම් කරන්ඩ පටන් ගත්තා. එතකොට නපුරු නාගයා මෙහෙම කියනවා:

''නුඹ දිනුවොත් නුඹ මාව කාපන්, මම දින්නොත් මම නුඹව කන්නම්.''

මුළු රෑම සෙල්ලම් කළා. බාබායිගා යකින්න ගේ ලොකු අක්කා හොරෙන්, හොරෙන් පුංචි ඉවාන්ට උදව් කළා. උදේ පාන්දර නපුරු නාගයා පැරදුනා, පුංචි ඉවාන් දිනුවා.

නපුරු නාගයා පුංචි ඉවාන්ට කතා කළා:

''තරුණයා අද රෑටත් අපේ ගෙදර නැවතියන්, හවසට අපි දෙන්නා ආයෙමත් කාඩ් සෙල්ලම් කරමු. මම ආසයි අද දිනන්න.''

නපුරු නාගයා උදේ පියාඹා ගියා. ලොකු නුවණක්කාර පුංචි ඉවාන් හිතේ හැටියට නිදා ගත්තා. බාබායිගා යකින්නගේ ලොකු අක්කා ඔහුට කෑම, බීම දුන්නා.

හවස් වුණ හැටියේ නපුරු නාගයා ආවා. රා බාල්දියක් බීලා, බැදපු වස්සකු කලා ඉවාන්ට අඬගැහුවා.

''දැන් ඉතින් අපි ආයෙමත් කාඩ් සෙල්ලම් කරමු. අද මම නුඹව පරද්දනවා.'' නපුරු නාගයා කීවා.

ඊයේ රෑ නිදාගත්තේ නැතුව කාඩ් සෙල්ලම් කරලා, උදේ පියාඹා ගිය නපුරු නාගයා දවස තිස්සේම නිදා ගත්තේ නැති හන්දා ඔහුට මහන්සියි. ඔහු නිදි කිරා වැටෙනවා. ලොකු නුවණක්කාර පුංචි ඉවාන්, නපුරු නාගයාගේ අම්මාගේ උදව් ඇතුව උදේ එළිය වැටෙන කොට කාඩ් සෙල්ලම් කරලා දිනා ගත්තා.

''මට දැන් වැඩට යන්න ඕන. අද හවසට තුන්වෙනි වතාවටත් අපි සෙල්ලම් කරමු.'' කියලා නපුරු නාගයා ඉගිලිලා ගියා.

ලොකු නුවණක්කාර පුංචි ඉවාන් කාලා, බීලා හොඳට නිදා ගත්තා. නපුරු නාගයා පිට, පිට රෑ දෙකක්ම නිදා ගත්තේ නෑ. ලෝකේ හැමතැනම



ගිහිල්ලා නපුරු නාගයා ගෙදර ආවා. ඔහුට බොහොම මහන්සියි. බැදපු වස්සකු කාලා රා බාල්දියක් බීලා, පුංචි ඉවාන්ට කතා කළා කාඩ් සෙල්ලම් කරන්නට.

"යාළුවා, වාඩිවෙයන් අද නම් නුඹව පරද්දනවා ම යි."

නපුරු නාගයාට බොහොම මහන්සියි, ඔහු නිදිකිරා වැටෙන්නට පටන් ගත්තා. එදා රෑ තුන්වෙනි වතාවටත් පුංචි ඉවාන් දිනාගත්තා.

නපුරු නාගයා බොහොම බයවෙලා දණගහලා මෙහෙම කියනවා:

"අනේ යාළුවා මාව මරන්ට එපා, මාව කන්ට එපා! නුඹට ඕන වැඩ මම කරලා දෙන්නම්!"

ඔහු අම්මාගේ දෙපා අල්ලා ගෙන කන්නලව් කළා:

"අනේ අම්මේ, එයාට කියන්ට මාව මරන්ට එපයි කියලා."

ලොකු නුවණක්කාර පුංචි ඉවාන්ටත් ඕන කරලා තිබුණේ ඒ ටික තමා.

"හොඳයි, නපුරු නාගයා මම නුඹව තුන් වතාවක්ම පැරැද්දුවා. නුඹ

මට, ඉබේ වයන වීණාව යි, නටන තාරාව යි, පිනුම් ගහන පූසාව යි දීපන්. එතකොට මම නුඹට සමාව දෙන්නම්.''

නපුරු නාගයා හිනාවෙලා එක පාරටම කැමති වුණා. පුංචි ඉවාන්ව යි, අම්මාව යි බඳා ගත්තා.

''මම නුඹට බොහොම සතුටෙන් ඒ පුදුම දෙවල් තෑගි කරන්නම්. ඒවාටත් වැඩිය හොඳ දේ හොයලා දෙන්නම්.''

නපුරු නාගයා බොහොම ජයට කෑම, බීම ගෙනල්ලා සාදයක් තිබ්බා. පුංචි ඉවාන්, එයාගේ මල්ලී කෙනෙක් කියලා නපුරු නාගයා කිව්වා.

''නුඹ මොකට ද ඉබේ වයන වීණාව යි, නටන තාරාව යි, පිනුම් ගහන පූසව යි අරගෙන පයින් යන්නේ, මම නුඹව අහසින් ගෙනයන්නම්.'' කියලා නපුරු නාගය පොරොන්දු වුණා.

''අන්න හොඳයි පුතේ! නුඹ පුංචි ඉවාන් මල්ලීව අරගෙන මගේ බාල නංගිලා ගේ, නුඹේ නැන්ද ගේ ගෙදර පලයන්. නුඹ ආපහු එන ගමන් මගේ ලොකු නංගී, නුඹේ ලොකු නැන්දා බලන්ට පලයන්. නුඹ නැන්දලා ගේ ගෙදර ගිහිල්ලා බොහොම කල් වෙනවා.'' නපුරු නාගයාගේ අම්මා පුතාට කිව්වා.

බොහොම ජයට කෑම කාලා, බීම බීලා ඉබේ වයන වීණාව යි, නටන තාරාව යි, පිනුම් ගහන පූසාව යි අරගෙන ලොකු නුවණක්කාර පුංචි ඉවාන්, බාබායිගා යකින්න ගේ ලොකු අක්කාගෙන් සමු අරගෙන ගමනට ලෑස්ති වුණා. නපුරු නාගයා ඔහුවත් අරගෙන අහසින් පියාසර කළා. පැයක් යන්ට ඉස්සෙල්ලා ඔහු පොඩි නැන්දා ගේ, බාබායිගා යකින්නගේ ගෙදරට ආවා. බාබායිගා යකින්න මිදුලට ඇවිල්ලා පුංචි ඉවාන්වයි, නපුරු නාගයාවයි පිළිගත්තා.

ලොකු නුවණක්කාර පුංචි ඉවාන් වැඩි වේලා ඉන්නේ නැතුව, රන් කෙඳි අස්වයා ගේ පිට උඩ නැගිලා, බාබායිගා යකින්නටත්, නපුරු නාගයාටත් ආයුබෝවන් කියලා, ඉබේ වයන වීණාව යි, නටන තාරාව යි, පිනුම් ගහන පූසාව යි අරගෙන තමා ගේ රටට ගියා.

පුංචි ඉවාන් රජ ගෙදරට යන වේලාවේ දී, අල්ලපු රටවලින් රජ කුමාරයෝ තුන් දෙනෙකු යි බිසෝවරු තුන් දෙනෙකු යි, මූදෙන් එතර රටවලින් රජවරුන් තුන් දෙනෙකු යි, බිසෝවරු තුන් දෙනෙකු යි, සිටුවරයො යි, ඇමතිවරු යි රැස්වෙලා හිටියා.

පුංචි ඉවාන් රජ ගෙදරට ගිහිල්ලා රජ තුමාට ඉබේ වයන වීණාව යි, නටන තාරව යි, පිනුම් ගහන පූසාව යි තෑගි කළා. රජ තුමා බොහොම සතුටු වුණා.

''ලොකු නුවණක්කාර පුංචි ඉවාන්, නුඹ මට ලොකු උදව්වක් කළා. මම නුඹට ප්‍රශංසා කරනවා. ලොකු වැටුප් ගෙවනවා. නුඹ ඉස්සර මගේ අස්ස ඉස්තාලේ නායක අස් ගොව්වා හැටියට වැඩ කළා. අද ඉඳලා නුඹ මගේ රාජ උපදේසකයෙකු හැටියට පත් කරනවා.'' කියලා රජ තුමා කිව්වා.

ඇමතිවරු යි, සිටුවරු යි මූහුණු ඇඹුල් කර ගත්තා:

''අස් ගොව්වෙක් එක්ක එකට වාඩි වෙන්න පුළුවන් ද! අපේ නම්බුවට කැළලක්. රජ්ජුරුවන් ගේ කල්පනාවේ හැටි!''

ඉබේ වයන වීණාව ලස්සන තාලයක් වාදනය කළා. පිනුම් ගහන පූසා සින්දුවක් කීවා. තාරාවා නැටුවා. දැන් ඉතින් නිකම් වාඩිවෙලා බලාගෙන ඉන්ට බැහැ. රජ ගෙදරට ආ අමුත්තෝ ඔක්කොමල්ලා නටන්ට පටන් ගත්තා.



කාලය ගෙවිලා යනවා. මිනිස්සු නටනවා නටනවා. ඉවරයක් නැහැ. රජ ගොල්ලන් ගේ ඔටුනු ඇලවෙලා. කුමාර ගොල්ලොයි, බිසොවරුයි කරකැවී, කැවී නටනවා, උඩ පනිනවා. ඇමති ගොල්ල යි, සිටු ගොල්ල යි, දාඩිය පෙරාගෙන නටනවා, කෙඳිරි ගගා නටනවා. ඒ ගොල්ලන්ට නැටීම නවත්වන්න බැහැ. රජ තුමා අත වනනවා.



"ලොකු නුවණක්කාර පුංචි ඉවාන් මේ සෙල්ලම නවත්වාපන්. මට නම් හොඳටම මහන්සි යි."

පුංචි ඉවාන් ඉබේ ගයන වීණාව යි, නටන තාරාව යි, පිනුම් ගහන පූසාව යි මල්ලකට දැම්මා. එතකොට නැටුම්, වැයුම් නැවතුණා.

අමුත්තෝ එක එක තැන්වල වැටිලා හති දමනවා:

"හරිම නැටුම්, හරිම ගැයුම්, වැයුම්. මෙහෙම දෙයක් උපන් තේකට දැක්කේ නැහැ!"

පිටරටවලින් ආ රජ ගොල්ලන්නට බොහොම ඉරිසියා හිතුණා. පුංචි ඉවාන් ගේ රජතුමා බොහොම සතුටු වුණා.

"දැන් පිටරටවල රජගොල්ලො මේ ගැන දූන ගෙන ඉරිසියාවෙන් මැරෙන්ට යාවි. වෙන කා ළඟවත් මේ වගේ දෙ නැහැ!"

ඇමති ගොල්ලො යි, සිටුවරයො යි එකතු වෙලා කසු කුසු ගාන්ට පටන් ගත්තා.

ඉක්මනටම මේ ගමයා මේ රටේ මහ ඇමති කම ගනීවි. ගමේ ඉඳලා ගමයන්ව ගෙන්නලා රාජ සභාව පුරවාවි. අපව, නම්බුකාර අපවරාජ සභාවෙන් පන්නා දමාවි. ඒකට ඉස්සෙල්ලා අපි මේ ගමයා ගෙන් බේරෙන්නට ඕන."

පහුව ආ ඇමති ගොල්ල යි, සිටු ගොල්ල යි එක්කහු වෙලා කල්පනා කරනවා, කොහොම ද මේ අලුත් රාජ උපදේසකයා ගෙන්, පුංචි ඉවාන් ගෙන් බේරෙන්නේ කියලා. බොහොම නාකි සිටු වරයෙක් නැගිටලා යෝජනාවක් කළා:

"බේබදු පොලිස් කාරයාට අඬගහමු. එයා හොඳ උපායක් කියලා දේවි."

ඔහුව ගෙන්වා ගත්තා. බේබදු පොලිස් කාරයා ඇවිල්ලා ආචාර කරලා මෙහෙම කියනවා:

"ඇමති තුමනි, සිටු තුමනි, ඔබ තුමන්ලා මට එන්ට කිව්ව කාරණය මම දන්නවා. අලුත් රාජ උපදේසකයා ගෙන් ගැළවීමට යස උපායක් කියලා දෙන්නම්. හැබැයි ඊට ඉස්සෙල්ලා කසිප්පු බාල්දියක් මට දීපල්ලා."

"උපාය ගැන කියපන්. කසිප්පු බාල්දියක් දෙන්නම්." ඇමති ගොල්ල කිව්වා.

ඉස්සෙල්ලා කසිප්පු වීදුරුවක් දුන්නා. පොලිස් කාරයා ඒක බීලා කතාව පටන් ගත්තා:

"අවුරුදු හතළිහකට ඉස්සෙල්ලා අපේ රජතුමාගේ බිසව මළා. එදා ඉඳලා අපේ රජතුමා තනිකඩයෙක්. රජතුමාට ලස්සන ඇලෝනා කුමරිය මගුල් ඇහුවා. මගුල හරිගියේ නැහැ. ඇලෝනා කුමරිය ගේ රට අල්ලා ගන්න තුන් පාරක්ම යුද්ද කළා. කොච්චර මිනිසුන් මළා ද! රට අල්ලා ගන්න බැරිවුණා. ලොකු නුවණක්කාර පුංචි ඉවාන්ව ඒ රටට යවලා ලස්සන ඇලෝනා කුමරියව ගෙන්වා ගන්ට රජතුමාට කියන්න. එයා ගියොත්, ආපහු මේ රටට එන්ට ලැබෙන්නේ නැහැ."

සිවු ගොල්ල යි, ඇමති ගොල්ල යි බොහොම සතුටු වුණා. පහුව දා උදේ රජතුමා ළඟට ඒ ගොල්ලො ගියා:

"මහරජ තුමාණෙනි, ඔබ නුවණ ඇති පාලකයෙක්. අලුත් රාජ උපදේ-සකයකුව පත් කළා. ඉබේ වයන වීණාව යි, නටන තාරාව යි, පිනුම් ගහන පූසාව යි ඔහු ගෙනාවා. "මට පුළුවනි, අපේ රජතුමාට ලස්සන ඇලෝනා කුමාරිව ගෙනත් දෙන්ට කියලා දැන් ඔහු සුරසාරම් දොඩවනවා." රජතුමාට ලස්සන ඇලෝනා කුමරියගේ නම ඇහුනා විතරයි, එක තැන ඉන්න බැරි වුණා. ඔහු සිංහාසනයෙන් පැන්නා:

"ඔව්. ඇත්ත තමා. මට අමතක වුණා! ලස්සන ඇලෝනා කුමරියව ගේන්ට පිටත් කරන්ට ඕන ඔහුව තමයි."

රජතුමා අලුත් රාජ උපදේසකයාව ගෙන්වලා ඔහුට අණ කළා:

"රටවල් තිස් නවයකට එහා, හතළිස් වෙනි රටට පළයන්. ගිහිල්ලා ලස්සන ඇලෝනා කුමාරිව අරගෙන වරෙන්."

ලොකු නුවණක්කාර පුංචි ඉවාන් රජතුමාට මෙහෙම පිළිතුරු දුන්නා:

"මහරජ තුමානෙනි! ලස්සන ඇලෝනා කුමරිය, ඉබේ වයන වීණාවක්, නටන තාරාවෙක්, පිනුම් ගහන පූසෙක් වගේ දෙයක් නොවෙයි. මල්ලක ආගෙන ගේන්න බැහැ. කුමරිය මේ රටට එන්ට කැමති වෙයිද අන්නෙත් නැහැ."

රජු අඩි පොළොවේ හප්පලා, දැත් වනලා, යටි රැවුළ හොලවලා කෑ ගහනවා:

"නුඹ මට කීකරු නැද්ද! එයා ගේ කැමැත්ත ගැන මම දන්නේ නැහැ. ලස්සන ඇලෝනා කුමරිව ගෙනාවොත්, නුඹට නගරයක්, උප නගරයක්



තෑගි දෙනවා. ඇමති පදවියක් දෙනවා. ගෙනාවේ නැතිනම් හිස ගහලා දානවා.''

ලොකු නුවණක්කාර පුංචි ඉවාන් කනගාටු වෙච්, කල්පනා කරනවා. රන්කෙඳි අස්වයාගේ පිටට සැදැලය දමනවා.

''හාම්පුතා මොකද කල්පනා කරන්නේ, විපතක් සිදුවුණා ද?'' රන්කෙඳි අස්වයා ඇහුවා.

''ලොකු විපතකුත් නැහැ. සතුටු වෙන්ට දෙයකුත් නැහැ. රජතුමා මට අණකළා ලස්සන ඇලෝනා කුමරියව ගෙනෙන්ට කියලා. රජතුමා අවුරුදු තුනක්ම කුමරියට මගුල් යෝජනා කළා. අවුරුදු තුනක් ඇගේ රට අල්ලා ගන්ට යුද්ද කළා. බැරිවුණා. දැන් මාව යවනවා තනියම ලස්සන ඇලෝනා කුමරියව ගෙනෙන්ට.''

''එක එතරම් විශාල විපතක් නොවෙයි. මම නුඹට උදවු කරන්නම්. කොහොම හරි කාරිය ඉටුකරමු.'' රන් කෙඳි අශ්වයා කීවා.

ලොකු නුවණක්කාර පුංචි ඉවාන් ගමනට ලෑස්ති වෙලා පිටත්වුණා. ඔහු අස්වයාව ලෑහැස්ති කරන හැටි විතරයි දැක්කේ, ඔහු යන හැටි කිසි කෙනෙකු දැක්කේ නැහැ.

ඒගොල්ලො ගිහිල්ලා, ගිහිල්ලා තිස් නව වෙනි රටට ආවා. මහ හරහා උස වැටක් තියෙනවා ඔවුන් දැක්කා. රන් කෙඳි අස්වයා වැටට උඩින් ලේසියෙන් පැනලා ඒ රටේ රජුගේ මල්වත්තට ආවා. එතකොට රන්කෙඳි අස්වයා පුංචි ඉවාන්ට කතා කරලා මෙහෙම කියනවා:

''මම රත්තරන් ඇපල් ගෙඩි තියන ඇපල් ගහක් වගේ වෙස් වළා ගන්නම්. නුඹ මා ළඟ හැංගිගා හිටපන්. හෙට ලස්සන ඇලෝනා කුමරිය මේ වත්තට ඇවිල්ලා රත්තරන් ඇපල් කඩාගන්ට ගහ ළඟට ඒවි. එතකොට නුඹ හොඳට ලෑස්ති වෙලා, එකපාරටම කුමරියව අල්ලා ගනින්. මම ආයෙමත් රන් කෙඳි අස්වයා වෙන්නම්. නුඹ කුමාරිවත් අරගෙන මගේ පිට උඩ නැගපන්.

නුඹ පමා වුණොත් නුඹත් ඉවරයි, මාත් ඉවරයි.''

පහුවදා උදේ පාන්දර ලස්සන ඇලෝනා කුමරිය රජ මල්වත්තට ආවා. රත්තරන් ඇපල් ගහ දැකලා ඇගේ කිරි මවු වරුන්ටයි, වැඩකාරියන්ටයි, යෙහෙලියන්ටයි කතා කළා:

''බලන්නකො කොතරම් ලස්සන ඇපල් ගහක් ද, රත්තරන් ඇපල් ගෙඩි! නුඹලා මෙතන ඉඳපල්ලා මම ගිහින් ඇපල් ගෙඩියක් කඩාගෙන එන්නම්.''

ඈ ඇපල් ගහ ළඟට දුවගෙන ගියා විතරයි, ලොකු නුවණක්කාර පුංචි ඉවාන් එක පාරටම පැනලා කුමරිය ගේ අත අල්ලා ගත්තා. ඇපල් ගහ රන් කෙඳි අස්වයා බවට පත්වුණා. රන්කෙඳි අස්වයා කුර පොළොවේ ගහලා දුවන්ට ලෑස්ති වුණා. පුංචි ඉවාන් ලස්සන ඇලෝනා කුමාරිවත් අරගෙන අස්වයා ගේ පිට උඩ නැගලා ඉඳ ගන්නවා විතරයි කුමරියගේ කිරි අම්මලා, වැඩකාරියෝ, යෙහෙලියෝ දැක්කේ.

ඒ ගොල්ලෝ මහ හයිගෙන් කෑ ගැහුවා. මුරකාරයෝ දුවගෙන ආවා. ලස්සන ඇලෝනා කුමාරි ආ ගිය අතක් හොයාගන්ට නැහැ. ඒ රටේ රජ තුමා ලස්සන ඇලෝනා කුමාරිව හොයන්ට අසරු හමුදා පිටත් කළා. ඒ ගොල්ලො හැම පැත්තටම ගිහිල්ලා හොයලා බලලා පහුවදා උදේ හිස් අතින් ආවා. ඇලෝනා කුමාරිව හොරකම් කරගෙන ගිය හොරා ව දැකපු කෙනෙකු පවා හොයාගන්ට බැරිවුණා.

ඒ වෙලාවේ දී ලොකු නුවණක්කාර පුංචි ඉවාන් රට, රටවල් පහුකරගෙන ගියා. කඳු උඩින් පැනලා, ගංගාවල් හරහා පැනලා ගියා.

ඉස්සෙල්ලා ලස්සන ඇලෝනා කුමරිය පැන යන්ට උත්සාහ කළා. අඬ, අඬා පුංචි ඉවාන් දිහා ඈ බලනවා. ආයෙමත් ඔහු දිහා බලනවා. අවසකට පස්සේ ඈ කත කළා:

''නුඹ කවුද කියලා කියාපන්? නුඹ කොයි රටින් ද? කොයි ජාතියට අයිති ද? නුඹේ අම්මයි තාත්තයි කවුද? නුඹේ නම මොකක් ද?''

මගේ නම පුංචි ඉවාන් මට මිනිස්සු කියනවා ලොකු නුවණක්කාරයා කියලා. මම අසවල් රටේ අසවල් රජ්ජුරුවෝ ළඟ සේවය කරනවා. මම ගොවියෙක්.'' කියලා පුංචි ඉවාන් කීවා.

''ලොකු නුවණක්කාර පුංචි ඉවාන් නුඹ මාව හොරකම් කළේ නුඹට ඕන නිසා ද, නැතිනම් වෙන කාගේවත් කීමකට ද?''

''අපේ රජතුමා මට නියම කළා.''

ලස්සන ඇලෝනා කුමරිය ඇත් ඔසවලා කෑ ගැසුවා:

''මම මළත් ඔය, නාකි මෝඩයා සමග විවාහ වෙන්නේ නැහැ. නුඹලාගේ රජා තුන් වතාවක්ම මාව සරණ පාවාගන්න ලෑස්ති වුණා. හරිගියේ නැහැ. තුන්වතාවක්ම අපේ රටට විරුද්ධව යුද්ද කළා. පැරදුණා. යුද්ද හමුදාව විනාශ වුණා විතරයි. එයාට කවදාවත් මාව අකින්ට ලැබෙන්නේ නැහැ.''

පුංචි ඉවාන්ට ලස්සන ඇලෝනා කුමරියගේ කතාව හිතට ඇල්లුවා. ඔහු කතා නොකර මෙහෙම කල්පනා කරනවා: ''අනේ මේ වගේ බිරිඳක් මට ඉන්නවනම්, කොතරම් හොඳද!''

ඔන්න ඉතින් ඉක්මනටම මේ ගොල්ලෝ රටට ළංවුණා. මහලු රජතුමා ජනේලය ළඟට වෙලා බලාගෙන ඉන්නවා, කොයි වෙලාවෙද ලොකු නුවණක්කාර පුංචි ඉවාන් එන්නේ කියලා.

පුංචි ඉවාන් රන්කෙඳි අසුපිටින් මඟ එනවා. රජතුමා දොරකඩට වෙලා ඔහු එනතුරු බලාගෙන ඉන්නවා. පුංචි ඉවාන් රන්කෙඳි අස්වයාගේ පිට උඩ නැග ලා රජ මාලිගාවේ මිදුලට එනකොට ම, රජතුමා දුවගෙන ඇවිල්ලා ලස්සන ඇලෝනා කුමරියව රන් කෙඳි අස්වයා පිටින් බිමට බස්සවලා, ඇගේ අතක් අල්ලා ගෙන මෙහෙම කියනවා:

''මම නුඹව සරණ පාවා ගන්න කී පාරක් මගුල් ඇහුව ද, නුඹ බැහැ කිව්වා. දැන් නුඹට සිද්ද වෙනවා මගේ බිසව වෙන්ට.''

''අනේ මහරජ තුමනි, මට බොහොම ගමන් මහන්සියි, විවේක ගන්නට ඉඩ දීලා පස්සේ මගුල ගැන කතා කරන්න.'' ලස්සන ඇලෝනා කුමරිය කීවා.

රජතුමා දුවලා, පැනලා කිරි මවුවරුන්ටයි, වැඩ කාරියන්ටයි, තරුණ යෙහෙලියන්ටයි අඬ ගැහුවා:

''අපේ ආදරනීය කුමාරීට මාලිගාවක් ලෑස්ති ද?''

''ලෑස්ති කරලා ඉවරයි.'' ඒගොල්ලො කිව්වා.

''ඔන්න පිළිගනිල්ලා නුඹලාගේ අනාගත රැජිණ. ඈ කියන ඕනෑම දෙයක් කරපල්ලා. ඇට විරුද්දවීම තහනම්.'' රජතුමා අණ කළා.

''පුංචි ඉවාන් නුඹ හරිම හපනෙක්. මේ කළ සේවය හන්දා මම නුඹව මගේ අගමැති කමට පත්කරනවා. නගර තුනකුයි, උපනගර තුනකයි නුඹට තෑගි දෙනවා.'' රජතුමා බොහොම සතුටු වෙලා පුංචි ඉවාන්ට කීවා.

අවසක්, අවස් දෙකක් ගතවුණා. රජ්ජුරුවන්ට ඉවසුම් නැහැ. ඉක්මනටම



මගුල් කන්නට ඔහුට ආසයි. ලස්සන ඇලෝනා කුමරිය ළඟට ගිහිල්ලා රජ්ජුරුවෝ මෙහෙම අසනවා:

"කවදාට ද අපි කසාද බඳින්නේ, කවදාට ද මගුල් උත්සවය තියන්නේ!"

"මම කොහොම ද කසාද බඳින්නේ? මට පේරැස් මුද්දක් නැහැ. මගුල් රියක් නැහැ." කුමරිය පිළිතුරු දුන්නා.

"ඒවා එතරම් ලොකු දේ නොවෙයි, අපේ රටේ මුදු ඕනතරම් තියනවා. ඕන එකක් තෝරාගන්න. හොඳ මුද්දක් හොයා ගන්ට බැරිවුණොත් දූතයකු පිටරට යවලා හොඳ පේරැස් මුද්දක් ගෙන්නලා දෙන්නම්."

"මහරජ තුමනි! එහෙම බැහැ. මට ඕන මගේ පේරැස් මුද්ද. එහෙම නැතුව මම ඔබ සමග විවාහ වෙන්නේ නැහැ." ලස්සන ඇලෝනා කුමරිය කිව්වා.

"නුඹේ පේරැස් මුද්දයි, නුඹේ මගුල් රියයි ලබා ගන්නේ කොහෙන් ද?" රජතුමා අහනවා.

"මගේ පේරැස් මුද්ද පෙට්ටගමක. පෙට්ටගම මගුල් රිය ඇතුලේ. මගුල් රිය බුයානා දූපත අහ මහ මුහුද පතුලේ හංගලා තියෙනවා."

රජතුමා ඔටුන්න ගලවලා හිස කැසුවා:

"මහ මුහුද පතුලේ තියෙන මගුල්රිය ලබා ගන්නේ කොහොම ද?"

"ඒක මගේ වැඩක් නොවෙයි. මහරජතුමා ගේ වැඩක්. කොහොම හරි ගෙනත් දෙන්න." ඇලෝනා කුමරිය කීවා.

රජතුමා මාලිගාවට ගියා.

ඔහු තනියම කල්පනා කරනවා.

කල්පනා කළා. කල්පනා කළා. ඔන්න හිටිහැටියේම ලොකු නුවණක්කාර පුංචි ඉවාන් ගැන මතක් වුණා.

"මගුල් රිය ගෙනත් දෙන්ට පුළුවන් එකම මිනිහා පුංචි ඉවාන් තමයි!"

ඔහු ගෙන්වාගෙන ඔහුට රජතුමා මෙහෙම කියනවා:

"මගේ ඉතාම හොඳ සේවකයා තමයි, නුඹ. ලොකු නුවණක්කාර පුංචි

ඉවාන්. ඉබේ වයන වීණාව යි, නටන තාරාව යි, පිනුම් ගහන පූසාව යි ගෙනාවේ නුඹ. ලස්සන ඇලෝනා කුමාරිව ගෙනාවේත් නුඹ. දැන් ඉතින් නුඹ මට තුන්වෙනි වරටත් සේවයක් කරපන්. ලස්සන ඇලෝනා කුමරිය ගේ මගුල් මුද්ද යි, මගුල් රිය යි, බුයානා දූපත ළඟ මහ මුහුද පතුලේ හංගලා තියෙනවා. නුඹ ඒක ගෙනාවොත් නුඹට මගේ රටින් තුනෙන් පංගුවක් තෑගි දෙනවා.''

''මහරජ තුමනි! මම මෝරෙක්, තල්මහෙක් වගේ මාළුවකු නොවේ. මම කොහොම ද මහ මුහුද පතුලේ තියෙන දේවල් ගෙනෙන්නේ.''

රජ්ජුරුවන්ට තරහ ඇවිල්ලා අඩි පොළොවේ හප්පලා කෑ ගහනවා:

''ඔය වගේ කතාවලින් කිසිම වැඩක් නැහැ. මම රටේ රජතුමා. මම අණ කරනවා. නුඹ අණ ඉටුකරපන්. මගුල් රියයි, මගුල් මුද්දයි ගෙනාවොත්, නුඹට තෑගි දෙනවා. නැතිනම් නුඹේ හිස ගසා දමනවා.''

පුංචි ඉවාන් කනගාටුවෙලා අස්ස ඉස්තාලෙට ගිහිල්ලා, රන්කෙඳි අස්සාට සැදෑලය ඇන්දෙව්වා. එතකොට රන්කෙඳි අස්සයා මිනිහෙක් වගේ කතා කළා:

''හාම් පුතා ලෑස්තිවෙන්නේ කොහේ යන්ට ද?''

''කොහේ යන්ට ද කියලා මම ම දන්නේ නැහැ. නමුත් යන්ට ඕන. රජතුමා අණකළා මගුල් මුද්ද යි, මගුල් රිය යි ගේන්ට. මගුල් මුද්ද පෙට්ටගමක, පෙට්ටගම මගුල් රිය ඇතුලේ. මගල් රිය බුයානා දූපත ළඟ මුහුද පතුලේ. අපි දෙන්නා ගිහිල්ලා හොයාගෙන එමු.'' පුංචි ඉවාන් රන් කෙඳි අස්වයාට කිව්වා.

''ඔය වැඩේ අනිත් ඒවාට වැඩිය අමාරුයි. දූපතට වැඩි දුරක් නැහැ. නමුත් වැඩේ බොහොම අමාරුයි. මා මැරෙන්නත් පුළුවනි. මම මහ මුහුද පතුලට ගිහිල්ලා මගුල් රිය ඇදගෙන එන්නම්. ඊට ඉස්සෙල්ලා මුහුදු අස්වයෝ මාව දැක්කොත් උන් මාව මරා දාවි. එතකොට නුඹට මාත් නැහැ. මගුල් රියත් නැහැ.'' රන් කෙඳි අස්වයා කිව්වා.

ලොකු නුවණක්කාර පුංචි ඉවාන් කල්පනා කළා, කල්පනා කළා.

අවසානයේ දි ඔහුට හොඳ නුවණක් පහළ වුණා. ඔහු රජතුමා ළඟට ගියා.

"රජ තුමනි, මට මී හරක් හම් දොළහකුයි, දුම්මල ලාටු ගාපු කඹ යාර පන්සීයකුයි, දුම්මල ලාටු රාත්තල් සීයකුයි, ලොකු හැළියකුයි දෙන්න."

"රජ ගෙදර ගබඩාවෙන් නුඹට ඕන දේවල් අරගනින්. හැබැයි, ඉක්මනට වැඩේ කරපන්." රජතුමා පුංචි ඉවාන්ට කීවා.

පුංචි ඉවාන් මීහරක් හම්, කඹ, දුම්මල ලාටු, හැළියක් ඔක්කෝම අරගෙන රන් කෙඳි අස්වයා පිට උඩ නැගිලා ගමනට පිටත් වුණා.

රජ්පුරුවන් ගේ තණ පිටිය හරහා ගිහිල්ලා මුහුදු වෙරළට ආවා.

පුංචි ඉවාන් රන් කෙඳි අස්වයාව මී හරක් හම් වලින් ඔතලා කඹ වලින් බැන්දා.

"මුහුදු අස්වයෝ නුඹව දකලා නුඹව හපාකන්ට ආවාත්, එකපාරටම නුඹට තුවාල වෙන්නේ නැහැ."

ඔහොම මී හරක් හම් දොළහ රන් කෙඳි අස්වයා ගේ ඇඟේ ඔතලා, කඹ වලින් බැඳලා දුම්මල ලාටු මී හරක් හම් වල ගෑවා.

"දැන් නම් මුහුදු අස්වයින්ට මම බය නැහැ. වෙරළ අයිනට වෙලා දවස් තුනක් ම ඉඳගෙන, ඉබේ වයන වීණාව, අහගෙන ඉඳපන්. ඇස් ඇරගෙන බලා ගෙන ඉඳපන්."

මෙහෙම කියලා රන් කෙඳි අස්වයා මුහුද යටට කිමිදිලා ගියා.

ලොකු නුවණක්කාර පුංචි ඉවාන් මූදු වෙරළ අයිනේ තනිවම ඉන්නවා. දවසක් ගතවුණා. දවස් දෙකක් ගතවුණා. පුංචි ඉවාන් නිදා ගන්නේ නැතුව, වෙරළ අයිනට වෙලා ඉන්නවා. ඉබේ ගයන වීණාවට කන් දී ගෙන වෙරළ දිහා බලා ගෙන ඉන්නවා. තුන්වෙනි දවසේදී පුංචි ඉවාන්ට බොහොම නිදිමතයි. ඉබේ වයන වීණාවේ හඬත් දැන් ඔහුට එපාවෙලා. ඉවසා ගෙන හිටියා, හිටියා, බැරිවුණා. නිදිකිරා වැටුණා.

ඔහොම නිදි කිර කිරා ඉන්නකොට, පුංචි ඉවාන්ට අස්වයකුගේ කුර ගැටෙන සද්දයක් ඇහුණා. ඇස් ඇරලා බැලින්නම්, රන් කෙඳි අස්වයා මගුල් රිය ඇදගෙන වෙරළට ඇවිල්ලා. මුහුදු අස්වයෝ හය දෙනෙක් උගේ බඩ දෙපැත්තේ එල්ලිලා ඉන්නවා.

ලොකු නුවණක්කාර පුංචි ඉවාන් රන් කෙඳි අස්වයාව පිළිගන්නට නැගිටලා ඉස්සරහට ගියා.

"නුඹ මාව මී හරක් හම් වලින් ඔතලා කඹ වලින් බැඳලා, දුම්මල ලාටු ගෑවේ නැත්නම්, මට මේ කපේට ගොඩ එන්ට ලැබෙන්නේ නැහැ. මුහුදු අස්වයෝ රංචුවක්ම මගේ ඇඟට කඩා පැන්නා. උන් මී හරක් හම් නවයක්ම ඉරා දැම්මා. තව මී හරක් හම් දෙකක් හපලා හිල් කලා. මේ මුහුදු අස්සයින් හය දෙනා දුම්මල ලාටු වලයි, කඹවලයි පැටලිලා ඉන්නවා. උන්ට ගැළවෙන්ට බැරි වුණා. උන්ගෙන් නුඹට වැඩ ගැනීමට පුළුවනි" රන් කෙඳි අස්වයා කීවා.

පුංචි ඉවාන් මුහුදු අස්වයින්ගේ කකුල් බැඳලා උන්ට නුවණ කියා දුන්නා:



''නුඹලා මාව නුඹලා ගේ හාමි පුතා හැටියට පිළිගන්නවා ද, මගේ කීම අහනවා ද? මට අකීකරු වුණොත් නුඹලාට හොඳටම පාර දීලා වෑකයින්ට දානවා.''

මුහුදු අස්වයෝ බයවෙලා වැඳ වැටුණා:

''අනේ හාමි පුතානෙනි! අපට ගහන්ට එපා, වද දෙන්ට එපා. අපි නුඹ ගේ අණට කීකරු වෙනවා. විපතක් වුණොත් නුඹව බේරාගන්නවා.''

මුහුදු අස්වයින් හයදෙනාම මගුල් රියට බැඳලා උන්ව දක්කාගෙන ගෙදර ගියා.

මගුල් රිය රජ ගෙදර මිදුලට ගෙනැවිත්, මුහුදු අස්වයින්වයි, රන් කෙඳි අස්වයාවයි අස්ස ඉස්තාලෙට අරගෙන ගිහිල්ලා, පසුව පුංචි ඉවාන් රජුට කතා කළා:

''මහරජ තුමනි! මගුල් රිය ගෙනාවා. අන්න මිදුලේ තියෙනවා. බාර ගන්න.''

රජතුමා පුංචි ඉවාන්ට ස්තුති කළේවත් නැහැ. ඔහු මගුල් රියට දුවගෙන ගිහිල්ලා පෙට්ටගම අරගෙන ලස්සන ඇලෝනා කුමරිය ළඟට දුවගෙන ගියා.

''ලස්සන ඇලෝනා කුමරියනි! මම නුඹ ගේ ඉල්ලීම ඉටු කළා. මගුල් මුද්ද යි, මගුල් රිය යි ගෙනාවා. මගුල් රිය රජ මිදුලේ තියෙනවා. මගුල් සිදු කරන්නේ කවදා ද? උත්සවය පවත්වන්නේ කවදා ද?'' රජතුමා ඇහුවා.

''විවාහ වෙන්න මම සතුටුයි. ඉක්මණට මගුල් උත්සවය පවත්වන්නට මම කැමති යි. නුඹ වගේ නාකි, හිසකෙස් පැහිච්ච කෙනෙකුව විවාහ කරගන්න මම ලෑස්ති නැහැ. 'නාකියා තරුණියක්ව බැඳ ගත්තා' කියලා මිනිස්සු කියාවි. නාකි මිනිහකුට තරුණ ගෑනියෙක් හිටියම රටේ මිනිස්සු කට කතන්දර ගොතාවි. නාකි නුඹ තිරිහන් වෙලා තරුණ වුණොත්, මම නුඹ සමග විවාහ වෙන්නම්.'' ලස්සන ඇලෝනා කුමරිය කීවා.

''නාකි මම කොහොම ද තරුණ වෙන්නේ? මාත් කැමතියි තරුණ වෙන්ට. නාකි තරුණ වෙන බවක් මම කවදාවත් අහලා නැහැ.''

එතකොට ලස්සන ඇලෝනා කුමරිය මෙහෙම කියනවා:

"ලොකු තඹ හැලි තුනක් හොයාගනින්. එකකට කිරි පුරවාපන්. අනිත් හැලි දෙකකට උල්පත් වල පිරිසුදු ජලය පුරවාපන්. කිරි හැලියයි, වතුර හැලියකුයි උණුකරපන්. කිරි උතුරන කොට, නුඹේ ඔළුව කිරි හැලියට ඔබා පන්, උණු කිරි නාපන්. ඊට පස්සේ උතුරන වතුර හැලියට ඔළුව ඔබාපන්. උණු වතුර නාපන්. අන්තිමට හීතල වතුර හැලියට ඔළුව ඔබාපන්. වතුර නාපන්, එතකොට නුඹ අවුරුදු විස්සක තරුණයෙක් වේවි."

"මාව පිච්චිලා යන්නේ නැද්ද?" රජ අහනවා.

"අපේ රටේ නාකි ඇත්තෙම නැහැ. නාකි වුණාම ඔක්කොමල්ලා මා කියාපු විදිහට කරනවා. කාවවත් පිච්චිලා නැහැ."

රජතුමා ලස්සන ඇලෝනා කුමරිය කී විදිහටම කරන්ට සේවකයින්ට අණ කළා.

වතුරයි, කිරියි උතුර උතුරා නටනකොට රජතුමා බයවුණා. හැලි වටේට ගිහිල්ලා, ගිහිල්ලා නළලට ටොකු ඇණ ගත්තා.

"මොකටද, මෙපමණ වේලා කල්පනා කරන්නේ? ලොකු නුවණක්කාර පුංචි ඉවාන් ඉස්සෙල්ලා නාපුදෙන්. ඔහුට හොඳනම්, ඊට පස්සේ මම නාන්නම්. ඉවාන් මැරුණොත්, ඔහු වෙනුවෙන් අඬන්න කවුරුවත් නැහැ. ඔහු මළොත්, මගේ රටේ තුනෙන් පංගුව මටම ලැබෙනවා."

ලොකු නුවණක්කාර පුංචි ඉවාන්ව අඬගහගෙන එන්ට සේවකයකු යැව්වා.

"මහ රජතුමනි මට එන්ට කීවේ මොකට ද? මට තවම ගමන් මහන්සිය ඇරුණේ නැහැ." පුංචි ඉවාන් කීවා.

"දැන් නුඹ මේ හැලි තුනේ වතුරයි, කිරියි නාලා ගිහින් විවේක ගනින්." රජතුමා කීවා.

හැලිවල වතුරයි, කිරියි, උතුරනවා. පුංචි ඉවාන් ඒවා දිහා බලනවා. තුන්වෙනි හැලියේ විතරයි ඇල් වතුර තියෙන්නේ.

"මහරජතුමනි! මාව පණ පිටින්ම තම්බලා මරන්ට සිතුවා ද? මා කළ සේවයට තෑගි දෙන්නේ ඔහොම ද?"

"පුංචි ඉවාන්, එහෙම නොවෙයි. මේ හැලි තුනෙන්ම නැවාම නුඹ ලස්සන තරුණයෙක් වේවි." රජ තුමා කීවා.

"මම නාකි නැහැ. මහරජ තුමනි මට තරුණයෙක් වෙන්ට ඕන නැහැ!" පුංචි ඉවාන් කීවා.

රජතුමාට කේන්ති ආවා:

"නුඹ මට අකීකරු වෙන්නේ මොක ද? නුඹ හැම දා ම මට විරුද්ධව කතා කරනවා. නුඹ දන්ම නැවේ නැතිනම්, නුඹව බලෙන් නාවනවා."

මේ වේලාවේදී ලස්සන ඇලෝනා කුමරිය එයාගේ මාලිගාවේ ඉඳලා එළියට ආවා. හොඳ වේලාවක් බලලා, රජුට ඇහෙන්නෙ නැතිවෙන්ට ඈ පුංචි ඉවාන්ගේ කණට රහසක් කීවා:

"නුඹ උතුරන හැලිවලට පනින්ට ඉස්සෙල්ලා, රන්කෙඳි අස්වයටයි, මුහුදු අස්වයින්ටයි කියාපන්. ඊට පස්සේ පැනලා නාපන්, නුඹට විපතක් වෙන්නේ නැහැ."

"මහරජ තුමනි! මම ආවේ මම කියාපු විදිහට වතුරයි, කිරියි ලැස්ති ද කියලා බලන්ටයි." ලස්සන ඇලෝනා කුමරිය එහෙම කියලා හැලි වටේටම වටයක් ගිහිල්ලා ආයෙමත් මෙහෙම කියනවා:

"වැඩේ හරියට කරලා තියෙනවා. මහරජ තුමනි, ඉක්මනින් නාන්ට. මම විවා මගුලට ලැස්ති වෙන්නම්."

කුමරිය ඇගේ මාලිගාවට ගියා. ලොකු නුවණක්කාර පුංචි ඉවාන් රජු දිහා බලලා මෙහෙම කියනවා:

"හොඳයි, මහරජ තුමනි, මම තව වරක් පිහිට වෙන්නම්. දෙවරක් මැරෙන්නෙත් නැහැ. වරක් මරණය වළක්වන්නත් බැහැ. මගේ රන් කෙඳි අස්වයා ගෙන් සමු අරගෙන එන්ට අවසර දෙන්න. මම ඌත් එක්ක රට, රටවල්වල ඇවිද්දා. ඌව බලන අන්තිම වාරය මෙය වෙන්ට පුළුවනි."

"නුඹට යන්ට අවසර දෙනවා. හැබැයි හුභාක් වේලා ඉස්තාලෙට

වෙලා ඉන්නට එපා!'' රජු කීවා.

ලොකු නුවණක්කාර පුංචි ඉවාන්, රන් කෙඳි අස්වයා ළඟටයි, මුහුදු අස්වයින් ළඟටයි ගිහිල්ලා, උන්ට කතා කළා. සතුන් පුංචි ඉවාන්ට උප-දෙසක් කියලා දුන්නා:

''අපි හත්දෙනා තුන් පාරක් කිඹුහුන් ඇරියායින් පස්සෙ නුඹ බය නැතුව උතුරන කිරි හැලියට පැනපන්, නුඹට විපතක් වෙන්-නේ නැහැ.''

පුංචි ඉවාන් රජු ළඟට ආවා:

''මහරජ තුමනි! දැන් මම ඔබ ගේ ඉල්ලීම ඉටු කරන්නම්. දැන් මම පනින්නම්.''

ඔන්න එතකොට අස්වයෝ හත් දෙනා ම කිඹුහුන් ඇරියා, දෙවැනි වරට ත් කිඹුහුන් ඇරියා. තුන්වෙනි වරට ත් කිඹුහුන් ඇරියා. පුංචි ඉවාන් කිරි හැලියට පැන්නා. ඒ හැලියේ ඉඳලා උතුරන වතුර තියෙන හැලියට පැන්නා. ඊට පස්සේ අනිත් හැලියට පැන්නා. ඒ පාර පුංචි ඉවාන් බොහොම ලස්සන වුණා. ඒතරම් ලස්සන අය ඉන්නෙ කතන්දරවල විතරයි.

රජ තුමා පුංචි ඉවාන් දිහා බලලා කල්පනා කරන්නේ නැතිවම, උතුරන කිරි හැලියට පැන්නා. ඔහු මැරිලා තැම්බිලා ගියා.

ලස්සන ඇලෝනා කුමරිය ඇගේ මාලිගාවේ ඉඳලා දුවගෙන ඇවිල්ලා ලොකු නුවණක්කාර පුංචි ඉවාන්ගේ අතක් අරගෙන පේරුස් මුද්ද ඔහුගේ ඇඟිල්ලකට දැම්මා. ඈ හිනාවෙලා මෙහෙම කිව්වා:

''රජුගේ අණ අනුව නුඹ මාව හොරකම් කරගෙන ආවා. දැන් රජු මළා. නුඹ කැමති නම් මාව මගේ රටට ගෙනියපන්. අකමැතිනම් මෙහෙ නුඹ ළඟ මාව තබා ගනින්.''

ලොකු නුවණක්කාර පුංචි ඉවාන් ලස්සන ඇලෝනා කුමරියට ඔහුගේ අතේ තිබුණු මුද්ද පළන්දලා, ඇයව සරණ පාවා ගත්තා.

අම්මවයි, තාත්තවයි අයියලා තිස් දෙදෙනාවයි ගමෙන් ගෙන්වා ගෙනැ බොහොම යසට මගුල් ලැස්ති කළා.

අම්මයි, තාත්තයි, අයියලා තිස් දෙදෙනායි රජ ගෙදරට ආවා. ලොකු නුවණක්කාර පුංචි ඉවාන් රජකමට පත්වුණා.

මගුල් උත්සවය බොහොම ජයයි. ලොකු නුවණක්කාර පුංචි ඉවාන් රජ තුමා ලස්සන ඇලෝනා කුමරිය සමග බොහොම සැපෙන් ආදරයෙන් ජීවත් වුණා. අම්මටයි, තාත්තටයි සැලකුවා, සත්කාර කළා.



සිමියොන්ලා හත්දෙනා

එකෝමත් එක රටක අයියලා මල්ලිලා හත් දෙනෙක් හිටියා. ඒ ගොල්ලන්ගේ වාසගම සිමියොන්, හත්දෙනා ම දක්ස වැඩ කාරයෝ.

දවසක් දා ඒ ගොල්ලෝ ගියා කුඹුරු වපුරන්ට. හත්දෙනාම කුඹුරු වැඩ කරන කොට, රටේ රජතුමා, යුද්ද නායකයාත් එක්ක ගමනක් ගියා. රජතුමා කුඹුර දිහා බලා හත් දෙනාව දැකලා පුදුම වුණා.

''හරි වැඩක් නොවැ. එකම කුඹුරක හත් දෙනෙක් වපුරනවා. හත්දෙනාගෙ ම උස එක වගෙ යි, මූණුවර එක වගෙ යි, ගිහිල්ලා දැනගෙන වරෙල්ලා කවුද මේ ගොවියෝ, කොහෙන්ද මේ ගොවියෝ කියලා'' රජතුමා කීවා.

රාජ සේවකයෝ ගිහිල්ලා සිමියොන්ලා හත්දෙනාව රජතුමා ඉදිරියට ගෙනාවා.

''නුඹලා කවුද? මොනවා ද කරන්නෙ?'' රජතුමා ඇහුවා.

''අපි සිමියොන්ලා. අයියලා මල්ලිලා හත්දෙනෙක්. ගොවිතැන් වැඩ කරනවා. සීයාලාගේ තාත්තාලාගේ කුඹුරු වපුරනවා. අපට කර්මාන්ත වැඩත් පුළුවන්.'' හත්දෙනාම පිළිතුරු දුන්නා.

''නුඹලා දන්න කර්මාන්ත මොනවාද?'' රජතුමා ඇහුවා.

''මහ පොළොවේ ඉඳලා අහසට වැදෙන තරම් උස යකඩ කණුවක් හදන්ට මට පුළුවනි.'' ලොකු සිමියොන් කිව්වා.

''ඒ කණුව දිගේ අහසට නැගලා හතර වටේටම බලලා, තොරතුරු හොයාගන්ට මට පුළුවනි.'' දෙවෙනි සිමියොන් කීවා.

''මට පුළුවනි, පට, පට ගාලා නැවක් හදලා මුහුදු ගිහිල්ලා, මූදේ යට කිමිදිලා වගතුග හොයාගෙන එන්නට.'' තුන්වෙනි සිමියොන් රජ තුමාට කීවා.

''පියාඹන මැස්සෙකුට වුණත් වරදින්නේ නැතුව ඊයෙන් විදින්න මට පුළුවනි.'' හතරවෙනි සිමියොන් කීවා.

''අහස දිහා බලා, අහසේ තියන තරු වරදින්නේ නැතුව ගණන් කරන්ට මට පුළුවනි.'' පස්වෙනි සිමියොන් කිව්වා.



''මට එක දවසකින් තිරිඟු ඉහළා, පැළ කරලා අස්වැන්න කපා දෙන්න, පුළුවනි.'' හයවෙනි සිමියොන් කිව්වා.

''නුඹට මොනවාද පුළුවන්?'' රජතුමා පොඩි සිමියොන්ගෙන් ඇසුවා.

''මහරජ තුමනි! මම සින්දු කියනවා. නළාව පිඹිනවා.''

එතකොට යුද්ධ නායකයා රජුට මෙහෙම කියනවා.

''දේවයන් වහන්ස! අපට ඕන වැඩට අක්ස උදවිය. සින්දු කාරයින් ගෙන් අපට වැඩක් නැහැ. උන්ව පන්නා දමන්ට ඕන. උන් නිකම් පිනට කාලා, බීලා ඉන්න එවුන්.''

''නුඹේ කතාව හරී.''

රජතුමා කීවා. පුංචි සිමියොන් රජුට නමස්කාර කරලා මෙහෙම කිව්වා:

''මහරජ තුමනි! මගේ හපන් කම් පෙන්වන්න අවසර දෙන්න. මම නළාව පිඹින්නම්.''

''හොඳයි අන්තිම වරට පිඹපන්. ඊට පස්සේ මගේ රටින් පිටවෙලා පලයන්.'' රජතුමා කිව්වා.

පුංචි සිමියොන් නළාව අරගෙන රුසියන් ගියක් වාදනය කළා. එතන රැස්වෙලා හිටිය මිනිස්සු ඔක්කොමල්ලා නටන්ට පටන් ගත්තා! රජතුමා නටනවා, සිවු වරයෝ නටනවා, මුර කාරයෝ නටනවා. ඉස්තාලෙ හිටිය අස්වයොත් නටනවා. ගව මඩුවල ගවයෝ, එළදෙන්නු නටනවා. කුකුළෝ, කිකිළියෝ නටනවා. ඔක්කෝටම වැඩියෙන් උඩ පැන, පැන නැටුවේ යුද්ද නායකයා. ඔහුට ආඩිය ආලා. ඔහුගේ යටිරැවුළ වෙවුලනවා, කම්මුල් දිගේ කඳුළු කැට ගලනවා. රජතුමා කෑ ගැහුවා.

''වාදනය නවත්වාපන්. මීට වැඩිය නටන්ට මට බැහැ. මට බොහොම මහන්සියි.''



"හොඳ මිනිසුන්ට, නැටුම් නවත්වලා විවේක ගන්ට පුළුවනි. යුද්ද නායකයා නුඹේ නපුරු කටයි, නපුරු ඇසුයි නිසා නුඹ තව නටපන්" කියලා පුංචි සිමියොන් කිව්වා.

ඔන්න ඒ පාර මිනිස්සු නිකම් හිටියා. යුද්ද නායකයා විතරක් හති දම, දමා නටනවා. නටලා, නටලා බැරිම තැන ඔහු බිම ඇද වැටුණා. බිම වැටිලා හරියට වැලි ගොඩක දාපු මාළුවකු වගේ ඉන්නවා. පුංචි සිමියොන් නළාව පිඹීම නැවැත්තුවා.

"මේ තමයි මම දන්නා කර්මාන්තය!" පුංචි සිමියොන් කිව්වා.

රජතුමා හිනා වුණා. යුද්ද නායකයා තරහ පෙන්වන්නේ නැතුව හිටියා.

"ලොකු සිමියොන් දැන් නුඹේ හපන්කම් පෙන්වාපන්!" රජතුමා අණ කළා.

ලොකු සිමියොන් රාත්තල් පන්සීයක් බර යකඩ මිටියක් අරගෙන මහ පොළොවේ සිට නිල් පාට අහසට යන කල් උසට උසේ යකඩ කණුවක් හැදුවා. දෙවැනි සිමියොන් යකඩ කණුව දිගේ අහසට නැගලා බලනවා.

"මොනවාද පෙනෙන්නේ කියලා කියාපන්!" රජතුමා අහනවා.

"මහ මූදේ නැව් යනවා පේනවා! කුඹුරුවල වපුරනවා පේනවා!" දෙවැනි සිමියොන් කියනවා.

"තව මොනවාද පෙනෙන්නේ?"

"මහා සාගරයේ බුයානා දූපතේ රත්තරන් මාලිගාවක ජනේලයක් ළඟට වෙලා, ලස්සන යෙලේනා සේද පා පිස්නක් ගොතනවා."

"යෙලේනා කොහොම කෙනෙක් ද?"

"ඒ තරම් ලස්සන කුමරියන් ඉන්නේ කතාවල විතරයි. හිස පිරලා අඩ සඳ පැළඳලා. හැම කෙස්ගහකම මැණික් ගලක්."

රජ තුමාට ලස්සන යෙලේනාව සරණ පාවා ගන්ට හිතුනා. ඒ රටට මගුල් කපුවකු යවන්ට හිතුනා. නපුරු යුද්ද නායකයා රජුට උපදෙස් දුන්නා:

"දේවයන් වහන්ස! ලස්සන යෙලේනා කැමති කරවා ගන්ට සිමියොන්ලා හත්දෙනාව යවන්ට. ඒ ගොල්ල දක්ස වැඩ කාරයෝ! කුමාරිව නො ගෙනාවොත් ඒ ගොල්ලන්ගේ බෙලි කපා දාන්ට අණ කරන්ට!"



''හොඳයි. ඒ ගොල්ලන්ව යවන්නම්!'' රජ තුමා කීවා.

ලස්සන යෙලේනා කුමාරිව අරගෙන එන්න කියලා රජතුමා සිමියොන්ලා හත්දෙනාට අණ කළා.

''නැතිනම් මගේ කඩුවෙන් නුඹලා ගේ බෙලි කපා දමනවා!'' රජු කීවා.

මොනවා කරන්ට ද? නැව් හදන සිමියොන් පොරවක් ගත්තා, පට, පට ගාලා ගස් කපලා, නැවක් හදලා මුහුදට දැම්මා. ඕන කරන බඩු මුට්ටු, වටිනා තෑගි බෝග නැවට පැටෙව්වා. සිමියොන්ලා හත් දෙනා ගේ නායකයා හැටියට රජතුමා නපුරු යුද්ද නායකයාව පත් කළා. නපුරා සුදුමැලි වුණා. එහෙත් කරන්ට දෙයක් නැහැ. නපුරා මිනිසුන් අමාරුවේ දාන්ට හපනා. ඒ වුණත් අනුන්ට කපාපු වළේ තමා වැටෙයි කියලා නපුරු යුද්ද නායකයාට බයයි.

ඔන්න ඉතින් මේ ගොල්ල නැව් නැග්ගා. හුළං පාරට රුවල් ලෙලදුන්නා. මහා සාගරයේ බුයානා දූපතට නැව පිටත් වුණා.

ඔහොම ගිහිල්ලා, ගිහිල්ලා, මහා සාගරයේ නැව් ගමන් කරලා බුයානා දූපතට ආවා.

පිරිස ගොඩ බැහැලා තෑගිබෝග අරගෙන ලස්සන යෙලේනා කුමරිය ළඟට ගිහිල්ලා විවා මගුල ගැන කතා කළා.

ලස්සන යෙලේනා කුමරිය තෑගි බෝග දිහා බලනවා. නපුරු යුද්ද නායකයා ඇගේ කනට රහසක් කියනවා:

''ලස්සන යෙලේනා නුඹ ඔය මගුලට කැමති වෙන්න එපා. අපේ රජ්ජරුවෝ හද්ද නාකියෙක්. එයාගේ රටපුරා වෘකයෝ හූ කියනවා. වලස්සු ඇවිදිනවා.''

ලස්සන යෙලේනාට තරහ ඇවිත් මගුල් කපුවන්ව පන්නා ගත්තා. දැන් ඉතින් මොනවා කරන්ට ද?

''අයියන්ඩියෙනි! නුඹලා නැවට නැගපල්ලා! රුවල් ආ ගනිල්ලා! ගමනට ලෑස්ති වෙයල්ලා! කෑම බීම නැවට පටවා ගනිල්ලා! කුමාරිව නැවට ගෙනෙන එක මම බලාගන්නම්.'' පුංචි සිමියොන් අයියලාට කිව්වා.

සිමියොන් ගොවිරාළ මූදු වෙරළේ තිරිඟු ගොවිතැන් කරලා, එක පැයකින් කරල් කපලා, තිරිඟු පිටි කරලා පාන් පුච්චලා, පාන්,



තිරිහු නැවට පැටෙව්වා. නැව පුංචි සිමියොන් එන තුරු බලාගෙන ඉන්නවා.

පුංචි සිමියොන් මාලිගාවට ගියා. ලස්සන යෙලේනා ජනේලය ළඟ වාඩිවෙලා සේද පා පිස්නක් ගොතනවා. පුංචි සිමියොන් ජනේලය ළඟ බංකුවක වාඩිවෙලා කුමාරියට ඇහෙන්නට කතා කරනවා:

"බුයානා දූපත හොඳ යි, මහ මුහුද යි, සාගරය යි හොඳ යි, අපේ රුසියාව ඊට වැඩිය බොහොම හොඳ යි. රුසියාවේ පිට්ටනි කොළ පාටයි, ගංගා නිල් පාටයි. රට බොහොම ලොකුයි. ඉමක් කොණක් පෙනෙන්නේ නැහැ. බිරියෝසා ගස් සුදු පාට යි, වතුවල මල් රතු පාට යි. එක පැත්තකින් ඉර බහිනකොට, තවත් පැත්තකින් ඉර පායනවා. රෑට හඳ බබළනවා, තරු දිලිසෙනවා. පිනි බිඳු රන්වන් පාට යි, දිය පාරවල් රිදී පාට යි,

උදෑසන එඬේරා පිටියට ඇවිත් නලාව පිඹිනවා. ඔහු පස්සේ යන්ට ගිහෙනවා..."

පුංචි සිමියොන් ඊට පස්සෙ නළාව පිඹින්නට පටන් ගත්තා. රත්රන් දොරකඩින් ලස්සන යෙලේනා එළියට ආවා. සිමියොන් නළාව පිඹින ගමන් මල් වත්තේ ඇවිදිනවා. ලස්සන යෙලේනා ඔහු පිටුපසින් ගමන් කරනවා. පුංචි සිමියොන් වත්ත මැදින් ආවා. කුමරිය ඔහු පිටුපසින් යනවා. පුංචි සිමියොන් වෙල මැදින් ගියා. කුමරිය ඔහු පිටුපසින් යනවා. පුංචි සිමියොන් වෙරළට ආවා. කුමරිය ඔහු පිටුපසින් වෙරළට ආවා. පුංචි සිමියොන් නැවට නැංගා, ලස්සන යෙලේනා කුමරිය ත් නැවට නැංගා.

සිමියොන්ලා ඉක්මනට නැව පදවාගෙන මහ මුහුදට ආවා.

මුහුද මැදදී පුංචි සිමියොන් නළා වාදනය නැවැත්වුවා. ඔන්න එතකොට තමයි, ලස්සන යෙලේනා කුමරිය වට පිට බැලුවේ. වටේටම මහ මුහුද. බුයානා දූපත බොහොම ඈත. යෙලේනා කුමරිය එකවරම අහසට පියාඹලා නිල් පාට තරුවක් වුණා. ඈ දැන් අහසේ අනිත් තරු මැද හැංගිලා ඉන්නවා. තරු ගණන් කරන සිමියොන් අහස දිහා බලා තරු ගණන් කරලා යෙලේනා තරුව හොයා ගත්තා. දුනු ශිල්පියා ඇවිත් යෙලේනා තරුව සොයාගෙන එල්ලය බලලා ඒ තරුවට විද්දා. එතකොට තරුව නැවට වැටිලා ආයෙමත් ලස්සන යෙලේනා කුමරිය බවට පත්වුණා.

"කුමරියනි, නුඹ අපෙන් දුවන්ට එපා. නුඹට හැංගෙන්නට බැහැ. නුඹ අකැමැති නම් අප සමග යන්ට, අපිට පුළුවනි නුඹව නුඹගේ රටට ගෙනයන්න. රජ්ජුරුවෝ අපගේ බෙලි කපා දැම්මත් කමක් නැහැ." පුංචි සිමියොන් කුමරියට කීවා.

ලස්සන යෙලේනා කුමරියට පුංචි සිමියොන් ගැන මහ දුකක් උපන්නා.

"පුංචි සිමියොන් සින්දු කාරයා. නුඹේ බෙල්ල කපන්ට මම ඉඩතියන්නෙ නැහැ. නාකි රජු ළඟට යන්නම්." කුමරිය කීවා.

දවසක් ගත වුණා, දවස් දෙකක් ගත වුණා. පුංචි සිමියොන් කුමරිය ළඟින් හෙළවෙන්නේවත් නැහැ. ලස්සන යෙලේනා කුමරිය ඔහු දිහා බලාගත්තු ගමන් ම ඉන්නවා.

නපුරු යුද්ද නායකයා මේවා සේරම හොඳට බලාගෙන ඉන්නවා. නපුරු වැඩ කරන්ට ඔහු කල්පනා කළා. ඔන්න දැන් රටත් වෙරළත් පේනවා.

යුද්ද නායක නපුරා සිමියොන්ලා හත් දෙනාට අඬ ගහලා පැණි, රයිවයින් දීලා මෙහෙම කිව්වා:

"අපේ රටට ජය පතා වයින් බොමු!"

වයින් බිව් හැටියේම හයදෙනාම බිමවැටිලා නිදා ගන්ට පටන් ගත්තා. දැන් ඉතින් හෙණ ගැහුවත් විදුලි කෙටුවත් ඔවුන් නැගිටින්නෙ නැහැ. ඒ වයින් වලට වහ කවලම් කරලා.

ලස්සන යෙලේනා කුමරියයි, පුංචි සිමියොනුයි විතරක් වයින් බිවුවේ නැහැ.

නැව රටට පැමිණියා. සිමියොන්ලා හය දෙනෙක්ම නිදාගෙන ඉන්නවා. ලස්සන යෙලේනා කුමරිය රජු ඉදිරියට ගෙනයන්ට ඇයට පුංචි සිමියොන් ඇඳුම් ඇන්දෙව්වා. දෙන්නාම අඬනවා, සුසුම් ලනවා. වෙන් වී යාමට කැමති නැහැ. මොනවා කරන්ට ද? හිතේ තියෙන වචන පිට නොකර ඉන්නවා.

නපුරු යුද්ද නායකයා ඉක්මනට රජු ළඟට දුවගෙන ගිහිල්ලා දණින් වැටිලා මෙහෙම කියනවා:

"දේවයන් වහන්සේ! පුංචි සිමියොන් ඔබ තුමා මරන්ට ලැස්ති වෙනවා. කුමරියව සරණ පාවා ගන්ට රහසේ ලැස්ති වෙනවා. ඔහුව මරා දමන්න."

කුමරියයි, පුංචි සිමියොනුයි ආව හැටියේම රජතුමා කුමරියව මාලිගාවට යවලා, පුංචි සිමියොන්ව හිරගෙට දැමීමට නියම කළා. පුංචි සිමියොන් කෑ ගැසුවා:

"අයියන්ඩියෙනි! මාව හිරගෙට ආනවා. මට පිහිට වෙයල්ලා!"

අයියලා හය දෙනා ම නිදි.

පුංචි සිමියොන්ව හිරගෙට ආලා අත් පාවලට යකඩ දම්වැල් දැම්මා.

උදේ පාන්දර පුංචි සිමියොන්ව මරා දමන්ට ගෙනගියා. ලස්සන යෙලේනා අඬනවා. ඇගේ කඳුළු කැට මැණික් ගල් වගේ. යුද්ද නායක නපුරා පුරසාරම් දොඩනවා.

පුංචි සිමියොන් ඉල්ලීමක් කළා:

"රජතුමා සමාව දෙන්නේ නැහැ. පැරණි සිරිත අනුව මරණයට ඉස්සෙල්ලා මගේ අන්තිම කැමැත්තට අවසර දෙන්න. මගේ නළාව වාදනය කරන්ට අවසර දෙන්න."

යුද්ද නායක නපුරා කෑ ගහනවා:

"දේවයන් වහන්ස! ඉඩ දෙන්න එපා!"

"පැරණි රජසිරිත් කඩ කරන්ට මට බැහැ. නළාව පිඹපන්. ඉක්මන් කරපන්. මගේ වදකයා බලාගෙන ඉන්නවා, නුඹේ බෙල්ල කපන්න." රජතුමා කීවා.

පංචි සිමියොන් නළාව වාදනය කළා.

නළාවේ හඬ කඳුවලට එහා, මුහුදු වල යන නැව් වලට ඇහුණා. නිදා හිටිය සිමියොන්ලා හය දෙනාටම ඇහුණා. ඔවුන් නැගිටලා මෙහෙම කියනවා:

"අපේ මල්ලිට ලොකු විපතක් වෙලා!"

සිමියොන් ලා හය දෙනා රජ ගෙදරට දුව ගෙන ගියා. වදකයා පුංචි සිමියොන් ගේ බෙල්ල කපන්ට ලෑස්ති වුණා. සිමියොන් වඩුවා, සිමියොන් ගණිතයා, සිමියොන් ගොවියා, සිමියොන් නාවිකයා, සිමියොන් දුනු ශිල්පියා, සිමියොන් කම්මල් කාරයා හැම පැත්තෙන්ම දුවගෙන ආවා.

අයියලා බලය පෙන්නලා රජුව බයකරලා මෙහෙම කිව්වා:

"අපේ මල්ලිව නිදහස් කරපන්. ඔහුට ලස්සන යෙලේනා කුමරිය පාවා දීපන්."

රජ්ජුරුවෝ බොහොම බයවුණා:

"නුඹලාගේ මල්ලිව අර ගනිල්ලා. කුමාරිවත් අරගනිල්ලා. මම ඇයට කැමති නැහැ. ඉක්මනට අරගෙන පලයල්ලා."

ඔන්න අයියලා එකතුවෙලා ජයට උත්සවයක් ලෑස්ති කළා. කාලා, බීලා, ගී කිව්වා. පුංචි සිමියොන් නළාව අරගෙන වාදනය කළා.

රජ්ජුරුවෝ නටනවා, බිසව නටනවා, සිවු ගොල්ලයි, ගෑණුයි නටනවා, ඉස්තාලවල අස්වයෝ නටනවා, ගව මඩුවල ගවයෝ, එළදෙන්නු නටනවා. කුකුළෝ, කිකිළියෝ නටනවා.

යුද්ද නායක නපුරා උඩ පැන, පැන හති දම, දමා නටලා, නටලා, බිම වැටිලා මළා.

පුංචි සිමියොන් ලස්සන යෙලේනාව විවාහ කර ගත්තා. සිමියොන් වඩුවා ලස්සන ගෙයක් හැදුවා, සිමියොන් ගොවියා ගොවිතැන් කරනවා, සිමියොන් නාවිකයා නැව් නැගලා ගියා, සිමියොන් ගණිතයා ගණන් කරනවා,



සිමියොන් දුනු ශිල්පියා රුසියාව රකිනවා... රුසියාවේ හැම දෙනාටම රස්සාවල් තියෙනවා.

පුංචි සිමියොන් නළාව වාදනය කරලා මිනිසුන්ගේ සිත් සතුටු කරලා, ඔවුන්ට වැඩ කිරීමට උදව් දෙනවා.



පටුන

ලස්සන වසිලිස්සා 5
ඉවාන් කුමාරයා සහ හොඳ වෘකයා 20
ඉවාන්ලා දෙදෙනා 33
නුවණැති රාජාලියා 43
අලෝනුෂ්කා අක්කා සහ ඉවානුෂ්කා මල්ලී 57
පුදුම අශ්වයා 63
හිම සීයා 74
නීල කොබෙයියා 79
හංසයෝ 109
රිදී පීරිසිය හා රත්රන් හදවත 115
මාළුවෙකුගේ අණ 124
නුවණැති කුමරිය 135
රතු එළදෙන 147
මරියා මොරේව්නා 152
ලොකු නුවණක්කාර පුංචි ඉවාන් 169
සිමියොන්ලා හත්දෙනා 203


පාඨකයන් වෙත


මෙම පොතෙහි අඩංගු කරුණු, අනුවාදය හා මුද්‍රණය පිළිබඳ ව ඔබ ගේ අදහස් දන්වා එවීමෙන් රාදුගා ප්‍රකාශකයන් ගේ කෘතඥතාව ඔබට හිමි වේ. ඔබ ගේ වෙනත් යොජනා ඇතොත් අපි එය කරුණාවෙන් බාර ගනිමු.


අපේ ලිපිනය:

Raduga Publishers,
17, Zubovsky Boulevard,
Moscow, USSR

ශ්‍රී ලංකාවේ බෙදා හරින්නෝ–
සී/ස මහජන ප්‍රකාශක මන්දිරය (පීපල්ස් පබ්ලිෂිං හවුස් ලිමිටඩ්)
124, කුමාරන් රත්නම් පාර, කොළඹ–2







සී/ස, ප්‍රෝග්‍රසිව් පබ්ලිෂිං හවුස් (පුද්.) සමාගම
අංක 91, [illegible] කොළඹ 08

ISBN 978-955-1319-14-4

LKR 650.00